

# භවලෝකය

## වාම සන්නිවේදනයේ

### පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි භූමිකාව

**චන්දන විජේකෝන්**

5

අවවාදයයි

පාඨකයින් විසින් පොත් විරූප
කිරීම හෝ සලකුණු කිරීම හෝ
නොකළ යුතුය. පොතක සලකුණු
කිසිවක් ඇත්නම් පාඨකයින් ඒ ගැන
නිකුත් කරන නිලධාරියාට දැන්විය
යුතුය. එබඳු රපෝර්තුවක්
නොමැති කල්හි නිකුත් කරන ලද
පොත පූර්ණ පිටපතක් හැටියට
සලකනු ලබනවා ඇත.
හානි කරන ලද පොතක් සඳහා
දණ්ඩනය එය නැවත ලබා ගැනීමට
වැයවන සම්පූර්ණ මුදල හා
දඩයක්ද වේ.

SRI PALEE CAMPUS

# නවලෝකය

වාම සන්නිවේදනයේ

පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි භූමිකාව

චන්දන විජේකෝන්

NAWALOKAYA

Vaama Sannivedanaye Poojya Udakendawala Siri Saranagkara Himi Buumikawa

by

CHANDANA WIJEKOON

Printed and published by

*Dayawansa Jayakody & Company*

101 & 112, Ven. S. Mahinda Himi Mawatha,

Colombo 10, Sri Lanka.

Tele : 011-2695773 Fax : 011-2695873

email: dayawansa@sltnet.lk

web site: www.dayawansajayakody.com


# නවලෝකය

වාම සන්නිවේදනයේ

පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි භූමිකාව

චන්දන විජේකෝන්


Class No:

Acc. No. 27631

Etc.

SPCLIB

027630



දයාවංශ ජයකොඩි සහ සමාගම



27630

දයාවංශ ජයකොඩි සහ සමාගම
101 සහ 112, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන, කොළඹ 10.
දුරකථන සහ ෆැක්ස් : 011-2695773 / 011-2696653

ISBN 978 - 624 - 5710 - 00 - 3

| | |
|---|---|
| Class No: | 335.435 |
| Acc. No. | 27630 |
| Etc. | C31 |

මුද්‍රණය :
දයාවංශ ජයකොඩි සහ සමාගම - මුද්‍රණ ශිල්පියෝ
163/4, සිරිධම්ම මාවත, මරදාන, කොළඹ 10.
කාර්යාලය : 101 සහ 112, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන, කොළඹ 10.

27630

**පිදුම**

අධිරාජ්‍ය විරෝධී සටනේ
පෙර ගමන්කරුවකු වෙමින්
සමාජවාදී සමාජයක්
ගොඩනැඟීම උදෙසා
තම ජීවන කුසුම කැප කළ
උඩකැන්දවල සිරි සරණංකර හිමිට
මේ කෘතිය උපහාරයක් ම වේ වා!

ප්‍රථම මුද්‍රණය : ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ ඉල් මස පුර පසළොස්වක ලත් ගුරු දින
හෙවත් 2021 නොවැම්බර් මස 18 වැනිදා බ්‍රහස්පතින්දා

චන්දන විජේකෝන්ගේ වෙනත් කෘති

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල නීතිය සහ එහි කාර්යභාරය - 1999

පුවත්පතේ කතන්දරේ - 2007
(න්‍යාය හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ විමසුමක්)

ජනමාධ්‍ය හා සමාජ විඥානය - 2011

ලාහෝර් බලකොටුව (පරිවර්තනයක්) - 2012

අසිරිමත් ගන්ධාරය - 2013
(පකිස්ථානයේ බෞද්ධ නටබුන් සොයා ගිය ගමනක්)

හිරෝෂිමාවේ කඳුළු - 2018

පකිස්ථානයේ නිර්මාතෘ අලි ජින්නා - 2019

පිට කවරය :- දීපාල් සංජීව

# පටුන

පෙරවදන - 1 ... ... ... ... ... 11

පෙරවදන - 2 ... ... ... ... ... 15

හැඳින්වීම ... ... ... ... ... 25

අනුමෝදනාව ... ... ... ... ... 32

පළමු වැනි පරිච්ඡේදය

ශ්‍රී ලංකාවේ වාම දේශපාලනයේ ආරම්භය හා එහි විකාශනය 35

1. තරුණ සංගම් ව්‍යාපාරය ... ... ... 35
2. සූරියමල් ව්‍යාපාරය ... ... ... 37
3. මැලේරියා වසංගතය ... ... ... 42
4. ලංකා සමසමාජ පක්ෂයේ උපත ... ... 44
5. ඇම්.ඒ.එල්. බ්‍රේස්ගර්ඩ්ල් සිද්ධිය ... ... 45

දෙවැනි පරිච්ඡේදය

උඩකැන්දවල සිරි සරණංකර හිමි ලංකා සමසමාජ පක්ෂයට එක් වීම ... ... ... ... .... 51

1. ට්‍රොට්ස්කිවාදය වැලඳ ගැනීම සහ සමසමාජ පක්ෂයෙන් කොමියුනිස්ට්වාදීන් නෙරපීම. ... 56
2. ලංකා කොමියුනිස්ට් පක්ෂය පිහිටුවා ගැනීම. ... 58

තුන් වැනි පරිච්ඡේදය

ශ්‍රී ලංකාවේ වාමාංශික දේශපාලනයේ සන්නිවේදනය ... 63

සිවු වැනි පරිච්ඡේදය

වාමාංශික පුවත්පත් හා සඟරා ගැන හැඳින්වීමක් ... 81

1. කම්කරුවා ... ... ... ... 81
2. සමසමාජය ... ... ... ... 83
3. මගේ සඟරාව ... ... ... ... 92
4. සමසමාජිස්ට් ... ... ... ... 95
5. සමධර්මම් ... ... ... ... . 96

6. ජන ශක්තිය ... ... ... 99
7. නව ශක්තිය (සිංහල) ... ... ... 103
8. නව ශක්තිය (දෙමළ පුවත්පත) ... ... 107
9. යුනයිටඩ් සෝෂලිස්ට් (ඉංග්‍රීසි පුවත්පත්) ... 108
10. ස්ට්‍රේට් ලෙෆ්ට් ... ... ... ... 109
11. ජන ශක්තිය (දෙවැනි වර) ... ... 110
12. කොමියුනිස්ට් ... ... ... ... 111
13. සටන ... ... ... ... 112
14. සමසමාජ සටන ... ... ... 113
15. මව්බිම ... ... ... ... 115
16. වෙනත් වමේ පුවත්පත් ... ... ... 116
17. නිදහස ... ... ... ... 119
18. කම්කරුවා (දෙවැනි වර) ... ... ... 120
19. ගිනිපුපුර ... ... ... ... 121
20. එක්සත් පෙරමුණු සමසමාජය ... ... 121
21. ජනසතිය ... ... ... ... 122
22. ඇත්ත ... ... ... ... 126

පස් වැනි පරිච්ඡේදය
නවලෝකය සහ අන්තර්ජාතික දේශපාලනයේ සන්නිවේදනය 141

ස වැනි පරිච්ඡේදය
සමාලෝචනය සහ නිගමනය ... ... ... 174

උපග්‍රන්ථය ... ... ... ... ... 178



# උඩකැන්දවල සිරි සරණංකර හිමි

'නවලෝකය' නමැති
සඟරාවේ කතුවරයා
කොළඹ ටැප්‍රොබේන්
හෝටලයට විත් මා
හමු විය,

හෝටලයේ සේවකයන්
කහ සිවුරක් පොරවාගෙන සිටි
උන්වහන්සේට දක්වූයේ
මහත් ගෞරවයකි.
ඔවුහු උන්වහන්සේට
'හාමුදුරුවෝ'
යනුවෙන් ඇමතූහ.

කහ සිවුරක් පොරවාගත්
මේ ශාන්ත පුද්ගලයා
පොලිස් හිරිහැරවලට
ලක් ව හිරේ වැටුණු
කෙනෙකැයි කෙනකුට
නොසිතෙයි.

මේ ස්වාමීන් වහන්සේ තම
මුළු ජීවිත කාලයෙහි ම
සාධාරණ මිනිස් සමාජයක්
ගොඩනැඟීමේ
මග සොයමින් සිටියහ.

සෝවියට් ලේඛක
වී. කොච්ටොවා

බලන්න - 'සටනක-සටහන්' ස්වයං ලිඛිත චරිතාපදානය
උඩකැන්දවල සිරි සරණංකර හිමි

# පෙරවදන - I

යටත් විජිත යුගයේ වයඹ පළාතේ හත් කෝරළයට අයත් හිරියාල ප්‍රදේශයේ උඩකැන්දවල නම් ඉතා පිටිසර ගමක දිළිඳු පවුලක 1902 ජනවාරි 7 වැනි ද උපත ලැබූ රන්බණ්ඩා, උඩකැන්දවල සිරි සරණංකර නමින් ළමා වියේ දී ම පැවිදි දිවියට ඇතුළු විය.

යටත් විජිත යුගයේ, වැඩවසම් ක්‍රමයේ සහ නැඟී එන ධනවාදයේ පීඩනයන්ට, මර්දනයන්ට රන්බණ්ඩා ඇතුළු පවුලේ සාමාජිකයන් ගොදුරු වූ බව ප්‍රකට වූ කරුණකි. විශේෂයෙන් පසු කලක අධිරාජ්‍ය විරෝධී ලෝක අරගලයේ ප්‍රතාපවත් නායකයකු වීමට උන්වහන්සේට මාර්ගය සකස් වූයේ ළමා වියේ දී යටත් විජිතවාදය ඇති කළ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික බලපෑමත්, අනගාරික ධර්මපාලතුමාගේ ආධාරයෙන් භාරතයේ ශාන්ති නිකේතනයට ගොස් උසස් අධ්‍යාපනය ලැබීමත් ඔස්සේ ය. එහි දී ඉන්දියානු නිදහස් අරගලය හා එක් ව, සටන් කළ අතර, රවීන්ද්‍රනාත් තාගෝර්, මහත්මා ගාන්ධි, ජවහර්ලාල් නේරු, සුභාෂ් චන්ද්‍රබෝස් මෙන්ම නරේන්ද්‍රදේව කාශි වැනි ඉන්දීය වාම හා කොමියුනිස්ට් පක්ෂ නායකයන් සමඟ ඉතා කිට්ටු සබඳතාවක් පැවැත්වීමෙන් උන්වහන්සේ පන්නරය ලැබූහ. ඒ මඟින් උන්වහන්සේගේ දේශපාලන ජීවිතය හැඩගස්වා ගැනීමටත්, දේශපාලන පරිචයක් ලැබීමටත් මඟ සකස් විණි.

අධිරාජ්‍ය විරෝධී අරගලයේ ප්‍රතාපවත් නායකයකු වූ සරණංකර හිමියෝ, බෞද්ධ දර්ශනයෙන් සහ මාක්ස් - ලෙනින්වාදී න්‍යායයෙන් පෝෂණ වී, සමාජවාදී සමාජයක් ගොඩනඟාගැනීමට නිරන්තරයෙන් සටන් කළ නායකයෙකි. මේ සටනේ ප්‍රතිඵලයක් හැටියට 1932-1936 තෙක් කල්කටාවේ ප්‍රෙසිඩැන්සි සිර කඳවුරේත්, 1942-1944 තෙක් ශ්‍රී ලංකාවේ බන්ධනාගාර තුළත් පුරා වසර හයක් ගත කිරීමට උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ට සිදු වූයේ අන්තර්ජාතික අධිරාජ්‍ය විරෝධී අරගලයේ ප්‍රතාපවත් කාර්යභාරයක් සිදු කළ බැවිනි.

1917 ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ බලපෑම පෙරදිග සුළඟක් මෙන් චීනය, ඉන්දියාව හරහා ශ්‍රී ලංකාවට හමා ගිය වකවානුවක උඩකැන්දවල සිරි සරණංකර හිමියන් ජීවත් වූ බව අමතක නොකළ යුතු කරුණකි. ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ නියමුවා මෙන් ම, ප්‍රථම සමාජවාදී රාජ්‍යයේ නායකයා වූ ව්ලැඩිමීර් ලෙනින් මාක්ස්වාදය හඳුන්වා දුන්නේ මෙසේ ය:

"ඉතිහාසය, දර්ශනවාදය, දේශපාලන විද්‍යාව, දේශපාලන අර්ථ ශාස්ත්‍රය, සමාජ විද්‍යාව, ස්වාභාවික විද්‍යාව හමු වූ තැන මාක්ස්වාදය බිහි වේ". මේ නයින් බලන විට උඩකැන්දවල සිරි සරණංකර හිමියන්, මාක්ස්වාදියකු වූ හැටි ලෙනින්ගේ එම හැඳින්වීමෙන් අපට සිතාගත හැකි ව තිබේ. සරණංකර හිමියන්ගේ ව්‍යක්ත දේශනවලින්, සම්පාදනය කළ කෘතිවලින්, පළ කරන ලද ලිපිවලින්, කතුවැකිවලින් මාක්ස්වාදය පිළිබඳ ව තිබූ දැනුම හා පරිචය මැනගත හැකි ය. මේ තත්ත්වය වඩාත් හොඳින් අපට මැනගත හැකි වන්නේ, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ පළමු වැනි සභාපති ධුරයට උන්වහන්සේ පත් වීමත් සමඟ ය. විශේෂයෙන් ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ ආරම්භක සමුළුවේ මුලසුන දැරීමේ වරප්‍රසාදය - සරණංකර හිමියන්ට ලැබුණේ උන්වහන්සේ තුළ තිබූ මාක්ස්-ලෙනින්වාදය පිළිබඳ පරිචය හා මැර බලයට මුහුණ දෙමින්, කම්කරු සටන් මෙහෙයවීමේ පුරෝගාමී කාර්යභාරයක් ඉටු කිරීමේ අත්දැකීම් නිසා ය.

'නවලෝකය - වාම සන්නිවේදනයේ පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර භූමිකාව' නම් පර්යේෂණාත්මක කෘතිය මඟින් ප්‍රකාශ වන්නේ උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ සන්නිවේදන භූමිකාව යි. සරණංකර හිමියන්ගේ සන්නිවේදන භූමිකාව තුළ ක්‍රියාත්මක වූ මාක්ස්-ලෙනින්වාදී දේශපාලන දෘෂ්ටිවාදය පිළිබඳ විමර්ශනාත්මක සන්දර්ශනයක මාධ්‍යවේදී චන්දන විජේකෝන් නියැළීම අගය කළ යුතු ය. විශේෂයෙන් වාම සන්නිවේදන ක්‍රියාවලිය තුළ සැඟවී, කාලයේ වැලිතලාවට වැසීගිය තොරතුරු රැසක් පාඨකයාට, සමාජයට අනාවරණය කිරීමට චන්දන උත්සාහයක යෙදීම අගය කළ යුතු ය. ශ්‍රී ලාංකික වාම සන්නිවේදනයේ පුරෝගාමීන්ට යටත් විජිත යුගයේ මුහුණ



දීමට සිදු වූ ගැටලු පිළිබඳ ව මේ කෘතියෙන් චන්දන මැනවින් පැහැදිලි කරයි. විශේෂයෙන් ස්වකීය අරමුණු සහ අධිරාජ්‍යවාදයට එරෙහි දේශපාලන දෘෂ්ටිය ජනතාව අතරට ගෙන යෑම සඳහා ගත් ක්‍රියාමාර්ග සොයා ඒවා පිළිබඳ ව පැහැදිලි කිරීමක් ඔහු කැර තිබීම අගය කළ යුතු ය.

යටත් විජිත පාලකයන් සහ ඔවුන්ගේ බලධාරීන් කෙරෙහි ජනතාව තුළ එද පැවැති බිය තුරන් කැර ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී සහ මානුෂික අයිතීන් දිනා ගැනීමත්, ජාතික නිදහස් සටන ප්‍රාණවත් කිරීමත් සඳහා මේ දේශපාලන පුරෝගාමීන් කළ ප්‍රමුඛ කාර්යයන් ගැන මාධ්‍යවේදී චන්දන විජේකෝන් සිය පර්යේෂණයෙන් පැහැදිලි කැරදීමට උත්සහ ගෙන ඇත. එසේ ම, වාමාංශික ව්‍යාපාරය වටා ගොනු වී සිටි දහස් සංඛ්‍යාත කම්කරුවන් හා ගොවීන් දැනුම්වත් කරමින් ඔවුන් අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනඟා ගැනීමට හැකි සංවිධාන යාන්ත්‍රණයක් හෝ සන්නිවේදන ක්‍රමවේදයක් හෝ එද නොතිබීමට හේතු වූ සාධක චන්දන විජේකෝන් සිය පශ්චාත් උපාධි පර්යේෂණයෙන් මතු කැර පෙන්වීමට උත්සාහ දරා තිබීම අගය කළ යුතු අතර, දේශපාලන විද්‍යාව විෂයයක් හැටියට හදරන විද්‍යාර්ථීන්ට එය හොඳ පාඩමකි.

එවැනි සංකීර්ණ සමාජ පසුබිමක් තුළ උඩකැන්දවල සිරි සරණංකර හිමියන් 'නවලෝකය' (1941) සඟරාව ආරම්භ කරමින්, ශ්‍රී ලාංකික දේශපාලන සාහිත්‍යයට ලබාදුන් මාක්ස්-ලෙනින්වාදී ප්‍රවේශය චන්දන විජේකෝන් තර්කානුකූල වත්, සන්දර්ශනාත්මක වත් විග්‍රහ කැර තිබීම පැසසුමට ලක් කළ යුතු ය. එසේ ම සමාජවාදය පිළිබඳ ව කම්කරු පන්තිය තුළ දෘෂ්ටිමය රුචිකත්වයක් ඇති කිරීමට 'නවලෝකය' සඟරාව මඟින් කළ ශාස්ත්‍රීය අරගලය මේ කෘතියෙන් විග්‍රහ කැර ඇත.

මාක්ස්-ලෙනින්වාදී දෘෂ්ටිවාදය 'නවලෝකය' සඟරාව මඟින් සමාජගත කිරීමට අමතර ව, ලෝක සාම ව්‍යාපාරය සහ ආසියා-අප්‍රිකා සහයෝගිතා ව්‍යාපාරය ශක්තිමත් කිරීමටත්, වියට්නාම්-කොරියා යුද්ධයට එරෙහි ව ජනතා ව්‍යාපාර ගොඩනැඟීමටත්, ලොව වටා සිදු වන ජාතික විමුක්ති අරගල

ශක්තිමත් කිරීමටත්, උඩකැන්දවල සිරි සරණංකර හිමියන් මේ සඟරාව හරහා ලබාදුන් අයෝමය ශක්තිය චන්දන විජේකෝන් සිය පර්යේෂණ විග්‍රහයන්ට හසු කැර ගැනීමට සමත් වී ඇත.

කෙසේ නමුත් දේශපාලන සන්නිවේදන විෂය පථය තුළ මෙවැනි කෘතියක් සම්පාදනය කිරීම ඒ තරම් පහසු නැත. එහෙත් මාධ්‍යවේදී චන්දන විජේකෝන් මෙවැනි කෘතියක් සම්පාදනය කිරීමට හැම අතින් ම සුදුසු බව මගේ අදහස යි. විශේෂයෙන් දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවල දී හා මාධ්‍ය පුහුණු ආයතනවල දී ඔහු ලබා ඇති න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ප්‍රයෝජනයට ගනිමින් කැර ඇති මෙම පශ්චාත් උපාධි නිබන්ධය පොදු පාඨකයාගේ දේශපාලන දැනුම වර්ධනය කිරීම සඳහා මුද්‍රණය කිරීම වැදගත් කාර්යයක් ලෙස මම සලකමි.

අවසාන වශයෙන් "උපදින සැම මිනිසකු ම ඉතිහාසයට එක්වන්නේ නැත. ඉතිහාසයට එක්වන සැම චරිතයක් ම, ඉතිහාසයේ රැඳී සිටින්නේ නැත. නොමැකී ඉතිහාසයේ රැඳී සිටින්නේ විරල, සුවිශේෂ චරිත පමණි." යනු සඳහන් කළ යුතු ය.

ඩිව් ගුණසේකර
හිටපු ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය

## පෙරවදන - 2

ලෝක සංහතික සන්නිවේදනයේ පමණක් නොව ශ්‍රී ලාංකේය සංහතික සන්නිවේදනයෙහි සුවිශේෂ සංහතික සන්නිවේදන ප්‍රභේදයක් ලෙස වාම සංහතික සන්නිවේදනය ඉදිරිපත් වන අතර, ලෝක සංහතික සන්නිවේදන ක්‍රියාවලියෙහි ලා වාම සංහතික සන්නිවේදනය ප්‍රභේදයක් ලෙස බිහි වී වර්ධනය වූයේ දක්ෂිණාංශික සංහතික සන්නිවේදනයට එරෙහි ව බව පෙනේ. මේ ඔබ අතට පත් වන 'නවලෝකය - වාම සන්නිවේදනයේ පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි භූමිකාව' කෘතිය ශ්‍රී ලාංකේය වාම සංහතික සන්නිවේදනයේ සුවිශේෂ සන්ධිස්ථානයක් සටහන් කරන යුගයක් අලළා ලියවී ඇති කෘතියකි. උඩකැන්දවල සිරි සරණංකර හිමි ශ්‍රී ලංකාවේ වාම සන්නිවේදන, වාම ප්‍රචාරණයේ පමණක් නොව, මනුෂ්‍ය වර්ගයාගේ ඉතිහාසයේ ප්‍රථම වරට බිහි වූ කොමියුනිස්ට්වාදී සමාජය ශ්‍රී ලාංකේය ජනතාවට හඳුන්වාදීමට සහ ඒ පිළිබඳ අධ්‍යාපනයක් ඇති කිරීමට සුවිශාල ප්‍රයත්නයක් දැරූ වාමවාදී ක්‍රියාකාරිකයෙකි. විශේෂයෙන් මාක්ස්වාදයේ, ලෙනින්වාදයේ, ස්ටැලින්වාදයේ සංකීර්ණ අදහස් ඉතා සරල ව සහ පැහැදිලි ව පොදු ශ්‍රී ලාංකේය මහජනතාවට අවබෝධ කරදීම සඳහා 1940 දශකය ආරම්භයේ සිට 'නවලෝකය' නම් සඟරාව ආරම්භ කොට දශක ගණනාවක් එහි සංස්කාරකවරයා ලෙස සහ වාම මාධ්‍යවේදියකු ලෙස කටයුතු කරමින් ශ්‍රී ලාංකේය ජනවිඥානය සහ සංහතික විඥානය සමාජවාදී දෘෂ්ටියක් ඔස්සේ හැඩගැස්වීම සඳහා මහඟු කාර්යභාරයක් ඉටු කර ඇති බව අවධාරණය කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ පමණක් නොව අපේ කලාපයේ සමාජවාදී සහ ජාතික විමුක්ති ව්‍යාපාරය වෙනුවෙන් උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ දයකත්වය සැපයෙන්නේ 1930 දශකයේ සිට බව පෙන්වාදිය යුතු ය. එය ශ්‍රී ලංකාවේ සංවිධානාත්මක ව වාමාංශික ව්‍යාපාරය සහ වාමාංශික දේශපාලන පක්ෂ ඇති

වීමට පෙර සිට බව සිහිපත් කළ යුතු ය. 1934 දී ඉන්දියාවේ බරණැස් නගරයේ විසූ සරණංකර හිමියෝ එකල ලංකාවේ පළ වූ 'ස්වදේශ මිත්‍රයා' පුවත්පත මඟින් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් හැකි තරම් ඉක්මනට ලංකාවේ ලාංකික කොමියුනිස්ට් පක්ෂයක් ඇති කර ඒ පක්ෂය යටතේ ලංකාවේ ආණ්ඩුක්‍රම බලය ඇල්ලීමට උත්සාහ කළ යුතු බව පෙන්වා දුන්හ (ලයනල්, 2000).

සරණංකර හිමි භූමිකාවේ ඓතිහාසික වැදගත්කම දැකිය හැක්කේ 20 වැනි සියවසේ දෙවැනි සහ තුන් වැනි දශකවල දී න්‍යායික සහ දෘෂ්ටිවාදී තලයට සීමා වී තිබූ මාක්ස්වාදය, කොමියුනිස්ට්වාදය 1917 රුසියානු විප්ලවයෙන් පසු ව ප්‍රායෝගික සහ සැබෑ ජීවන ක්‍රියාවලියක් බවට පත්වීමත් එහි ආදර්ශය සහ ආභාසය ලබමින් ලොව පුරා යටත් විජිතවල ජනතාවන් අතර සිය ජාතික නිදහස, ස්වෛරීත්වය, ජාතික විමුක්තිය පිළිබඳ අරගලය උත්සන්න වීමත්, ක්‍රමානුකූල ව මානව සමාජ සංවිධානයේ සහ පරිණාමයේ සාධාරණ සහ මානවවාදී සමාජයක් ලෙස සමාජවාදී සමාජය දැකීමත් හේතු කොට ගෙන ලෝක අධිරාජ්‍යවාදයේ යටත් විජිත පද්ධතිය අර්බුදයකට ලක්වීම නිසා ලෝක අධිරාජ්‍යවාදීන් ඇතුළු දේශීය අධිරාජ්‍යවාදීන්ගේ දැඩි ප්‍රහාරය සෝවියට් දේශයටත්, සමාජවාදයටත්, ලෝක සාමයටත් එල්ල වීම ඔස්සේ ය. අධිරාජ්‍යවාදීන්ගේ එම ප්‍රහාරය ආර්ථික, දේශපාලන, සංස්කෘතික, දෘෂ්ටිවාදී, සාහිත්‍ය - කලා ආදි පෙරමුණු රාශියක් ඔස්සේ පැතිර යන්නට විය. එහි දී සරණංකර හිමියෝ දේශීය සහ ලෝක අධිරාජ්‍යවාදී බලවේග විසින් ගෙන යන ලද සෝවියට් විරෝධී, සමාජවාදී විරෝධී, මාක්ස්වාදී විරෝධී, දෘෂ්ටිවාදී සහ ප්‍රචාරක ව්‍යාපාරයට එරෙහි ව ප්‍රබල සහ ඉතා ඵලදායික මෙහෙයුමක්, ව්‍යාපාරයක් සිය 'නවලෝකය' මඟින් ආරම්භ කරමින් දශක ගණනාවක් තිස්සේ ගෙන ගියහ.

එසේ ම ලොව පුරා අධිරාජ්‍යවාදී ධනේශ්වර බලවේග කොමියුනිස්ට්වාදී, සමාජවාදී විරෝධී අරගලයේ දී තවත් ප්‍රබල සාධකයක් ලෙස ආගම භාවිත කළ බව පෙනේ. ආගම, ජාතිවාදය සහ රාජ්‍ය බලය අතර පවතින සම්බන්ධතාව මෙන් ම ආගම සහ ජනවිඥානය අතර ද ආගම සහ රාජ්‍ය අතර ද පවතින සාම්ප්‍රදායික



සහ ඓතිහාසික සම්බන්ධතා පදනම් කොටගෙන අධිරාජ්‍යවාදීහු සහ දේශය අධිරාජ්‍ය ගැති බලවේග මාක්ස්වාදී සහ සමාජවාදී විරෝධී අරගලයේ දී ආගම ප්‍රබල දෘෂ්ටිවාදී අවියක් ලෙස යොදා ගත් හ. ඊට එරෙහි ව සටන් කිරීමේ අභියෝගය ශ්‍රී ලාංකේය සමාජවාදී මාක්ස්වාදී ව්‍යාපාරය සහ දෘෂ්ටිවාදය මුහුණ දුන් දුෂ්කර අභියෝගයකි. එය සාර්ථක ව ජය ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රගතිශීලී ස්වාමීන් වහන්සේලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ. උඩකැන්දවල සිරි සරණංකර හිමි, බටපොල අනෝමදස්සී හිමි, රාහුල සංකෘත්‍යායන හිමි සහ බළන්ගොඩ ආනන්ද මෛත්‍රී හිමිවරුන් එහි දී සුවිශාල භූමිකාවක් ඉටු කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කොමියුනිස්ට්වාදය ආගම් විරෝධී වූත්, ආගම විනාශ කරන්නා වූත්, මනුෂ්‍ය ඝාතන කරන්නා වූත් ව්‍යාපාරයක් බවට කොමියුනිස්ට්වාදී විරෝධීන් විසින් තහවුරු කරනු ලැබ තිබූ මතය වෙනස් වන්නට විය. මේ අනුව මේ කාලය වන විට අධිරාජ්‍යවාදී ධනේශ්වර බලවේගත්, කොමියුනිස්ට්වාදී ප්‍රගතිශීලී බලවේගත් අතර දෘෂ්ටිවාදී අරගලය උත්සන්න වෙමින් පැවැති පසුබිමෙහි ලා එක් අතකින් දිනමිණ, ඩේලිනිව්ස්, ටයිම්ස් ආදි ධනේශ්වර මාධ්‍යය ද අනික් අතින් 'නවලෝකය', 'සමසමාජය', 'ජනශක්ති', 'නවශක්තිය', 'කොමියුනිස්ට්', 'මව්බිම' ආදි පුවත්පත් වාර ප්‍රකාශන ද එකල සමාජයෙහි දෘෂ්ටිවාදී අරගලයේ මූලික ගමන් මඟ තීරණය කළ බව පෙන්වා දිය යුතු ය.

ලෝක සංහතික මාධ්‍යවේදය මඟින් මෙම ද්වි ප්‍රවාහය නූතන යුගය ආරම්භයේ සිට නිරීක්ෂණය වේ. වාමාංශික සංහතික මාධ්‍යවේදය ලෝක සංහතික මාධ්‍යවේදයේ ප්‍රධාන ප්‍රභේදයක් ලෙස බිහි වී වර්ධනය වීම දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන බව පෙනේ. යුරෝපීය ධනේශ්වර පන්තිය සමාජ පන්තියක් ලෙස මානව සමාජ පරිණාමයෙහි කරළියට ප්‍රවිෂ්ට වීම සහ ඊට සමගාමී ව ධනේශ්වර සමාජ ස්ථාපනය වීමත් සමඟ වාමාංශික සංහතික මාධ්‍යවේදය ප්‍රභේදයක් ලෙස වර්ධනය වීම ආරම්භ වන්නේ ප්‍රාග් මාක්ස්වාදී සංහතික මාධ්‍ය ක්‍රියාකාරිත්වයේ ද ඍජු බලපෑම යටතේ ය. විශේෂයෙන් 17-18 සහ 19 වැනි සියවසේ ආරම්භයේ දී යුරෝපීය රටවල බිහි වූ සමාජ-දේශපාලන විචාරක (සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථ ලේඛනවේදය) සංහතික මාධ්‍යවේදී

ක්‍රියාකාරකම් සහ එහි සම්ප්‍රදයයන් අනාගත කොමියුනිස්ට්වාදී සංහතික මාධ්‍යවේද ප්‍රභේදය හැඩගැසීමෙහි ලා සැලකිය යුතු පදනමක් මෙන් ම බලපෑමක් ද කළ බව අවධාරණය කළ යුතු ය. ගොට්කෝල්ඩ් ලිසින්ග්, කාල් ගුට්ස්කව්, ලුද්විග් බෝර්නේ, ලෙමෙනාසිස් ගයෝතේ, ජේන් පාවුල්, හේන්රිච්හයින්, බවර්බ්‍රෑනෝ, එෆ්. කොප්පේන්, මේයින් රූටන්බර්ග්, විල්හෙල්ම් වෙයිට්ලිං ආදීහු ජර්මනිය තුළ ද, දෙමුලෙන් ඉස්තාලෝ, මරාත් ප්‍රංශය තුළ ද විලියම් කෝබේට්, තෝමස් කාර්ලයින්, ජොර්ජ් ජූලියන්, හෙන්රි ඒරියෙස්ට් ජෝන්ස් ආදීහු බ්‍රිතාන්‍ය තුළ ද අනාගත කොමියුනිස්ට්වාදී සංහතික මාධ්‍යවේද ප්‍රභේදයේ මූලික මූලධර්ම හැඩගැසීමෙහි ලා සුවිශාල භූමිකාවක් ඉටු කළ අය වෙති (විරසිංහ, 2014).

ඓතිහාසික ව බලන විට වාමාංශික සංහතික මාධ්‍යවේදී ප්‍රභේදය ස්වාධීන ව වර්ධනය වීමට පෙර ඒවා ධනේශ්වර - ලිබරල්වාදී සංහතික මාධ්‍ය ප්‍රකාශන, පුවත්පත්, සඟරා ආදි වාර ප්‍රකාශන තුළ වර්ධනය වූ බව පෙන්වාදිය යුතු ය. සැබැවින් ම වාමාංශික ව්‍යාපාරයේ ප්‍රභවය ලෙස 1840 ගණන්වල යුරෝපා පන්ති ව්‍යාපාරය සැලකීමේ දී ඒවා තමන්ගේ ස්වාධීන පුවත්පත් පවත්වාගෙන ගිය බවක් පැහැදිලි නැත (ගුණසේකර, 2008). එසේ ම ඓතිහාසික ව බලන විට දක්ෂිණාංශික සහ වාමාංශික භේදනය සමාජ දේශපාලන සහ දෘෂ්ටිවාදී ක්‍රියාවලිය තුළ ඇති වන්නේ ප්‍රංශ විප්ලවයේ (1789 - 1799) ප්‍රංශ පාර්ලිමේන්තුව තුළ විවිධ දේශපාලන බලවේග නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වාඩි වී සිටි ආකාරය පදනම් කරගෙන ය. පාර්ලිමේන්තුවේ වම් පසට වන්නට පවතින ක්‍රමය වෙනස් කළ යුතු ය යන රැඩිකල් ස්ථාවරය නියෝජනය කරන ලද අය ද දකුණු පසට වන්නට ව්‍යවස්ථාපිත රාජාණ්ඩුව ක්‍රමයට සහයෝගය දක්වන ලද අය ද මාධ්‍ය ආසනවල එහේට මෙහේට දෝලනය වන්නා වූ සමූහාණ්ඩුවාදීහු ද අසුන් ගෙන සිටියහ. ඒ අනුව මේ වන තෙක් පවතින සමාජ - දේශපාලන ක්‍රමයට එරෙහි ව, එය රැඩිකල් ලෙස වෙනස් කිරීමට ප්‍රයත්න දරන ප්‍රගතිශීලි, ප්‍රතිසංස්කරණවාදී සමාජ - දේශපාලන බලවේග වාමාංශික ලෙස හඳුන්වනු ලැබේ. 'වාමාංශික දේශපාලනය',



'වාමාංශික බලවේග', 'වාමාංශික දෘෂ්ටිවාදය', 'වාමාංශික ආණ්ඩුව', 'වාමාංශික පුවත්පත්', 'වාමාංශික සංහතික මාධ්‍යවේද' ආදි සංකල්ප රාශියක් ඉන් අනතුරු ව බිහි වන්නට විය.

මේ අනුව සංහතික මාධ්‍යවේදයේ ඓතිහාසික වර්ගීකරණය මඟින්, වාමාංශික සංහතික මාධ්‍යවේදය ධනවාදී සමාජ සන්දර්භයෙහි ලා වර්ධනය වූ සමාජ චින්තනයේ සහ සමාජ දේශපාලන ව්‍යාපාරවල කටයුතු කළ කණ්ඩායම් විසින් වර්ධනය කරනු ලබන පන්ති අරගලය තුළ ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා සහ ළැදියා නියෝජනය කිරීමත් සමඟ වාමාංශික මාධ්‍යවේදය බිහි වූ බව දැක්විය හැකි ය. 19 වැනි සියවස මැද දී සහ 19 වැනි සියවස අවසාන භාගයේ දී විශාල යුරෝපීය රටවල ධනේශ්වර - ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයෙන් වෙන් වූ සමාජවාදී (වාමාංශික) දෘෂ්ටිවාදය පාදක කැර ගත් ස්වාධීන මාධ්‍ය ප්‍රකාශන ආරම්භ වන්නට විය. මාක්ස් සංස්කරණය කළ, එංගල්ස් ඇතුළු තවත් සගයන්ගේ සහයෝගයෙන් පවත්වාගෙන ගිය 'නව රීන්ස්කී' පුවත්පත නිදර්ශනයක් ලෙස දැක්විය හැකි ය.

එසේ ම 19 වැනි සියවස අවසාන භාගයේ දී රුසියාවේ විප්ලවීය, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ වාර ප්‍රකාශන ඔස්සේ සමාජවාදී අදහස් ප්‍රකාශයට පත් විය. බොහෝ යුරෝපීය රටවල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස සමසමාජවාදී (වාමාංශිකවාදී) සංහතික මාධ්‍යයන් බිහි වූ බව පෙනේ. සමාජවාදී දෘෂ්ටිවාදය නිර්මාණය කිරීම සහ සමාජවාදය කරා යන මාවත නිර්ණය කිරීම පිළිබඳ ව විවිධ ප්‍රවණතා අතර සිදු වූ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස සමාජවාදී ව්‍යාපාරය සමාජ - ප්‍රජාතන්ත්‍රවාදී සහ කොමියුනිස්ට්වාදී ලෙස ද්වයයකට විභේදනය විය.

සමාජ - ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ මාධ්‍ය භාවිතයේ මූලික ප්‍රතිපත්තිය වූයේ ක්‍රමානුකූල ප්‍රතිසංස්කරණවාදී මාර්ග ඔස්සේ සමාජවාදී ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී රීතීන් ඔස්සේ මාධ්‍ය මෙහෙයවීම යි. විද්‍යා තාක්ෂණ විප්ලවයේ සමාජ ප්‍රතිවිපාක හේතු කොටගෙන සමාජ - ප්‍රජාතන්ත්‍රවාදයේ සමාජ පදනම හැකිළී ගිය අතර එම දෘෂ්ටිවාදයේ සහ

දේශපාලනයේ නවීකරණයන් කිරීමේ අවශ්‍යතාව මතු විය. කොමියුනිස්ට්වාදී ව්‍යාපාරය සහ ඊට සම්බන්ධ සංහතික මාධ්‍ය බොල්ෂෙවික්වාදී සම්ප්‍රදයයන් ඔස්සේ වර්ධනය වන්නට විය. මූලික වශයෙන් කොමියුනිස්ට්වාදී සංහතික මාධ්‍යවේදය නිර්පාක්ෂික සන්දර්භයක ක්‍රියාත්මක වෙමින් ඊට පෙර මානව ඉතිහාසයෙහි වූ සංහතික මාධ්‍යවේද ප්‍රභේදයන්ට වඩා වෙනස් වූ නව මාදිලියක සංහතික මාධ්‍ය භාවිතයක් බිහි කෙළේය. බටහිර සංහතික මාධ්‍ය න්‍යායාචාර්යවරුන් එය සෝවියට් කොමියුනිස්ට්වාදී සංහතික මාධ්‍ය න්‍යාය ලෙස හැඳින්වුව ද එහි ගැඹුරු වූ ද පළල් වූ අර්ථය ග්‍රහණය කැර ගැනීමට ඔවුන්ට නොහැකි විය. බොහෝ විට ඔවුන් එහි බාහිර පෘෂ්ඨීය ලක්ෂණ පමණක් ගෙන හැර දක්වා ඇත (Siebert Schramm, Peterson, 1956). සංහතික මාධ්‍යවේදය ඓතිහාසික කොමියුනිස්ට්වාදී සංහතික මාධ්‍යවේදයට වඩා යම් යම් සුවිශේෂතා ප්‍රකට කරන්නේය. එය මූලික වශයෙන් පුනරුද යුගයේ හැඩගස්වන ලද වියුක්ති - සදචාරික - ආචාරධාර්මික ස්ථාපනයන්ගේ සම්මිශ්‍රණයකි. වාමාංශික ධනේශ්වර විප්ලවවල ප්‍රතිඵලයක් වන අතර, කොමියුනිස්ට්වාදය නිර්ධන පාන්තික විප්ලවවල ප්‍රතිඵලයකි. විශේෂයෙන් වාමාංශික සංහතික මාධ්‍යවේදය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය සහ දේශපාලන නිදහස පුළුල් කිරීම ඉල්ලා සිටින අතර, කොමියුනිස්ට්වාදී සංහතික මාධ්‍යවේදය ඊට එරෙහි ව සූරාකෑමෙන් තොර වූ නිදහස සහ කොමියුනිස්ට්වාදී ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරන්නේය. කොමියුනිස්ට්වාදී සංහතික මාධ්‍යවේදය කොමියුනිස්ට්වාදී සමාජය තුළ ජීවත් වන පුද්ගලයන් කොමියුනිස්ට්වාදී දෘෂ්ටිවාදය මඟින් ශික්ෂණය කිරීම සඳහාත් සාමූහිකවාදීත් ප්‍රජාමූලකවාදී සමාජ සම්බන්ධතා ස්ථාපනය කිරීම සඳහාත් යොමු ව ක්‍රියාත්මක වේ. මේ දෘෂ්ටිකෝණයට අනුව උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ සංහතික මාධ්‍ය භාවිතය වාමාංශික සංහතික මාධ්‍ය භාවිතයක් වන අතර, එය මූලික වශයෙන් 'නවලෝක' සඟරාව මඟින් මනා ව ප්‍රකට වූ බව පෙනේ. 'නවලෝකය' ඇතුළු වාමාංශික සංහතික මාධ්‍යවේදය ලෝකයෙහි සිය ඓතිහාසික ගමනේ දී ඉතා ම අභියෝගාත්මක අවස්ථාවන්ට සහ සිද්ධීන්ට මුහුණ දෙමින් වාමාංශික මාධ්‍යවේදාත්මක ප්‍රභේදයේ සම්ප්‍රදය



ආරක්ෂා කරගෙන ඇති බව සඳහන් කළ යුතු ය. 'නවලෝකය' සඟරාව ද බිහි වන්නේ ලෝක ඉතිහාසයේ තීරණාත්මක වූ ද, අභියෝගාත්මක වූ ද සන්ධිස්ථානයක දී ය. 'නවලෝකය' ආරම්භ වන්නේ 1941 දී දෙවැනි ලෝක මහා සංග්‍රාමය ආරම්භ වීමත් සමඟ ය. දෙවැනි ලෝක මහා සංග්‍රාමය සහ ෆැසිස්ට්වාදය පිළිබඳ ව එකල ලාංකේය ධනේශ්වර මාධ්‍යයේ ස්ථාවරය සහ හැසිරීම සම්බන්ධ ව 'නවලෝකය' සිය 5 වැනි සංවත්සර කලාපයේ මෙසේ දක්වා තිබේ. ''මේ අවස්ථාව ලෝකයේ එක ම නිර්ධන පන්ති දේශය වූ සෝවියට් රුසියාවට හිට්ලර් පහර දුන් අවස්ථාවයි. අප රටේ ධනපති ප්‍රවෘත්ති පත්‍ර පිටු ගණන් සෝවියට් දේශයේ පසුබැසීම් ගැන ලියමින් තව සති කීපයකින් සෝවියට් දේශයත් යුරෝපයේ අනෙක් රටවල් මෙන් යටත් වන බවට අනාගත වැකි ප්‍රකාශ කළෝය.'' (නවලෝකය, 1946 ජනවාරි - පෙබරවාරි කලාපය) එහෙත් එද 1941 සැප්තැම්බර් කලාපය සෝවියට් රුසියාව පිළිබඳ ව 'නවලෝකය' සඟරාවේ ආකල්පය වූයේ කුමක් ද? ''තව ටික දිනකින් ජර්මනියත්, යුරෝපයේ ජර්මානුන් බලහත්කාරයෙන් යටත් කරගෙන සිටින සෑම රටකින් ම නැඟින විප්ලව ගින්නෙන් හිට්ලර් පමණක් නොව, ඔහුගේ සුවච කීකරු මුසලිනී නැමැති මිනීමරුවාත් ෆැසිස්ට් තිරිසන් ධර්මයත්, පිලිස්සී විනාශ වී යන්නේය. සෝවියට් රුසියාවටත් ලෝක සෝෂලිස්ට් ව්‍යාපාරයටත් මේ යුද්ධයෙන් ඒකාන්තයෙන් ම ජය අත්වන්නේය. (නවලෝකය - 1941 සැප්තැම්බර් කලාපය). සමාජ - දේශපාලන ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ සම්භාව්‍ය වාමාංශික මාධ්‍යවේදය සතු වූ විෂය මූලිකත්වය, විද්‍යාත්මක භාවය සහ අපෝහකාත්මක ක්‍රමවේදී ප්‍රවේශය 'නවලෝකය' ඉතා මැනවින් ප්‍රකට කරමින් ඊට සමකාලීන ධනේශ්වර හෝ දක්ෂිණාංශික හෝ මාධ්‍යවේදයට පමණක් නොව, සමහර වාමාංශික මාධ්‍යවේදයටත් වඩා ඉදිරියෙන් සිට ඉතා නිවැරදි ආකාරයට තත්ත්වයන් වාර්තා කළා පමණක් නොව, ඒවායේ අනාගත වර්ධනයන් පවා නිශ්චිත ව සහ නිවැරදි ව ප්‍රකාශ කළ බව අවධාරණය කළ යුතු ය.

මෙම වාමාංශික මාධ්‍යවේද ප්‍රභේදයේ 'නවලෝකවාදී' මාධ්‍ය භාවිත ප්‍රවේශයේ විශේෂත්වයට එහි ප්‍රධාන සංස්කාරක භූමිකාව දැරූ උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ පුළුල්

දර්ශනික සහ ක්‍රමවේදී එළඹුම තීරණාත්මක සාධකයක් වූ බව අපගේ අදහසයි. විශේෂයෙන් බෞද්ධ දර්ශනික සහ මාක්ස්වාදී දර්ශනික ඥාන ධාරාවන් ගෙන් ලද ශික්ෂණයත්, අපෝහාත්මක ක්‍රමවේදයේ භාවිත පරිචයත්, එසේ ම අධිරාජ්‍ය විරෝධී, යටත් විජිත විරෝධී ජාතික විමුක්ති ව්‍යාපාරයේ සක්‍රිය සටන් සගයකු ලෙස ක්‍රියා කිරීමත් ආදි සාධක සහ කොන්දේසි සංස්කාරකවරයාගේ ලෝක දෘෂ්ටිවාදය හැඩගැසීම කෙරෙහි පාදක වී ඇත. ඒ නිසා ම 'නවලෝකය' වාමාංශික සංහතික සන්නිවේදනයේ සහ මාධ්‍යවේදයේ ඉහළ ම ලක්ෂ්‍යය නියෝජනය කිරීමට සමත් වූ බව පැහැදිලි ය.

වර්තමාන ගෝලීය මෙන් ම ජාතික වාමාංශික සංහතික මාධ්‍යවේදය සිය ඓතිහාසික පරිණාමයෙහි මුහුණ දුන් තීරණාත්මක ම අර්බුදයකට පමණක් නොව බිඳ වැටීමකට ලක් වී ඇති අතර, අද්‍යතන බොහෝ වාමාංශික හෝ කොමියුනිස්ට්වාදී හෝ සංහතික මාධ්‍යයන් ලිබරල්කරණයට ලක් වී ඇති සන්දර්භයක දී 'නවලෝකය' මාධ්‍ය භාවිතයේ වර්තමාන වැදගත්කම සහ වටිනාකම අතිශයින් ඉහළ බව අවධාරණය කළ යුතු ය.

ඇත්ත වශයෙන් ම 'නවලෝකය' සිය මාධ්‍ය භාවිතය තුළ යුගකාරක අරගලයක් ගෙන ගියා පමණක් නොව, අනාගත මානව සමාජ පරිණාමය පිළිබඳ අලුත් පරිණාමීය සමාජ ප්‍රවණතාවක දෘෂ්ටිවාදය ශ්‍රී ලාංකේය ජනතාවට දයාද කිරීමට අද්විතීය යුග මෙහෙවරක නියැළුණේය.

'නවලෝකය' සඟරාව ශ්‍රී ලංකාවේ වාමාංශික සංහතික සන්නිවේදනයේ පුරෝගාමී මෙහෙවරක් ඉටු කරමින් එහි ක්‍රියාකාරිත්වය පුළුල් සමාජ, දේශපාලන, ආර්ථික, සංස්කෘතික, ජාතික හා අන්තර්ජාතික විෂය පරාසයක් ආවරණය කෙළේය. ලෝක සාමය සහ සහජීවනය සඳහා සමාජවාදී දර්ශනයේ වැදගත්කම ඉදිරිපත් කිරීම, සැබෑ කොමියුනිස්ට්වාදී සමාජය නිරූපණය කිරීම සහ එය ප්‍රතිවාදීන්ගෙන් ආරක්ෂා කිරීම, ජාතික වාම දේශපාලන චින්තනය දියුණු කිරීම, ධනේශ්වර සහ අධිරාජ්‍ය විරෝධී අරගලය සඳහා වන දෘෂ්ටිවාදය නිර්මාණය



කිරීම, සෝවියට් කොමියුනිස්ට්වාදී විප්ලවය සහ ඉන් බිහි වූ කොමියුනිස්ට්වාදී සමාජය ආරක්ෂා කිරීම, ලෝක හා ජාතික තත්ත්වයන් සහ සංසිද්ධීන් වාමවාදී දෘෂ්ටි කෝණයකින් වාර්තා කිරීම, මානව සමාජ පරිණාමයේ අලුත් ප්‍රවණතාවක දෘෂ්ටිවාදය ප්‍රචාරය කිරීම, මාක්ස්-ලෙනින්වාදී දර්ශනවාදයේ ඉගැන්වීම් සහ අදහස් පිළිබඳ ප්‍රචාරය කිරීම හා ඒවා දේශීය සංස්කෘතියට සහ චින්තනයට අදළ ව ඉදිරිපත් කිරීමට ප්‍රයත්න දැරීම ආදිය ඊට ඇතුළත් විය.

ශ්‍රී ලංකාවේ වාමාංශික සංහතික සන්නිවේදනයේ හැඩ තල තීරණය කිරීමෙහි ලා ''නවලෝකය'' සිය භූමිකාව ඉටු කරමින් ඊට අවශ්‍ය පාරිභාෂික පද, යෙදුම් ආකෘති සහ ශෛලි පවා නිර්මාණය කෙළේය. මෙහි දී ඉතා වැදගත් වන්නේ වාමාංශික සංහතික මාධ්‍යවේදයේ වාර්තාකරණය, ප්‍රවෘත්තිකරණය පමණක් නොව, විශේෂයෙන් ම 'නවලෝකය' සඟරාවක් ලෙස සමාජ - දේශපාලන මාධ්‍ය විචාරය හෙවත් සමාජ - දේශපාලන ප්‍රකාශකාර්ථී ලේඛනවේදය යන ප්‍රකාශන ප්‍රභේද වාමාංශික සන්දර්භයක ලා වර්ධනය කිරීම කෙරෙහි සුවිශාල බලපෑමක් සිදු කිරීම ය.

මේ ඔබ අතට පත්වන කෘතියේ කතුවර වන චන්දන විජේකෝන් මෙම විෂයය පිළිබඳ ව ලිවීමට සුවිශේෂ සුදුසුකම් ඇත්තකු වන්නේ එක් අතකින් ඔහු ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය තුළ සක්‍රිය ක්‍රියාකාරිකයකු ලෙස මෙන් ම අනෙක් අතින් මාධ්‍යවේදියකු සහ මාධ්‍යවේදය ශාස්ත්‍රීය ව අධ්‍යයනය කරන්නකු ද වන නිසා ය.

මෙම කෘතිය ශ්‍රී ලාංකේය සංහතික මාධ්‍ය සන්නිවේදනයේ, විශේෂයෙන් වාමාංශික සංහතික සන්නිවේදනයේ සහ පොදුවේ දේශපාලන සන්නිවේදනයේ ඉතිහාසය සහ එහි සංකල්පීය පැතිකඩ අධ්‍යයනය කෙරෙහි උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන් සඳහා පමණක් නොව, ශ්‍රී ලාංකේය වාමාංශික දේශපාලනය සහ මාධ්‍ය පිළිබඳ උනන්දුවක් දක්වන පොදු පාඨකයාට ද වැදගත් වේ. ධනේශ්වර සංහතික මාධ්‍යවේදයේ සුවිශේෂීය සංහතික මාධ්‍ය ප්‍රභේදයක් ලෙස වර්තමානයේ වර්ධනය වෙමින් පවතින

බටහිරවාදී සංහතික මාධ්‍ය අවකාශය තුළ කොමියුනිස්ට්වාදී සහ ජාතිකවාදී යුගයට අයත් වූ බොහෝ සමාජ, ආර්ථික, දේශපාලන සාංග්‍රාමික, ඓතිහාසික සිද්ධි, ක්‍රියාවලි සහ තොරතුරු විකෘත කිරීමේ, ව්‍යාජකරණය කිරීමේ සැලසුම් සහගත ව්‍යාපාරයක් පශ්චාත් ප්‍රජාතාන්ත්‍රික සහ පශ්චාත් කොමියුනිස්ට්වාදී මාධ්‍ය මඟින් ගෙන යන සන්දර්භයෙහි ලා වාමාංශික කොමියුනිට්ස්වාදී සංහතික සන්නිවේදනයේ සහ මාධ්‍ය පිළිබඳ කෘතිවල සුවිශාල කාලීන හා ජාතික වැදගත්කමක් ද පවතින බව පෙන්වාදිය යුතු ය. චන්දන විජේකෝන්ගේ මේ කෘතිය ඊට ද දක්වන ලද කාලීන ප්‍රතිචාරයක් ලෙස අපි දකිමු.

ආචාර්ය ටියුඩර් වීරසිංහ
ශ්‍රීපාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය

පාදක සටහන්

1. ලයනල්, සරත් (2000) 'ලංකාවේ වාමාංශික ජනසන්නිවේදනය' - (මුල් යුගය), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදන
2. වීරසිංහ, ටියුඩර් (2014) 'මාක්ස්වාදී සහ නව මාක්ස්වාදී සංහතික මාධ්‍ය න්‍යාය', සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ
3. ගුණසේකර, චන්දිම (2008) 'නව සම සමාජ පක්ෂයේ පුවත්පත් ඉතිහාසය' - ප්‍රකාශනය SPREOD MEDIA නුගේගොඩ
4. Freds Sieert, Wilbur Schromm, Theodore Peterson (1956)Four Theories of the Press, University of Illinois, Carbondale, USA
5. 'නවලෝකය' (1946) ජනවාරි - පෙබරවාරි සාංවත්සරික කලාපය
6. 'නවලෝකය' (1941) සැප්තැම්බර් කලාපය

## හැඳින්වීම

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය මෙහෙයවන ජනමාධ්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ අවසාන පරීක්ෂණය සඳහා මා ඉදිරිපත් කළ 'ශ්‍රී ලංකාවේ වාමාංශික දේශපාලන සන්නිවේදනයේ උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ භූමිකාව' - 'නවලෝකය සඟරාව ඇසුරෙන් විමසුමක්' නමැති විස්තෘත රචනය හෙවත් ස්වාධීන පර්යේෂණ නිබන්ධනය සංශෝධන සහිත ව ශාස්ත්‍රීය කෘතියක් ලෙස මුද්‍රණය කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

එ බැවින් සංශෝධනය කරන ලද මේ නිබන්ධනය 'නවලෝකය' - 'වාම සන්නිවේදනයේ පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි භූමිකාව', ලෙස මුද්‍රණය කැර ප්‍රකාශයට පත් කිරීමට ලැබීම මගේ දේශපාලන හා මාධ්‍ය ජීවිතයේ ජයග්‍රහණයක් ලෙස සලකමි.

උඩකැන්දවල සිරි සරණංකර හිමියෝ වූකලි හුදෙක් අප රටේ නිදහස හා විමුක්තිය වෙනුවෙන් සටන් කළ පැවිදි නායකයෙක් ම නොවෙති. උන්වහන්සේ, පොදුවේ අධිරාජ්‍යවාදයට, යටත් විජිතවාදයට, ධනපති ක්‍රමයට, සූරාකෑමට මේ සියලු බලවේගවලට දැඩි සේ විරුද්ධ ව සටන් කළ සංඝ පිතෘවරයෙකි. කෙටියෙන් කියතහොත් ස්වරාජ්‍යයක් වෙනුවෙන් සටන් කිරීම උන්වහන්සේගේ මුඛ්‍ය පරමාර්ථය විය. ධර්මපාලතුමාගේ ගෝලයකු ලෙස සාමණේර අවදියේ ම ඉන්දියාවේ ශාන්ති නිකේතනයට ගොස් අධ්‍යාපනය හදාරන උන්වහන්සේ, පසු කලක ධර්මපාලතුමා ද අත්හැර දමා මහත්මා ගාන්ධි, ජවහර්ලාල් නේරු, රවීන්ද්‍රනාත් තාගෝර්, සුභාෂ් චන්ද්‍රබෝස් සහ ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ ආරම්භක නායකයන් සමඟ එකතු වී අධිරාජ්‍ය විරෝධී සටන පණ පෙවීම සඳහා පෙරමුණ ගත්හ. එහි ප්‍රතිඵලයක් හැටියට උන්වහන්සේ කල්කටාවේ ඉතා පැරණි හිරගෙදරක් වූ 'ප්‍රෙසිඩැන්සි' බන්ධනාගාරයේ සිර කොට තැබීමට ඉන්දියාවේ සිටි බ්‍රිතාන්‍ය පාලකයෝ කටයුතු කළ හ. වසර

27630

කීපයක් සිරගත ව සිටි සරණංකර හිමියන් ඉන් නිදහස් ව වැඩි කලක් යෑමට පෙර 1936 අප්රේල් අවසාන භාගයේ ලංකාවට පිටුවහල් කිරීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව කටයුතු කෙළේය.

ලංකාවට පැමිණි සරණංකර හිමියෝ නිහඬ ව කාලය ගත නොකළ අතර නැවතත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට එරෙහි ව සටන් කිරීමට පටන් ගත්හ. ''බ්‍රිතාන්‍ය මහරජුට අපහාස කිරීම සහ යටත් වැසියන් නොමඟ යැවීම'' පිළිබඳ චෝදනාව යටතේ 1942 ජූනි 30 වැනි ද සරණංකර හිමියන් නැවතත් වසර දෙකක සිරදඬුවමකට යටත් කිරීමට යටත් විජිත පාලකයෝ කටයුතු කළහ. සරණංකර හිමියන් ජනතාව ඉදිරියේ අවලංගු කිරීම පිණිස ඉංග්‍රීසි ආණ්ඩුව මේ අන්දමින් අනුගමනය කළ පියවර කිසිවක් සාර්ථක නොවූ අතර, ඒවා නිෂේධ වී උන්වහන්සේ ජනතා ආදරය හා ගෞරවය ලබන සංඝ පිතෘවරයකු බවට පත් වූහ.

සරණංකර හිමියන් ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ ආරම්භක නායකයන් සමඟ ඉදිරියට ගමන් කළ නිසා බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතර සිටි අධිරාජ්‍ය විරෝධී බොහෝ පිරිස් නැඟී සිටින්නටත්, බෞද්ධ ජනතාව අධිරාජ්‍ය විරෝධී සටනේ බහුතරය බවට පත්වීමටත් පටන් ගත්හ. එහෙත් භාරතීය නිදහස් සටන මෙන් ශ්‍රී ලංකාවේ නිදහස් සටන් ව්‍යාපාරය කැපී පෙනෙන කාර්යයක් ඉටු නොකළ ව්‍යාපාරයක් විය. විශේෂයෙන් භාරතීය නිදහස් සටන් ව්‍යාපාරයේ සිටි ප්‍රධාන බලවේගවලට සමාන බලවේග කිසිවක් ලාංකේය නිදහස් සටනේ කොටස්කරුවන් නොවීම බරපතළ ඛේදවාචකයක් විය. නිදසුනක් ලෙස භාරතීය නිදහස් සටනේ පෙරමුණේ සිටි ලේඛකයන් හා කලාකරුවන් මෙන් ම විවිධ කුලවලට අයත් ජනයා මෙන් ලාංකේය නිදහස් සටනේ ප්‍රධාන බලවේගයක් නොවීමේ පාඩුව මනා ලෙස තේරුම් ගත් සරණංකර හිමියෝ 30 දශකයේ අවසානයේ සිට අධිරාජ්‍ය විරෝධී සාහිත්‍යයක් මෙරට ගොඩනැඟීමේ ක්‍රියාවලියේ පෙරමුණ ගත්හ.

ඒ අනුව 40 දශකයේ මුල් කාලයේ 'නවලෝකය' නමින් සඟරාවක් ආරම්භ කළ සරණංකර හිමියෝ, ශ්‍රී ලංකාව පුරා විසිරී සිටි කලාකරුවන්ට, ලේඛකයන්ට හා පොදුවේ ප්‍රගතිශීලි



බලවේගවලට අධිරාජ්‍ය විරෝධී දෘෂ්ටිය සපයන වේදිකාවක් බවට එම ('නවලෝකය') සඟරාව පත් කළහ. මේ නිසා 'නවලෝකය' ඇසුරෙන් අලුත් ලේඛක පරපුරක් ද, ප්‍රබුද්ධ පාඨක සමූහයක් ද ගොඩනැඟුණේය. එසේ ම ප්‍රගතිශීලි සාහිත්‍යයක් ද උපත ලැබුවේය. රටේ බුද්ධිමතුන් අතර ප්‍රගතිශීලී අදහස් මතු ව ආ අතර අධිරාජ්‍ය විරෝධී හැඟීම් ද උත්සන්න වූයේය. මේ නිසා ශ්‍රී ලංකාවේ වාම සන්නිවේදනය පෝෂණය කිරීමට ඔවුන් කළ යුග මෙහෙවර අඩුවෙන් තක්සේරු කිරීමට ද නොහැකි ය.

එ බැවින් මේ ශාස්ත්‍රීය කෘතිය වන 'නවලෝකය' - 'වාම සන්නිවේදනයේ පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි භූමිකාව' සම්පාදනය කිරීමේ දී පැරණි තොරතුරු හා මූලාශ්‍ර සොයමින් ඒවා පරිශීලනය කරමින් කෘතියේ අන්තර්ගතය පෝෂණය කිරීමට මට හැකි විය. එහෙත් ජීව දත්ත හා සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් ලෙස නොතිබීම කැපී පෙනෙන සිද්ධියකි. විශේෂයෙන් උඩකැන්දවල සිරි සරණංකර හිමියන් සමඟ වැඩ කළ සමකාලීන දේශපාලන සගයන් හෝ ලේඛකයන් හෝ මේ වන විට ජීවතුන් අතර නොසිටීම මේ කෘතිය සම්පාදනය කිරීමේ දී මට යම් ගැටලුවක් විය. එහෙත් ඉහතින් සඳහන් කළ අන්දමට ඓතිහාසික මූලාශ්‍ර කේන්ද්‍ර කැර ගනිමින් මේ කෘතිය ලියා අවසන් කිරීමට ලැබීම මා ලැබූ ජයග්‍රහණයකි.

කෙසේ නමුත් එද අධිරාජ්‍යවාදය පරාජය කිරීම වාම දේශපාලනයේ මූලික අරමුණ වූ නිසා, ජනතාව දිනපතා දැනුම්වත් කිරීමේ අවශ්‍යතාව පැන නැඟිණි. මේ සඳහා ක්‍රමවත් සන්නිවේදන ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමේ අවශ්‍යතාව දැඩි ලෙස පැන නැඟිණි. විශේෂයෙන් එද අධිරාජ්‍ය විරෝධී අරගලයේ සිටි වාමාංශිකයෝ (මාක්ස්වාදීහු) ඒ සඳහා විවිධාකාරයෙන් ක්‍රියාත්මක වූහ. ඒ වන විට ප්‍රධාන ජන සන්නිවේදන ක්‍රමයක් වූ පුවත්පත, අත්පත්‍රිකා ආදී ප්‍රකාශන මුද්‍රණය කිරීමට, සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් යුත් පෝස්ටර්, බැනර් ආදිය අතින් ලියා පළ කිරීමට අතිරේක ව තවත් අනියම් සන්නිවේදන පියවර රාශියක් අනුගමනය කැර ඇත. රැස්වීම්, පෙළපාලි, වැඩවර්ජන, උද්ඝෝෂණ, මහාමාර්ගවල සටන් පාඨ ලිවීම ඒ අතර ප්‍රධාන විය. මේ සැම සන්නිවේදන ක්‍රියාවලියකට ම නායකත්වය

දෙමින් මඟ පෙන්වූවෝ වමේ ව්‍යාපාරයේ ආරම්භක වෘත්තීය සමිති නායකයෝ සහ වාම තරුණ කොටස් ය. ඔවුහු ඍජු ලෙස ම අධිරාජ්‍ය විරෝධීන් වූ අතර, අන්තර්ජාතික කොමියුනිස්ට් ව්‍යාපාරය හා කම්කරු පන්තිය පිළිබඳ ව මනා අවබෝධයකින්, අත්දැකීම් සම්භාරයකින් සන්නද්ධ ව සිටි අය වූහ.

සමාජවාදය පිළිබඳ ව දැඩි විශ්වාසයකින් කටයුතු කළ මේ වාමවාදී නායකයන්ට, මාක්ස්වාදය, ලෙනින්වාදය පිළිබඳ ව මනා පරිචයක් තිබිණි. එම පරිචය ප්‍රයෝජනයට ගනිමින් ඔවුහු පුවත්පත් සඟරා සති පතා හා මාස් පතා ද ඇතැම් විට කඩින් කඩ ද ප්‍රකාශයට පත් කිරීමට කැප වූහ. ඒ සඳහා යන වියදම් කම්කරුවන් හා කම්කරු සමිති විසින් සොයා දෙනු ලැබී ය. එසේ ම මේ ප්‍රකාශනවලින් සමාජවාදී අදහස් සමාජගත කිරීමට ඔවුහු උත්සාහ කළහ. එහෙත් මේ අදහස් ක්‍රමවත් ව නොකඩවා ඉදිරියට ගෙන යෑමට ශක්තිමත් යාන්ත්‍රණයක් නොතිබිණි. ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සමාජ, ආර්ථික, දේශපාලන ප්‍රවාහයෙන් මතු ව ආ අභියෝග යි. එසේ ම සන්නිවේදන සැලැස්මක් හා එය සංවිධානය කිරීමට හැකි පිරිසක් වාම ව්‍යාපාරය වටා රොක් වී නොසිටීම ප්‍රධාන කරුණක් විය. විශේෂයෙන් වාම ව්‍යාපාරය හා සම්බන්ධතා පැවැත්වූ කම්කරුවන් බහුතරයක් කොළඹ නගරය කේන්ද්‍ර කැර ගනිමින් ජීවත් වුව ද, ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම (ලිවීමට හා කියවීමට හැකියාව) සැලකිය යුතු තත්ත්වයක පැවතියේ නැත. මේ නිසා, මේ වකවානුවේ ප්‍රකාශයට පත් වූ බොහෝ වාමවාදී පුවත්පත්වල ලේඛකයන් මෙන් ම කර්තෘවරුන් වූයේ වෘත්තීය සමිතිවලට සම්බන්ධ ව සිටි පූර්ණකාලීන වෘත්තීය සමිති නායකයන් වීම කැපී පෙනෙන්නට තිබූ ලක්ෂණයකි. මෙයට අමතර ව යටත් විජිත පාලකයන් කම්කරු පන්තිය වෙත නොකඩවා මුදාහැරිය මර්දනය නිසා, ක්‍රමවත් සන්නිවේදන සැලැස්මක් සමාජ ගත කිරීමට නොහැකි විය. විශේෂයෙන් වෘත්තීය සමිති නායකයන් හිරබාරයට ගැනීම, ඇතැම් වාමවාදී පුවත්පත් තහනම් කිරීම මේ අතර විය. මේ පසුබිම තුළ ජනතාව වාම දෘෂ්ටියෙන් සන්නද්ධ කිරීමත්, අධිරාජ්‍ය ගැති ධනපති පන්තියෙන් එල්ල වන මතවාදී ප්‍රහාරයන් පරාජය කිරීමත් ඒ තරම් පහසු වූයේ නැත.



උඩකැන්දවල සිරි සරණංකර හිමියන් 'නවලෝකය' සඟරාව ආරම්භ කරමින් වාම සන්නිවේදනය පෝෂණය කෙළේ මෙවැනි සංකීර්ණ වූ සමාජ ආර්ථික දේශපාලන වටපිටාවක් තුළ වීම විශේෂත්වයකි.

එ බැවින් මේ අභියෝග ජය ගැනීම සඳහා සරණංකර හිමියන් 'නවලෝකය' සඟරාව ප්‍රයෝජනයට ගෙන කළ වාම සන්නිවේදන මෙහෙයුම පිළිබඳ න්‍යායාත්මක වත්, ප්‍රායෝගික වත් යම් විග්‍රහයක් කිරීමට මේ කෘතිය ඔස්සේ මා උත්සාහ ගත් බව කිව යුතු ය.

එ බැවින් මේ කෘතිය මූලික පරිච්ඡේද හයකට සීමා කැර ඇත. පළමු පරිච්ඡේදයෙන්, ශ්‍රී ලංකාවේ වාම දේශපාලනයේ ආරම්භය සහ විකාශනය පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් කැර ඇත. එහි මාතෘකා පහක් යටතේ, තව දුරටත් වාම දේශපාලනය හා එහි විකාශනය විග්‍රහ වෙයි. ශ්‍රී ලංකාවේ තරුණ සංගම් ව්‍යාපාරය, සූරියමල් ව්‍යාපාරය, මැලේරියා වසංගතය, ලංකා සමසමාජ පක්ෂයේ උපත සහ ඇම්.ඒ.එල්. බ්‍රෙස්ගර්ඩ්ල් සිද්ධිය පිළිබඳ පැහැදිලි කිරීම් මෙයට අයත් වෙයි.

දෙවැනි පරිච්ඡේදයෙන් පැහැදිලි කැර ඇත්තේ උඩකැන්දවල සිරි සරණංකර හිමි ලංකා සමසමාජ පක්ෂයට එක් වීම පිළිබඳ ව යි. ට්‍රොට්ස්කිවාදය වැලඳ ගැනීම සහ සමසමාජ පක්ෂයෙන් කොමියුනිස්ට්වාදීන් නෙරපීමත්, කොමියුනිස්ට් පක්ෂය පිහිටුවා ගැනීමත් පිළිබඳ ව යම් විග්‍රහයක් මෙම පරිච්ඡේදය යටතේ සාකච්ඡාවට ලක් වෙයි.

තුන් වැනි පරිච්ඡේදයෙන් සාකච්ඡාවට ලක් කැර ඇත්තේ ශ්‍රී ලංකාවේ වාමාංශික දේශපාලනයේ සන්නිවේදනය පිළිබඳ ව යි. වාමවාදී අදහස් සමාජගත කිරීමේ දී, මාක්ස්වාදීන් අනුගමනය කළ උපායයන් හා උපක්‍රම මේ පරිච්ඡේදය යටතේ යම් තරමක් දුරට විග්‍රහ කැර ඇත.

සිවු වැනි පරිච්ඡේදයෙන් සාකච්ඡාවට ලක් වන්නේ, පුවත්පත් හා සඟරා පිළිබඳ ව යි. මේ කෘතිය සම්පාදනය කිරීමේ දී මා හට පරිශීලනය කිරීමට හැකි වූ පැරණි වාමවාදී පුවත්පත්

හා සඟරා විසි එකක් පිළිබඳ ව කෙටි විග්‍රහයක් මේ පරිච්ඡේදය යටතේ සිදු කිරීමට මට හැකි විය. එහෙත් ඇතැම් පුවත්පත් පිළිබඳ ව මා කළ විග්‍රහ කෙටි ම නොවේ.

මේ කෘතියේ පස් වැනි පරිච්ඡේදය මා වෙන් කෙළේ නවලෝකය හා අන්තර්ජාතික දේශපාලන සන්නිවේදනය පිළිබඳ ව සාකච්ඡා කිරීමට ය. එම පරිච්ඡේදය යටතේ 'නවලෝකය' කතුවරයා වන උඩකැන්දවල සිරි සරණංකර හිමියන් විසින් සිය මාධ්‍ය භාවිතය අන්තර්ජාතික දේශපාලන සාධක හා වෙනස් වීම් සඳහා යොද ගනු ලැබුවේ කෙසේ ද යන්න දීර්ඝ වශයෙන් මා සාකච්ඡාවට ලක් කැර ඇත.

සවැනි පරිච්ඡේදයෙන් කෙටි සමාලෝචනයක් හා නිගමනයන් ඉදිරිපත් කැර ඇත. එය සාර්ථක සමාලෝචනයක් නොවුණත්, සන්නිවේදනය සමාජ ගතවීමේ දී බලපෑ කරුණු හා 'නවලෝකය' හමුවේ තිබූ දේශපාලන, ආර්ථික අභියෝග පිළිබඳ යම් පැහැදිලි කිරීමක් කිරීමට මා උත්සාහ කැර ඇති බව කිව යුතු ය.

එසේ ම මේ කෘතියට උපග්‍රන්ථය ඇතුළත් කැර ඇත. එම උපග්‍රන්ථයට උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ ජීවිතය හා සම්බන්ධ ඡායාරූප, උන්වහන්සේ විසින් ලියන ලද පෞද්ගලික ලිපි ආදිය ඇතුළත් වෙයි.

තව ද මා මේ කෘතිය සම්පාදනය කිරීමේ දී ප්‍රධාන වශයෙන් 'ප්‍රමුඛ පද' පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වූ බව කිව යුතු ය. ඒ මන්ද යත් ශ්‍රී ලංකාවේ වාම සන්නිවේදනය මූලික වශයෙන් මාක්ස්, ලෙනින්වාදී ස්ථාවරයක සිට සමාජ, ආර්ථික, දේශපාලන ප්‍රශ්න විග්‍රහ කිරීමට උත්සාහ කිරීම නිසා ය.

එ බැවින් මේ කෘතියේ විග්‍රහවල දී 'ධනවාදය, අධිරාජ්‍යවාදය, මාක්ස්වාදය, ලෙනින්වාදය, සමාජවාදය, පැසිස්ට්වාදය, පන්ති අරගලය, විප්ලවය, සූරාකෑම, දේශපාලන දෘෂ්ටිය, ප්‍රජාතන්ත්‍රවාදය, න්‍යාය, දෘෂ්ටිය, හීනභාවය, විඥනය, ක්‍රමෝපායයන්, උපාය හා උපක්‍රම, සන්නිවේදනය, වාමාංශික කම්කරු පන්තිය, රැඩිකල්වාදී, ජාතිවාදී, සමාජ ප්‍රතිසංස්කරණ' වැනි 'ප්‍රමුඛ පද' බහුල ව භාවිත කැර තිබීම විශේෂත්වයකි.



සන්නිවේදනය හා ජනමාධ්‍යය විෂයයක් ලෙසින් හදරන විද්‍යාර්ථීන්ට මෙන් ම, පුවත්පත් කලාවේදීන්ට හා දේශපාලනඥයන්ටත් සිය දැනුම වර්ධනය කැර ගැනීම සඳහා 'නවලෝකය' - 'වාම සන්නිවේදනයේ පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි භූමිකාව' නමැති මේ කෘතිය පිටුබලයක් වන බව මගේ විශ්වාසය යි. ඒ හැරුණු විට පොදුවේ සියලු පාඨකයන්ට මේ කෘතිය බෙහෙවින් ප්‍රයෝජනවත් වන බව ද සඳහන් කළ යුතු ව ඇත.

'දේශපාලන සන්නිවේදනය' මේ කෘතිය සඳහා මගේ විෂය රාමුව වෙයි. ඒ විෂය පසුබිම් සීමාවලින් ඔබ්බට ගොස් කෘතියේ එක් එක් පරිච්ඡේද පාදක කැර ගනිමින්, වඩාත් පුළුල් ලෙසින් පර්යේෂණ කෘතියක් යමකුට සම්පාදනය කළ හැකි බව මගේ වැටහීම යි. ඒ සඳහා මේ කෘතිය පාදක කැර ගෙන යම් පදනමක් ගොඩනැඟිය හැකි බව කිව යුතු ය.

චන්දන විජේකෝන්

# අනුමෝදනාව

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය මෙහෙය වූ ජනමාධ්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ අවසාන පරීක්ෂණය සඳහා මා ඉදිරිපත් කළ 'ශ්‍රී ලංකාවේ වාමාංශික දේශපාලන සන්නිවේදනයේ උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ භූමිකාව' ('නවලෝකය' ඇසුරෙන් විමසුමක්) නමැති විස්තෘත රචනය යම් සංස්කරණයකට ලක් කැර 'නවලෝකය' - 'වාම සන්නිවේදනයේ පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර භූමිකාව' නමින් ප්‍රකාශයට පත් කිරීමට ලැබීම ගැන සතුටු වෙමි.

පාසල් අවදියේ දී ම, උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ ස්වයං ලිඛිත චරිතාපදානය වන 'සටනක සටහන්' නමැති කෘතිය කියවීමට මට අවස්ථාවක් ලැබිණි. ඉන් මා උකහාගත් දැනුමත්, 1966 නොවැම්බර් මස 13 වැනි ද උන්වහන්සේ අපවත් වීමෙන් පසු පුවත්පත්, සඟරාවල පළ වූ ලිපිලේඛන පරිශීලනය කිරීමෙන් ලත් දැනුමත් මගේ ශාස්ත්‍රීය ඥානය තවත් පෝෂණය වීමට මග සැලසිය. ඊට අමතර ව සරණංකර හිමියන් වසර 25කට ආසන්න කාලයක් සංස්කරණය කළ 'නවලෝකය' සඟරාව පරිශීලනය කිරීමෙන් පසු වාම සන්නිවේදනයේ ඓතිහාසික මූලාශ්‍රයයන් ගැන ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගැනීමට මට හැකි විය.

එම ශාස්ත්‍රීය දැනුම ප්‍රයෝජනයට ගත් මා හට පශ්චාත් උපාධි අධ්‍යයනයේ දී දේශපාලන සන්නිවේදන විෂය ඒකකය පදනම් කැර ගනිමින් විස්තෘත රචනය ඉතා සාර්ථක ව ලියා අවසන් කිරීමට ලැබීම සතුට ගෙන දෙන කරුණකි. එහෙත් මෙය ලිවීමේ දී ප්‍රායෝගික ගැටලු රැසකට මට මුහුණ දීමට සිදු විය. විශේෂයෙන් සරණංකර හිමියන්ගේ ජීවන ගමනේ සමකාලීනයන් වැඩි පිරිසක් ජීවතුන් අතර නොසිටීමත්, සිටින කිප දෙනා ඉතා වයෝවෘද්ධ වීම නිසාත් ඇතැම් මූලාශ්‍ර සොයා යන ගමනේ දී යම් බාධක මතු විය.



කෙසේ නමුත් මේ විස්තෘත රචනය යම් සංස්කරණයකට ලක් කොට කෘතියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට ලැබීම උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ට කරන උපහාරයක් මෙන් ම, මා ලද යම් ජයග්‍රහණයක් ලෙස සලකමි. ඒ මන්ද යත්, උඩකැන්දවල සිරි සරණංකර හිමියන් අනුගමනය කළ දේශපාලන දෘෂ්ටිවාදයේ සන්නිවේදන භූමිකාව පිළිබඳ යම් තරමක් දුරට හෝ ශාස්ත්‍රීය විග්‍රහයක් කිරීමට ලැබීම වැදගත් කටයුත්තක් ලෙස මා සලකන නිසාය.

එ බැවින් මේ විස්තෘත රචනය ලිවීමේ දී විශ්වවිද්‍යාලයීය උපදේශකවරයා ලෙස කටයුතු කරමින් ඊට අදළ උපදෙස් මා හට ලබාදුන් කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතාට මුලින් ම මගේ ගෞරවය හා ස්තුතිය පුද කරමි. එසේ ම මේ විස්තෘත රචනය කෘතියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා විටින් විට මා ධෛර්යවත් කරමින් ඊට අදළ ව ශාස්ත්‍රීය පෙරවදනක් ලියාදුන් කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතාටත්, මගේ ගෞරවය පුද කරමි. එසේ ම මේ කෘතියට තවත් පෙරවදනක් ලියා දෙන ලෙස මා කළ ඉල්ලීම ඉතා ඔනෑකමින් භාර ගත් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ හිටපු ප්‍රධාන ලේකම් ඩිව් ගුණසේකර සහෝදරයාට ද මෙහි දී ස්තුතිය පුද කරමි.

තව ද මේ කෘතිය ලියමින් සිටින විට මතු වූ ශාස්ත්‍රීය හා පර්යේෂණ ගැටලු ක්‍රමානුකූල ව විසඳා ගැනීමට ප්‍රමාණවත් දැනුමක් මට ලබාදුන් කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහාචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්, කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ මහාචාර්ය සඳගෝමි කෝපරහේවා, දිනමිණ හිටපු කර්තෘ බන්දුපාල ගුරුගේ, ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ සභාපති නීතිඥ ආනන්ද ගුණතිලක මහත්වරුන්ට ද මගේ ස්තුතිය මෙහි දී පුද කරමි. එමෙන් ම මෙම විස්තෘත රචනයට අදළ වූ තොරතුරු හා මූලාශ්‍රය සොයා ගැනීමේ දී මට සහාය දැක්වූ රංජිත් විජේසිංහ, නීතිඥ නිහාල් හෙට්ටිආරච්චි, කවිපති ෆරීන් බූසෝ සහෝදරවරුන්ට ස්තුතිය පුද කරමි.

මගේ සෑම කෘතියක ම බස් වහර නිවැරදි කැර ගැනීමට උපදෙස් ලබාදෙන, කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථි මා හිතවත් ශ්‍රීනාත් ගණේවත්ත සොහොයුරාටත් අත් පිටපත් කියවා බලා සංස්කරණය විය යුතු තැන් නිවැරදි කැර දුන් 'දිනමිණ' පුවත්පතේ උප කර්තෘ උපුල් බණ්ඩාර, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ජයත් ප්‍රියදසුන් සොහොයුරන්ටත් ස්තුති කිරීම මගේ යුතුකමකි. එමෙන් ම, මගේ අත්පිටපත් සෑම ද මෙන් ම මෙවරත්, පරිගණක අක්ෂරකරණය කැර දුන් සඳමාලි නංගීටත් මගේ ස්තුතිය පුද කරමි.

මෙම කෘතියේ ප්‍රකාශන කටයුතු භාරගෙන එය මැනවින් කැර දුන් දයාවංශ ජයකොඩි මහතාට සහ එම සමාගමේ කාර්ය මණ්ඩලයටත්, කෘතියේ පිටු නිර්මාණය සඳහා දයක වූ වී.එච්.ඩී. කමලවංශ මහතාටත්, කෘතියට ගැළපෙන අයුරින් පිටකවරයක් නිර්මාණය කැර දුන් ලේක්හවුස් ආයතනයේ සැලසුම් හා නිර්මාණ අංශයේ දීපාල් සංජීව සොහොයුරාටත් ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කැර ගනිමි.

චන්දන විජේකෝන්
103/1, වැව පාර
බොරලැස්ගමුව
chandana_wijekoon@yahoo.com

පළමු වැනි පරිච්ඡේදය

# ශ්‍රී ලංකාවේ වාම දේශපාලනයේ ආරම්භය හා එහි විකාශනය

## 1. තරුණ සංගම් ව්‍යාපාර

"1927 දී ඩොනමෝර් කොමිෂන් සභාව ලංකාවට පැමිණීමෙන් පසු දේශපාලන කටයුතු ගැන උනන්දුව තියුණු විය. ලංකාවට ලැබිය යුතු ස්වපාලන අයිතියේ ප්‍රමාණය, ඡන්ද බලය ව්‍යාප්ත කිරීම යනාදි ප්‍රශ්න ගැන උණුසුම් වාද-විවාද කැරිණි. ලංකා ජාතික සංගමය කෙරෙහි හෝ ලංකා කම්කරු පක්ෂය කෙරෙහි හෝ විශ්වාසයක් නොතිබුණු, දේශපාලන හැඟීමකින් යුතු තරුණයෝ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරෝධය පළ කිරීම් වස්, රටේ විවිධ ප්‍රදේශවල තරුණ සංගම් තුළ සංවිධාන වූහ" (ජයවර්ධන, 2009 : පි.159). ඒ අනුව හැන්ඩි පෙරිම්පනායගම්ගේ හා සී. බාලසිංගම්ගේ ක්‍රියාකාරි නායකත්වය යටතේ 'යාපනය තරුණ සංගමය' පිහිටුවාගෙන ඇත. යාපනයෙන් ආරම්භ වූ ප්‍රථම තරුණ සමිතියට අමතර ව කොළඹ හා තදාසන්න ප්‍රදේශ ගණනාවක තවත් ක්‍රියාකාරී තරුණ සමිති රැසක් බිහි විය. 1931 දී පමණ මේ තරුණ සමිති එක් කොට තරුණ සම්මේලනයක් පිහිටුවාගෙන ඇති අතර, එහි සභාපති වශයෙන් නීතිඥ ඊලියත් පෙරේරා පත් වී ඇත. මෙහි ලේකම් වශයෙන් නීතිඥ වැලන්ටයින් එස්. පෙරේරාත්, සම ලේකම් ධුරයට ජෝර්ජ් කල්දේරාත් පත් කැර ගෙන ඇත.

මේ තරුණ සංගම් 1931 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණය වර්ජනය කරන ලෙස සමස්ත රටවැසියන්ගෙන් ඉල්ලීමක් කැර ඇත. මෙයට ප්‍රධාන හේතුව වූයේ ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය පිළිබඳ ව ද්‍රවිඩ ජනතාව තුළ තිබූ ප්‍රබල විරුද්ධත්වය යි. එහෙත් වර්ජන ව්‍යාපාරය සාර්ථක වූයේ යාපනය ප්‍රදේශයේ පමණි. තරුණ සංගම් ව්‍යාපාරයේ කොටසක් මැතිවරණ තරග වර්ජනය කරද්දී, රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් වූ දොස්තර එස්. ඒ.

වික්‍රමසිංහ මොරවක ආසනය ජය ගත්තේ ය. උද්ඝෝෂණය හා ප්‍රචාරය සඳහා එය වටිනා වේදිකාවක් බව වටහාගත් ඔහු 1931 සිට 1936 තෙක් කාලය තුළ තොකඩවා රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළ බ්‍රිතාන්‍ය යටත්විජිතවාදී ආණ්ඩුවට සහ ලාංකික ඇමැති මණ්ඩලයේ දේශපාලන හා ආර්ථික ප්‍රතිපත්තියට ප්‍රබල ලෙස පහර එල්ල කෙළේ ය. රටේ බහු ජනතාව මුහුණ දෙන ප්‍රශ්න මතු කිරීම සඳහා හැම අවස්ථාවක් ම හෙතෙම ප්‍රයෝජනයට ගත්තේ ය; සමාජ සේවා කටයුතුවල අඩුපාඩු දැඩි සේ විවේචනය කෙළේ ය; අවම වැටුප් ක්‍රමයක් ඉල්ලා සිටියේ ය; ළමා මෙහෙකරුවන් පිළිබඳ කොමිසමේ වාර්තාවට අතුරු වාර්තාවක් ඉදිරිපත් කෙළේය.

තරුණ සංගම් විසින්, විදේශීය භාණ්ඩ වර්ජනය කිරීම ඇතුළු තවත් වර්ජන ගණනාවක් ගෙන යනු ලැබිණි. රටේ අධ්‍යාපන ක්‍රමය ද දැඩි විවේචනයට ලක් කැරිණි. එහි මූලිකත්වය ගත්තේ කොළොන්නාව විද්‍යාලයේ ආරම්භකයා වූ ටෙරන්ස් ද සිල්වා ය.

තරුණ සමිති සාමාජිකයන් අතර වර්ෂ කිහිපයක් තිස්සේ සාකච්ඡා වූ සමස්ත ලංකා තරුණ සමිති සම්මේලනය 1931 මැයි 19 වැනි දින කොළඹ වැල්ලවත්තේ ප්ලාසා සිනමා ශාලාවේ දී පැවැත්විණි. එහි මූලාසනය වැලන්ටයින් එස්. පෙරේරා හෙබවී ය. ජාතියේ පරම අවශ්‍යතාව සේ හඳුනාගනු ලැබූ පූර්ණ ජාතික ස්වාධීනත්වය එහි පරමාර්ථය වූ අතර, ඒ සඳහා ජාතික කර්මාන්ත හා කලා ශිල්ප නඟාසිටුවීමේ අවශ්‍යතාව ද පැහැදිලි කැරිණි. ඒ වන විට ක්‍රියාත්මක කිරීමට සූදානම් ව සිටි "ඩොනමෝර් ව්‍යවස්ථාව තුළින් තරුණ සමිති අපේක්ෂා කරන ස්වාධීනත්වය නොලැබෙන හෙයින් ඒ යටතේ පවත්වන මහා මැතිවරණය වර්ජනය කිරීම ද සම්මේලන යෝජනා මඟින් ඒකමතික ව තීරණය කළහ" (ස්වදේශ මිත්‍රයා, 1931). මේ "සම්මේලනයට ආරාධිත අමුත්තන් වශයෙන් ජවහර්ලාල් නේරු, නේරු ආර්යාව, ඉන්දිරා ගාන්ධි හා කමලා දේවි චට්ටෝපාධ්‍යාය ද සහභාගි වූහ" (සිල්වා, 2012 : පි.229). අධිරාජ්‍යවාදයේ සහ ධනවාදයේ ස්වරූප වටහාගන්නා ලෙසත්, ධනවාදී ක්‍රමය ක්‍රියාවේ යෙදෙන අන්දම



ගැන අවබෝධයක් නොමැති ව ජාතිකවාදී සටන්වල පමණක් යෙදීම ප්‍රමාණවත් නොවන බවත් ඔහු පෙන්වා දුන්නේ ය.

පූර්ණ ස්වාධීනත්වය, ආර්ථික ස්ථායිතාව සහ ජාතික සමෘද්ධිය මුදුන් පත් කැර ගැනීම සිය අරමුණ බව 1932 තරුණ ව්‍යාපාරය මඟින් ප්‍රකාශයට පත් කළ 'තරුණ ලංකා' මාසික සඟරාව කියා සිටියේ ය. විදේශීය ආධිපත්‍යයෙන් සහ ආර්ථික සූරාකෑමෙන් රට මුදාගන්නා ලෙස එය තරුණයන්ට ආයාචනය කෙළේ ය. විදේශවල අධ්‍යාපනය නිමවා පැමිණි සමාජවාදී අදහස් දරූ තරුණයන් තරුණ සංගම් ව්‍යාපාරයට එකතු වීම නිසා තරුණ සංගම්වල දේශපාලන අදහස් සැලකිය යුතු ලෙස වෙනස් විය. සෝවියට් සංගමයේ අත්දැකීමට පක්ෂපාත ලිපි මෙන් ම මාක්ස් හා ලෙනින් කොමියුනිස්ට්වාදය පිළිබඳ ව දක්වූ අදහස් ද 'තරුණ ලංකා' පුවත්පතේ පළ ව ඇත. 1932 අවසාන භාගයේ සිට තරුණ ලංකා සඟරාවේ ලිපි අතර මාක්ස් හා ලෙනින් ගැන ලියූ ලිපියක "නිර්ධන පන්ති විප්ලවයේ ශ්‍රේෂ්ඨතම සදාචාර බලවේගය වන ලෙනින්ගේ කතාවලින් මතු කොට ඇති උනන්දුවට වැඩි උනන්දුවක් ඇවිස්සීමට, මෑත කාලයේ දී පවත්වන ලද කිසි ම කතාවක් සමත් නොවන්නේ යි" පළ විය. තව ද 'සමාජවාදය හා යුද්ධය' නමැති පොත ගැන වූ විවේචනයක, එම පොතෙන් ලෙනින්ගේ තියුණු විචක්ෂණ හා පැහැදිලි බුද්ධිය ගැන ස්වල්ප වශයෙන් හෝ තේරුම් ගැනීමට පුළුවන් වූ බව දක්විණි (ජයවර්ධන, 2009 : පි.164).

## 2. සූරියමල් ව්‍යාපාරය

මේ තරුණ සංගම්වලට ජාතිකවාදී දේශපාලන කටයුතුවලට වේගයෙන් අවතීර්ණ වීමට උපකාරී වූයේ පොපිමල් දිනයට විරුද්ධ ව්‍යාපාරය යි. 1926 දී රැඩිකල්වාදී ශිෂ්‍ය කණ්ඩායමක් ආරම්භ කළ මෙම ව්‍යාපාරය, 1931 දී ලංකා සේවා මුක්ත භට සංගමය හා තරුණ සංගම් විසින් ඉදිරියට ගෙන යන ලදී. 1933 දී පමණ මැද කොළඹ තරුණ සංගමයේ නායකත්වය යටතට පත් වීමෙන් පසු මෙම ව්‍යාපාරය පැහැදිලි වශයෙන් ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට විරුද්ධ වූ සටන්කාමී ස්වරූපයක්

ගත්තේ ය. එහෙත් "පළමු වැනි ලෝක යුද්ධයේ අවසානය සිහි කරමින් නොවැම්බර් 11 වැනි දාට යෙදුණු යුද්ධ සමාදාන දිනය (පොපිමල් දිනය) පිළිබඳ උත්සවය ලංකාවේ රජයේ නිලධාරීහු හා බ්‍රිතාන්‍ය ජාතික පදිංචිකරුවෝ මහත් උද්යෝගයෙන් යුතු ව පැවැත්වූහ" (ජයවර්ධන, 2009 : පි. 164). මේ දිනයේ දී පොපිමල් විකුණා ලැබෙන ආදායම එංගලන්තයට යැවිණි. පල්ලියේ පූද පූජා සහ යුද්ධ පෙළපාළි මඟින් අධිරාජ්‍යය කෙරෙහි වූ භක්තිය යළි සහතික කරන ලදි. මේ අතර වාර්ෂික පොපිමල් අරමුදලට ආධාර වශයෙන්, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත් ව තිබූ බොහෝ රටවලින් ලැබුණු මුදලට වඩා විශාල මුදලක් ලංකාවෙන් යැවීම ගැන තරුණ ශිෂ්‍යයෝ තදින් විරුද්ධ වූ හ.

මෙයට ප්‍රතිචාරාත්මක ව්‍යාපෘතියක් වශයෙන් පොපිමල් විකිණීමේ දිනයෙහි සූරියමල් විකිණීම ආරම්භ කැරුණු අතර, එය ජනතාවගේ සුභ සිද්ධිය සඳහා කටයුතු කරන අධිරාජ්‍ය විරෝධී සංවිධානයක් ලෙසින් ක්‍රියා කෙළේ ය. සූරියමල් විකිණීමෙන් එකතු කරන ලද මුදල් සමාජ සුභ සාධන කටයුතු සඳහා ද, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට විරුද්ධ ව පත්‍රිකාවක් මුද්‍රණය කැර ප්‍රසිද්ධ කිරීම සඳහා ද ප්‍රයෝජනයට ගනු ලැබිණි. 1934 මැලේරියා වසංගත සමයේ දී සූරියමල් ව්‍යාපාරයේ සාමාජිකයෝ මහජනයාගේ මුදල් එකතු කැර, එම මුදලින් ගත් බෙහෙත් හා ආහාර ද්‍රව්‍ය බෙදාදෙමින් වසංගතයෙන් පීඩා විඳි ගම්වැසියනට ආධාර කළෝ ය.

එකල සූරියමල් ව්‍යාපාරයේ සිටි වාමාංශිකයන් අතර දොස්තර ඇස්. ඒ. වික්‍රමසිංහ, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, ලෙස්ලි ගුණවර්ධන, ටෙරන්ස් ඇන්. ද සිල්වා, ඇම්. ජී. මැන්දිස්, ටී. දොරෙයිසිංහම්, බී. ජේ. ප්‍රනාන්දු සහ රෙජී සේනානායක ද වූ හ. සූරියමල් ව්‍යාපාරයේ ප්‍රථම සභාපතිනිය වශයෙන් ඩොරීන් වික්‍රමසිංහ මහත්මිය තෝරා පත් කැර ගනු ලැබුවා ය.

සූරියමල් ව්‍යාපාරයේ ක්‍රියාකාරී වැඩ කොටසක් කළ මේ රැඩිකල් වාමාංශික තරුණ කොටස් වෘත්තීය සමිති පිහිටුවීමටත්, කම්කරු සටන්වලට නායකත්වය දීමටත් පටන් ගත්හ. වැඩි



කල් යන්නට පෙර කම්කරු නායකයකු වශයෙන් ගුණසිංහට තිබූ තත්ත්වය නැති ව ගියේ ය. වැල්ලවත්තේ රෙදි මෝලේ කම්කරුවන් සංවිධානය කිරීම මේ රැඩිකල් වාමාංශික තරුණ කොටස් යටතේ සිදු විය. මෙහි දී සේවක හිමිකම් කප්පාදුවට එරෙහි ව 1933 දී වැඩ වර්ජනයක් ආරම්භ කැරුණු අතර, කම්කරුවෝ 1400 දෙනෙක් පමණ මාස හයකට ආසන්න කාලයක් එම වැඩ වර්ජනයෙහි යෙදී සිටියහ. මෙම කාල සීමාවේ දී, වාමාංශිකයෝ මීරිගම හා ලුණුවිල වැවසියර් සමාගමේ පොල් හා කොහු මෝල්වල වැඩ වර්ජන ද, කොමර්ෂල් කොම්පැනියේ කැලණියේ හා හුනුපිටියේ පොහොර මෝල්වල වැඩ වර්ජන ද වැනි වෙනත් කම්කරු පන්ති අරගල සංවිධානය කැර, ඒවාට නායකත්වය දුන්නෝ ය. මේ අවධියේ කොල්වින් ආර්. ද සිල්වා සහ දකුණු කොළඹ තරුණ සංගමයේ සාමාජිකයෝ එක් ව, කම්කරුවන් වෙනුවෙන් සටන් කිරීම සඳහා පෙරමුණ ගත්හ. "1933 පෙබරවාරි 23 වැනි දා පවත්වන ලද කම්කරුවන්ගේ මහා සභා රැස්වීමක දී වැල්ලවත්තේ කම්කරු සංගමය පිහිටුවන ලදි. කොල්වින් ආර්. ද සිල්වා එහි සභාපති වශයෙන් ද, ක්‍රියාශීලී තරුණ සංගම් සාමාජිකයන් දෙදෙනකු වූ වර්නන් ගුණසේකර හා ජේ. ඩබ්ලිව්. සේනානායක සම ලේකම්වරුන් වශයෙන් ද පත් වූ හ. පිලිප් ගුණවර්ධන, ඇන්. ඇම්. පෙරේරා, එස්. ඒ. වික්‍රමසිංහ, රොබට් ගුණවර්ධන, සූසන් ද සිල්වා යනාදීහු ද, අප්පුහාමි, කුට්ටන් සහ රාමයියා යනාදි සටන්කාමී කම්කරුවෝ ගණනාවක් ද වැඩ වර්ජන සංවිධානය කිරීම, මහජන රැස්වීම්වල කථා කිරීම, අරමුදල් එකතු කිරීම සහ සහනාධාර බෙදාදීම ආදි කටයුතුවල දී ආධාර කළහ" (ජයවර්ධන, 2009 : පි.168). තිරිකුණාමල වරායේ කම්කරුවන්ගේ වැඩ වර්ජනය වාමාංශික නායකත්වයකින් සිදු වූ ප්‍රථම වරාය වැඩ වර්ජනය ලෙස සැලකෙයි. යටත් විජිත ආණ්ඩුවත්, ස්වාමි පක්ෂයත් මෙම වැඩ වර්ජනවලට හතුරුකම් කළ නමුත්, කාර්මික කොම්පැනිවල වැඩ වර්ජනවලට, වඩාත් දැඩි විරුද්ධත්වයක් දක්වන ලද්දේ ඒ. ඊ. ගුණසිංහ විසිනි. පොදු වශයෙන් වැඩ වර්ජනය නොකිරීමට ඔහු ස්වාමි පක්ෂය සමඟ ගිවිසුමකට එළඹ සිටියේ ය. කෙසේ වුවත් වැටුප් හා කම්කරුවන්ගේ ජීවන තත්ත්වය බොහෝ පහළ තත්ත්වයක

පැවැති බැවින් කම්කරුවෝ වාමාංශිකයන්ගේ නායකත්වය හා ආශීර්වාදය නොඅඩු ව ලබමින් එම කටුක තත්ත්වයට විරුද්ධ ව සටන් කිරීමට ඉදිරිපත් වූ හ.

ඉහත සඳහන් කැර ඇති පරිදි ස්වාමිවරුන්ගේ පක්ෂය ගත් ගුණසිංහ වැඩ වර්ජන බිඳ හෙළීම සඳහා මැර බලය පවා යෙදවී ය. කොළඹ වැඩ පොළ රැසක එකල සේවයේ යොදවා සිටි ඉන්දීය කම්කරුවන්ට විරුද්ධ ව වර්ග භේදය ඇවිස්සීමෙන් ද ඔහු කම්කරු පන්තිය භේද කැර දුර්වල කෙළේ ය.

වැඩ වර්ජන ගණනාවක් ම කඩාකප්පල් කිරීමට ස්වාමි පක්ෂයට සහාය දීම හේතුවෙන් ගුණසිංහගේ කම්කරු පන්ති නායකත්වය හා ඔහු කෙරේ වූ ප්‍රසාදය අහෝසි වන්නට පටන් ගත්තේ මේ අවධියේ දී ය. ඔහුගේ වෘත්තීය සමිති සඳහා සාමාජික මුදල් එකතු කැර දීමෙන් කොම්පැනිකරුවෝ ගුණසිංහට ආධාර කළහ. ගුණසිංහගේ සමිතිවලින් තුණ්ඩු රැගෙන එන ඉල්ලුම්කරුවන්ට පමණක් රැකියා දීමෙන් ස්වාමි පක්ෂය තව දුරටත් ගුණසිංහට අනුබල දුන් අතර, එමගින් හීලෑ කම්කරු පිරිසක් ඇති කැර ගැනීමට අපේක්ෂා කැරිණි.

1935 දී වෘත්තීය සමිති ආඥාපනත නීතිගත කරන ලදි. එංගලන්තයේ මෙන් නො ව, ලංකාවේ වෘත්තීය සමිති ලියාපදිංචි කිරීමට නීතියෙන් බල කෙළේ ය. වෘත්තීය සමිති ආඥා පනතෙහි ඇති පූර්විකාවෙහි සඳහන් වන්නේ එම ආඥා පනත "වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම හා පාලනය සඳහා" පිළියෙළ යොදන බව ය. "එබැවින් ලංකාවේ ලියාපදිංචි නොකරන ලද වෘත්තීය සමිතියක් වෙතොත් එය නීති විරෝධී සංවිධානයක් වන්නේ ය" (නවරත්න රාජා, පි.1935).

වෘත්තීය සමිති ආඥා පනත පිළිබඳ යෝජනාවට විරුද්ධත්වය දැක්වීමේ නායකත්වය ගත්තේ දොස්තර ඇස්. ඒ. වික්‍රමසිංහ ය. එම පනතේ ඇති ප්‍රතිගාමී ස්වභාවයත්, එයින් කම්කරුවන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොසැලසෙන බවත්, එය මුළුමනින් ම ස්වාමි පක්ෂයට පක්ෂපාත ව සකස් වී තිබෙන බවත් ඔහු රාජ්‍ය මන්ත්‍රණ සභාවට දන්වී ය. ප්‍රධාන වශයෙන් මේ පනතට විරුද්ධ වූයේ වෘත්තීය සමිති ලියාපදිංචි කිරීමට බල



කිරීම සඳහාත්, වෘත්තීය සමිති මුදල් දේශපාලන කටයුතු සඳහා වියදම් කිරීම වැළැක්වීම සඳහාත් එහි අඩංගු වූ කොටස් නිසා ය. "යම් කිසි වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා නිසි කල්හි ඉල්ලුම් නොකළ හොත්, නැත් නම් යම් කිසි වෘත්තීය සමිතියක ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ හොත්, ඉල්ලා අස් කැර ගත හොත් හෝ අවලංගු කළ හොත් එවිට එම වෘත්තීය සමිතිය නීති විරෝධී සංවිධානයක් ලෙස සලකනු ලැබේ" (වෘත්තීය සමිති ආඥාපනත, 1935).

මේ පනතේ නියම ස්වභාවය කලින් නොදුටු රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරු කිප දෙනෙක් පසු ව දොස්තර වික්‍රමසිංහ සමඟ එක් ව ඊට විරුද්ධ වූ හ. වෘත්තීය සමිති පිහිටුවීම නිති විරෝධ කරන්නා වූ සහ වෘත්තීය සමිති මඟින් එකතු කරනු ලබන මුදල් වැය කිරීම සීමා කරන්නා වූ මෙම පනතේ වගන්තිවලින් ම පැහැදිලි වන්නේ මේ පනතින් වෘත්තීය සමිතිවලට කිසි ම අයිතිවාසිකමක් නොදෙන බව සහ ඒ වෙනුවට එම සමිතිවල සාධාරණ හිමිකම් උදුරාගනු ලබන බව යයි" ඔහු ප්‍රකාශ කෙළේ ය (හැන්සාඩ් වාර්තාව, 1935 : පි.2890).

මුල් අවධියක දී එම පනතට පක්ෂ වූ ඒ. ඊ. ගුණසිංහ ද පසු ව ඊට විරුද්ධ විය. ඒ සම්බන්ධයෙන් ඔහු මෙසේ කීවේ ය: "1923 වර්ෂයේ අප ප්‍රථම පොදු මහ වැඩ වර්ජනය පැවැත්වූ තැන් පටන් මේ මොහොත දක්වා ම වෘත්තීය සමිති පාලනය කිරීම සඳහා වෘත්තීය සමිති රජයේ පාලනයට යටත් කිරීම සඳහා යම් මාධ්‍යයක් තිබිය යුතු ය යි ධනපති පන්තිය හඬ නැඟූ හ. මේ සඳහා නීති සම්පාදනය කරන ලෙස අවුරුද්දක් නැර ම ධනපති පන්ති මුර ගෑ හ" (හැන්සාඩ් වාර්තාව, 1935 : පි. 2881).

කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි හෝ කම්කරුවන්ට ආධාර දුන් හෝ හැම කෙනෙක් ම මෙම පනතට විරුද්ධ වූ හ. ඊට විරුද්ධ වූ අය අතර ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ද විය. මේ විරුද්ධත්වය පවා නොතකා එය සැණෙකින් සම්මත කැර, 1935 දී නීති ගත කරනු ලැබිණි. ප්‍රතිගාමී ආණ්ඩුවෙන් හා අකැමැති ස්වාමි පක්ෂයෙන් මූලික වෘත්තීය සමිති අයිතිවාසිකම් ප්‍රතිලාභයන් දිනා ගැනීම සඳහා වූ සටනෙහි ආරම්භය මෙය

විය. "මෙම ආඥා පනතෙන් වෘත්තීය සමිතිවලට දෙන ලද අයිතිවාසිකම් අතර, දේපළ අයිති කැර ගැනීම හා තබා ගැනීම සඳහා අයිතිය ද ස්වකීය ලියාපදිංචි නමින් නඩු පවරනු ලැබීමට අයිතිය ද විය. එමෙන් ම එංගලන්තයේ බලපැවැති තත්ත්වයෙන් ම වන්දි ගෙවීමට බැඳීමෙන් ආරක්ෂාව ද එම නීතියෙන් සැලසිණි" (ලංකා වෘත්තීය සමිති සම්මේලනය, 1966 : පි.9).

## 3. මැලේරියා වසංගතය

අතීත කම්කරු නායකයන් මෙන් ම, නවසිය තිස් ගණන්වල සිටි ලාංකික තරුණ රැඩිකල්වාදීහු ද බහු ජන සහන වැඩ කටයුතුවල ද යෙදුණෝ ය. මේ නිසා ඔවුන්ට රට තුළ දිළිඳුකම හා ලෙඩ දුක් හා ප්‍රශ්න ගැන පෞද්ගලික අවබෝධයක් තිබිණි. පිට පිට දෙවාරයක් ම පැවැති දරුණු ඉඩෝරයත්, දිගින් දිගට ම අස්වනු පාළු වීමත් සමඟ රට පුරා දරුණු මැලේරියා වසංගතයක් ද පැතිරිණි. එය ලංකාවේ සිදු වූ ඉතා ම බියජනක ජාතික විපතකි. මැලේරියා වසංගතයේ පහසු ම බිල්ල බවට පත් වූයේ ආර්ථික පරිහානියෙන් දුබල ව සිටි දුප්පත් ගැමි ජනතාව යි. ලක්ෂ 15කට වැඩි පිරිසක් මේ වසංගතයට ගොදුරු වූ හ. සිදු වූ මරණ සංඛ්‍යාව ලක්ෂයකට අධික විය. සහනාධාර ලබාදීම සඳහා ආණ්ඩුව ද පෞද්ගලික සංගම් ද ඉදිරිපත් විය. සූරියමල් ව්‍යාපාරය වටා රොක් වී සිටි තරුණ පිරිස් හා ඊට උදවු-උපකාර කළ ජනතාව මෙහි දී සුවිශාල කාර්යභාරයක් ඉටු කළහ. මේ පිරිස් ස්වේච්ඡාවෙන් ආහාර සහ බෙහෙත් ද්‍රව්‍ය එකතු කොට ගෙයින් ගෙට ගොස් ඒවා බෙදා දීමට පියවර ගත්හ. එයට අමතර ව රෝගීන්ට බෙහෙත් ලබාදීම සඳහා කෑගල්ල ප්‍රදේශයේ බෙහෙත් ශාලාවක් ද ආරම්භ කරනු ලැබිණි. හේවාගම් කෝරලයේ මූලස්ථානය වූයේ බොරලුගොඩ වලව්ව යි. "එස්. ඒ. වික්‍රමසිංහ, කොල්වින් ආර්. ද සිල්වා, හැරී, පිලිප් සහ රොබට් ගුණවර්ධන සොහොයුරෝ, ඇන්. ඇම්. පෙරේරා, රෙබින් රත්නම්, දොස්තර මේරි රත්නම්, සෙලිනා පීරිස් යනාදීහු ද ආනන්ද බාලිකා විද්‍යාලයේ ගුරුවරු කීප දෙනෙක් ද මාස ගණනක් තිස්සේ මේ පෙදෙසේ වැඩ කළහ" (ජයවර්ධන, 2009 : පි.171). මැලේරියා



වසංගතයෙන් පීඩා විඳි ජනතාව ඉන් මුදා ගැනීමට පෙරමුණ ගත් තරුණ සංගම් නායකයෝ, ජනතා ප්‍රසාදයට ලක් ව සිටියහ. මෙහි එක් පියවරක් වන්නේ 1936 මහා මැතිවරණයේ දී ඇන්. ඇම්. පෙරේරාට රුවන්වැල්ල ආසනය දිනා ගැනීමට හැකි වීම යි. කෙසේ නමුත් මැලේරියා වසංගතයෙන් සිදු වූ විනාශයට ආණ්ඩුව ඍජු ව ම වග කිව යුතු බවට තරුණ සංගම්වල හා සූරියමල් ව්‍යාපාරයේ ක්‍රියාශීලීහු චෝදනා කළහ.

දහස් ගණන් ජනතාව මැලේරියා වසංගතයෙන් නිරාහාර ව මිය යමින් සිටිය දී ඊනියා ජාතික නායකයෝ රාජකීය ජයන්ති උත්සවය පැවැත්වීමෙහි යෙදී සිටියහ. එංගලන්ත රජ්ජුරුවන්ගේ රිදී ජුබිලි උත්සවයට සුබ පැතුම් යෝජනාවක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ගෙන ආ අවස්ථාවේ දී එයට දොස්තර වික්‍රමසිංහ සහෝදරයා අතුරු යෝජනාවක් ඉදිරිපත් කෙළේ යඃ

"ඔබතුමාගේ පාලනය පැවති විසිපස් අවුරුද්ද තුළ මේ රටේ බහු ජනතාවගේ තත්ත්වය අල්ප මාත්‍රයකින් හෝ වැඩි දියුණු වී නැත. ඔවුහු නොයෙකුත් බාධකයන්ට ද දරුණු නීති රීතිවලට හා සූරාකෑමට ද ගොදුරු වී ඇත්තා හ. ඔබතුමාගේ පුරෝහිතයන්ගේ නොසැලකිලිමත්කම හා සාපරාධී උදාසීනත්වයේ ප්‍රතිඵල වශයෙන් දිළිඳුකම, ලෙඩ රෝග හා හාමතය ගොඩගැසී ඇත" (ජයවර්ධන, 2009 : පි.174) යනුවෙන් එහි සඳහන් වූයේ ය. මැලේරියා වසංගත සමයේ ක්‍රියාත්මක වූ සහනාධාර සේවාවන්හි අඩුපාඩුකම් රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළ දී නිරන්තරයෙන් හෙළිදරවු කිරීමට දොස්තර වික්‍රමසිංහ පෙරමුණ ගත්තේ ය. මේ මහා වසංගතය උගැන්වූ පාඩම නම්, "දේශපාලන විමුක්තිය මුදුන්පත් කැර ගැනීමේ අවශ්‍යතාව" බව හෙතෙම මැනවින් පෙන්වා දුන්නේ ය.

වසංගත කාලයේ සූරියමල් ව්‍යාපාරය කටයුතු කළ ආකාරයත්, සහනාධාර සේවයට අලුත් අරුතක් එක් කරන්නට එහි තරුණ-තරුණියන් දැරූ විශිෂ්ටතර ප්‍රයත්නයත් 'තරුණ ලංකා' සඟරාවෙන් විස්තර කැර පෙන්වා දෙනු ලැබිණි. විශේෂයෙන් ඔවුන් කියා සිටියේ "ගොවියන් සහ සූරියමල් සේවකයන් අතර ගොඩනැඟුණු සම්බන්ධකමේ සදාචාරාත්මක වටිනාකම අප

විසින් සපයන ලද වෛද්‍ය හා ද්‍රව්‍යමය ආධාරවලට වඩා වැදගත්" වන බව යි.

ලංකා ජාතික සංගමය හා ලංකා කම්කරු පක්ෂය, ආර්ථික හා සමාජීය ප්‍රතිසංස්කරණ පිළිබඳ හදිසි ප්‍රශ්නවල දී ක්‍රියා කිරීමට අසමත් වීම ගැන තරුණ සංගම් සාමාජිකයෝ, එම පක්ෂවල නායකත්වයන් දැඩි ලෙස විවේචනය කරමින් පහර ගැසීමට පටන් ගත්හ. ලංකාවේ දේශපාලන ව්‍යුහය තුළ රැඩිකල්වාදී ජාතිකවාදී වැඩපිළිවෙළකින් යුත් නව දේශපාලන පක්ෂයක් තිබීමේ වැදගත්කම මේ තරුණ පිරිස් තදින් අවබෝධ කැර ගත්හ.

වෘත්තීය සමිති පාලනයට මර්දන නීති ගෙන ආ 1935 පනතට විරුද්ධ ව දොස්තර වික්‍රමසිංහ සටන් කෙළේ ය. 1929 දී ද වෘත්තීය සමිති පාලනය කිරීම සඳහා ආණ්ඩුව මර්දන නීති පැනවීමට වෑයම් කළ නමුත් එවකට මහා බ්‍රිතාන්‍යයේ කම්කරු පාක්ෂික ආණ්ඩුවේ යටත් විජිත භාර රාජ්‍ය ලේකම් ධුරය දැරූ පාස්ෆීල්ඩ් සාමි එය වළක්වන්නට පියවර ගත් අතර, 1931 දී වෘත්තීය ආරවුල් සම්බන්ධයෙන් මතභේදයෙන් තොර අණපනතක් පමණක් සම්මත කැරිණ. එසේ වුව ද 1935 වන විට ලංකාව පරිහානියේ පශ්චාත් ප්‍රතිඵලවලින් මිදීමට පටන් ගත් වේලේ කම්කරු සටන් යළි ආරම්භ වීමේ හැකියාව ඇති වූයෙන්, වෘත්තීය සමිති සඳහා වූ ප්‍රථම අණපනත (1935 නීතිගත කළ වෘත්තීය සමිති ආඥා පනතෙහි 18 වැනි කොටස) රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දී සම්මත කැරගනු ලැබිණි.

## 4. ලංකා සමසමාජ පක්ෂයේ උපත

වෘත්තීය සමිති ව්‍යාපාරයට වැදගත් වන 1935 වර්ෂයේ සිදු වූ තවත් වැදගත් සිද්ධියක් නම්, ඒ දක්වා අසංවිධානාත්මක ලෙස සූරියමල් ව්‍යාපාරයේ යෙදී සිටි වාමාංශිකයන් එක් වී දේශපාලන පක්ෂයක් පිහිටුවා ගැනීම යි. ඒ 1935 දෙසැම්බරයේ දී බිහි වූ 'ලංකා සමසමාජ පක්ෂය' යි. කොළඹ හා අවට කාර්මික කම්කරුවන් අතර ද වතු කම්කරුවන් අතර ද ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා වූ නිරන්තර උද්ඝෝෂණයක් පක්ෂ සාමාජිකයෝ ගෙන ගියහ. ස්වකීය ජීවන තත්ත්වය උසස් කැර ගැනීම සඳහා ද වැටුප්



වැඩි කැර ගැනීම සඳහා ද කම්කරුවන් එක්සත් ව සටන් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙනු ලැබිණි. උද්‍යානවල, පිට්ටනිවල, වීදි මුලුවල හා වතු අසල රැස්වීම් පැවැත්වූ සමසමාජ පාක්ෂිකයෝ සිංහලයෙන් හා දෙමළෙන් රැස්වීම් ඇමතූ හ. එකල වෙනත් දේශපාලනඥයන් තම රැස්වීම් ඇමතුයේ ඉංගිරිසියෙන් බව මෙහි ලා සැලකිය යුතු ය. එකල දේශපාලනය ඉංගිරිසි උගත් අතළොස්සකට සීමා වී තිබිණි. දේශපාලන රැස්වීම්වල දී සිංහල හා දෙමළ භාෂා භාවිතයට ගැනීමට පළමුවෙන් කටයුතු කරන ලද්දේ වාමාංශිකයන් විසිනි.

1935 වසරේ දී විප්ලවීය මාක්ස්වාදයේ පැමිණීමත් සමඟ මෙරට කම්කරු පන්තියේ බහුතර කොටස් නව දිසාවකට යොමු වී, තවත් යුගයක අවසානය සලකුණු විය.

ලංකා කම්කරු ව්‍යාපාරයේ ඉතිහාසයෙහි විශාලතම ප්‍රවාහණ වැඩ වර්ජනය වූයේ 1936 මුල හරියේ දී කැරුණු බස් කම්කරුවන්, ලොරි කම්කරුවන්, කුලී හා පෞද්ගලික කාර් රියදුරන් වැනි සියලු මෝටර් ප්‍රවාහණ කම්කරුවන් සහභාගි වුණු දින දෙකක දීප ව්‍යාප්ත විරෝධතා වැඩ වර්ජනය යි. වාමාංශිකයන් මෙහෙයවූ මේ වැඩ වර්ජනය සිදු වුණේ මෝටර් රථ සුළු වැරදිවලටත් රියදුරු බලපත් අවලංගු කිරීම ගැන විරෝධය දක්වනු පිණිස ය. මේ වැඩ වර්ජනය කොතරම් ප්‍රතිඵලදායක වූයේ ද යත්: එම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම අතහැරදැමීමට ආණ්ඩුවට සිදු විය. මේ වැඩ වර්ජනය මෙහෙය වූවන් අතර ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා, ඇම්. ජී. මැන්ඩිස් හා ජේ. සී. ටී. කොතලාවල යන අය වූ හ. කොළඹ හා අවට ප්‍රදේශවල බස් ධාවනය කැරවූ එකල විශාල ම බස් සමාගම වූ බී. එම්. රැද්‍රිගු සහෝදරයෝ සහ සමාගමේ සේවකයන්ගේ වැඩ වර්ජන කීපයක් ද කොළඹ දී සිදු විය.

## 5. ඇම්. ඒ. එල්. බ්‍රේස්ගර්ඩ්ල් සිද්ධිය

බ්‍රේස්ගර්ඩ්ල් සිද්ධිය, සමසමාජ පක්ෂයට මහත් ප්‍රසිද්ධියක් ලබා දුන්නේ ය. මාක් ඇන්තනී ලිස්ටර් බ්‍රේස්ගර්ඩ්ල් ඔස්ට්‍රේලියාවේ

උපන්, යුරෝපීය ජාතිකයෙකි. වතු පාලනය ගැන ඉගෙන ගැනීමට ලංකාවට පැමිණි ඔහු සේවය කෙළේ මඩොල්කැලේ රේලුගස් වතුයායේ ය. වතු පාලකයන් කම්කරුවන් කෙරෙහි දක්වන නොසැලකිලිමත්කම ගැන කලකිරීමට පත් ඔහු වතුකරයේ සමිති පිහිටුවා ගෙන සටන් කළ හැටන් මන්ත්‍රී නාතේසා අයියාර් වෙත ගියේ ය. පසු ව කොළඹට පැමිණි හෙතෙම මාක්ස්වාදී තරුණ පිරිස් සමඟ එක් විය. සමසමාජ පක්ෂයට උඩරට වතුකරයේ කම්කරුවන් අතරට පිවිසීමට බ්‍රේස්ගර්ඩ්ල් මහත් රුකුලක් විය.

නාවලපිටියේ පැවැති වතු කම්කරු රැස්වීමක දී ඔහු සුදු වතු පාලකයන්ගේ හැසිරීම්වල තිබූ අධිපතිවාදී බව හෙළිදරව් කරමින් කතා කෙළේ ය. බ්‍රිතාන්‍ය ජාතිකයකු ම බ්‍රිතාන්‍ය වතුකාරයන්ට විරුද්ධ ව කතා කිරීම ගැන වතු පාලකයන් තදින් උරණ වූ අතර, වතු කම්කරුවන්ට නම් එය මහත් අස්වැසිල්ලක් හා උද්‍යෝගයක් විය. ඔහු වහා ම රටින් පිටුවහල් කරන ලෙස වතු පාලකයෝ ආණ්ඩුවෙන් රහසිගත ව ඉල්ලා සිටියහ. මේ අනුව 1937 අප්‍රේල් 24 වැනිදා සවස 6.00ට පෙර රටින් පිට වන ලෙස බ්‍රේස්ගර්ඩ්ල්ට නියෝගයක් නිකුත් කරනු ලැබිණ. රහසිගත ස්ථානයක ඔහු සඟවා තැබූ සමසමාජ නායකයෝ නියෝගයට විරුද්ධ ව උද්ඝෝෂණයක් ඇරඹූ හ. උද්ඝෝෂණයේ නිවැරදි භාවය පිළිගත් සමහර මැති-ඇමැතිවරුන්ට ද එම ව්‍යාපාරය පිළිගැනීමට සිදු විය.

එවකට පොලිසිය භාර වී තිබුණේ ස්වදේශ කටයුතු කාරක සභාවට ය. එහෙත් මෙම නියෝගය නිකුත් කැර තිබුණේ එය භාර ඇමැතිවරයාගේ අනුමතියකින් තොර ව ය. ඒ නිසා තවත් අර්බුදයක් මතු විය. මේ වන විට ස්වදේශ කටයුතු ඇමැති ඩී. බී. ජයතිලක නිවාඩු ලැබ රටින් බැහැර ව සිටි අතර, වැඩ බැලුවේ වෙනත් අයෙකි. මෙහි දී පැහැදිලි වූයේ වතුහිමියන්ගේ අවශ්‍යතාව අනුව ඇමැතිවරුන් වෙත පවරා තිබුණු බලතල පවා තමන් අතට ගැනීමට ආණ්ඩුකාරයා කටයුතු කැර ඇති බව යි.

සිද්ධිය සම්බන්ධයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට මාතලේ මන්ත්‍රී බී. එච්. අලුවිහාරේ මහතා යෝජනාවක් ඉදිරිපත් කෙළේ ය. නාරම්මල මන්ත්‍රී සමරක්කොඩි මහතා එයට අතුරු යෝජනාවක් ගෙන ආවේ ය. වැසියන්ගේ නිදහසට අකුල් හෙළන පිළිකුල් සහගත පිටුවහල් නීතිය අවලංගු කළ යුතු බව එම අතුරු යෝජනාවෙන් කියැවිණි.



යෝජනාවට පක්ෂ ව ඡන්ද 34ක් ලැබිණි. ටී. බී. ජයා, ජී. ජී. පොන්නම්බලම් සමඟ යුරෝපීය ජාතීන් වෙනුවෙන් පත් කළ මන්ත්‍රීවරුන් සිවු දෙනා ද යෝජනාවට විරුද්ධ ව ඡන්දය දුන් අතර, ඉංග්‍රීසි ජාතිකයකු වූ අනුරාධපුර මන්ත්‍රී ප්‍රීමන් මහතා යෝජනාවට පක්ෂ ව ඡන්දය දීම විශේෂයකි.

රාජ්‍ය මන්ත්‍රණ සභා වාදයට පසු ගාලු මුවදොර දී ආණ්ඩුකාරයා හෙළාදකිමේ දැවැන්ත රැලියක් පැවැත්විණි. රැස්වීමේ උද්වේගකර ම සිද්ධිය වූයේ අතුරුදන් ව සිටි බ්‍රේස්ගර්ඩ්ල් වේදිකාව මත පෙනී සිට ජනතාවට ආචාර කිරීම යි. ඉන් පසු රැස්වීමේ සිටි මහජනතාව ඇමතූ ඔහු යළිත් අතුරුදන් වූයේ ය. දෙදිනකට පසු රහස් පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබූ ඔහු යළි නිදහස ලැබුවේ අධිකරණයේ දී ය.

බ්‍රේස්ගර්ඩ්ල් එංගලන්තයට යැවීම පිණිස සිර භාරයේ තැබුව ද සමසමාජ පක්ෂය හබයාස් කෝපුස් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කෙළේ ය. පෙත්සම විභාග කළ විනිශ්චයකාරවරුන් ප්‍රකාශ කෙළේ ආණ්ඩුකාරයාගේ තීරණයට එරෙහි මතයකි. "රටේ කලබල අවධියක නොවේ නම් බ්‍රිතාන්‍ය පුරවැසියකු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය තුළ වූ රටකින් පිටුවහල් කිරීමට නොහැකි ය" යන්න ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව යි. මෙයින් පසු ව බ්‍රේස්ගර්ඩ්ල් සමසමාජ පක්ෂයේ තවත් කැපී පෙනෙන පුද්ගලයකු බවට පත් වූයේ ය.

බ්‍රේස්ගර්ඩ්ල් පිටුවහල් කිරීම සම්බන්ධ ව තවත් අරගලයක් මතු විය. පොලිස්පති බැන්ක්ස් කියා සිටියේ ඔහු මේ පිළිබඳ ව ස්වදේශ කටයුතු ඇමැති ජයතිලකට දැනුම් දුන් බව යි. රාජකාරිය කිරීමේ දී පොලිස්පති බැන්ක්ස් තමාට විරුද්ධ ව කටයුතු කිරීම ද්‍රෝහිකමකැ යි කියා සිටි ජයතිලක මහතා ඔහු නිලයෙන් පහ කළ යුතු යැ යි කීවේ ය. එසේ නැති ව ස්වදේශ කටයුතු ඇමැති ධුරයේ කටයුතු කළ නොහැකි බව හෙතෙම දැනුම් දුන්නේ ය.

මේ ප්‍රශ්නය නිසා ඇමැති මණ්ඩලය ම ඉල්ලා අස් වුව ද පසු ව සමථයක් ඇති විය.

ආණ්ඩුකාරයාගේ සහ සුදු නිලධාරින්ගේ මඩ සෝදා ගැනීම සඳහා කොමිසමක් පත් කැරිණි. කොමිෂන් සභාවේ තීරණය අනුව ද පැහැදිලි ව පෙනුණේ සුදු පාලකයන්ගේ ආණ්ඩුවට අමතර ව වතුපාලකයන් පොලීසිය සමඟ තමන්ගේ ම තවත් ආණ්ඩුවක් පවත්වාගෙන යන බව යි. පොලිස්පති බැන්ක්ස් බ්‍රේස්ගර්ඩ්ල් රටින් නෙරපා හැරීමට ඉදිරිපත් වූයේ අනිසි චේතනාවකින් නොවන බවත් බ්‍රේස්ගර්ඩ්ල් ලක්දිව සුදු මහත්වරුන්ට විරුද්ධ ව ඇති කළ උද්ඝෝෂණ නිසා ගැටුමක් ඇති වීමට ඉඩ තිබුණු බව සිතීමට මහ ලේකම්ට සිදු වූ බවත් වාර්තාවේ සාරාංශය විය.

මෙම අගතිගාමී බ්‍රේස්ගර්ඩ්ල් කොමිසමේ වාර්තාවේ තත්ත්වය පහදා දෙමින් එය ප්‍රතික්ෂේප කළ යුතු බව කියැවෙන යෝජනාවක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ගෙන එනු ලැබිණි. එය ඉදිරිපත් කරන ලද්දේ පිලිප් ගුණවර්ධන මහතා විසිනි. එම යෝජනාව මෙසේ ය:

"ආණ්ඩුවේ ස්ථිර නිලධාරින්ගේ වැරදි වසාලීමට උපකාරී වන අනර්ථකාරී දේශපාලන ලේඛනයක් වන නිසාත් මහජනයා විසින් තෝරා පත් කරගත් නියෝජිතයන්ගේ යුක්ති සහගත බලය, තත්ත්වය සහ ගෞරවයත් අඩු කිරීමට හා මහජනයා විසින් තෝරා පත් කර ගන්නා ලද මන්ත්‍රණ සභාවට විරුද්ධ ව මහජනයාට අහිතකාරී වූ සුදු නිලධාරීන්ගේ ආණ්ඩුවට තම බලය වැඩි කර ගැනීමට ධෛර්යය දීම පිණිසත් කරන ලද, ඉදිරිපත් වූ සාක්ෂිවලට නොසරිලන තීරණවලින් යුතු වූ නිසාත් මෙම සභාව බ්‍රේස්ගර්ඩ්ල් කොමිෂන් සභාවේ වාර්තාව හෙළාදකිනවාත් සමඟ ම එය ප්‍රතික්ෂේප කරන්නී ය."

යෝජනාව සභාව ඉදිරිපිට තබන ලදුව, 05 දෙනකු පක්ෂ වීමෙන් හා 43 දෙනකු විපක්ෂ වීමෙන් එය නිෂ්ප්‍රභ විය.

සිංහල මහා සභා සාමාජිකයකු වූ සිරිපාල සමරක්කොඩි මහතා අතුරු යෝජනාවක් ඉදිරිපත් කෙළේ ය. එය මෙසේ ය:



"මේ සභාව බ්‍රේස්ගර්ඩ්ල් කොමිෂන් සභාවේ වාර්තාව හෙළා දකිනවාත් සමඟ එය ප්‍රතික්ෂේප කරන්නී ය."

ඡන්දය විමසන ලදු ව 34 දෙනකු පක්ෂ වත් 14 දෙනකු විපක්ෂ වත් ඡන්දය දුන් අතර, අතුරු යෝජනාව සම්මත විය.

එහෙත් ඉහත සඳහන් යහපත් කටයුතු අතර සාවද්‍යතා රාශියක් ද සමසමාජ පක්ෂයෙහි තිබිණි.

- සෝෂලිස්ට් ව්‍යාපාරය සහ කම්කරු පන්ති ව්‍යාපාරය සම්බන්ධ කිරීමට ප්‍රබල ප්‍රයත්නයක් නොදැරිණි.
- ඉන්දියානු කම්කරුවන් සම්බන්ධ ව අනුගමනය කෙළේ අස්ථිර වැනෙන සුලු පිළිවෙතකි.
- ජාතික ව්‍යාපාරය පිළිබඳ ව නිවැරදි ක්‍රියාත්මක තත්ත්වයක් නොගත්තේ ය.

ජාතික නායකයන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් සමඟ සහයෝගී ව කටයුතු කරද්දී නිවැරදි මඟ පෙන්වීම නොකොට, තමන් ම ජාතික ව්‍යාපාරය හැටියට කල්පනා කිරීමත්, පරාජය කළ යුතු ප්‍රධාන සතුරා ජාතික ව්‍යාපාරය ලෙස සැලකීමත් ඔවුන්ගේ කැපීපෙනෙන අඩුවකි.

### පාදක සටහන්

1. ජයවර්ධන, කුමාරි (2009), 'ශ්‍රී ලංකාවේ කම්කරු පංති ව්‍යාපාරයේ කෙටි ඉතිහාසය - 1893-1947', කොළඹ, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පෞද්ගලික) සමාගම.
2. 'ස්වදේශ මිත්‍රයා', (1937), මැයි 27.
3. සිල්වා, එම්. යූ. ද, (2012), 'වෘත්තීය සමිති - තරුණ සමිති ව්‍යාපාරය හා ජාතික නිදහස සඳහා ජනතා පෙළගැසීම'. විජේතුංග, ඩබ්ලිව්. එම්. කේ. ජයවර්ධන, අමල් (සංස්කරණ), 'ශ්‍රී ලාංකේය ඉතිහාසය' (වෙළුම IV), කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම.
4. ජයවර්ධන, කුමාරි (2009), 'ශ්‍රී ලංකාවේ කම්කරු පංති ව්‍යාපාරයේ කෙටි ඉතිහාසය - 1893-1947', කොළඹ, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පෞද්ගලික) සමාගම.
5. එම.
6. එම.
7. නවරත්නරාජා, සී. (1935), වෘත්තීය සමිති හා නීතිය.
8. වෘත්තීය සමිති ආඥා පනත, (1935), 18 වැනි කොටස, කොළඹ, රජයේ මුද්‍රණාලය.
9. හැන්සාඩ් වාර්තාව (1935), කොළඹ, රජයේ මුද්‍රණාලය.
10. හැන්සාඩ් වාර්තාව (1933), කොළඹ, රජයේ මුද්‍රණාලය.
11. ලංකා වෘත්තීය සමිති සම්මේලනය, (1966), 'ලංකා වෘත්තීය සමිති සම්මේලනය හා කම්කරු පන්ති ව්‍යාපාරය', කොළඹ, මරදානේ ගුණරත්න සහ සමාගම.
12. ජයවර්ධන, කුමාරි (2009), 'ශ්‍රී ලංකාවේ කම්කරු පංති ව්‍යාපාරයේ කෙටි ඉතිහාසය - 1893-1947', කොළඹ, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පෞද්ගලික) සමාගම.
13. එම.

LIBRARY
SRI PALEE CAMPUS

දෙවැනි පරිච්ඡේදය

# උඩකැන්දවල සිරි සරණංකර හිමියන් ලංකා සමසමාජ පක්‍ෂයට එක් වීම

අනගාරික ධර්මපාල තුමා, තාගෝර් හා ඉන්දියානු ජාතික සටන් ව්‍යාපාරයේ විප්ලවවාදීන්ගෙන් අධිරාජ්‍ය විරෝධී අරගලය පිළිබඳ අදහස් උකහාගත් සරණංකර හිමියන් මෙරට සමාජවාදී දේශපාලන පක්‍ෂය හා සම්බන්ධ වූ ආකාරය විග්‍රහයට ලක් කිරීම වැදගත් ය. 1936 අප්රේල් අවසාන භාගයේ ලංකාවට පිටුවහල් කැර එවනු ලැබූ සරණංකර හිමියන්, ඒ වන විට ලංකාවේ වාමාංශික ව්‍යාපාරය සමඟ යම් සම්බන්ධකමක් ඇති කැර ගෙන තිබිණි. වාමාංශික ව්‍යාපාරය මේ වන විට ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයට විරුද්ධ ව නිරන්තර අරගලයක නිරත ව සිටියේ ය. එහෙත් ඇතැම් භික්ෂූන් වහන්සේලා ද බ්‍රිතාන්‍යයේ 6 වැනි ජෝර්ජ් රජතුමාටත් (1936-1952) ඔහුගේ පවුලේ සැමටත් සෙත් පතා ගුණ වර්ණනා කොට පින් අනුමෝදන් කිරීම සිරිතක් කොටගෙන තිබිණි. භික්ෂූන්ගේ මේ අධිරාජ්‍ය ගැති භාවය පිළිබඳ ව සරණංකර හිමියන් තුළ පැවැතියේ බරපතළ පිළිකුලක් හා කලකිරීමකි. ඇතැම් පින්කම් පොළවල දී බ්‍රිතාන්‍යයේ 6 වැනි ජෝර්ජ් රජුගේ ගුණ වර්ණනා කරන විට ඉන් නැඟිට ඉවත් ව යෑම සරණංකර හිමියන්ගේ ලක්ෂණයක් විය. සරණංකර හිමියන්ගේ මේ ක්‍රියාකලාපයෙන් කෝපයට පත් ඇතැම් භික්ෂූහු හා ගිහියෝ උන්වහන්සේට ඇනුම්පද කී හ. සරණංකර හිමියන් සමඟ කතා කිරීම, ඇසුරු කිරීම පවා තමන් අමාරුවේ වැටීමක් යැ යි සිතූ මේ පිරිස් උන්වහන්සේ යන-එන තැන් පිළිබඳ වත්, කරන-කියන දේ පිළිබඳ වත් රහස් පොලිසියට තොරතුරු සැපයූ හ. රටේ ස්වාධීනත්වය හා විමුක්තිය සඳහා සටන් කිරීමේ දී අධිරාජ්‍ය ගැති පිරිස්වලින් දින පතා ම එල්ල වූ මෙබඳු විවිධ විරුද්ධවාදීකම් සුළු-පටු නොවුණත්, ඒ කිසිවක් ගණන් නොගත් උන්වහන්සේ බෙහෙවින් ධෛර්යවන්ත ව අධිරාජ්‍ය විරෝධී බලවේග ශක්තිමත් කිරීමට විවිධ මං සෙවූ හ. මෙහි දී ඉන්දිය

නිදහස් අරගලයට එක් වෙමින් උන්වහන්සේ ලැබූ අත්දැකීම් හා උපක්‍රම බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

මේ වන විට රට තුළ ගොඩනැඟෙමින් පැවැති දේශපාලන සංසිද්ධි හා අධිරාජ්‍යවාදීන්ගේ හැසිරීම් පිළිබඳ ව දැඩි අවධානයකින් සිටි උඩකැන්දවල සිරි සරණංකර හිමියෝ, තම පැවිදි දිවියේ තවත් තීරණාත්මක තීන්දුවකට එළැඹුණහ. ඒ අධිරාජ්‍ය විරෝධී අරගලයේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමින් සිටි ලංකා සමසමාජ පක්ෂයේ සාමාජිකත්වය ගැනීමට යි. මේ වසරේ දී (1936) 'සමසමාජ' සහ 'තරුණ සමාජවාදියෝ' (Young Socialists) පුවත්පත් ආරම්භ වූ අතර, සරණංකර හිමියෝ තම අධිරාජ්‍ය විරෝධී අදහස් සමාජගත කිරීමට මේ පුවත්පත් ප්‍රයෝජනයට ගත්හ. මේ වන විට ආරියපාල ගුණසේන මහතාගේ සංස්කාරකත්වයෙන් ප්‍රකාශයට පත් වූ 'මගේ සඟරාව' (My Magazine) මාසික සංග්‍රහය (ලංකාවේ පළමුවැනි මාක්ස්වාදී සඟරාව) ප්‍රයෝජනයට ගනිමින් අධිරාජ්‍යවාදය දැඩි සේ විවේචනය කිරීමට සරණංකර හිමියන් පසුබට වූයේ නැත.

සරණංකර හිමියන් ලංකා සමසමාජ පක්ෂයට එකතු වීමට ගත් තීරණය එවකට සිටි අධිරාජ්‍ය ගැති බොහෝ දෙනකු මවිතයට පත් කරන සිද්ධියක් විය. සමසමාජ, කොමියුනිස්ට්කාරයන්ට ආගමක් දහමක් නැතැයි කියමින්, අධිරාජ්‍ය විරෝධී අරගලය වෙත ඇදී ආ නාගරික හා ග්‍රාමීය ජනතාව ඉන් ඈත් කිරීමට ඔවුහු විවිධ උත්සාහයන් ගත්හ. රට පුරා සිටි දූෂිතයන්, මංකොල්ලකරුවන් පොලිස් අත්අඩංගුවට පත් වූ විට ඔවුන් සමසමාජ ව්‍යාපාරයේ කොටස්කරුවන් යැ යි රට ඉදිරියේ ප්‍රසිද්ධ කරමින් සමසමාජ ව්‍යාපාරය ජනතාවගෙන් කොන් කිරීමට අධිරාජ්‍ය ගැති පොලිසිය එදා කටයුතු කෙළේ ය. මේ අධිරාජ්‍ය ගැති වැඩ පිළිවෙළ ඔස්සේ ජීවත් වූ බෞද්ධ භික්ෂූන් හා ක්‍රිස්තියානි පූජකවරුන් ධර්ම දේශනාවල දී පවා සමසමාජ ව්‍යාපාරයට එරෙහි ව බොරු ප්‍රචාර පතුරවන්නට පටන්ගත් අවස්ථා එමට ය. "මේ සමසමාජකාරයන් සමඟ බෞද්ධ භික්ෂූන් එක් වී අපේ රජතුමාට විරුද්ධ ව කටයුතු කරන බව" කියමින් ඇතැම් අධිරාජ්‍යවාදී ගැත්තෝ සරණංකර හිමියන්ට දොස් නැඟූ හ; අපහාස කළහ; මාක්ස්වාදියකු නිසා උන්වහන්සේට



වෛර කළහ. මෙහි දී සරණංකර හිමියෝ තවත් ධෛර්යයෙන් යුතු ව සමසමාජ රැස්වීම්වලට දිගින් දිගට ම සහභාගි වූ හ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට විරුද්ධ ව උන්වහන්සේ කථා කළ ඇතැම් රැස්වීම් පොළවල ගැටුම් පවා ඇති විය. විශේෂයෙන් කොළොන්නාව, නාත්තණ්ඩිය, හෝමාගම, බුලත්කොහුපිටිය, යාපනය ආදි ප්‍රදේශවල දී ලේ සෙලවුණු දරුණු ගැටුම් ඇති වූ අතර, ඒ ගැටුම් පිටුපස සිටියේ අධිරාජ්‍යවාදීන්ගේ අතකොළු බවට පත් වූ පිරිස් ය.

මේ අතර කාලයේ දිනක සරණංකර හිමියන් දත් වළඳමින් සිටින විට ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා යන මහත්වරු හදිසියේ ම කොස්පිල්ලෑව පන්සලට පැමිණ, මීරිගම ප්‍රදේශයේ රැස්වීමක් පැවැත්වෙන බවත්, එහි කලබලයක් ඇති විය හැකි බැවින් එහි ගිය හොත් ඉතා වැදගත් බවත් උන්වහන්සේට දැන්වූ හ. සරණංකර හිමියෝ වහා කොල්වින් හා ඇන්. ඇම්. සමඟ රැස්වීම් පොළට පිටත් වූ හ. මීරිගම ලෝලුවාගොඩ පොල් මෝලේ වැඩ වර්ජනයක් සම්බන්ධ ව මෙම රැස්වීම පැවැත්විණි. මේ රැස්වීම කඩාකප්පල් කිරීමට ඩී. ඇස්. සේනානායක මහතාගේ මඟ පෙන්වීමත්, උසිගැන්වීමත් යටතේ අධිරාජ්‍ය ගැති පිරිස් රැස් ව සිටියහ. සමසමාජකාරයන් මීරිගම පන්සල කඩාදැමීමට පැමිණෙන බවට පැතිර ගිය ප්‍රචාරයත් සමඟ කිපුණු ප්‍රදේශවාසීහු කැති හා ගල්මුගුරු අතැති ව පැමිණ සිටියේ පන්සල කඩා දැමීමට එන පිරිස්වලට මුහුණ දීම සඳහා ය. මෙම රැස්වීම පැවැත්වෙන ස්ථානයට ඇන්.ඇම්. හා කොල්වින් සමඟ සරණංකර හිමියන් පැමිණෙන බව දුටු ප්‍රදේශවාසීහු මහත් පුදුමයට පත් ව මුහුණින් මුහුණ බලාගත්හ; තවත් සමහරු ආඩපාලි කියන්නට වූ හ. කිසිවක් නෑසුණු සේ පිරිස් අතරින් ගමන් කළ සරණංකර හිමියෝ අසුනක වාඩි වී, "දැන් කවුරුත් පන්සිල් සමාදන් වීම සඳහා නමස්කාරය කියන්නැ" යි ප්‍රකාශ කළහ. ප්‍රදේශවාසීහු ගල්ගැසී බලා සිටිහ. උන්වහන්සේ යළිත් එසේ කී හ. සමසමාජකාරයන්ට පහර දීමට පැමිණ සිටි පිරිස් තමන් අත තිබුණු කැති හා ගල්මුගුරු බිමට දමා, දෑත් ඔසවා නමස්කාරය කියන්නට පටන් ගත්හ. ඉන් අනතුරු ව නැඟී සිටි සරණංකර හිමියෝ දේශනයක් කිරීමට පටන් ගත් හ. මෙහි දී

උන්වහන්සේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් හා ඔවුන්ගේ ගැත්තන් මේ රටේ අහිංසක දුප්පත් ජනතාව රවටමින්, රටේ සාරය උරා බොන හැටිත්, ඊට විරුද්ධ ව සටන් කරන අයට පහර දීමට දුප්පතුන් ම යොදා ගන්නා හැටිත් පැහැදිලි කළ අතර, සමාජවාදී පාලන ක්‍රමයක් රට තුළ ගොඩනැඟීමෙන් මේ ප්‍රශ්නවලට විසඳුම් ලබාගත හැකි බව රැස් ව සිටි ප්‍රදේශවාසීනට පෙන්වා දුන්හ. සරණංකර හිමියන්ගේ දේශනයෙන් පසු ඇන්.ඇම්. හා කොල්වින් ද ජනතාව අමතා කතා කළහ. රැස්වීම අවසානයේ සියලු දෙනා සමසමාජ අදහස් පිළිගත් අතර, ඇතැමෙක් දේශපාලන පතපොත ගෙන දෙන ලෙස සරණංකර හිමියන්ට වැඳ නමස්කාර කැර ඉල්ලීමක් ද කළෝ ය. මේ කාල වකවානුවේ සමසමාජ පක්ෂය සංවිධානය කළ සැම රැස්වීමකට ම සහභාගි වීම සරණංකර හිමියන්ගේ පුරුද්දක් වී තිබිණි. විශේෂයෙන් එම පක්ෂයේ ප්‍රධාන කථිකයකු වශයෙන් උන්වහන්සේ කළ-කී දෑ බොහෝ ය. සැම රැස්වීමක් ම පටන් ගැනීමට පෙර පන්සිල් දීම සරණංකර හිමියන්ගේ සිරිතක් විය. ඉන් අනතුරු ව රැස්වීම අමතන සරණංකර හිමියන්, ජනතාව තමන් වෙත ග්‍රහණය කැර ගැනීමට ඉතා වේගයෙන් කථා කළ අවස්ථා එමට ය. නිදසුනක් වශයෙන් 1936 එක්තරා දිනක ගාලු මුවදොර පිටියේ පැවැති රැස්වීමක දී ඉතා වේගවත් කථාවක් කළ උන්වහන්සේ මෙසේ කියා ඇති බව 1947 'නවලෝකය' නොවැම්බර් කලාපයේ පළ වී ඇතඃ "නඩුකාරවරයාගේ ගෙයි වහලය උඩ රතු කොඩියක් ඔසවන කාලය එතරම් ඈත නො වේ."

1937 දී 'සමසමාජ ක්‍රමය ලංකාවට වුවමනා ද?' යනුවෙන් සරණංකර හිමියන් කුඩා පොත් පිංචක් මුද්‍රණය කැර බෙදාහැරියේ, අධිරාජ්‍ය විරෝධී අරගලයේ නියැළී සිටි ජනතාවගේ දැනුම වර්ධනය කිරීමත්, එය මුවහත් කිරීමත් සඳහා ය. මේ පොතට පෙරවදනක් ලියූ ලෙස්ලි ගුණවර්ධන මහතා මෙසේ සඳහන් කැර ඇතඃ "අධිරාජ්‍ය ක්‍රමය ලාංකිකයන් වහල් භාවයේ තබා ඔවුන්ගේ පැරැණි ශිෂ්ටාචාරය නැති කෙළේ ය. ධනේශ්වර ක්‍රමය ලාංකිකයන් වැඩි කොටසක් අතරේ දිළිඳුකම හා රක්ෂා නැතිකම පතුරුවා හරින්නේ ය. අධිරාජ්‍ය ධනේශ්වර ක්‍රමය නැති කළ හැක්කේ එම ක්‍රමය නිසා අමාරුවට පත් වී සිටින සියලු දෙනාගේ



ම සමඟි බලයෙන් පමණෙකි. මේ සමඟි බලය ඇති කිරීමටත්, ලක්වැසියාට සැබෑ නිදහසක් ලබාදීමටත් තිබෙන එක ම මාර්ගය සමසමාජ ක්‍රමය වේ" (සරණංකර, පි.172).

මේ පොත මුද්‍රණය කැර බෙදාහැරීමෙන් පසු ජනතාව අතර මහත් ආන්දෝලනයක් ඇති වූයේ ය. අධිරාජ්‍ය ගැති පිරිස් කුපිත වී සරණංකර හිමියන්ට අපහාස කිරීමට පටන් ගත්හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් 'සමසමාජ ප්‍රලාපය' නමින් 'සිංහල ජාතිය' පුවත්පතට ලිපි පෙළක් ලියූ ප්‍රකට ලේඛක පියදාස සිරිසේන මහතා, සරණංකර හිමියන් 'කැන්දකොළයා' නමින් හඳුන්වා අපහාසයට ලක් කෙළේ ය. එයින් නොනැවතුණු හෙතෙම ඒ ලිපි එකතු කැර පොතක් වශයෙන් මුද්‍රණය කොට රට පුරා බෙදා හැරියේ ය. එම පොතේ පෙරවදනේ මෙසේ ද සඳහන් ව ඇතඃ

"කොමියුනිස්ට් ප්‍රලාපය" නැමැති මේ පොත ලියන්න වුවමනා වූයේ උඩකැන්දවල සිරි සරණංකර නැමැති උන්නාස්සේ කෙනෙකු විසින් ලියන ලද 'සමසමාජ ක්‍රමය ලංකාවට වුවමනා ද?' යන පොත් පිංච නිෂ්ප්‍රභා කිරීමටය. 'සමසමාජය' යයි මොවුන් කියන්නේ 'කොමියුනිස්ට්' නැමැති උච්ඡේදවාදයටය. ලෝකයේ පවත්නා සියලු ආගම් 'සාස්වත - උච්ඡේද - විභජ්ජ' යන තුනට බෙදේ. සාස්වත නම් සදාකාලික ආත්මයක් තිබෙනවයි කියන, දෙවියකු මුල් කොට ගන්නා ආගමයි. කොමියුනිස්ට් කියන උච්ඡේදවාදය වනාහි පෙර උත්පත්තියක්වත්, මරණින් පසු උත්පත්තියක්වත් නැතැයි කියන මිථ්‍යාවයි. විභජ්ජවාදය යනු මේ දෙකෙන් වෙනස් වූ උත්තම ධර්මයයි" (සරණංකර, පි.176).

මේ කාලය වන විට සමසමාජ ව්‍යාපාරය ජනතාව අතර ජනප්‍රිය ව පැවති අතර, ඊට විරුද්ධ ව ප්‍රබල ව්‍යාපාරයක් රට තුළ ගොඩනැඟී තිබිණි. විශේෂයෙන් ලංකාවේ නිදහස වෙනුවෙන් කථා කළ, නිදහස පිළිබඳ ලිපි ලියූ බොහෝ දෙනා කාලයාගේ ඇවෑමෙන් අධිරාජ්‍ය ගැති ධනපති පන්තියෙන් පඩි ලබන පුද්ගලයන් බවට පත් වූ හ. ඒ අතර ජාතික වීරයකු වශයෙන් පෙනී සිටි පියදාස සිරිසේන මහතා ද විය. අධිරාජ්‍යවාදයට එරෙහි ව එදා රට තුළ ගොඩනැඟෙමින් ආ ප්‍රගතිශීලී ජනමතයට පහර දීම සඳහා ආරම්භ කරන ලද 'වීරයා', 'සිංහල හඬ' ආදි

පුවත්පත්වල කතුවරයා වූයේ පියදාස සිරිසේන මහතා ය. මෙම පුවත්පත්වලට මුදල් වැය කරමින් එය පවත්වාගෙන යෑම සඳහා ඩී. බී. ජයතිලක, ඩී. ඇස්. සේනානායක හා ජේ. එල්. කොතලාවල වැනි අධිරාජ්‍ය ගැති නායකයන් පෙරමුණ ගත් බව මෙහි දී සඳහන් කළ යුතු ය.

පියදාස සිරිසේන මහතා වැනි දේශ හිතෛෂීන් පසු කලක ධනපති අධිරාජ්‍යවාදීන්ගේ අතකොළු බවට පත් වීම ගැන සරණංකර හිමියන් තුළ පැවතියේ කලකිරීමකි; එමෙන් ම දුකකි.

"මා පවා මුල දී දේශප්‍රේමී හැඟීම්වලින් පිබිදුණේ සිරිසේන මහතාගේ 'සිංහල ජාතිය' පත්‍රය කියවීමෙනි. ළපටි වියේ පටන් මම ඔහුගේ පත්‍රයට ලියුම් ලීවෙමි. මා මුල දී ලියූ ලියුම් වැරැදි හරිගස්සා පත්‍රයේ පළ කොට මට මහත් ධෛර්යයක් දුන්නේ පියදාස සිරිසේන මහතා ය. සිරිසේන මහතා වැන්නවුන් පුරෝගාමී ව ඇරඹූ වර්තමාන ජාතික ප්‍රබෝධයෙන් පිබිදුණු අප වැන්නවුන්ට ඔහු ලවා ම පහර ගැසීමට තරම් ධනවාදීනට පුළුවන්කම ලැබුණේ, ඔහු ආර්ථික අතින් පිරිහී සිටි නිසා ය. ආර්ථික පරිහානියේ ප්‍රතිඵලයක් වශයෙන් මා වැන්නවුන්ට පහර ගසමින් ජීවත් වීමට සිදු වූ පියදාස සිරිසේන මහතා ගැන මා තුළ ද්වේෂයක් නැත" (සරණංකර, පි.177-178) යනුවෙන් සරණංකර හිමියන් සිය ස්වයං ලිඛිත චරිතාපදානයේ සඳහන් කැර ඇත.

## 1. ට්‍රොට්ස්කිවාදය වැලඳගැනීම සහ සමසමාජ පක්ෂයෙන් කොමියුනිස්ට්වාදීන් නෙරපීම

තුන් වැනි ජාත්‍යන්තරය ස්ටාලින්ගේ මෙහෙයුම යටතේ ලෝක විප්ලවය නොතකා කටයුතු කරන බැවින්, එය කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි යැ යි ප්‍රකාශ කළ ට්‍රොට්ස්කි ලෝක විප්ලවයට නව නායකත්වයක් දීමේ අරමුණින් 1938 දී හතර වැනි ජාත්‍යන්තර සභාව පිහිටුවූයේ ය. මේ පසුබිම හේතු කොටගෙන ට්‍රොට්ස්කි-ස්ටාලින් මතභේද ලොව පුරා ඇති සමාජවාදී පක්ෂවලට දැඩි සේ බලපෑවේ ඉන් පසු ව ය. මේ කාල වකවානුවේ සමසමාජ පක්ෂයේ නායකත්වයේ සිටි ඇතැමුන් ට්‍රොට්ස්කිවාදී අදහස් අනුගමනය කිරීම නිසා එම පක්ෂය තුළ නිරන්තර වාද-



විවාද ඇති විය. විශේෂයෙන් සමසමාජ පක්ෂ මධ්‍යම කාරක සභාව තුළ නිසි පරිදි මතභේදයට තුඩු දෙන කාරණාකාරණා සාකච්ඡා වීමට ඉඩ නොදී, තුන් වැනි ජාත්‍යන්තරය කෙරෙහි විශ්වාසය නොතබන බව සඳහන් වන යෝජනාවක් සම්මත කැර ගත්තේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ 1939 වසරේ අවසානයේ සමසමාජ පක්ෂයේ පළමු බෙදීමට අඩිතාලම වැටීම යි.

සම්මත කැරගත් එම යෝජනාවට විරුද්ධ ව ඍජු ලෙස පෙනී සිටි දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ, ඇම්. ජී. මැන්ඩිස්, ඒ. ගුණසේකර, ඩබ්ලිව්. ආරියරත්න, කේ. රාමනාදන් යන මධ්‍යම කාරක සභිකයෝ 1940 අප්‍රේල් 18 වැනිදා සමසමාජ පක්ෂයෙන් නෙරපාදමනු ලැබූ හ. සමසමාජ පක්ෂයේ මෙම බෙදීමට ප්‍රධාන හේතුව වූයේ ප්‍රතිපත්ති හා උපාය මාර්ග සම්බන්ධ ප්‍රශ්නයක් නො ව, වෙනත් මවාගත් හේතුවක් බව පැහැදිලි සත්‍යයකි. වාම දේශපාලනය සහ කම්කරු පන්ති ව්‍යාපාරය කෙරෙහි මේ බෙදීම අනර්ථකාරී ලෙස බලපෑ අතර, අවුල් සහගත සිදුවීම් රැසකට ඉන් මඟ පෑදුණේ ය.

සමසමාජ පක්ෂය, මධ්‍යම කාරක සභිකයන් පස් දෙනකු නෙරපීම ඒකාධිපති ප්‍රතිපත්තියක් බව ප්‍රකාශ කරමින්, ඊට විරුද්ධ ව පෙනී සිටි උඩකැන්දවල සිරි සරණංකර හිමියන් සමඟ ඊ. එස්. රත්නවීර, ඒ. වෛද්‍යලිංගම්, ටී. දුරේසිංහම් හා ඩී. පී. යසෝදිස් ද නෙරපනු ලැබූ හ. මධ්‍යම කාරක සභාවෙන් නෙරපූවවුන් ආපසු ගන්නා ලෙස ද, විශේෂ සම්මේලනයක් පවත්වා එහි දී මේ ප්‍රශ්න සාකච්ඡා කරන ලෙස ද ඉල්ලා සිටියාහු ද පක්ෂයෙන් නෙරපාදමුණහ. සමහරු නෙරපීමට පෙර ඉල්ලා අස් වූ හ. ටික දිනකට පසු කේ. රාමනාදන්, අයි. ඇම්. ඊබ්‍රාහිම්, එස්. පී. අමරසිංහම්, ඕ. සී. රිචඩ් සිල්වා සහ කේ. සිරිරත්න ද පක්ෂයෙන් නෙරපාදමුණු බව ප්‍රකාශයට පත් කැරිණි. ට්‍රොට්ස්කිවාදය වැලඳ ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලාංකික වමේ ව්‍යාපාරය මෙසේ භේද-භින්න වූ බව ප්‍රකට කරුණකි. විශේෂයෙන් සෝවියට් සංගමයේ (එවකට) නායකත්වය යටතේ ගෙන යන නිදහස හා සමාජවාදය සඳහා වූ ව්‍යාපාරයට ට්‍රොට්ස්කිවාදීන් ප්‍රසිද්ධියේ ම විරුද්ධ වන තත්ත්වයක් ප්‍රදර්ශනය විය.

ලංකාවේ කම්කරුවන් අතර, එදා ඉන්දීය කම්කරුවෝ ද වූ හ. ඉන්දියාව තුළ, ඉන්දීය කම්කරු පන්තිය නිදහස් කැර ගැනීම සඳහා සටන් කළ යුතු යැ යි ලංකා සමසමාජ පක්ෂය තීරණයකට එළැඹිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1942 දී පැරණි 'ලංකා සමසමාජ පක්ෂය' විසුරුවා හැර, 'ඉන්දියානු බෝල්ෂේවික් ලෙනිනිස්ට් පක්ෂය' ආරම්භ කරනු ලැබී ය. එහෙත් වැඩිකලක් යෑමට පෙර එම පක්ෂය (ඉන්දියානු බෝල්ෂේවික් ලෙනිනිස්ට් පක්ෂය) තුළ ද අර්බුද මතු වී, කැඩී-බිඳී ගියේ ය. ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතාගේ නායකත්වය යටතේ නැවතත් 'ලංකා සමසමාජ පක්ෂය' පිහිටුවනු ලැබූ අතර, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතාගේ නායකත්වය පිළිගනිමින් සිටි පිරිස් ද ලංකා සමසමාජ පක්ෂයට යළි එකතු වන්නට වූ හ.

## 2. ලංකා කොමියුනිස්ට් පක්ෂය පිහිටුවා ගැනීම

මේ අන්දමින් සමසමාජ පක්ෂයෙන් නෙරපනු ලැබූ දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ, ඇම්. ජී. මැන්ඩිස්, උඩකැන්දවල සිරි සරණංකර හිමි, ඒ. වෛද්‍යලිංගම්, ඩබ්ලිව්. ආරියරත්න, ටී. දුරෙයිසිංහම්, ඩී. පී. යසෝදිස් හා කේ. රාමනාදන් යන කොමියුනිස්ට්වාදීහු "1940 මුල් හරියේ දී කොළඹ, 'කම්කරු සමාජය' පිහිටුවූ හ. එහි කාර්යාලය පිහිටියේ කොළඹ උසාවිය පාරේ අංක 61 දරන ස්ථානයේ හා පසු ව විල්සන් වීදියේ, අංක 37 දරන ස්ථානයේ ය" (ලංකා වෘත්තීය සමිති සම්මේලනය, 1966 : පි.11). මේ පිරිස පිහිටුවා ගත් කොළඹ කම්කරු සමාජය කම්කරුවන් අතර වැඩ කරමින්, සංවිධාන ගොඩනැංවී ය. වැඩි කලක් යෑමට මත්තෙන් කම්කරු සමාජය විසුරුවා හැර, 1940 නොවැම්බර් 13 වැනි දා මේ වෘත්තීය සමිති නායකයෝ 'එක්සත් සමාජවාදී පක්ෂය' පිහිටුවා ගැනීමට මුල පිරූ හ. ඒ අනුව පැලියගොඩ දී රහසිගත සම්මේලනයක් පවත්වා මෙම පක්ෂය පිහිටුවා ගත් අතර, එය ලංකාවේ පිහිටුවන ලද දෙවැනි මාක්ස්වාදී පක්ෂය විය. ලංකාවේ සිටි මලයාලි කම්කරුවන්ගේ සහායත්, ලංකා කම්කරු සමිතිවල සහායත් ඇති ව ගොඩනැඟුණු 'එක්සත් සමාජවාදී පක්ෂය' බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට එරෙහි වත්, ඔවුන්ට ගැතිකම් කරන කොම්පැනිවලට එරෙහි වත් රට පුරා සිටින ජන කොටස් විධිමත්



ව ඒකරාශි කොට සංවිධාන ගත කිරීමට පටන් ගත්තේ ය. එහෙත් ඒ වන විට රට තුළ ජාතිවාදී ප්‍රවණතා බහුල ව තිබීමත්, වර්ජනය කරන කම්කරුවන්ට ධනපති ගැත්තන් ලවා පහර දීම් වැනි ක්‍රියා බහුල වීමත් නිසා වෘත්තීය සමිති ගොඩනැඟීම වඩාත් දුෂ්කර විය. මේ සියලු දුෂ්කරතා විඳ-දරාගත් මේ පිරිස ලංකා වතු කම්කරු සමිති ආරම්භ කරමින්, වතුකරයේ වෘත්තීය අරගල ශක්තිමත් කිරීමට පියවර ගත්හ. මේ පසුබිම පිළිබඳ ව අවධානයෙන් සිටි අධිරාජ්‍යවාදීහු වෘත්තීය සමිතිවලට නීති පැනවීමට පියවර ගත්හ. ඒ අනුව අවසර නොමැති ව වතුවලට ඇතුළු වී, කම්කරුවන් සමඟ සබඳකම් ගොඩනගා ගැනීමට බාහිර පුද්ගලයන්ට ඉඩ ලබා නොදෙන 'ට්‍රෙස්පස් නීතිය' බල ගැන්වූවා පමණක් නො ව, මාස 18ක් ඉක්මවා යන්නට පෙර 'එක්සත් සමාජවාදී පක්ෂය' ආරක්ෂක නීතිය යටතේ තහනමට ලක් කැරිණි. 'එක්සත් සමාජවාදී පක්ෂය' තහනමට ලක් කැර, ඉන් නොනැවැතුණ බ්‍රිතාන්‍ය පාලකයෝ කොමියුනිස්ට්වරුන් ප්‍රමුඛ ප්‍රගතිශීලීන් ගෙන ගිය සටන දිගින් දිගට ම මැඬපැවැත්වීමට කටයුතු කළහ. එහි ප්‍රතිඵලයක් හැටියට මුල්ඔය සිද්ධියේ දී පොලිස් වෙඩි පහරින් ගෝවින්දන් නමැති වතු කම්කරුවා මිය ගියේ ය. වතු කම්කරු අරගලයක දී මිය ගිය ප්‍රථම කම්කරුවා වූයේ මොහු ය. මේ සිද්ධියත් සමඟ ම එවකට සිටි බ්‍රිතාන්‍යයට පක්ෂපාත ඇමැතිවරුන් ඉල්ලා අස් වන තැනට රට තුළ විශාල ආන්දෝලනයක් ඇති වූයේ ය. බ්‍රිතාන්‍ය ගැති පොලිස් වෙඩි පහරින් ගෝවින්දන් මරණයට පත් වීමත්, තවත් වතු කම්කරුවකු වූ පෙරියසාමි පොලිස් රියකට යට කැර මරණයට පත් කිරීමත් සමඟ ම වතු කම්කරුවන් අතර පමණක් නො ව, මුළු රට පුරා ම ජනතා අවධානය ඒ වෙත යොමු කරවීමට කොමියුනිස්ට්වරුන් මෙන් ම, සමසමාජ පාක්ෂිකයෝ ද සමත් වූ හ. වතුකරයේ තිබූ වෘත්තීය සමිති මේ ප්‍රධාන දේශපාලන බලවේග දෙක වටා රොක් වෙමින්, වර්ජන, උද්ඝෝෂණ දිගින් දිගට ම දියත් කෙළේ ය. වතු කම්කරුවන් මෙල්ල කැර මර්දනය කිරීම ඒ තරම් පහසු කාර්යයක් නොවන බව දැනගත් පාලකයෝ ඒ බව සැලකිල්ලට ගෙන, ඉතිහාසයේ මුල් වතාවට වතු කම්කරු ප්‍රශ්නයක් වෙනුවෙන් වෘත්තීය සමිතිවලට සාකච්ඡා ලබා දීමට එකඟ වූ හ.

එහෙත් මේ වන විට රටේ ආර්ථිකය ශීඝ්‍ර ලෙස පිරිහීමට ලක් ව තිබිණි. විශේෂයෙන් දෙවැනි ලෝක යුද්ධය හේතු කොටගෙන රටේ ජීවන වියදම වැඩි වූ අතර, ජනයාට විඳීමට සිදු වූ දුෂ්කරතා ප්‍රමාණය සුළු-පටු නො වී ය. රැකී-රක්ෂා හිඟ වීම ප්‍රධාන ගැටලුවක් විය. කොළඹ ඇතැම් ව්‍යාපාරික ස්ථාන තම සේවකයන්ගෙන් කොටසක් සේවයෙන් පහ කිරීම නිසා රැකියා හිඟය උග්‍ර ප්‍රශ්නයක් බවට පත් වූයේ ය.

වැඩි වන ජීවන වියදම නිසා මහජනයාට විඳීමට සිදු වූ දුෂ්කරතා 1940 නොවැම්බර් මස රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දී ද සාකච්ඡා විය. රාජ්‍ය සේවකයන්ගේ වේතනය වැඩි කිරීමට රාජ්‍ය මන්ත්‍රණ සභාවට යෝජනා පැමිණියත්, පෞද්ගලික ආයතනවල සේවකයන්ගේ වේතනයන් වැඩි කිරීමට පිළිවෙළක් නො විණි. මේ නිසා කම්කරුවන්ට විවිධ දුෂ්කරතාවලට ලක් වීමට සිදු විය. ඒ දුෂ්කරතාවලින් වැඩ කරන ජනතාව (පොදුවේ රටවැසියන්) බේරා ගැනීම සඳහා කොමියුනිස්ට්වරු පෙරමුණ ගත්හ.

මේ කාලසීමාව තුළ පැරණි ප්‍රතිපත්ති මුළුමනින් ම අතහැර දැමූ කොමියුනිස්ට්වාදීහු, ලබාගත් අත්දැකීම් සැලකිල්ලට ගනිමින්, අධිරාජ්‍යවාදීන්ගේ තර්ජනවලට මුහුණ දෙමින්, කම්කරු පන්තිය සූදානම් කළහ. උඩකැන්දවල සිරි සරණංකර හිමියෝ මේ කටයුත්තේ දී ක්‍රියාකාරී දායකත්වයක් සැපයූහ. මෙහි ප්‍රතිඵලයක් වූයේ කොමියුනිස්ට්වාදීන් තම නායකත්වයෙන් පැවැති සියලු වෘත්තීය සමිති ඒකාබද්ධ කැර 1940 දෙසැම්බර් මස එක් සැන්දෑවක 'ලංකා කම්කරු සමිති සම්මේලනය' ආරම්භ කිරීම ය. කොම්පඤ්ඤවීදියේ අබලන් ගරාජයකට රැස් වුණු අධිරාජ්‍ය විරෝධී වෘත්තීය සමිති නායකයෝ එම සියලු සමිති එක් සම්මේලනයකට අනුබද්ධ කිරීමට තීරණය කළහ. මේ තීරණය ප්‍රකාර ව එකල පැවැති සමිතිවල නියෝජිතයෝ 1940 දෙසැම්බර් 22 වැනි දින රාත්‍රියේ කොළඹ යූනියන් පෙදෙසේ අංක 211 දරන ස්ථානයට රැස් ව, ලංකා කම්කරු සමිති සම්මේලනය විධිමත් ලෙසින් ගොඩනඟා ගෙන ක්‍රියාත්මක කළෝ ය.

ඒ අනුව මේ රැස්වීමට සහභාගි වූ සමිතිවල නියෝජිතයෝ ලංකා කම්කරු සමිති සම්මේලනයේ ප්‍රථම නිලධාරීන් වශයෙන් තෝරා පත් කැර ගැනුණහ. "ලංකා කම්කරු සමිති සංවිධානය



කිරීමෙහි ලා මුල් තැන ගත් අය අතර ඇම්. ජී. මැන්ඩිස්, ඩබ්ලිව්. ආරියරත්න, ඒ. වෛද්‍යලිංගම්, ඩී. පී. යසෝදිස්, පී. ශන්කර්, ලයනල් කුලතුංග, කේ. රාමනාදන්, ටී. ඩබ්ලිව්. පේදිරිස්හාමි, පී. කන්දයියා හා බී. එච්. පීරිස් වූ හ. සරණංකර හිමියෝ ප්‍රථම රැස්වීමේ මූලාසනය ගත්හ" (ලංකා වෘත්තීය සමිති සම්මේලනය, 1966 : පි.14).

භූමිතෙල් ලාම්පු එළියෙන් බෙහෙවින් රහසිගත ව ඇරැඹි මෙම රැස්වීමේ මුලසුනේ කතාව පවත්වමින් උඩකැන්දවල සිරි සරණංකර හිමියන් මෙසේ පවසා ඇතඃ

"මේ සංවිධානය අද අප මේ අඳුරු ගුහාවේ දී අඳුරු ලාම්පු කුප්පියක එළියෙන් රහසිගත ව ඇරැඹුව ද, මෙය අනාගත ලෝකයේ ප්‍රබල කම්කරු සමිතියක් වී මේ ලාංකික කම්කරු පන්තිය ලෝක කම්කරුවන් සමඟ සටන් කරන මහ කම්කරු බලවේගයක් වනවා ඇත" (සරණංකර, පි.186). සරණංකර හිමියන්ගේ මේ ප්‍රකාශය සමාජයේ යථාර්ථයක් වීමට වැඩි කලක් ගත වූයේ නැත. පසු කලක 'ලංකා වෘත්තීය සමිති සම්මේලනය' නමින් ප්‍රකට වූයේ මේ සම්මේලනය බව කිව යුතු ව ඇති කරුණකි. සරණංකර හිමියෝ කම්කරුවන් අතර පමණක් නො ව, ගොවීන් අතර ද ජනප්‍රිය වූ හ. ඒ අන් කිසිවක් නිසා නො ව, ගොවි සංවිධාන රට පුරා පිහිටුවීමට මුල් වීම හේතුවෙනි. 1941 'ලංකා ගොවි සම්මේලනය' පිහිටුවීමට ද මූලිකත්වය ගත් සරණංකර හිමියෝ දක්ෂිණ 'ලංකා ගොවි සම්මේලනය' පිහිටුවීමේ දීත් පෙරමුණ ගත් හ.

වෘත්තීය සමිති කටයුතුවලට සමාන්තර ව දේශපාලන පක්ෂයක් පිහිටුවීමට තීරණය කළ ඔවුහු, 1943 ජූලි මස 2-3 දිනවල බොරැල්ලේ, කෝට්ටේ පාරේ, අංක 85 දරන ස්ථානයේ දී රහසිගත සම්මේලනයක් පවත්වා, අධිරාජ්‍යවාදීන්ගේ තහනමට ලක් ව තිබුණු 'එක්සත් සමාජවාදී පක්ෂය' විසුරුවා හැර, 'ලංකා කොමියුනිස්ට් පක්ෂය' පිහිටුවා ගත්හ.

මේ ලෙස පිහිටුවා ගත් කොමියුනිස්ට් පක්ෂයේ මූලික පරමාර්ථය වූයේ 'සමාජවාදී ලංකාවක්' ඇති කිරීම යි; ඒ සඳහා සංවිධාන ශක්තිමත් කරමින් පෙරමුණ ගැනීම යි.

## පාදක සටහන්

1. සිරි සරණංකර හිමි, උඩකැන්දවල, 'සටනක සටහන්', කොළඹ, මහජන ප්‍රකාශකයෝ.
2. එම.
3. එම.
4. ලංකා වෘත්තීය සමිති සම්මේලනය, (1966), 'ලංකා වෘත්තීය සමිති සම්මේලනය හා කම්කරු පන්ති ව්‍යාපාරය', කොළඹ, මරදානේ ගුණරත්න සමාගම.
5. එම.
6. සිරි සරණංකර හිමි, උඩකැන්දවල, 'සටනක සටහන්', කොළඹ, මහජන ප්‍රකාශකයෝ.

තුන් වැනි පරිච්ඡේදය

# ශ්‍රී ලංකාවේ වාමාංශික දේශපාලනයේ සන්නිවේදනය

බ්‍රිතාන්‍ය රාජාණ්ඩු ක්‍රමය යටතේ ශ්‍රී ලාංකිකයන් බහුතරයක් ආර්ථික, සමාජීය, දේශපාලන හා සංස්කෘතික වශයෙන් පීඩාවට පත් වූ බව ප්‍රකට කාරණයකි. මේ බහුතර ජනතාව ඉන් මුදාගැනීම සඳහා වාමාංශික ව්‍යාපාරයේ පුරෝගාමීහු විවිධ ක්‍රමවේදයන් අනුගමනය කළ හ. එහෙත් මෙරට සිටි ධනපති පන්තියෙන් එල්ල වූ විවිධාකාර බලපෑම් මෙහි දී සුළු කොට තැකිය නොහැකි ය. විශේෂයෙන් "ගුණසිංහගේ ප්‍රථම මැයි දින පෙළපාලියේ ගෙන ගිය ධජ පතාකවල සඳහන් වූයේ ද, ජාතිය රකිමු, උත්සාහ වඩමු, රාජපාක්ෂික වෙමු, ලක් මව රකිමු" යනාදි පාඨ ය. ඔහුගේ 'වීරයා' පත්‍රයේ කතුවැකියකින් "දුප්පතුන් දේශපාලනයට ඈඳා ගැනීම අනවශ්‍ය බව" කියා තිබිණි. ආණ්ඩු යන්ත්‍රණයේ සියලු කටයුතු සිදු වූණේ ඉංග්‍රීසි භාෂාවෙනි. පොලීසියේ හා පහළ උසාවිවල කටයුතු ද එසේ ම විය. ගම්බද පෙදෙස් මුදලිවරුන්, මුහන්දිරම්වරුන් සහ ගම්මුලාදෑනියන් යටතේ අර්ධ වැඩවසම් පිළිවෙත් අනුව පාලනය කරනු ලැබීම ද සාමාන්‍ය ජනයා මහත් හිරිහැරයට පත් කෙළේ ය. ග්‍රාමීය වශයෙන් කුල පීඩනය උග්‍ර විය. ඇතැම් කුලවල ස්ත්‍රීන්ට පවා උඩු කය වැස්ම චාරිත්‍රානුකූල ව තහනම් වී තිබිණි. ඔවුන්ගේ දරුවෝ පාසල්වලට ද වැද්ද ගනු නොලැබූ හ" (සරත්, 2000 : පි.7). මෙවැනි සමාජ පසුබිමක් ඉදිරියේ ස්වකීය අරමුණු සහ දේශපාලන දෘෂ්ටිය ජනතාව අතරට ගෙන යෑම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සොයා බැලීම ශ්‍රී ලාංකික වාමාංශික දේශපාලන ව්‍යාපාරයේ ප්‍රධාන අභියෝග යක් විය. විශේෂයෙන් මේ වන විට අධිරාජ්‍ය ආණ්ඩු සහ බලධාරීන් කෙරෙහි ජනතාව තුළ පවතින බිය තුරන් කැර, ඔවුන් තම ප්‍රජාතන්ත්‍රවාදී සහ මානුෂික අයිතීන් දිනා ගැනීමට උනන්දු කරවීම හා ජාතික නිදහස් සටන් ප්‍රාණවත් කිරීම දේශපාලන පුරෝගාමීන්ගේ න්‍යාය පත්‍රයේ ප්‍රමුඛ ම කාර්යයක් විය. ඒ

වෙනුවෙන් ප්‍රචාරක රැස්වීම්, සම්මේලන පවත්වනු ලැබූ අතර, "ලංකාවට සම්පූර්ණ නිදහස දෙනු", "කොමිශන් ප්‍රෝඩාව එපා", "අධිරාජ්‍යවාදීන් ලංකාවෙන් පිට වෙනු", "පැසිස්ට්වාදය භංග වේ වා", "සමාජවාදයට ජය වේ වා" ආදි සටන් පාඨ සහිත වර්ණ ධජ පතාක කොළඹ හා අවට ප්‍රදේශවල දක්නට ලැබිණි. එහෙත් වාමාංශික ව්‍යාපාරය වටා ගොනු වී සිටි දහස් සංඛ්‍යාත කම්කරුවන් හා ගොවීන් දිගින් දිගට ම දැනුම්වත් කරලනු පිණිස ඔවුන් අතර, මනා සම්බන්ධීකරණයක් මේ වන විට ගොඩනැඟී නොතිබිණි. මේ නිසා දෘෂ්ටිමය වශයෙන් හීනභාවයක් ප්‍රදර්ශනය වූ අතර, සංකල්පීය වෙනසක් ජන විඥානය තුළ ඇති කිරීමට ලාංකික වාම ව්‍යාපාරය අපොහොසත් විය. මේ නිසා අධිරාජ්‍යවාදී, ධනවාදී දේශපාලනයට එරෙහි ව වාමාංශික ව්‍යාපාරය ආරම්භ කළ උද්ඝෝෂණ කෙටි කාලීන අරගල බවට පත් වූ අවස්ථා තිබිණි.

වාමාංශික සන්නිවේදන ක්‍රමවේදයේ පැවති මේ සංකල්පීය දුර්වලතාව හේතුවෙන් ජාතිභේදවාදී අදහස් කම්කරු පන්තිය අතරින් පිටුදැකීමට අවස්ථාවක් උදා කැර ගැනීම පහසු කාර්යයක් නො වී ය. මේ නිසා කම්කරු පන්තියේත්, දේශවාසී විවිධ ජනවර්ගයන් අතරත් සමඟිය වර්ධනය කැර ගැනීමට නොහැකි අවස්ථා බහුල වශයෙන් උදා විය.

ඉහත සඳහන් කළ ගැටලුකාරී තත්ත්වය හමුවේ වාමාංශික ව්‍යාපාරයට සිය දේශපාලන සමාජවාදී දර්ශනය නගරයේ සිට ග්‍රාමීය ප්‍රදේශ තෙක් ව්‍යාප්ත කැර ගැනීමේ දී විරුද්ධවාදී බලවේගවලින් නිරන්තරයෙන් එල්ල වූ බොරු ප්‍රචාර හා විකෘත මත සුළු කොට තැකිය නොහැකි ය. විශේෂයෙන් ම මේ කාල වකවානුවේ අන්තර්ජාතික ව ගලා එන්නට වූයේ වාමාංශික ව්‍යාපාරයට බෙහෙවින් ම අහිතකර වූ, එමෙන් ම විකෘත වූ පුවත් ය. සෝවියට් සංගමය තුළ ඇති වූ සිද්ධීන් පිළිබඳ පුවත් හා තොරතුරු ශ්‍රී ලංකාවේ පුවත්පත්වල පළ වූයේ, සමස්ත වැඩ කරන ජනතාව තැති ගන්වන ආකාරයෙනි. මේ රටේ ඇතැම් ධනපති පුවත්පත් මෙන් ම, ධනපති පන්තියේ නියෝජිතයන් එම පුවත් අතිශයෝක්තියෙන් සහ විකෘත කොට ඉදිරිපත් කිරීමට කිසි



සේත් පසුබට වූයේ නැත. ඒ.ඊ. ගුණසිංහ මැයි දින උත්සවයක දී කළ කථාවක් මේ තත්ත්වයට එක් නිදසුනකි. 1934 මැයි 3 වැනි දා ඔහු කළ ඒ කථාව 'දිනමිණ' පුවත්පතේ පළ කොට තිබුණේ මේ අයුරිනි: "යුරෝපයේ කොමියුනිස්ට්වාදී රටවල වාසය කොට කොමියුනිස්ට් ධර්මයේ විෂබීජ වපුරා හැරීමට මෙහි එන පුද්ගලයන්ගේ බිණීම් හා ක්‍රියා ගැන පරිස්සම් වුව මැනවි. නැත හොත් කොමියුනිස්ට්වාදය විසින් සකස් කරන ලද මේ මිනී මරන ව්‍යාපාරයෙන් තමුන්නාන්සේලාට නිදහසක් ලැබේ යැයි සිතා මුලාවෙන්නට පුළුවෙනි."

මෙවැනි ප්‍රචාරයන්ට එරෙහි ව සාර්ථක ප්‍රතිචාරයක් දැක්විය හැකි වන්නේ පුවත්පත් මඟින් පමණක් බව වාමාංශික ව්‍යාපාරයේ පුරෝගාමීහු විශ්වාස කළහ. දේශපාලන ව්‍යාපාරයක, විශේෂයෙන් ධනපති පන්ති විරෝධී ව්‍යාපාරයක ප්‍රචාරයක් අනෙක් පුවත්පතකින් බලාපොරොත්තු විය හැකි දෙයක් නො වී ය. සාම්ප්‍රදායික සමාජ හා දේශපාලන මත අබිබවා යන ව්‍යාපාරයකට තමන්ගේ ම ප්‍රචාරක මාධ්‍යයකින් හැර අන් ක්‍රියාමාර්ගයකින් අරමුණු ඉටු කැර ගැනීම පහසු කාර්යයක් නොවන බව පිළිබඳ ව මේ වාම පුරෝගාමීහු මනා තක්සේරුවක සිටියහ.

මෙ නයින් බලන විට අපේ වාමාංශික පුවත්පත් ඉතිහාසය දළ වශයෙන් අවස්ථා හතරකට බෙදා දැක්විය හැකි ය;

i. ආරම්භක අවස්ථාව
ii. යුද්ධ වකවානුව
iii. පශ්චාත් යුද්ධ වකවානුව
iv. නිදහස ලැබීමෙන් පසු අවදිය, යනුවෙනි.

විශේෂයෙන් ආරම්භක අවස්ථාවේ මේ රටේ වාමාංශික පුවත්පත්වල ප්‍රධාන අරමුණ වූයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයට විරුද්ධ ව සටන් කිරීම යි. ජාතික නිදහස මෙන් ම ජනතා අයිතීන් දිනා ගැනීම ප්‍රධාන තැනක් ගත්තේ ය. දේශීය වශයෙන් සිටින විවිධ ජනවර්ගවල සමඟිය ආරක්ෂා කරමින් අධිරාජ්‍යවාදී සටන මුවහත් කිරීම සහ සමසමාජ (කොමියුනිස්ට්)

මතවාදය හඳුන්වා දීම වාමාංශිකයන්ගේ න්‍යාය පත්‍රයේ ප්‍රමුඛ කාර්යයක් විය. මෙහි දී ධනපති පන්තියෙන් එල්ල වූ ජාතිභේදවාදී ප්‍රහාරවලටත්, මාක්ස්-ලෙනින්වාදය ආගම් විරෝධී දහමක් ය යන ඊනියා ප්‍රචාරවලටත් පිළිතුරු දීමට ද වාමාංශික පුවත්පත්වලට නිරන්තරයෙන් සිදු විය.

මේ පසුබිම තේරුම් ගත් කොමියුනිස්ට් පක්ෂය, වාම සන්නිවේදකයන් ඒකරාශි කිරීමට කටයුතු කෙළේය. කොමියුනිස්ට් පක්ෂයට එදා දෙමළ ලේඛකයන් ඒකරාශි කැර ගැනීම ඒ තරම් අපහසු කාර්යයක් නොවීය. මන්ද යත්, කොමියුනිස්ට් පක්ෂය බහු ජාතීන් නියෝජනය කරන, මාක්ස්-ලෙනින්වාදී දේශපාලන ව්‍යාපාරයක් වූ නිසා ය.

එදා කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියාකාරි සාමාජිකයන් වූ කේ. රාමනාදන්, කේ. ගණේශන්, කේ.ආර්. කුරුපකුට්ටි මහත්වරුන් ප්‍රමුඛ දෙමළ ජාතික ලේඛකයෝ රැසක් මාක්ස්වාදය සෞන්දර්යාත්මක දෘෂ්ටියකින් සමාජ ගත කිරීම සඳහා පුවත් පත්, සඟරා ප්‍රකාශන රැසක් මුද්‍රණය කළ හ. 'නවශක්ති' (දෙමළ) පුවත්පත 1940 සැප්තැම්බර් 1 වැනි ද නිකුත් විය. කේ.ආර්. කුරුපකුට්ටි මහතා එහි ප්‍රකාශකයා හා කර්තෘවරයා වශයෙන් පෙනී සිටියේය. සංස්කාරක සහායක වූයේ 'සමධර්මම්' පත්‍රයේ කර්තෘ ධුරය දැරූ කේ. රාමනාදන් මහතා ය. මෙම පුවත්පත යොදා ගනිමින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව විවේචනය කිරීමේ වරදට කුරුපකුට්ටි හා රාමනාදන් යන මහත්වරුන් කීප වරක් ම සිරබාරයට ගෙන ඇත. කේ. රාමනාදන් මහතා ඉංගිරිසි උපාධිධරයකු වූ අතර, දෙමළ හා ඉංගිරිසි භාෂාවලින් ලිවීමේ අතිදක්ෂයෙක් විය" (විජේකෝන්, 2007, පි.158) 'නවශක්ති' පුවත්පත බිහි වී වසර හයකට පසු ව, එනම් 1946 දී 'භාරතී' නමින් දෙමළ භාෂා සඟරාවක් ප්‍රකාශයට පත් වූ අතර, එහි කතුවරුන් වූවෝ කේ. රාමනාදන් හා කේ. ගණේශන් යන මහත්වරු ය. එහෙත් මෙම සඟරාවේ ආයු කාලය කෙටි විය. අධිරාජ්‍ය ගැති ධනපති පන්තියෙන් එල්ල වූ නිරන්තර අභියෝග හමුවේ මෙම සඟරාව ඉදිරියට ගෙන යෑමට අවස්ථාවක් ලැබුණේ නැත. විශේෂයෙන් ඉන්දියාවට නිදහස ලබා ගැනීම සඳහා, බෙංගාලයේ කොමියුනිස්ට්වරුන් ගෙන යන සටන්වල තොරතුරු මෙන් ම මාක්ස්වාදයේ සෞන්දර්ය පැතිකඩ පිළිබඳ



ශාස්ත්‍රීය ලේඛන ද මෙම සඟරාවේ පළ වී ඇත. තව ද 1965 දී 'මල්ලිකෙයි' නමින් තවත් ප්‍රගතිශීලි සඟරාවක් මුද්‍රණය වී ඇත. මෙම සඟරාවේ සංස්කාරකවරයා වූයේ, කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයකු මෙන් ම පසු කලෙක එම පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයකු වූ ඩොමිනික් ජීවා මහතා ය. මෙම සඟරාව මඟින් කලාව, සංස්කෘතිය, දේශපාලනය පාඨක රුචිය වැඩි වන අන්දමින් කතාබහට ලක් කැර ඇත. මාක්ස්වාදය තුළ බොහෝ ගැටලුවලට විසඳුම් ඇති බව මේ සඟරාව මඟින් පෙන්වා දීමට එහි සංස්කාරකවරයා උත්සාහයක් ගෙන ඇත.

යුද්ධ වකවනුවේ දී මේ තත්ත්වය මඳක් වෙනස් වුව ද, යුද්ධ විරෝධී මත ප්‍රචාරයේ ප්‍රමුඛ කාර්යභාරය ඉටු කෙළේ, ඒ වන විට තිබූ වාමාංශික පුවත්පත් ය. මේ වන විට වමේ පක්‍ෂ දෙක (සමසමාජ-කොමියුනිස්ට්) අතර මතු වී තිබුණු න්‍යායික බෙදීම සම්බන්ධයෙන් මත ද මේ පුවත්පත්වලට අලුතින් එකතු විණි. මේ කාලසීමාව තුළ අධිරාජ්‍යවාදයටත්, යුද්ධයටත් විරුද්ධ ව ප්‍රචාරයේ යෙදුණු වමේ පුවත්පත් ප්‍රකාශකයෝ සහ ලේඛකයෝ කීප දෙනෙක් ම යුද්ධ නීතිය යටතේ සිරභාරයට ගනු ලැබූ හ. නිදසුනක් ලෙස 'ජනශක්ති' පුවත්පත මුද්‍රණය කැර බෙදා හළ දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ සහ බෙනට් සිල්වා බ්‍රිතාන්‍ය පාලකයන්ගේ නියෝග මත සිරභාරයට පත් වූ හ. 'ජනශක්තිය' වෙනුවට 'නවශක්තිය' මුද්‍රණය කැර බෙදා හළ ඩී.පී. යසෝදිස් ද සිරභාරයට ගනු ලැබිණි. වමේ පුවත්පත් කීපයක් සහ ඒවා මුද්‍රණය කළ මුද්‍රණාල ද බ්‍රිතාන්‍ය ආණ්ඩුව මඟින් තහනමට ලක් කැරිණි.

පශ්චාත් යුද්ධ වකවනුව තුළ වාමාංශික ව්‍යාපාරයේ ප්‍රධාන අංග තුනක් කැපී පෙනිණි. එක් එක් පක්‍ෂයට අයත් පුවත්පත් ප්‍රහාර එල්ල කැර ගනිමින් තියුණු විවේචනයන්හි යෙදිණි. මේ අතර න්‍යායාත්මක ව බෙදී වෙන් වී ගිය පක්‍ෂ එක්සත් කැර ගැනීමේ උද්ඝෝෂණවලට මේ පුවත්පත් නායකත්වය දිනි.

නිදහස ලැබීමෙන් පසු මේ රටේ වාමාංශික පුවත්පත්වලට සන්නිවේදන ඉලක්ක පහක් ඉටු කැර ගැනීමට තිබිණි. විශේෂයෙන් දේශීය පාරම්පරික ධනපතීන්ගේ බලය අඩපණ

කිරීම ඉන් ප්‍රධාන විය. එක් එක් දේශපාලන පක්ෂ බලය ලබා ගැනීමට තම දෘෂ්ටිවාදය සමාජ ගත කිරීම සඳහා තරගකාරී ව ක්‍රියා කිරීම දෙවැනි ඉලක්කය වූ අතර, තුන් වැනි ඉලක්කය වූයේ අධිරාජ්‍යවාදී බැඳීම්වලට ඍජු ලෙස විරුද්ධ වෙමින් කටයුතු කිරීම යි. සිවු වැනි ඉලක්කය වූයේ එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනයට විරුද්ධ ව ඒකාබද්ධ පෙරමුණක් ගොඩනැඟීම යි. ජාතික පුවත්පත් යැ යි කියා ගන්නා 'දිනමිණ' සහ 'ඩේලිනිව්ස්' වමට හා සමාජවාදී දර්ශනයට එරෙහි ව දිගින් දිගට ම ගෙන යන ප්‍රචාරවලට ප්‍රතිප්‍රහාර එල්ල කිරීම පස් වැනි ඉලක්කය වූයේ ය.

මේ වාමාංශික පුවත්පත් ප්‍රධාන වශයෙන් මුල් තැන දුන්නේ දේශපාලන ලිපිවලට හා ප්‍රවෘත්තිවලට ය. එම දේශපාලන ලිපි ජාතික හා අන්තර්ජාතික ප්‍රශ්න විග්‍රහ කැර දැක්වී ය. එමෙන් ම අන්තර්ජාතික වශයෙන් කම්කරු පන්තිය ලබාගන්නා ජයග්‍රහණ මෙරට කම්කරු පන්තියට දැන්වීම සඳහා මේ පුවත්පත් ඉඩ-කඩ වෙන් කෙළේ ය. පාඨක අදහස්වලට ද ඉඩ-කඩ වෙන් වූ අතර, ප්‍රහාරාත්මක හා උපහාසාත්මක තීරුලිපි ආදි වූ විශේෂාංග මේ පුවත්පත්වල දක්නට ලැබිණි. කාව්‍ය රචනාවලට ද ඉඩ-කඩ වෙන් විය. ඒ හැම දෙයකින් ම ප්‍රකාශ වූයේ සමාජවාදය පිළිබඳ න්‍යායික මතවාදයකි.

මේ සමාජවාදී මතවාදය සමාජගත කිරීමේ හා ජාතික ස්වාධීනත්වය දිනා ගැනීමේ සටනේ ප්‍රමුඛ කාර්යභාරයක් සිදු කළ සන්නිවේදකයන් අතර බටපොළ අනෝමදස්සී හිමි, බළන්ගොඩ ආනන්ද මෛත්‍රී හිමි, රාහුල් සංකෘත්‍යායන හිමි, උඩකැන්දවල සිරි සරණංකර හිමි ප්‍රමුඛස්ථානයක් ගත්හ. මේ කාලයේ සිටි සිංහල උගත් කවීන් වන සෝමවීර චන්ද්‍රසිරි, බොරලැස්ගමුවේ ජී. එච්. පෙරේරා, පී. බී. අල්විස් පෙරේරා, සිරිසේන කුලතිලක වැන්නෝ ද වාම මතවාදී සන්නිවේදනයේ කොටස්කරුවන් අතර ප්‍රමුඛයෝ වූ හ.

මුල් අවදියේ වාමාංශික බොහෝ පුවත්පත් සිය මතවාදය ඉදිරියට ගෙන යෑම සඳහා සිංහල, දෙමළ, ඉංගිරිසි හා මලයාලි භාෂා ප්‍රයෝජනයට ගත්තේ ය.



විශේෂයෙන් මුල් කාලයේ මේ වාමාංශික පුවත්පත්වලට සම්බන්ධ ව සිටි ලේඛකයෝ බොහෝ දෙනෙක් සිංහල, දෙමළ හා ඉංගිරිසි භාෂාත්‍රයයෙන් ම ලිවීමේ නිපුණතාවක් දැක්වූ හ. මේ තත්ත්වය වාමාංශික ව්‍යාපාරයට මහත් ශක්තියක් මෙන් ම, සම්පතක් ද විය. මෙයට අතිරේක ව මොවුන්ට දේශපාලන වේදිකාවල දී ඉතා චතුර ලෙස එකී භාෂා තුනෙන් ම කථා පැවැත්වීමේ හැකියාව ද තිබිණි. එමෙන් ම වමේ අනෙකුත් කථිකයන්ගේ කථා සිංහල, දෙමළ හා ඉංගිරිසි භාෂාවලට ක්ෂණික ව ම පරිවර්තනය කිරීමේ සමත්කම ද ඔවුන් සතු විය.

මෙම වාමාංශික පුවත්පත් එළිදැක්වීමේ දී ඊට විවිධ සමාජ කණ්ඩායම් සහය දුන් හ. වාම දේශපාලන මතවාදය පිළිගත් කම්කරුවෝ පුවත්පත් මුද්‍රණයට හා බෙදාහැරීමට නිරන්තරයෙන් ම දායක වූ හ. මේ නිසා මෙම පුවත්පත්වල සියලු කටයුතු සාමූහික ප්‍රයත්නයන් ලෙස සිදු වූයේ ය. විශේෂයෙන් රාජ්‍ය සේවයේ නියුතු, දේශපාලන අයිතිවාසිකම් සම්පූර්ණයෙන් ම තහනම් වී සිටි අය මෙන් ම, විවිධ වෘත්තීන්හි නියැළී සිටි අය ද ස්වේච්ඡාවෙන් ස්වකීය දේශපාලන ව්‍යාපාරය (වාම ව්‍යාපාරය) පෝෂණය කිරීම සඳහා කාලය හා ශ්‍රමය කැප කළෝ ය. මෙහි කැපී පෙනෙන ලක්ෂණය වූයේ මුල් කාලයේ මේ පුවත්පත්වලට සම්බන්ධ ව කටයුතු කළ අයට පුවත්පත් කලාව පිළිබඳ නිපුණත්වයක් නොතිබීම යි. එහෙත් තමන් දැන සිටි වාම දේශපාලන අරමුණු සමාජගත කිරීමට ඔවුහු උපරිමයෙන් කැප වූහ. ඇතැම් විට පුවත්පත් කලාවේදියා ශෝධ්‍යපත්‍ර බලන්නකු, පුවත්පත් බෙදාහරින්නකු, මුද්‍රණ යන්ත්‍රය ක්‍රියා කරවන සේවකයකු වශයෙන් භේදයක් නොමැති ව කටයුතු කෙළේ ය. විශේෂයෙන් මෙහි කැපී පෙනෙන කාරණයක් වූයේ රාජ්‍ය සේවයට සම්බන්ධ ව සිටි බොහෝ දෙනෙකු 'ආරූඪ' නම්වලින් මේ පුවත්පත්වලට ලිපි සැපයීම යි. දේශපාලන, ආර්ථික, සමාජ ප්‍රශ්න පාඨක සිත් ගන්නා ආකාරයෙන් දක්ෂ ලෙස රචනා කිරීමට ඔවුහු සමත් වී සිටිය හ. රාජ්‍ය ආයතනවල සිදු වන දූෂණ හා අක්‍රමිකතා පිළිබඳ තොරතුරු තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රයට අනුකූල ව පළ කිරීමට ඔවුන් පසුබට වූයේ නැත.

මුල් අවදියේ ජාතික යැ යි කියන පුවත්පත්වලට සාපේක්ෂ ව වාමාංශික පුවත්පත්වල යම් පසුබෑසීමක් තිබිණි. ඊට ප්‍රධාන වශයෙන් බල පෑ කරුණු කීපයක් විය. මේ ජාතික පුවත්පත්වලට තිබූ වෙළෙඳ අධිකාරිය සහ සිංහල, දෙමළ, ඉංගිරිසි භාෂාවලින් පුවත්පත් පළ වීම මහත් ශක්තියක් විය. විවිධ විෂයයන් යටතේ විශේෂාංග පළ වූ අතර, සති අන්තයේ පිට වූ පුවත්පත්වල පිටු සංඛ්‍යාව ද වැඩි විය. දින පතා 'දිනමිණ' ඩිමයි ප්‍රමාණයෙන් මුද්‍රණය වූ අතර, මිල සත පහක් පමණ විය. එසේ ම 'දිනමිණ' සහ 'ටයිම්ස්' පුවත්පත්වලට බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ හා ව්‍යාපාරිකයන්ගේ දැන්වීම් බහුල ව ලැබිණි. මේ නිසා ආදායම ඉහළ ගියා පමණක් නො ව, එහි අධිකාරී බලය තීරණාත්මක සමාජ සාධකයක් විය. ලාංකික වාම ව්‍යාපාරය 'සමාජවාදී දර්ශනය' මූලික කැර ගනිමින් ගෙන ගිය සටන, මතවාදී ව ඝාතනය කිරීමට මේ ජාතික යැ යි හැඳින්වූ පුවත්පත්, සිය අධිකාරී බලය ප්‍රයෝජනයට ගත් අවස්ථා එමට ය.

මෙවැනි පසුබිමක් තුළ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රථම සභාපතිවරයා වූ අපවත් වී වදාළ උඩකැන්දවල සිරි සරණංකර හිමියෝ, අධිරාජ්‍ය විරෝධී ප්‍රගතිශීලී සාහිත්‍යයක් ඇති කිරීම සඳහා විශාල කාර්යභාරයක් සිදු කළ හ. විශේෂයෙන් උන් වහන්සේ සතු ව තිබූ සිංහල, පාලි, සංස්කෘත, ඉංගිරිසි දැනුමත්, බෙංගාලි භාෂාව හා පෙරදිග සංස්කෘතීන් පිළිබඳ ව තිබූ පරිචයත්, මාක්ස්-ලෙනින්වාදී දෘෂ්ටියත් නිසා ප්‍රගතිශීලී සාහිත්‍ය කලාවක් හා අධිරාජ්‍ය විරෝධී දේශපාලනයක් රට තුළ ගොඩනැඟීමට වැර දැරූ හ. අධිරාජ්‍යවාදයේ හා ධනවාදයේ බියකරු බව ජනතාවට එත්තු ගන්වමින්, මාක්ස්වාදය සෞන්දර්ය විද්‍යාත්මක දෘෂ්ටියකින් සමාජ ගත කිරීම සඳහා උන් වහන්සේ කටයුතු කළහ. මෙයට සමාන්තර ව කොමියුනිස්ට් පක්ෂය වටා රොක් වී සිටි ද්‍රවිඩ ලේඛකයෝ අධිරාජ්‍ය විරෝධී අරගලයට දායකත්වය ලබා දීම සඳහා විවිධ මට්ටමින් සංවිධානය වූ හ. අධිරාජ්‍ය විරෝධී අරගලයේ නියැළුණ භාරතයේ සිටි උගතුන් බුද්ධිමතුන් සමඟ සම්බන්ධතා වර්ධනය කැර ගත් අවස්ථා තිබිණි. "විශේෂයෙන් 20 වැනි සියවසේ බිහි වූ ශ්‍රේෂ්ඨතම ලේඛකයකු වූ භාරතයේ, මුල්ක් රාජ් ආනන්ද් ඔවුන්ගේ එක් ආදර්ශයක් විය.



ඔවුහු මුල්ක් රාජ් ආනන්ද් සහ කේ.ඒ. අබ්බාස් වැනි භාරතීය ලේඛකයන්ගේ ග්‍රන්ථ මෙරට ද්‍රවිඩ භාෂාවට පරිවර්තනය කළහ". (හැටපස් වසරක් - ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, 2008ඃ පි.96)

කොමියුනිස්ට් පක්ෂය වටා සිටි මෙම ද්‍රවිඩ නායකයන් 1946 දී මුල්ක් රාජ් ආනන්ද් ශ්‍රී ලංකාවට ගෙන්වීමට කටයුතු කෙළේ අධිරාජ්‍ය විරෝධී අරගලය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ය. "ද්‍රවිඩ හා සිංහල ලේඛකයන් සඳහා කොළඹ 2 පිහිටි 'පොල්ස්කි' හෝටලයේ දී (වර්තමාන නිපොන් හෝටලයේ දී) ආනන්ද් ගේ නායකත්වයෙන් සම්මන්ත්‍රණයක් පැවැත්විණි. මෙසේ සිංහල හා දෙමළ ලේඛක සන්ධානය 1940 ගණන්වල දෙවැනි භාගයේ දී වැදගත් සන්ධිස්ථානයකට එළඹියේ ය.

1940 දී ඔවුහු එක් ව 'Ceylon Writers Association' නමින් සංවිධානයක් පිහිටුවා ගත්හ. එහි සභාපතිවරයා වූයේ සුප්‍රකට ද්‍රවිඩ බුද්ධිමතකු වූ ස්වාමි විපුලානන්ද ය. උප සභාපතිවරුන් වූවෝ මාර්ටින් වික්‍රමසිංහ සහ කොමියුනිස්ට් පක්ෂයේ නායකයකු වූ පී. කන්දයියා මහත්වරු ය. සම ලේකම්වරුන් වූයේ නැඟී එන තරුණ බුද්ධිමතකු හා කලාකරුවකු වූ ඒ වන විට 32 වැනි වියේ සිටි එදිරිවීර සරච්චන්ද්‍ර සහ කොමියුනිස්ට් පක්ෂයේ කේ. ගණේශන් මහත්වරු ය. (හැටපස් වසරක් - ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, 2008 ඃ පි.96)

මෙයින් පැහැදිලි වන එක් කරුණක් වන්නේ වාම සන්නිවේදනය ජනතාව අතරට ගෙන යෑමට නම් ප්‍රධාන ජනවර්ග දෙක (සිංහල හා දෙමළ) එක්සත් විය යුතු බව කොමියුනිස්ට්වරුන් එදා විශ්වාස කළ බව යි. මේ ලේඛකයන් අතර විවිධ අදහස් තිබුණ ද, පොදු අරමුණක් වෙනුවෙන් සමාජයට බලපෑම් කිරීමට හැකියාවක් තිබිණි. මේ පසුබිම නිර්මාණය කිරීමට අධිරාජ්‍යවාදී විරෝධය මූලික අඩිතාලම සකස් කළ බව කිව යුතු ව තිබේ. විශේෂයෙන් මාක්ස්වාදය සෞන්දර්ය විද්‍යාත්මක ව සමාජගත කිරීම සඳහා කොමියුනිස්ට්වරුන් වාම සන්නිවේදනය ප්‍රයෝජනයට ගත් බව කිව යුතු කරුණකි. මේ නිසා විවිධ මත ඉතා ප්‍රබුද්ධ භාවයකින් සාකච්ඡා කොට පොදු තීරණයකට

පැමිණි ජන සමාජයට වින කරන පොදු සතුරා දේශපාලනමය සහ සාහිත්‍යමය වශයෙන් පරාජය කිරීමට කටයුතු කරන ලදි.

මෙවැනි දේශපාලන වටාපිටාවක් තුළ උඩකැන්දවල සිරි සරණංකර හිමියන් ඉතා ප්‍රබුද්ධ ලෙස කටයුතු කරමින්, නව සම්ප්‍රදායක් වාම සන්නිවේදනයට හඳුන්දීමට පෙරමුණ ගත් හ.

මේ සම්ප්‍රදායට කදිම නිදසුනක් වන්නේ, උඩකැන්දවල සිරි සරණංකර හිමියන් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත යි. මාක්ස්-ලෙනින්වාදී දර්ශනයටත් පෞද්ගලික ව උන්වහන්සේටත් අපහාස කරමින් පියදස සිරිසේන මහතා ලිපි පවා පළ කෙළේය. සිරිසේන මහතාගේ දේශපාලන මතවලට හා ස්ථාවරත්වයට ඉතා තදින් පහර දුන් සරණංකර හිමියෝ, ඔහු මිය යෑම නිමිති කොටගෙන 'නවලෝකය' සඟරාවේ හරබර ලිපියක් ලියා පළ කළ හ. පියදස සිරිසේන මහතා මේ රටේ නිදහස, සංස්කෘතිය රැකගැනීම සඳහා පෑන හැසිරවූ අන්දම සරණංකර හිමියන් අගය කැර ඇත. තව ද "තමන් විසින් ලංකාවේ උසස් ම ලේඛකයා ලෙසින් පිළිගනු ලැබූ මාර්ටින් වික්‍රමසිංහ, ලේක්හවුස් අධිපතීන්ට තම ආත්මය විකුණූ බව වික්‍රමසිංහගේ ප්‍රකාශනයන් ගෙන් ම උදහරණ ගනිමින් අනුකම්පා සහිත විවේචනයක යෙදුණ හ. 'භාරතීය දර්ශනය' නම් ග්‍රන්ථයක් පිළිබඳ ලියන ලද විචාරයක් පදනම් කොට ගනිමින් එතුමෝ වික්‍රමසිංහට නිර්දය ලෙස පහර ගැසූ හ". (හැටපස් වසරක් - ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, 2008 : පි.97). මෙවැනි විවේචන තිබිය දී වුව ද, වික්‍රමසිංහ මහතා සමඟ දිගින් දිගට ම සාහිත්‍ය කලා ක්ෂේත්‍රයේ ඉතා කිට්ටුවෙන් සිටිමින් කටයුතු කිරීමට සරණංකර හිමියන්ට ශක්තිය තිබිණි.

මේ තත්ත්වයට කදිම නිදසුනක් වන්නේ 'සමාජවාදී ලේඛකයා සහ මානව හිතවාදියා' යන හිසින් යුතු ව මාර්ටින් වික්‍රමසිංහයන්, 1968 නොවැම්බර් මස ප්‍රකාශයට පත් වූ 'නවලෝකය' විශේෂ අතිරේකයට සරණංකර හිමියන් පිළිබඳ ව ලියා ඇති ලිපිය යි. එම ලිපියේ මෙසේ ද සඳහන් වෙයි.

"සරණංකර හිමියෝ සමාජවාදය නමැති නිදහස් බිමට පිවිසෙන මං කීපයක් ඇති බව වටහා ගත්හ. විප්ලවය ගැන



දෙඩන අන්ධ භක්තිකයකු සේ විරුද්ධ මතධාරීන්ට ඊර්ෂ්‍යා කරන පටු කල්පනා කාරයෙක් නොවූහ. එහෙයින් උන්වහන්සේ කොමියුනිස්ට්වාදීන් නොවන නිදහස් සමාජවාදී, පීඩිත ජනයා නිසා උපන් අනුකම්පාව ඇති ස්වාධීන ලේඛකයන්, ආදී සියල්ලන්ගේ ම සහාය ලබාගෙන ඔවුන් සියලු දෙනා එක් කිරීමට වෑයම් කළහ.

"ඒ වෑයමට හොඳ ම නිදසුන උන්වහන්සේ පැවැත්වූ 'නවලෝකය' සඟරාව යි.

"සරණංකර හිමින් මහත් කොට සැලකුවේ ව්‍යවහාර සමාජවාදය මිස මාක්ස්වාදී සිද්ධාන්ත නොවේ. සිද්ධාන්ත ව්‍යවහාරයෙහි දී වෙනස් වන බව උන්වහන්සේ ප්‍රත්‍යක්ෂයෙන් දත්හ; සිද්ධාන්ත ගැන දෙඩන අවස්ථාවාදීන්ටත් ඔවුනොවුන් නිසා උපන් ඊර්ෂ්‍යාව ඇති පණ්ඩිතයන්ටත් නොරැවටුණහ. මාක්ස්වාදීන් නොවතත්, සමාජවාදයට හිතවත් ඍජු අවංක උගතුන් හා ලේඛකයන් උන්වහන්සේ ඉවෙන් මෙන් හඳුනාගත්හ.

"පීඩිත ජනයාගේ ජීවිත හා චරිත විස්තර කරන පැරණි බෞද්ධ කතා සමාජවාදය උදෙසා මිනිසුන්ගේ සිත් හැදීමට උපයෝගීවන වැදගත් සාහිත්‍යයක් බව උන්වහන්සේ වටහා ගත්හ. ඒ හැඟීම ඔවුන්ගේ සිතට පිවිසියේ පැවිදි ජීවිතයත් ගමෙහි ජීවත්වීමෙන් ලත් අත්දැකීමත් නිසාය.

"සමාජවාදය මිනිසුන්ගේ සිත්හද ඔවුන් පුබුදු කළ හැක්කේ මාක්ස්වාදය ඉගැන්වීමෙනියි යන හැඟීම ශ්‍රී ලංකාවේ සමාජවාදීන්ගේ සිත් තුළ ලැග ගත් මතයක් විය. මේ මතයෙහි එල්බගත් ඔවුහු සමාජවාදය උදෙසා මිනිසුන්ගේ සිත් තුළ දැඩි හැඟීම් දනවිය හැකි ගද්‍ය පද්‍ය රචනා නොසැලකූහ. එපමණක් නොව පොදු ජන සඟරා, පොදු ජන ප්‍රවෘත්ති පත්‍ර, පවා ඇරඹීමට ඔවුහු උනන්දු නොවූහ. ඔවුන්ගේ මේ අඩුපාඩු ඔවුන්ට වැටහුණේ ඉතා මෑතකදීය. පෝද ඇත්ත, ජනසතිය, පෝද සිරිලක යන ආදී සඟරා-පත් ආරම්භ කරන ලද්දේ පසුගිය අවුරුදු හත අට තුළදීය.

"සරණංකර හිමියෝ අවුරුදු විසිහතකට පමණ පෙර මේ වැදගත් කරුණ වටහා ගත්හ. 'නවලෝකය' සඟරාවට අවුරුදු

විසි අට ලබයි. මැක්සිම් ගෝර්කිගේ Mother නමැති නවකතාවේ සංක්ෂිප්ත සිංහල පරිවර්තනයක් කෙළේ උන්වහන්සේය. එය පළවූයේ මීට අවුරුදු කිහිපයකට උඩදීය. එය සමාජ විප්ලවය සඳහා කම්කරුවන් පුබුදුවන කතාවකි. එහෙත් ගෝර්කි ඒ කථාවෙහි ප්‍රමුඛ චරිතය ලෙස නිරූපණය කරන්නේ පැලගෙයා විලසෝවා නමැති කම්කරු කාන්තාවයි. ඇගේ පුතා පවෙල් කම්කරුවකු පමණක් නොව එඩිතර නිර්භය විප්ලවවාදියෙකි. ඔහුත් ඔහුගේ අනික් සගයෝත් විනිශ්චයකාරයන් විසින් රාජද්‍රෝහීන් ලෙස සලකා සයිබීරියාවට පිටුවහල් කරන ලදහ.

"නඩු විසඳන අවස්ථාවේදී ඔහු ධනවාදයටත්, ආණ්ඩු-වාදයටත්, නිලධාරීන්ටත් චෝදනා නඟමින් දරුණු කතාවක් කරයි. එය හොරෙන් මුද්‍රණය කරනු ලබයි. ඒ පිටපත් කම්කරුවන් අතර බෙදා හරින්නේ පවෙල්ගේ මවයි. පොලිස්කාරයන් පැමිණ ඒ පිටපත් බෙදීම නවත්වන්නට ඇට කියයි. ඈ එය නොතකා කම්කරුවන් විඳින පීඩා විස්තර කරයි. පොලිස්කාරයෝ 'බැල්ලි' යි බැණ වදිමින් ඇට ගසති. නැහැයෙන් කටින් ලේ ගලතත් ඈ නිහඬ නොවෙයි.

"කෙනකුගේ යළි උපන් ආත්මය විනාස කරන්නට කිසිවකුට බැරි ය'යි ඈ මුරගායි. පොලිස්කාරයෝ ඇගේ බෙල්ල මිරිකති.

"මෙය ගෝර්කිගේ 'අම්මා' නමැති නවකතාවේ අවසානය ය. ඔහු ප්‍රචණ්ඩ විප්ලවවාදීන් නොව අකුතෝභය අධ්‍යාත්ම ශක්තිය ප්‍රකට කරමින් වධවේදනා විඳ මියගිය පැලගෙයා විලසෝවා නමැති කම්කරු කත සමාජවාදී ජයග්‍රහණය පිළිබඳ සංකේතයක් කරයි. කවර විප්ලවයකට වුව ද පිටුපසින් ඇත්තේ කටවල් හා කඩු තුවක්කු නොව අධ්‍යාත්මක ශක්තියයි. ''පරාජිත චරිත ගැන අනන් මනන් දොඩන සමහර සමාජවාදීන් වැටහෙන නුවණින් ගෝර්කිගේ 'අම්මා' කතාව කියවීම වටිනේය. ඒ කතාව සපුරා සිංහලට නගා සෝවියට් දේශයේ ප්‍රකාශක සමාගමක් මේ ළඟදී පළ කොට ඇත. පිටු හාරසියකට වැඩි ඒ කතාවේ නම 'අම්මා' වෙයි."



එම ලිපිය අවසානයේ මාර්ටින් වික්‍රමසිංහයෝ මෙසේ සඳහන් කරති.

"සරණංකර හිමියන් ඉතා අවංක, නිර්ව්‍යාජ, ව්‍යවහාරික සමාජවාදියෙකියි මම කීවෙමි. එය ඔවුන්ගේ චරිතයෙන් ඉඳුරාම හෙළිවෙයි. උන්වහන්සේ කිසිම මතාන්තරයක් දැඩි කොට නොගත්හ; එහෙයින් මතභේද ඉවසූහ. මතභේදයෙන් සටන් කළ සමාජවාදීන්, ලේඛකයන් අතර එක මතයක් ඇති කරන්නට වෑයම් කළහ. දූනගෙන අවස්ථාවාදීන්ට අනුබල නොදුන්හ. මහා විප්ලවයකින් ලෝකයේ සමාජවාදය පිහිටුවූ රුසියාවට අවංකව ඇල්ම කළහ. රුසියාව හා චීනය භේද වූ විට එයින් වාසි ලැබීමට නොසිතූහ. සමාජවාදී ඒ මහා රටවල් දෙක සමඟි කරන්නට වෑයම් කළහ. ලොකු මිනිසුන් හා ගැවීමෙන් පළවන්ට වෑයම් නොකළහ. මතභේදවලින් බිඳුණු සාහිත්‍යකාරයන්, දේශපාලනඥයන් නිසා ඔවුන් තුළ පක්ෂ භජනයක්, ඒ නිසා උපදින ඊර්ෂ්‍යාවක් හට නොගත්තේ ය. මේ උන්වහන්සේ ගුරු කොටගත් මානව සාධු ධර්මයන්ගෙන් කිපයකි. සරණංකර හිමියෝ නියම සමාජවාදියෙකි, මානව හිතවාදියෙකි."

වාම සන්නිවේදනය බලගැන්වීම සඳහා කොමියුනිස්ට් පක්ෂය, ස්වාධීන පියවර රැසක් ගත් බව කිව යුතු ය. විශේෂයෙන් වාර ප්‍රකාශන, ග්‍රන්ථ, පුවත්පත් ප්‍රකාශයට පත් කරමින්, තම දේශපාලන ස්ථාවරත්වය අනුව මාක්ස් - ලෙනින්වාදී දෘෂ්ටිය සමාජගත කිරීමට කටයුතු කිරීම කැපී පෙනෙයි. එසේ ම අධිරාජ්‍ය විරෝධී දේශපාලන මතවාදවල සිට ලේඛකයන් රැසකට තම මත ප්‍රකාශ කිරීමට වේදිකාවක් සපයා දීමට කොමියුනිස්ට් පක්ෂය කටයුතු කළ බව මැනවින් පෙනෙයි.

කොමියුනිස්ට් පක්ෂය, 1948 නොවැම්බර් 5 වැනි ද නිල පුවත්පත ලෙස 'කොමියුනිස්ට්' ප්‍රකාශයට පත් කෙළේ ය. මේ රටේ වෘත්තීය සමිති නායකයකු ව සිටි එම්.ජී. මැන්ඩිස් මහතා මෙම පුවත්පතේ කර්තෘ ලෙස කටයුතු කැර ඇත. මෙම පුවත්පත මූලික ව ම ආමන්ත්‍රණය කෙළේ කම්කරු පන්තිය - කේන්ද්‍ර කැර ගනිමිනි. විශේෂයෙන් එම යුගයේ පැවැති කම්කරු සටන් හා ජයග්‍රහණ ගැන ද මාක්ස්-ලෙනින්වාදී විග්‍රහයන් ද පළ කිරීමට

කටයුතු කැර ඇත. පසු කලෙක 'මව්බිම' නමින් කොමියුනිස්ට් පක්ෂය 1950 සැප්තැම්බර් 1 වැනි ද පුවත්පතක් ප්‍රකාශයට පත් කෙළේ ය. මෙම පුවත් පත දේශපාලන කරුණු-කාරණාවලට පමණක් සීමා නො වූ අතර සාහිත්‍ය, කලාව ප්‍රගතිශීලි දෘෂ්ටියකින් සමාජ ගත කිරීමට කටයුතු කෙළේ ය. විශේෂයෙන් සමාජවාදී රටවල සාහිත්‍ය කලා ක්ෂේත්‍රයේ ප්‍රවණතා පාඨකයාට හඳුන්වා දීමට 'මව්බිම' යොද ගත්තේ ය. මේ වන විට උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ සංස්කාරකත්වයෙන් ප්‍රකාශයට පත් වී තිබූ 'නවලෝකය' මෙන් ම 'මව්බිම' පුවත්පත දේශීය මෙන් ම, විදේශීය සාහිත්‍යවේදීන් සිංහල පාඨකයාට හඳුන්වාදීමට කටයුතු කෙළේ ය. විශේෂයෙන් ඇන්ටන් චෙකෝෆ්ගේ, ලියෝ තෝල්ස්තෝයි, මක්සිම් ගෝර්කි, රවීන්ද්‍රනාත් ඨාගෝර්, සරත්චන්ද්‍ර චට්ටෝපාධ්‍යාය, සුබෝද් ඝෝෂ් වැනි ලේඛකයන්ගේ කෘති මෙන් ම, ලොව ප්‍රකට සෝවියට් සිනමාකරුවන් වූ සෙර්ජ අයිසන්ස්ටයින්, වී. පුදෙව්කින් ආදීන් ගේ සිනමා කෘති සිංහල පාඨකයා අතර ජනප්‍රිය කැරවීමට කටයුතු කෙළේ ය. මෙහි දී අමරනාත් ජයතිලක, රෙජී රණසිංහ වැනි සාහිත්‍ය විචාරකයන් මේ සඟරා, පුවත්පත් ප්‍රයෝජනයට ගනිමින් විශාල කාර්යභාරයක් කළ බව සඳහන් කිරීම ඉතා වැදගත් ය.

ශ්‍රී ලාංකික වාම සන්නිවේදනයේ තවත් සුවිශේෂ සන්ධිස්ථානයක් වන්නේ 1964 'ඇත්ත' පුවත්පත ප්‍රකාශයට පත්වීමයි. 'ඇත්ත' දේශපාලන පුවත්පත් කලාවේ ප්‍රමුඛයා වූවා පමණක් නොව, ප්‍රගතිශීලී කලාවක් සමාජ ගත කිරීම සඳහා දයක විය. සමාජ අසාධාරණයට එරෙහි ව, පීඩිත පන්තිය වෙනුවෙන් සටන් කළ 'ඇත්ත' පුවත්පත සතුරා සොයා ගෙන ගොස් පහර දී තම දේශපාලන ප්‍රතිපත්ති වෙනුවෙන් ඍජු ව පෙනී සිටියේ ය. එසේ ම මේ රට පුරා විසිරී සිටි ප්‍රගතිශීලි ලේඛකයන්ට පුළුල් වේදකාවක් තනා දිනි. එම වේදිකාව තුළ විවිධ මතවාද නියෝජනය කළ ලේඛකයන් හා සාහිත්‍ය ධරයන් සිටි අතර, ඔවුන් පොදු අරමුණක් වෙනුවෙන් පෙළ ගැස්වීමට දේශපාලන නායකත්වය ලබා දිනි.

මේ දේශපාලන නායකත්වයට අයෝමය ශක්තියක් වූයේ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩල සාමාජික



එච්.ජී.එස්. රත්නවීර මහතා ය. ඔහුගේ දේශපාලන නායකත්වයට නිර්මාණශීලී භාවයක් එක් කිරීමට 'ඇත්ත' ප්‍රධාන කර්තෘ බී.ඒ. සිරිවර්ධන මහතාට හැකි විය.

මේ කාල වකවානුවේ, එනම් 60 දශකයේ පමණ ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයකු ව සිටි ගුණසේන විතාන මහතාගේ නායකත්වයෙන් ගොඩනඟන ලද 'ජනතා ලේඛක පෙරමුණ' ප්‍රගතිශීලි ලේඛකයන් ඒකරාශි කළ මධ්‍යස්ථානය විය. සරණංකර හිමියන් සහ 'නවලෝකය' කේන්ද්‍ර කැර ගනිමින් ඒකරාශි වී සිටි ලේඛකයෝ රැසක් 'ජනතා ලේඛක පෙරමුණ' වටා රොක් වූහ. එහෙත් 'ජනතා ලේඛක පෙරමුණ' මඟින් ප්‍රකාශයට පත් කළ 'ජනරුචිය' පුවත්පත මේ ලේඛකයන් තවදුරටත් සංවිධාන ගත කිරීමට අපොහොසත් විය. විශේෂයෙන් "ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ කලා සංවිධානයන්හි තිබූ ස්වාධීනත්වය වෙනුවට සෝවියට් දේශයෙහි 1930 ගණන්වල ඇරඹුණු 'සමාජවාදී යථාර්ථවාදය' නමැති නිල ප්‍රතිපත්තිය ආදේශ වීමක් සිදු විය. මෙය කොතෙක් දුරට පැතිරුණේ දැයි කිවහොත් එම මතය නොපිළිගන්නා පාක්ෂිකයන්ට පමණක් නොව සරණංකර සමයේ ඒකරාශි කොට ගෙන සිටි බුද්ධිමතුන්ගෙන් වැඩි දෙනෙකුට ද 'සෝවියට් විරෝධී' හංවඩුව තබා ඔවුන් සමඟ පැවැති සම්බන්ධතා බිඳ වැට්ටීමක් ද සිදු විය." (හැටපස් වසරක් - ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, 2008 : පි.101)

ඉහත මෙම පසුබිම සමාජ යථාර්ථයක් කිරීමට 'ජනතා ලේඛක පෙරමුණ' හා එහි ප්‍රතිපත්ති ක්‍රියාවට නඟන මෙවලම වූ 'ජනරුචිය' පුවත්පත කටයුතු කිරීම නිසා මේ රටේ සාහිත්‍ය කලා විෂය තුළ පුළුල් සංවාදයක් ගොඩනැඟීමට තිබූ පසුබිම බිඳ වැටිණි. එසේ ම වාමවාදී සන්නිවේදනයක් සමාජ ගතවීමට තිබූ ඉඩකඩ සීමා විය.

එමෙන් ම ලේඛකයන් හා කලාකරුවන් දෙස ඉතා පටු දෘෂ්ටියකින් බලා ඒවාට නිර්දය ලෙස පහර දීමට 'ජනතා ලේඛක පෙරමුණේ' නායකයෝ පෙරමුණ ගත්හ. විශේෂයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය කේන්ද්‍ර කැර ගනිමින් 50 දශකයේ සිට ඇති වූ ප්‍රගතිශීලි සාහිත්‍ය කලා ප්‍රබෝධය වැනි ප්‍රවණතාවන්හි යථාර්ථය

වටහා ගැනීමට මේ පෙරමුණේ නායකයන් තැත් නොකිරීම බරපතළ දුර්වලකමක් විය. එදිරිවීර සරච්චන්ද්‍ර සහ ප්‍රගතිශීලි ශ්‍රී ලාංකික මහාචාර්යවරයකු වූ ලූඩොවයික් වැනි බුද්ධිමතුන් මෙරට කලාවට කළ දයකත්වය ඔවුනට වටහා ගැනීමට නොහැකි වූවා පමණක් නොව වටහා ගැනීමට වුවමනාවක් ද නොවූ බව, ශ්‍රී ලාංකික වාම සන්නිවේදනයේ ප්‍රවණතා පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වෙයි. විශේෂයෙන් ප්‍රගතිශීලි මතවාදවල සිටි මේ බුද්ධිමතුන් "ධනපති පන්තියේ ගැත්තන්" ලෙස හංවඩු ගැසීමට සිරිතක් කැර ගත් මොවුන්, මාර්ටින් වික්‍රමසිංහ මෙරට ලේඛන කලාවේ 'සුරුවමක්' ලෙස පෙන්වාදීමට ද කටයුතු කෙළේය. මාර්ටින් වික්‍රමසිංහගේ සහ මක්සීම් ගෝර්කි ගේ චින්තන දහරාවන් සම කිරීමට ද 'ජනතා ලේඛක පෙරමුණේ' ලේඛකයන් උත්සාහ කිරීම නිසා ශ්‍රී ලාංකේය ලේඛන කලාව දෙස විචාරශීලි ව බැලීමට ඔවුන්ට වුවමනාවක් නොතිබුණු බව පෙනේ. එසේ ම උඩකැන්දවල සිරි සරණංකර හිමියන්, ශ්‍රී ලාංකික සමාජයට හඳුන්වා දුන් ප්‍රගතිශීලි, අධිරාජ්‍ය විරෝධී ලේඛන සම්ප්‍රදය පසකට තල්ලු කැර දමා අනුගමනය කළ ක්‍රියා පිළිවෙත හේතුවෙන් මාර්ටින් වික්‍රමසිංහයෝ ඉබේ ම අපහාසයට සහ උපහාසයට ලක් වූ හ.

මෙවැනි ක්‍රියාවන් නිසා සිදු වූයේ 'ජනතා ලේඛක පෙරමුණ' පමණක් නොව, කොමියුනිස්ට් පක්ෂය ප්‍රමුඛ වාම සන්නිවේදනයට සමාජයේ යම් ඉඩක් ලබා ගැනීමට අවස්ථාවක් නොලැබී යෑම යි.

මෙවැනි පසුබිමක් යටතේ වාමාංශික ව්‍යාපාරයට තම පුවත්පත් අලෙවි කැර ලැබෙන ආදායමෙන් යැපෙන්නට සිදු විය. කෙසේ නමුත් "ආරම්භක යුගයේ ඩිමයි පිටු හතරක ටැබ්ලොයිඩ් පිටු 08 ප්‍රමාණයේ වාමාංශික පුවත්පතක් සත දෙකකට හෝ තුනකට හෝ විකුණන ලදි" (සරත්, 2000: පි.38). එහෙත් ජාතික පුවත්පත්වලට සාපේක්ෂ ව, මේ වාමාංශික පුවත්පත් ක්‍රමානුකූල ව බෙදා හැරීමේ ක්‍රමවේදයක් සකසා නොතිබීම නිසා පාඨක ජනතාව සමඟ සාර්ථක සන්නිවේදනයක් පවත්වාගෙන යෑමට අපොහොසත් විය. ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මේ පුවත්පත්වලට සම්බන්ධ ව කටයුතු කළ පිරිස්වලට වාමාංශික

LIBRARY
SRI PALEE CAMPUS



ඥානය හෝ හුරුව හෝ නොතිබීම යි. ජාතික පුවත්පත් විදුලි බලයෙන් ක්‍රියාත්මක කරන මුද්‍රණ යන්ත්‍ර භාවිත කළ ද, වාමාංශික පුවත්පත්වලට එවැනි යන්ත්‍ර නොතිබිණි. මුද්‍රණ කටයුතු සියල්ල සිදු වූයේ ''පරණ පන්නයේ දෑතින් රෝද කරකවා ක්‍රියාත්මක කරන මැෂින් හෝ පයින් පාගා ක්‍රියාත්මක කරන කුඩා මැෂින්වලිනි'' (සරත්, 2000: පි.38). එහෙත් මෙවැනි යන්ත්‍ර ප්‍රයෝජනයට ගනිමින්, ජාතික පුවත්පත්වලින් සමාජගත කළ ධනේශ්වර දෘෂ්ටිවාදයට ඍජු ව පිළිතුරු දෙමින්, ඔවුන්ට අභියෝගයක් වීමට වාමාංශික පුවත්පත් සමත් විය. මේ අභියෝගාත්මක ප්‍රවේශය කල් යෑමේ දී යම් පසුබෑමකට ලක් විය. විශේෂයෙන් මූල්‍යමය හිඟයත් නියමිත දිනට පුවත්පත වෙළෙඳපොළට නොපැමිණීමට හේතු සාධක විය. මේ අතර වඩාත් බරපතළ සිද්ධිය වූයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය ආණ්ඩුවේ මර්දනයට එම වාමාංශික පුවත්පත් ගොදුරු වීම යි. වාමාංශික පුවත්පත්වලට එරෙහි ව විවිධ බාධක පැනවූ අතර, ඒවාට සම්බන්ධ වී වැඩ කළ කොටස් මැර ප්‍රහාරවලට ද ලක් වූ අවස්ථා තිබේ. එහෙත් මේ වාමාංශික පුවත්පත් ප්‍රකාශයට පත් කළ සමසමාජ, කොමියුනිස්ට් පක්ෂ මූලික සමාජ, දේශපාලන ප්‍රශ්න පසෙක තබා න්‍යායිකවාදී (ට්‍රොට්ස්කි-ස්ටාලින් මතභේදය) ගැටුම් දෙසට වේගයෙන් තල්ලු වී ගියේ ය. මේ නිසා ආරම්භක යුගයේ වාමාංශික පුවත්පත් සිය දෘෂ්ටිවාදය සමාජගත කිරීම සඳහා දැක්වූ සන්නිවේදන දායකත්වයත්, එය වටා ගොඩනැඟුණු ශක්තියත් ක්‍රමයෙන් හීන වීමට පටන් ගත් බවක් දක්නට ලැබිණි.

LIBRARY
SRI PALEE CAMPUS



## පාදක සටහන්

1. සරත්, ලයනල් (2000), 'ශ්‍රී ලංකාවේ වාමාංශික ජන සන්නිවේදනය' (මුල් යුගය), කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
2. විජේකෝන්, චන්දන (2007), 'පුවත්පතේ කතන්දරේ' - න්‍යාය හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ විමසුමක්, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
3. හැටපස් වසරක් (1943-2008), 'ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට පක්ෂයේ 65 වැනි සංවත්සර සංග්‍රහය', කොළඹ 07, සේයා ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට්ස් පුද්ගලික සමාගම.
4. එම.
5. එම.
6. එම.
7. සරත්, ලයනල් (2000), 'ශ්‍රී ලංකාවේ වාමාංශික ජන සන්නිවේදනය' (මුල් යුගය), කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
8. එම.

සිවු වැනි පරිච්ඡේදය

# වාමාංශික පුවත්පත් හා සඟරා

## 1. කම්කරුවා

ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රථම සිංහල පුවත්පත 'කම්කරුවා' නමින් හැඳින්විණි. 1934 මාර්තු 9 වැනි දා ප්‍රකාශයට පත් වූ මෙම පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයා ලෙස කටයුතු කැර ඇත්තේ බී. ජේ. ප්‍රනාන්දු ය. ඔහු ලංකා සමසමාජ පක්ෂයේ ආරම්භක සම ලේකම්වරයකු ලෙස ද කටයුතු කැර ඇත. වැල්ලම්පිටියේ 'නවජීවන' මුද්‍රණාලයේ දී 'කම්කරුවා' මුද්‍රණය කැර ඇති අතර, ප්‍රකාශක ලෙස කටයුතු කැර ඇත්තේ වමේ ව්‍යාපාරයේ ක්‍රියාධරයකු වූ ඩී. බී. සමරනායක ය. 'ටැබ්ලොයිඩ්' ප්‍රමාණයෙන් මුද්‍රණය වී ඇති මේ පුවත්පතේ මිල ශත දෙකක් බව සඳහන් වුව ද, අයිතිකරුගේ නම එහි දක්නට නොලැබේ.

'කම්කරුවා' මාක්ස්-ලෙනින්වාදී ප්‍රකාශයක් ලෙස මුද්‍රණය විය. එහි පළ වී ඇති බොහෝ ලිපිවලින් හා සන්දේශවලින් අධිරාජ්‍යවාදය හා ධනවාදය දැඩි සේ විවේචනයට ලක් කැර තිබේ. මෙහි පළමු කතුවැකියෙන් ධනවාදයේ ඇති ප්‍රශ්න පිළිබඳ වත්, සෝවියට් දේශයේ පවතින යහපත් සමාජ තත්ත්වය වැනසීමට ධනවාදී රටවල් දරන වෑයමත් හෙළිදරව් කැර තිබේ. අමෙරිකාවේ හා එංගලන්තයේ පවතින රැකියා අර්බුදයත්, ලෝක යුද්ධයකට ධනවාදී රටවල් දරන වෑයමත් කතුවැකිය මඟින් පෙන්වා දී ඇත. එහෙත් මේ පුවත්පත ආරම්භ කළ පුරෝගාමීන්ගේ මූලික අරමුණ වූයේ කම්කරු පන්තිය අධිරාජ්‍යවාදීන් ඉදිරියේ පාවා දුන් ඒ. ඊ. ගුණසිංහගේ අවස්ථාවාදී දේශපාලන න්‍යාය පත්‍රය දැඩි ලෙස විවේචනයට ලක් කිරීම යි. ගුණසිංහගේ මූලිකත්වයෙන් ප්‍රකාශයට පත් වූ 'වීරයා' පුවත්පත ඒ අවස්ථාවාදී දේශපාලනය ඉදිරියට ගෙන ගියා පමණක් නො ව, වාමාංශික ව්‍යාපාරයට දැඩි ප්‍රහාරයක් ද එල්ල කෙළේ ය. ඒ සියලු මතවාදී ප්‍රහාරවලට පිළිතුරු දීමට 'කම්කරුවා' සමත් විය.

වාමාංශික පුරෝගාමීන් විවිධ අවස්ථාවල 'කම්කරුවා' මඟින් තම දේශපාලන අරමුණු පැහැදිලි කැර ඇත. වරෙක තීරු ලිපි මඟින් ද, වරෙක තීරු හතරක ලිපියක් මඟින් ද සිය අරමුණු හෙළි කැර තිබේ. මේ එසේ පළ වූ ලිපියක කොටස් කීපයකි:

"... ලෝකයේ හයෙන් කොටසක් පමණ වූ රුසියාවේ අද දවසෙහි සම්පූර්ණ කම්කරු ආණ්ඩුවක් දැහැමින් සෙමින් ජනකායක් සතප්වයි. ... පොහොසතුන්ගෙන් කප්පන් ගෙන කම්කරු අයිතිවාසිකම්වලට පයින් ගසා තමන්ට ම යාතිකා කරගෙන සෙත් කවි කියවාගන්නා වූ පුද්ගලික හුදු පූච්චානම්වලින් පුරවන පත්‍ර මෙන් නොව 'කම්කරුවා' පත්‍රය නිකාය, වර්ග, ආගම්, ජාති භේදවලින් තොරව සම්පූර්ණයෙන් ම, සහමුලින් ම කම්කරුවාගේ දියුණුව අරභයා පමණක් පවත්වන්නක් වේ. සියලු ම කම්කරුවන් එක් වී කම්කරුවන්ගේ ම පත්‍රය වූ මේ කම්කරු පත්‍රය නංවාලීමෙන් කම්කරු බලය ලංකා මිහිතලයෙහි පතුරාලීමට උත්සාහ කළ යුතු ය" (සරත්, 2000 : පි.39-40).

එමෙන් ම රාජ්‍ය මන්ත්‍රණ සභා මන්ත්‍රී දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ මන්ත්‍රණ සභාවේ දී කළ කථා 'කම්කරුවා' ප්‍රකාශයට පත් කැර ඇත. රටේ ජනතාවට කිසිදු සහනයක් ලබා නොදී පාලකයන් බදු පනවන ආකාරය පිළිබඳ ව දොස්තර වික්‍රමසිංහ කළ විග්‍රහවල ඇති වැදගත්කම පෙන්වා දී තිබේ. මෙයට අමතර ව වික්‍රමසිංහ 'කම්කරු ව්‍යාපාරය' මැයින් ද, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා 'ලංකාව ගැන පාර්ලිමේන්තු විවාද (බ්‍රිතාන්‍ය)' මැයින් ද, පිලිප් ගුණවර්ධන 'ලංකා ජාතික සංගමය' මැයින් ද, හෙන්රි පීරිස් 'ගම්බද කම්කරුවා' මැයින් ද ලියා තිබූ ලිපි 'කම්කරුවා' සතිපතා ප්‍රකාශයට පත් කැර ඇත. ජනතාවට දේශපාලන අවබෝධයක් ලබා දීමේ අරමුණින් මේ ලිපි සම්පාදනය වී තිබේ. විශේෂයෙන් නාගරික කම්කරුවන්ගේ දේශපාලන දැනුම වර්ධනය කිරීමට 'කම්කරුවා' සමඟ වාම ව්‍යාපාරයේ පුරෝගාමීන් නිරන්තර උත්සාහයක යෙදී ඇති බව මෙයින් පැහැදිලි ය. අධිරාජ්‍ය ආණ්ඩුව මැලේරියා වසංගතය මැඩපැවැත්වීමට නිසි ලෙස මැදිහත් නොවී සිය සුබ විහරණය උදෙසා අනුගමනය කළ ක්‍රියාකලාපවලට ප්‍රහාර එල්ල කරමින් ලිපි හා තීරු ලිපි පළ කැර තිබේ. මැලේරියා වසංගතයෙන් පීඩා විඳි ලක්ෂ අටක්



පමණ ලාංකික ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ගැන අවධානය නිසි ලෙස යොමු නොකළ රාජාණ්ඩුව ග්ලෝස්ටර් ආදිපාදවරයා වෙනුවෙන් රට පුරා උත්සව පැවැත්වීමට කටයුතු යොදා තිබිණි. රාජාණ්ඩුවේ මේ ක්‍රියා කලාපයට එරෙහි ව සිංහල හා බර්ගර් රැඩිකල් කොටස් පිරිස් කොළඹ නගරය පුරා සුළු සුළු උද්ඝෝෂණ කැර ඇත. විශේෂයෙන් මෙහි කැපී පෙනෙන සිද්ධිය වී ඇත්තේ ටෙරන්ස් ඇන්. ද සිල්වා සහ ආර්. බර්ග් යන දෙදෙනා (මේ දෙදෙනා ම කොළඹ සිටි ප්‍රධාන පෙළේ බර්ගර් ජාතිකයෝ ය.) කළු කොඩි ඔසවා ගෙන රාජාණ්ඩුවට එරෙහි ව පත්‍රිකා බෙදමින් මෝටර් රථවල ගමන් කිරීම යි. මෙයින් කුපිත වූ ආණ්ඩුව මේ දෙදෙනා අත්අඩංගුවට ගත් ආකාරය පිළිබඳ ව 'කම්කරුවා' පත්‍රය පැහැදිලි වාර්තාවක් පළ කැර තිබිණි. එසේ ම වාම ව්‍යාපාරයේ දේශපාලන නායකත්වය පිළිගත් කම්කරුවන්ගේ වැඩ වර්ජන (විශේෂයෙන් රෝහල් කම්කරුවන්ගේ) හා ඔවුන්ගේ ඉල්ලීම් පිළිබඳ වත්, නාගරික ව හා ග්‍රාමීය ව අකුරු ලිවීමට හා කියවීමට නොහැකි පිරිස් හා ආණ්ඩුව පිළිබඳ වත්, ලංකාවට ගෙන්වන ලද ආහාර-පාන පිළිබඳ වත් විවේචනාත්මක ලිපි 'කම්කරුවා' නිරන්තරයෙන් පළ කැර ඇත. වාමාංශික පුරෝගාමීන් විසින් කොළඹ නගරයේ හා ඉන් පිටත පිහිටුවන ලද කම්කරු සමිතිවල තොරතුරු හා ඒ සමිතිවල සාමාජිකයන් ඇමැතු පුරෝගාමීන්ගේ කථා පුවත්පත මඟින් ප්‍රකාශයට පත් කැරිණි. එසේ ම සූරියමල් ව්‍යාපාරයේ ප්‍රචාරක කටයුතු ඉදිරියට ගෙන යෑම සඳහා ද 'කම්කරුවා' ප්‍රයෝජනයට ගෙන ඇත. "වාමාංශික ව්‍යාපාරයේ මුල් පුවත්පත වූ මෙය 1934 දෙසැම්බර් 28 වැනි දායින් පසු පළ නො වී ය. එතෙක් පළ වුණු කලාප ගණන විසිදෙකකි. මේ පුවත්පත ඇතැම් විට නොමිලයේ ද බෙදාහැර තිබේ. පුවත්පතේ නම සාමාන්‍ය ජනතාව ආකර්ෂණය කෙරෙන තත්ත්වයක නොතිබීම එය ඇනහිටීමට හේතු වුණා විය හැකි ය" (සරත්, 2000: පි.42).

## 2. සමසමාජය

'කම්කරුවා' පුවත්පත ඇනහිටීමෙන් පසු වාමාංශික ව්‍යාපාරයට සිය මතවාද ඉදිරියට ගෙන යෑමට ක්‍රමවත් මාධ්‍යයක්

නො වී ය. වසරකුත් මාස හතක් යන තුරු පුවත්පතක් මුද්‍රණය නොවීම නිසා අධිරාජ්‍ය ගැති බලවේගවලින් එල්ල වූ අභියෝග ජය ගැනීම ඒ තරම් පහසු කාර්යයක් නො වී ය. මේ තත්ත්වය යටතේ 1936 ජූලි මස 10 වැනි දා සතිපතා ප්‍රවෘත්ති පත්‍රයක් ලෙස 'සමසමාජය' ප්‍රකාශයට පත් විය.

ලංකා සමසමාජ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයකු වූ කේ. ජී. අමරසිංහගේ නමින් 'සමසමාජය' ආරම්භක පුවත්පත ප්‍රකාශයට පත් කරනු ලැබිණ.

කොළොන්නාවේ 'සූර්යෝදය යන්ත්‍රාලයේ' දී මෙම පුවත්පත මුද්‍රණය වූ අතර, ප්‍රධාන කාර්යාලය මරදාන පංචිකාවත්තේ අංක 39 දරන ස්ථානයේ පවත්වාගෙන යන ලදි. 'කම්කරුවා' පුවත්පතේ ආරම්භක කර්තෘවරයා වූ බී. ජේ. ප්‍රනාන්දු 'සමසමාජ' කතුවරයා වූයේ ය. හෙන්රි පීරිස් (පසු කලක ඔහු රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පාණදුර මන්ත්‍රීවරයා ලෙස මහජන ඡන්දයෙන් තේරී පත් විය.) සහායක කතුවරයා ලෙස ක්‍රියා කෙළේ ය. (1936 ජූලි මස 10 වැනිදා සතිපතා ප්‍රවෘත්ති පත්‍රයක් ලෙස 'සමසමාජය' ප්‍රකාශයට පත් විය.) 'සමසමාජය' ලාංකික වාමාංශික ව්‍යාපාරයේ දෙවැනි සිංහල පුවත්පත වූ අතර, විටින් විට අවස්ථා කීපයක දී ඇනහිටිමින් යළි යළිත් ආරම්භ විය. ලංකා සමසමාජ පක්ෂයේ නිල පුවත්පත වූ මෙය, ටැබ්ලොයිඩ් ප්‍රමාණයෙන් පිටු අටකින් මුද්‍රණය වූ අතර, ආරම්භක මිල ශත දෙකක් වී ඇත. එහෙත් වසර එකහමාරකට පසු 'සමසමාජයේ' මිල ශත තුනක් වූයේ මුද්‍රණ කටයුතු සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වූ බැවිනි.

'සමසමාජය' ආරම්භක අවස්ථාවේ පිටපත් 2000ක් පමණ මුද්‍රණය කැර තිබේ. එහෙත් වැඩි කලක් යෑමට මත්තෙන්, එනම් 1937 දෙසැම්බර් 31 වැනිදා වන විට මේ පුවත්පතේ අලෙවිය පිටපත් 14000ක් දක්වා වැඩි වී ඇත. ඒ වන විට රටේ සිටි ජනගහනයට සාපේක්ෂ ව මේ අලෙවිය සමාජයට ප්‍රබල බලපෑමක් සිදු කෙළේ ය. '' 'සමසමාජය' ගෙයින් ගෙට ගොස් විකිණීමේ ප්‍රචාරක ව්‍යාපාරයක් ද පක්ෂයේ ප්‍රාදේශීය ශාඛා මඟින් පවත්වා ගෙන යනු ලැබී ය'' (සරත්, 2000: පි.42). මේ වන විට ප්‍රකාශයට පත් වූ 'දිනමිණ' සහ සතිපතා පුවත්පත් කීපයක්



සමාජවාදී දර්ශනයට විරුද්ධ ව දිගින් දිගට ම ගෙනගිය දැවැන්ත ප්‍රචාරයට පිළිතුරු දීමට 'සමසමාජය' ඉදිරිපත් විය. විශේෂයෙන් වාමාංශික ව්‍යාපාරය ගෙන ගිය රැඩිකල් ක්‍රියාමාර්ග 'දිනමිණ' වැනි පුවත්පත් විසින් සමච්චලයට ලක් කරන ලද අවස්ථා එමට ය. ඒ සඳහා විශේෂාංග ලිපි හා කාටූන් ප්‍රයෝජනයට ගත් අවස්ථා තිබේ. ඒ සියලු ප්‍රහාරවලට සාර්ථක ව ප්‍රතිප්‍රහාර එල්ල කළ 'සමසමාජය' විධිමත් ව සතිපතා ප්‍රකාශයට පත් වූයේ 1940 ජූනි 14 වැනි දා දක්වා පමණි. මේ වන විට කලාප දෙසිය හතළිහකට ආසන්න ප්‍රමාණයක් මුද්‍රණය කැර තිබේ. මෙම පුවත්පත නැවතී යෑමට ප්‍රධාන වශයෙන් බල පෑ හේතුව වූයේ දෙවැනි ලෝක යුද්ධය සමයේ ක්‍රියාත්මක වූ යුද්ධ නීතිය යි. මේ නීතිය පාදක කොටගෙන සමසමාජ පක්ෂයට සම්බන්ධ නායකයෝ රැසක් අත්අඩංගුවට ගෙන සිරභාරයට පත් කරන ලද හ. පුවත්පත මුද්‍රණය කළ මුද්‍රණාලය වෙත රාජාණ්ඩුවේ පොලිසිය පැමිණ කළ බාධා කිරීම් හා අවහිරතා පුවත්පතේ පැවැත්මට ප්‍රධාන වශයෙන් බලපෑවේ ය. උඩරට මුල්ඔය වත්තේ ඇති වූ කම්කරු අරගලවලට සමසමාජ නායකයන් හා 'සමසමාජය' පුවත්පත සම්බන්ධ බවට රාජාණ්ඩුව සැක කළ නිසා මේ අවහිරතා නිරන්තරයෙන් එල්ල විය.

මෙවැනි පරිසරයක සිට සිය දේශපාලන මතවාදය ඉදිරියට ගෙන යෑම වාම කණ්ඩායම්වලට අභියෝගයක් විය. එයට මුහුණ දෙමින්, 1940 ජූනි මස අවසානයේ සිට 'සමසමාජය' රහස්‍ය පත්‍රිකාවක් වශයෙන් නොමිලේ බෙදාහැරීමට මේ කණ්ඩායම් සමත් වූ හ. ඒ අනුව මෙම පත්‍රිකාව අක්‍රමික ව කලාප හතළිස් පහකට ආසන්න ප්‍රමාණයක්, 1942 ඔක්තෝබර් 28 වැනි දා තෙක් ප්‍රකාශයට පත් විය. පුවත්පතේ පිටු ගණන, කලාප අංක හා ප්‍රමාණය ක්‍රමානුකූල නොවුණත්, අධිරාජ්‍යවාදය හා ඒ වටා ගොඩනැඟුණු දේශපාලනය 'සමසමාජය' විසින් තියුණු විවේචනයකට ලක් කරන ලදි. නිදසුනක් නම් 1938 ජූලි 15 වැනි සිකුරාදා 'සමසමාජය' මුල් සිරස්තලයෙන් ඒ. ඊ. ගුණසිංහගේ දේශපාලන ව්‍යාපාරයට පහර ගැසීම ය. එහි සඳහන් ව තිබුණේ 'කාපු පතේ වැලි දාපු ගුණසිංහ', 'කම්කරු පංතියෙන් නැග කම්කරු පංතියට කළ නින්දාව' යනුවෙනි. ගුණසිංහ කම්කරු

පන්තිය උගසට තියා තම ආත්ම ප්‍රයෝජනය සඳහා ධනපති පන්තියත් සමඟ සන්ධානගත වී කරන කුමන්ත්‍රණ මේ සිරස්තලය යටතේ ලියැවුණු ප්‍රවෘත්තියේ සඳහන් විය. එහි සඳහන් වී ඇති අන්දමට "විශ්ව සංවේගයට කරුණක් වූයේ කම්කරු පන්තියේ කර උඩින් බලයට හා යසසට පැමිණි ඒ. ඊ. ගුණසිංහ මහතාගේ පංති ද්‍රෝහී ප්‍රකාශයන් ය. ගුණසිංහ මහතා කථා කරමින් ඕවර්ලෝඩිං ගැන ඩ්‍රයිවර්වරුන්ට දඬුවම් නොපමුණුවා බස් අයිතිකාරයින්ට දඬුවම් පැමිණවීම ගැන සිය විරුද්ධත්වයක් දක්වී ය. මොටෝ රියැදුරන් වෙනුවෙන් වචනයක් වත් සඳහන් නොකර බස් අයිතිකාර ධනපතීන්ගේ ම පක්ෂය පමණක් ගෙන, ඒ. ඊ. ගුණසිංහ මහතා කථා කිරීම මහත් පුදුමයට කරුණක් බැව් සහෝදර ඇන්. ඇම්. පෙරේරා කියයි".

1942 මාර්තු මාසයේ දී ලංකා සමසමාජ පක්ෂය තහනමට ලක් කරනු ලැබිණි. සිරභාරයේ රඳවාගෙන සිටි නායකයන් ඉන් පලා යෑමත් සමඟ 'සමසමාජය' මාස කීපයක් ඉතා ම රහසිගත ව පළ කිරීමට වග බලාගත්හ. ආණ්ඩුව 1945 අග භාගයේ දී පමණ රට පුරා පනවා තිබූ ආරක්ෂක නීති ඉවත් කිරීමෙන් පසු සමසමාජ පක්ෂ නායකයන්ට නිදහස ලැබිණි. නැවතත් 'සමසමාජය' මුද්‍රණය කිරීමට පටන් ගත් අතර, ජනතාව මුළා කරන නායකයන්ට පිළිතුරු දීම ආරම්භ කරන ලදි. ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා වැනි නායකයන්ගේ නම්වලින් ලිපි මෙහි පළ විය.

එහෙත් ආරක්ෂක නීති ඉවත් කැර වැඩි කලක් යෑමට මත්තෙන් ලංකා සමසමාජ පක්ෂය දෙවැනි වරටත් බිඳී ගියේ ය. සමසමාජ පක්ෂයෙන් වෙන් වී ගිය කොටස් 'ඉන්දියානු බොල්ෂෙවික් පක්ෂය' නමින් සංවිධානයක් පිහිටුවාගත් හ. මෙම දේශපාලන සංවිධානය සිය ප්‍රතිපත්ති ජනතාව අතරට ගෙන යෑම සඳහා 'සටන' නමින් පුවත්පතක් ආරම්භ කෙළේ ය. එහෙත් වැඩි කලක් යෑමට පෙර මේ දේශපාලන සංවිධානයට සම්බන්ධ ව සිටි කණ්ඩායම් දෙක ඒකාබද්ධ වීමෙන් පසු පුවත්පතක් ප්‍රකාශයට පත් කළ අතර, එය 'සමසමාජ සටන' නමින් හැඳින්විණි.



කෙසේ නමුත් 'සමසමාජය' පුවත්පතේ ප්‍රථම කතුවැකියෙන් ධනවාදය දැඩි සේ විවේචනයට ලක් කැර තිබූ අතර, සමසමාජ දර්ශනය වැඩදායක බව පැහැදිලි කැර තිබිණි. ''අප ලක්දිව ද ධනේශ්වරවාදීන් විසින් දුප්පතුන් භේද කිරීමට කරන උත්සාහයන්ට ද, සමසමාජ ධර්මය ගැන කරන අභූත චෝදනාවන්ට ද විරුද්ධ ව නිර්භය ව සටන් කිරීමටත්, සමසමාජ ධර්මය මේ යැ යි සාධාරණයට හිතැති සැම සත්පුරුෂ ජනයාට පහදා දීමටත් මේ පත්‍රය පටන් ගන්නා ලද්දේ ය. ඒ බැවින් යුක්ති ගරුකව මහජනයා මේ සත් කාර්යයට සැම ආධාරයක් ම දේ යැ යි අප බලාපොරොත්තුව යි.'' (ලයනල්, 2000: පි.45) යනුවෙන් කතුවැකියේ සඳහන් ව තිබිණි.

මේ පුවත්පතේ විශේෂත්වය වූයේ 'දිනමිණ' වැනි ජාතික පුවත්පත් අබිබවා යන අන්දමින් ජාතික හා අන්තර්ජාතික ප්‍රවෘත්ති පළ වීම යි. ඒ හැම ප්‍රවෘත්තියකින් ම දේශීය වශයෙන් හා අන්තර්ජාතික වශයෙන් ක්‍රියාත්මක වන ධනවාදී ක්‍රම උපායවලට දැඩි ලෙස පහර ගසා තිබිණි. ඒ වන විට යුරෝපය පුරා පැතිර යමින් තිබූ පැසිස්ට්වාදී දේශපාලනය පරාජය කිරීමට සෝවියට් දේශය ගෙන යන වෑයම මේ 'සමසමාජය' වාර්තා කැර තිබිණි. සමාජවාදී ලෝකයක් තුළ ජනතාවට අත් වන ප්‍රතිලාභ හා සූරාකෑම අවසන් වීම ගැන විචාර ලිපි සතිපතා පළ වී ඇත. ඇතැම් විදේශ ප්‍රවෘත්ති ලබාගෙන ඇත්තේ 'ඇසෝසියේටඩ් ප්‍රෙස්' ප්‍රවෘත්ති ඒජන්සියෙනි. මේ ප්‍රවෘත්ති ලබාගැනීමේ දී 'සමසමාජය' කර්තෘ බී. ජේ. ප්‍රනාන්දු ට කේරලයේ මලයාලි නායකයන් සහයෝගය දී ඇත.

දේශපාලන ලිපි සහ වෙනත් විශේෂ ලිපි 'සමසමාජයට' ලිවීම සඳහා පෙරමුණ ගත් අය අතර, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා, වර්නන් ගුණසේකර, ලෙස්ලි ගුණවර්ධන, දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ, උඩකැන්දවල සිරි සරණංකර හිමි, ඇම්. ජී. මැන්ඩිස්, ජේ. සී. ඩී. කොතලාවල, හෙන්රි පීරිස්, ඊ. ඇස්. රත්නවීර, සිරිසේන කුලතිලක, කරන්දෙණියේ සුගතවංස හිමි සහ සෝමවීර චන්ද්‍රසිරි වැනි ලේඛකයෝ පෙරමුණ ගත් හ. මෙයට අමතර ව ස්වාධීන උගත්

බුද්ධිමතුන් ලෙස පෙනී සිටි ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් ඇතුළු තවත් කීප දෙනෙක් 'සමසමාජය'ට ලිපි ලියූ හ. එම බොහෝ ලිපිවලින් සමාජවාදී ක්‍රමයේ පවතින සාධනීය ලක්ෂණ හා ඒවා සිදු වන ආකාරය පැහැදිලි කැර තිබිණි. මේ වන විට රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කළ ඇන්. ඇම්. පෙරේරා සහ පිලිප් ගුණවර්ධන රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළ කළ කථා කිසි ම සංශෝධනයකට ලක් නොකැර පළ කිරීමට මෙම පුවත්පත කටයුතු කැර ඇත.

ලංකාවට නිදහස ලබා ගැනීම සම්බන්ධයෙන් පැවැති සාකච්ඡා උද්ඝෝෂණ සහ ඊට අවශ්‍ය මඟ පෙන්වීම් සම්බන්ධ වාර්තා 'සමසමාජය' සිය වගකීමක් ලෙස සලකා පළ කැර තිබේ. මෙහි දී කැපී පෙනෙන සිද්ධියක් වූයේ විදේශ කම්කරුවන් මෙරටට ගෙන්වීමට විරුද්ධ ව ලංකා සමසමාජ පක්ෂය ගෙන ගිය උද්ඝෝෂණ ව්‍යාපාරය ගැන සාකච්ඡා කිරීම සඳහා ලංකාවට පැමිණි ජවහර්ලාල් නේරු සමසමාජ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ නායකයන් විසින් පිළිගනු ලැබීම සම්බන්ධ වාර්තාව හා ඡායාරූපය 'සමසමාජය' පළ කැර තිබීම ය.

1937 දී බ්‍රෙස්ගර්ඩ්ල් පිටුවහල් කිරීමට රාජාණ්ඩුව ගත් තීරණයට එරෙහි ව ලංකා සමසමාජ පක්ෂය ගෙන ගිය සටන පිළිබඳ විස්තර වාර්තා මෙම පුවත්පතේ පළ කැර ඇත. විශේෂයෙන් ඒ වන විට එංගලන්ත කිරීටය හිමි වික්ටෝරියා රැජනගේ පිටුවහල් කිරීමේ නීතිය 'සමසමාජය' දරුණු විවේචනයකට ලක් කැර තිබිණි. 1937 ජූනි 2 වැනි දා 'සමසමාජය' වික්ටෝරියා රැජනගේ පිටුවහල් කිරීමේ නීතිය මේ දිවයිනෙන් ම අවලංගු කරන ලෙසට බල කැර සිටියේ ය. 'සමසමාජය' එවැනි බලපෑමක් ඇති කෙළේ බ්‍රෙස්ගර්ඩ්ල් එවකට ලංකාවේ පුරවැසියකු වූ නිසා ය.

1940 ජූනි 26 වැනි දා සිට 1942 ඔක්තෝබර් 17 වැනි දා තෙක් 'සමසමාජය' රහසිගත ව ප්‍රකාශයට පත් වී ඇත. එහි ඇතැම් ප්‍රවෘත්තිවලින් ට්‍රොට්ස්කිවාදී මතවලට තැනක් දී තිබිණි. විශේෂයෙන් හතර වැනි ජාත්‍යන්තර සභාවේ ක්‍රියාමාර්ග 'සමසමාජය' මඟින් ප්‍රකාශයට පත් කරන ලදි. නිදසුනක් වශයෙන් ''ඉන්දියා බොල්ෂෙවික් ලෙනිනිස්ට් පක්ෂය වනාහි 4 වැනි



ඉන්ටර්නැෂනල් සභාවේ ක්‍රියාමාර්ග අනුගමනය කරන පක්ෂයකි. එය ඉන්දියන් කම්කරු පන්තියේ එක ම නියම විප්ලවවාදී පක්ෂය යි. ලංකා සමසමාජ පක්ෂය එහි ශාඛාවකි'' (ලයනල්, 2000: පි.43) යනුවෙන් 'සමසමාජය' පත්‍රයේ සඳහන් වී තිබේ. 1942 ඔක්තෝබර් 28 වැනි දා 'සමසමාජ පත්‍රයේ' ඉහළින් මෙසේ සඳහන් ව ඇත: "4 වෙනි ඉන්ටර්නැෂනල් එකේ ඉන්දියන් කොටස වන ඉන්දු-ලංකා බොල්ෂෙවික් ලෙනිනිස්ට් පක්ෂයේ ලංකා ශාඛාව පළ කරයි" යනුවෙනි. මේ මතවාදී ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් මතු වූයේ සමසමාජ පක්ෂයේ අභ්‍යන්තර භේදවලින් පසු ව ය. පුවත්පත ආරම්භ වූ මුල් කාලයේ ජාතික නිදහස අධිරාජ්‍ය විරෝධී භාවය, සමාජවාදී ලංකාවක් සඳහා වූ සන්නිවේදන ක්‍රියාදාමය ප්‍රධාන වශයෙන් වෙනස් වූයේ ය. "1941 දී රහසිගත ව පවත්වන ලද සම්මේලනයක දී ලංකා සමසමාජ පක්ෂය, තදින් වෙළුණු පක්ෂයක් ලෙස ප්‍රතිසංවිධානය කොට ට්‍රොට්ස්කිවාදී හතරවැනි ජාත්‍යන්තරයට සම්බන්ධ කරන ලදී" (ජයවර්ධන, 2009: පි.190). මේ තත්ත්වය නිසා රහසිගත කාලසීමාවේ නිකුත් කළ පුවත්පත ඉහත සන්නිවේදන ක්‍රියාදාමය ඉදිරියට ගෙන යෑමට දායක වූයේ නැත.

ඉංග්‍රීසි භාෂාව රාජ්‍ය භාෂාව ලෙස ක්‍රියාත්මක වීම ගැන 'සමසමාජය' විරෝධාත්මක ලිපි පළ කළ අවස්ථා තිබේ. විශේෂයෙන් යුරෝපීය ඇඳුම්-පැලඳුම්වලින් සැරසී බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතේ සේවය කළ නිලධාරීහු 'සමසමාජය' විවේචනයට ලක් කළහ. 'සමසමාජය' රාජ්‍ය නිලධාරීන් හා ඔවුන්ට සේවය කරන සේවකයන් උපහාසයට ලක් කරමින් විවිධ අදහස් සන්නිවේදනය කෙළේ ය. එය කොළඹ නගරයේ සිටින, රාජ්‍ය නිලධාරීන් දුප්පතුන්ට සිදු කරන සතුරුකම් උපහාසයෙන් හෙළා දක්කේ ය. රාජ්‍ය නිලධාරීහු 'රට අමුඩයන්' ලෙසත්, ඔවුන් යටතේ සේවය කරන සේවකයෝ 'තෝල්ක රට අමුඩයන්' ලෙසත් හඳුන්වන ලද හ. මෙයට අමතර ව රට පුරා ආණ්ඩුවේ පරිපාලන කටයුතු ස්වභාෂාවෙන් කළ යුතු බවට අදහස් සන්නිවේදනය කෙළේ ශ්‍රී ලාංකික වාම ව්‍යාපාරය විසිනි. මේ සමඟ ම පොලිස් සටහන් හා සාක්කි සිංහල හා දෙමළ භාෂාවලින් සඳහන් විය යුතු ය යන යෝජනාවක් වාමාංශිකයෝ ඉදිරියට ගෙන ආ හ.

විශේෂයෙන් මේ සම්බන්ධ යෝජනාව පිලිප් ගුණවර්ධන 1939 රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කෙළේ ය. පිලිප් ගුණවර්ධන ගෙනා එම යෝජනාව ස්වදේශීය කටයුතු අමාත්‍යාංශයේ කාරක සභාවේ දී සාකච්ඡාවට ලක් විය. ඩී. බී. ජයතිලක ප්‍රමුඛ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරුන් පිරිසක් මේ යෝජනාව සම්බන්ධ ව පිළියෙළ කළ වාර්තාවේ සඳහන් වූයේ එය කළ නොහැකි කාර්යයක් ලෙසයි. ඩී. බී. ජයතිලකගේ ක්‍රියා කලාපය 'සමසමාජය' දැඩි සේ විවේචනයට ලක් කෙළේ ය. මේ විවේචනයෙන් නොනැවතුණු 'සමසමාජය' උසාවිවල සිංහලයෙන් හා දමිළ බසින් නඩු ඇසීම සිදු කළ යුතු බවට මතයක් සන්නිවේදනය කෙළේ ය. ඒ මතයට පසුබිමක් සකස් කළෝ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි සමසමාජ පක්ෂ නායකයෝ ය. මේ කාරණය සම්බන්ධයෙන් ලංකාවේ සිටි නීති ලේකම්ගේ අනුමතිය ලැබුණ ද, නීතිඥයෝ ඊට විරුද්ධ ව නැඟී සිටියහ. මේ ක්‍රියාවලිය හෙළා දකිමින් ලංකා සමසමාජ පක්ෂය රට පුරා රැස්වීම් සංවිධානය කළ අතර, 'සමසමාජය' පුවත්පත නීතිඥයන්ට දැඩි ලෙස ප්‍රහාර එල්ල කෙළේ ය. මේ සටනේ ප්‍රතිඵලයක් හැටියට 1939 නොවැම්බර් මාසයේ දී ගම්පහ උසාවියේ රෝලන්ඩ් ද සොයිසා විනිශ්චයකරු නීති ලේකම් එවා තිබූ ලිපියක් සැලකිල්ලට ගෙන ප්‍රථම වරට සිංහලයෙන් නඩු විසඳීම ආරම්භ කැර ඇත.

මෙම සිද්ධිය අගය කරමින් 'සමසමාජය' මෙසේ ලිව්වේ ය: "ඇත්ත වශයෙන් ම බ්‍රිතාන්‍ය ආණ්ඩු පාලනයට යටත් වූවාට පසු මෙතරම් වැදගත් සහනයක් දුප්පත් මහජනයාට තවත් ලැබුණේ යැ යි කීම සැක සහිත ය. එක් උසාවියක ආරම්භ වූවාට පසු එය නිදර්ශනයට ගෙන අනිකුත් උසාවිවල ද මෙය ක්‍රියාවේ යෙදවීම මෙතරම් අපහසු නො වේ. වැඩ කරන ජනතාව වෙනුවෙන් ඉල්ලීම් ඉදිරිපත් කෙළේ ලංකා සමසමාජ පක්ෂය පමණකි. සිංහලෙන් නඩු ඇසීම වනාහි ලංකා සමසමාජ පක්ෂයේ ආරම්භයේ දී ම ඉදිරිපත් කළ ඉල්ලීමකි. සිංහල භාෂාවේ උන්නතිය පතා ක්‍රියා කරන පණ්ඩිතයන් ද, ස්වරාජ්‍ය ආරක්ෂා කරන ධනපති දේශපාලකයන් ද සිංහලයන් මුරුංගා අත්තේ තබන සිංහල මහ සභාව ද, කම්කරු පන්තිය ආරක්ෂා කිරීමට ලේබර් පක්ෂයක් ද තිබුණේ වී නමුත්, එක පක්ෂයකට



වත් මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමට කල්පනා වූයේ නැත. මෙසේ නොවීමට එක් වැදගත් හේතුවක් ඇති විය. එනම් මේ සෑම සංවිධානයක් ම නීතිඥයන්ගේ සෙල්ලම් බඩු වීම ය. ඉංග්‍රීසි උගත්කම මුල් කරගෙන ශත වර්ෂයක පමණ කාලයක් මහජනයා ගසාකෑමෙන් තර වූ මේ පුද්ගලයෝ අදත් මේ යහපත් යෝජනාව ක්‍රියාවේ යෙදවීමට විරුද්ධ ව සිටිති. එහෙත් මේ පිළිබඳ මන්ත්‍රණ සභාව ස්ථිර තීරණයකට බැස තිබෙන බැවින් ඒ ගැන නීතිඥයන්ගේ අදහස කුමක් වුවත් සිංහලෙන් නඩු ඇසීම සෑම උසාවියක ම කළ යුතු බැව් මහජන උද්ඝෝෂණය විය යුතු යි."

සමසමාජය ප්‍රමුඛ වාමාංශික කොටස් මෙසේ සිංහලයෙන් සහ දමිළ භාෂාවලින් උසාවි කටයුතු මෙන් ම පොලිසිවල කටයුතු ද කැර ගෙන යන ලෙස ඉල්ලා සිටියේ ඊනියා ජාතිකවාදී ප්‍රවේශයක් පදනම් කැර ගෙන නො වේ; ඉංග්‍රීසියෙන් රාජකාරි කටයුතු කිරීම නිසා එය නොදන්නා බහුතරයක් වූ පොදු ජනතාව අපහසුතාවට පත් වන බැවිනි. තව ද, එයින් අයුතු ප්‍රයෝජන ලබා ගැනීමට නීතිඥයනුත් පොලිස් නිලධාරීනුත් මේ කාලයේ පෙලඹී සිටි නිසා ය.

1940 පෙබරවාරි දෙවැනි දා 'සමසමාජය' මේ තත්ත්වය පිළිබඳ ව තව දුරටත් මෙසේ සඳහන් කැර තිබේ:

"ලෝකයේ සෑම රටවල ම වගේ නඩු අසන්නේ ඒ ඒ රටවල මනුෂ්‍යයන් පාවිච්චි කරන භාෂාවලින් ය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අයත් වුවත් ඉන්දියාවේ හා බුරුමයෙහි ඒ ඒ දේශවල භාෂාවලින් නඩු අසන බව පෙනේ. ලක්දිව පමණක් මෙය කරන්නට නුපුළුවන් මන්ද යි මහජනයා විසින් මෙම මහජන සතුරු නීතිඥ කුඩැල්ලන්ගෙන් ප්‍රශ්න කළ යුතු ය. යෝජනා පමා කිරීමට ඉඩ දිය යුතු ද යන්න අද ලක්වැසියන් විසින් මුහුණ පෑ යුතු ප්‍රශ්නයක් වේ," යනුවෙනි. සමසමාජ පක්ෂය තුළ ඉතා ජනප්‍රිය නීතිඥයන් ගණනාවක් සිටියත්, සිංහල භාෂාවට විරෝධය දැක්වූ නීතිඥයන් සම්බන්ධයෙන් 'සමසමාජය' පුවත්පත දැක්වූ ස්ථාවරය හා එය සන්නිවේදනය කිරීමට භාවිත කළ භාෂාව ද ඉතා කර්කශ ස්වරූපයක් පෙන්නුම් කෙළේ ය.

## 3. මගේ සඟරාව

වාමාංශික පුවත්පත්වලට අමතර ව මේ කාලයේ දේශපාලන සඟරාවක් ද ප්‍රකාශයට පත් වී ඇත. 'මගේ සඟරාව' නමින් හැඳින්වූ මෙය 1937 ජනවාරි මාසයේ ප්‍රකාශයට පත් වූයේ මාසික සංග්‍රහයක් වශයෙනි. පිටු විසිහතරකින් සමන්විත වූ මෙහි මිල ශත දහයකි. ලංකාවේ පළමු වැනි මාක්ස්වාදී මාසික සංග්‍රහය වන මෙය වැල්ලවත්තේ ඩබ්ලිව්. ඒ. සිල්වා මාවතේ (එකල හයි ස්ට්‍රීට්) පිහිටි කොස්තා මුද්‍රණාලයේ දී මුද්‍රණය කැර බෙදා හැර ඇත. සඟරාවේ කර්තෘවරයා වශයෙන් කටයුතු කැර ඇත්තේ ආරියපාල ගුණසේන ය. ඔහු මාක්ස්වාදය ගුරු කොටගත් අයෙකි.

මෙම සඟරාව සෘජු ලෙස ම අධිරාජ්‍ය විරෝධී ස්ථාවරයක සිට කටයුතු කළ අතර, මාක්ස්-ලෙනින්වාදී විග්‍රහවල ඇති වැදගත්කම ලාංකික සමාජයට ඒත්තු ගැන්වීමට උත්සාහ දරා ඇත. ධනපති පන්තිය හා නිර්ධන පන්තිය අතර පවතින නොනවතින අරගලය පැහැදිලි කිරීමට ලාංකික සමාජයේ සිද්ධි නිදසුන් ලෙස භාවිත කැර තිබේ.

මෙම සඟරාවේ මුල් පිටුවේ සෑම මසක ම 'මනුෂ්‍ය නිදහස' යන සිරස්තලය යටතේ ජවහර්ලාල් නේරුගේ ප්‍රකාශයක් පළ කැර ඇත. එම ප්‍රකාශය මෙසේ යː

"මිනිසෙක් තවත් මිනිසෙකුගේ වහලෙක් හෝ ජාතියක් තවත් ජාතියකගේ වහල් ජාතියක් ද නොවන්නා හ. මේ දිව්‍යමය හැඟීමෙන් උද්‍යොගවත් වූ කාලාන්තරයක් මුළුල්ලේ වහල් බැම්මෙන් බඳිනු ලැබ දරුණු පීඩා විඳිමින් සිටි සුළු මනුෂ්‍ය ජාතීන්ගේ උත්පත්තියෙන් හිමි විය යුතු මනුෂ්‍ය නිදහස ලබා ගැනීමට කරන කෙදිරීම්වලට අධිරාජ්‍යවාදීන් බිහිරන් වීම නිසා පැන නඟින නන්විධ විප්ලවයන් සම්බන්ධ ව ලෝකයට වගකිව යුත්තෝ බලසම්පන්න ජාතීහු ය."

මෙම සඟරාවේ පළ කැර ඇති ඇතැම් චිත්‍ර ඉන්දීය චිත්‍ර ශිල්පීන් විසින් අඳින ලද ඒවා ය. එමෙන් ම ඇතැම් විශේෂාංග ලිපි ශාන්ති නිකේතනයේ ඉගෙනුම ලබන ලාංකික භික්ෂූන් විසින් ලියා එවන ලද ඒවා ය. මේ කාලයේ ඉන්දියාවේ ශාන්ති



නිකේතනයේ ඉගෙනුම ලබමින් සිටි කේ. ආනන්ද සාගර හිමියන් 'ලෝකය වෙනස් වෙයි' යන හිසින් ලියන ලද ලිපියේ මෙසේ සඳහන් ව ඇතː

"බලනු මැනවි. ඈත අතීතයේ වහල් වෙළෙඳාම ආරම්භ වූයේ බැරෑරුම් ප්‍රශ්නයක් විසඳීමට ය. රටවල් අල්වා ගැනීමෙන් එකකුගේ සිරකරුවන් බවට පත් වූ දහසක් දෙනාට සාගින්නේ මියයන්නට සිදු විය. ඔවුන් අල්ලාගත් 'මහ වීරයාට' 'චක්‍රවර්තියාට' හෝ ඔහුගේ සහචර පිරිසට සිරකරුවන් නඩත්තු කර ගැනීම බරපතල අපහසු දෙයක් විය. සිරකරු ගැහැණු පිරිමි ළමාලපටියෝ බඩගින්නේ මිය යන්නට වූහ. ඒ දුටු කිසියම් කාරුණිකයකුට ඔවුන්ගේ ජීවිත ආරක්ෂාව පිණිස කළ යුතු එකම දෙය ඔවුන් දාස මෙහෙවර සඳහා අධිපති ධනවත් පෙළට පවරාදීම බව පෙනුණේය. ඒ සඳහා බලවත් ව්‍යාපාරයක යෙදුන ඔහුට සිරකරු අසරණයන් වහලුන් ලෙස ධනපතියන්ට පවරාදීමේ අවස්ථාව ලැබුණේ ය."

'තුන්වැදෑරුම් ධනපතියන්ට මැදි වී දුක් විඳින ගම්වැස්සා' යන සිරස්තලය යටතේ 'මගේ සඟරාවට' 'උඩරට තරුණයකු විසින්' (නම සඳහන් කැර නැත) ලියනු ලැබූ ලිපියක දේශිය හා විදේශීය ධනපතියන් විවේචනයට ලක් කැර තිබිණ. ශ්‍රී ලංකාවේ ගැමි ජනතාව මුහුණ දී ඇති ප්‍රශ්න අනුමාතෘකා යටතේ විස්තර වී ඇත. 'උඩරට උපදින විශාල ආදායමින් කුමාර සැප විඳින්නෝ කවරහු ද' යන අනුමාතෘකාව ඔස්සේ මෙසේ සඳහන් කැර තිබිණː "යුරෝපීය බලසම්පන්න ජාතීන්ගේ අධිරාජ්‍ය ගොඩනැඟීමේ මිනීමරු තරඟය නිසා ප්‍රමාණවත් ශිෂ්ටාචාරයක් ගොඩනඟාගෙන සිටි රටවල් කිහිපයකම මනුෂ්‍ය ජාතීන් කිහිපයක්ම ඉතා පරිහානියට පත්වූහ. තවත් සමහර ජාතීහු වඳ වී ගෙන යන්නාහ. තවත් සමහර මනුෂ්‍ය ජාතීහු නැත්තටම නැති වී ගොස් ඉවරය. සමහර වඳ වී ගිය මනුෂ්‍ය ජාතීන්ගේ නම් ගම් පවා අද නැත. අමෙරිකාවේ මායාවරුන්ටත්, ඉන්කාස්වරුන්ටත් සිදු වූ විපතට නොදෙවෙනි විපතකට උඩරට සාමාන්‍ය ගම්වැස්සන්ට මුහුණපාන්නට සිදු වී තිබේ." තව දුරටත් එම ලිපියේ පහත සඳහන් අනුමාතෘකා දක්නට ලැබේː 'උඩරට ආදායම් මාර්ග කා අතේ ද?', 'සිංහලයාගේ ආහාර නිෂ්පාදනය

කෙරුණු ඉඩකඩම්වලට ගිය කල දසාව', 'පරම්පරාගත උරුමයේ ඉඩකඩම්', 'පහතරට ධනපතීන්ගේ වතු', 'ත්‍රිවිධ ධනපතීන් ගෙන් පීඩා විඳින උඩරට වැසියා'. මේ හැම සිරස්තලයකින් ම ධනපති පන්තියට පහර ගසා ඇති අතර, පන්ති භේදය නිසා සමස්ත සමාජය ම සූරාකෑමට ලක් වී ඇති අන්දම පාඨකයාට පෙන්වාදීමට උත්සාහ දරා තිබේ.

'ස්ත්‍රීන්ගේ නිදහස' යන සිරස්තලය යටතේ කවි කීපයක් 'මගේ සඟරාව' 1937 අප්රේල් කලාපයේ පළ කැර ඇත. මෙම කවි උපුටාගෙන ඇත්තේ ඉන්දියාවේ මුද්‍රණය කැර ප්‍රසිද්ධ කළ 'මගේ සඟරාව' ඇසුරෙනි. සත්‍යවතී අයියංගර් නම් වූ කාන්තාව ලියා තිබූ කවි දෙකක් සිංහලයට පරිවර්තනය කොට පළ කැර තිබේ:

පිබිදෙව් සහෝදරියෙනි නොනිදව් ඉති     නී
නරඹව් යුගැස් හැර මැළි බැව් දුරලමී     නී
නොනැවෙව් අගතියට බිය සුල්ලන් ලෙසි     නී
සැරසෙව් ලබන්නට නිදහස එක සිති     නී

සාගින්නේ පෙළෙන අද බඩ පිටට ඇ     ලී
වේලෙන්නා වූ පිරිසකි තද දුකින් වෙ     ලී
පේමෙන් රටට වැඩ සදනුව නොම පැකි     ලී
දෑමෙන් ඉදිරිපත් වව් නොබියව නොසැ     ලී

ඉන්දියාවේ සිට ලංකාවට පැමිණි උඩකැන්දවල සිරි සරණංකර හිමියෝ 'මගේ සඟරාවට' මාස්පතා ලිපි ලියූ හ. මේ හැම ලිපියකින් ම ධනවාදය හා අධිරාජ්‍යවාදය විවේචනයට ලක් කැරිණි. විශේෂයෙන් බෙංගාල භාෂාවෙන් පළ වී තිබූ ඇතැම් ශාස්ත්‍රීය ලේඛනයන් සිංහල බසට පරිවර්තනය කැර පළ කිරීමට උන්වහන්සේ කටයුතු කළහ. 1937 ජූනි කලාපයට සෝවියට් දේශය පිළිබඳ ව ලියා තිබූ ලිපියක මෙසේ සඳහන් වෙයි. එම ලිපියේ සිරස්තලය "රටවාසීන් සුඛිත මුදිත කරවන එක්සත් සෝවියට් රාජ්‍යයේ පවත්නා ආණ්ඩු ක්‍රමය" යන්න යි.

"රසියාව යන වචනය ඇසෙන විට ම විස පත්තුවන මිනිසුන් සමූහයක් ලංකාවේ සිටිති. රසියාව වනාහි නෑදෑකම් පවා නොසලකා ක්‍රියා කරන, ආගම් විනාශ කර දමන හිඟන බවට



පත්ව එකළුකා මරාගන්නා බිහිසුණු මනුෂ්‍ය ජාතියකගේ රටක් හැටියට ලංකාවේ පළ වන අති පණ්ඩිතයන්ගේ පුවත්පත්වලින් දේශනා කර තිබේ. ඔවුන්ගේ නොදැනීම නිසා කෙරෙන බොරු ප්‍රකාශයන්ගෙන් මුලාවේ වැටී සිටින්නනට මෙම කියවීම ප්‍රයෝජනවත් වේ."

තව දුරටත් එම ලිපියේ මෙසේ සඳහන් වෙයි: ''ධනේශ්වර ආණ්ඩු ක්‍රමයක් පවතින රටක රැකී රක්‍ෂා නොමැති වීම, නූගතුන් වැඩි වීම, මුඩුක්කු ඇති වීම, දිළිඳුකම ඇති වීම, ගණිකා වෘත්තිය වැනි පහත් ජීවිකා වෘත්තීන්හි ස්ත්‍රීන් යෙදීම, සොරකම් කිරීම, අපරාධ බහුල වීම ආදී නොයෙක් දුර්විපාකයන් දකින්න ලැබෙන්නේ අනිකක් නිසා නොව එහි පවතින අසමාන ආර්ථික තත්ත්වය නිසාය.''

'මගේ සඟරාව' පවත්වාගෙන යෑම සඳහා පාඨක ආධාර හා කුඩා වෙළෙඳ දැන්වීම් ප්‍රයෝජනයට ගෙන ඇත. සමාජවාදය පිළිබඳ ව විශ්වාසයෙන් කටයුතු කළ ප්‍රගතිශීලී බුද්ධිමත්හු මෙම සඟරාවේ පාඨක පිරිස් බවට පත් ව සිටියහ. එහෙත් 'මගේ සඟරාවට' වූයේ වසර තුනක් වැනි කෙටි කාලයකට සීමා වූ ආයුෂයකි. හතළිහ දශකයේ මුල මෙම සඟරාව නැවතී ගියේ ආර්ථික වශයෙන් මුහුණ දීමට සිදු වූ ගැටලු නිසා ය.

## 4. සමසමාජිස්ට්

සමසමාජ පක්‍ෂය සිංහල පුවත්පතට සමගාමී ව ඉංග්‍රීසි පුවත්පතක් සහ දෙමළ පුවත්පතක් ද නිකුත් කෙළේ ය. ඉංග්‍රීසි පුවත්පත වන 'සමසමාජිස්ට්' ප්‍රථම කලාපය 1937 ජූනි 5 වැනි දා පළ කැරිණි. එය ටැබ්ලොයිඩ් (ඩිමයි 1/2) ප්‍රමාණයේ පිටු අටකින් යුත් ප්‍රකාශනයක් විය. මිල ශත දහයකි. මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලද්දේ හෙක්ටර් පෙරේරා විජේසිංහ විසිනි. කර්තෘවරයා වූයේ නීතිඥ වර්නන් ගුණසේකර ය. ඔහු සමසමාජ පක්‍ෂයේ ආරම්භක සම ලේකම්වරයෙකි.

ප්‍රථම කලාපයේ මුල් පුවත රාජ්‍යාභිෂේක උත්සවය වෙනුවෙන් ලේක්හවුස් ලන්ඩන් නියෝජිතයා විසින් එහි සිටි ලාංකික ශිෂ්‍යයන්ට පැවැත්වූ රාත්‍රී භෝජන සංග්‍රහයක් සම්බන්ධ

ව ය. මෙම සාදය වර්ජනය කරන ලෙස එහි ලංකා ශිෂ්‍ය සංගමය ඉල්ලීමක් කෙළේ ය. ඒ අනුව සිය ගණනක් ශිෂ්‍යයන්ගෙන් භෝජන සංග්‍රහයට සහභාගි වූයේ තුන් දෙනෙකු පමණකැයි සඳහන් වෙයි. බ්‍රේස්ගර්ඩ්ල් සිද්ධිය සම්බන්ධ ව ආචාර්ය අධිනීතිඥ කොල්වින් ආර්. ද සිල්වාගේ ලිපියක් සහ 'කතාබහ' ශීර්ෂයෙන් යුතු තීරුවක් ද මුල් පිටුවෙහි වෙයි.

'සමසමාජිස්ට්' ඉංග්‍රීසි පුවත්පතේ ආරම්භය සිදු වූයේ බ්‍රේස්ගර්ඩ්ල් සිද්ධියේ උණුසුම් තත්ත්වය තිබිය දී ය. එහෙත් එය සිංහල පුවත්පතේ තත්ත්වයට ගෙන ඒමට නොහැකි විය. රටේ ඉංග්‍රීසි පාඨක පිරිස 'සමසමාජිස්ට්' පුවත්පත කෙරෙහි එතරම් ළැදිකමක් නොපෙන්වූ හ. උසාවි කටයුතු, පොලිසි කටයුතු, කාර්යාලයීය කටයුතු ආදිය ස්වභාෂාවන්ගෙන් කළ යුතු බවට වාමාංශික පුරෝගාමීන් ගෙන ගිය උද්ඝෝෂණය ඉංග්‍රීසි කතා කළ සිංහල මධ්‍යම පන්තියට රුචිකර නොවීම ඊට බලපෑවේ ද යනු සැක සහිත ය. මේ පුවත්පත පවත්වාගෙන යා හැකි වූයේ දෙමාසයක් වැනි සුළු කාලයකි. 1937 ජූලි 24 වැනි දා නිකුත් කළ අට වැනි කලාපයෙන් පසු එය මාසික සඟරාවක් බවට පත් විය. 'සමසමාජිස්ට්' සඟරාවේ මුල් පිටුවේ සමසමාජ පක්ෂයේ අරමුණ 'සම්පූර්ණ ජාතික ස්වාධීනත්වය ලබා ගෙන සමාජවාදය පිහිටුවීම' බව සඳහන් කරමින් පක්ෂයට බැඳෙන ලෙස කළ ඉල්ලීමක් පළ කරනු ලැබිණි. 'සමසමාජිස්ට්' සඟරාව පළ වූයේ 1938 ජනවාරි තෙක් කලාප හතරක් පමණි.

## 5. සමධර්මම්

සිංහල 'සමසමාජය' ඍජු ලෙස දෙමළ භාෂාවෙන් නිකුත් කිරීමක් ලෙස 'සමධර්මම්' හඳුන්වා දිය හැකි ය. එහි ප්‍රධාන පාඨක පිරිස ස්වදේශීය ද්‍රවිඩ ජනයා සහ වතුකරයේ ඉන්දීය දෙමළ ජනයා වූ හ. දෙමළ බස ව්‍යවහාර කළ මුස්ලිම් ජනයා ද 'සමධර්මම්' කියවූ හ. පුවත්පතේ මූලික අරමුණ වූයේ සමසමාජ පක්ෂයේ මතවාදය ඉදිරිපත් කිරීම සහ සිංහල - දෙමළ දෙවර්ගයා එක ම දේශපාලන ධාරාවකට යොමු කිරීම ය. 'සමධර්මම්' පළමු වැනි කාණ්ඩයේ ප්‍රථම කලාපය 1938 අප්‍රේල් 29 වැනි දා නිකුත්



විය. 'ටැබ්ලොයිඩ්' ප්‍රමාණයේ පිටු හයකින් යුත් පුවත්පතේ මිල ශත දෙකකි. ආරම්භක පත්‍රයේ කර්තෘ හා ප්‍රකාශකයා වශයෙන් සමසමාජ පක්ෂයේ කාරක සභික වී. ඊ. පුෂ්පරාජන්ගේ නම සඳහන් වී තිබේ. 'ලංකා සමසමාජ පක්ෂයේ සතිපතා පුවත්පත' යනුවෙන් මුල් පිටුවේ ඉහළින් දක්වේ.

මුල් කතු වැකියේ කොටස් කීපයක සිංහල අනුවාදය මෙසේ යඃ

"අද සිට ලංකා සමසමාජ පක්ෂය විසින් 'සමධර්මම්' පුවත්පත නිකුත් කරනු ලැබේ. මෙම ප්‍රකාශනය මඟින් එහි නමට ගැළපෙන පරිදි ම සමසමාජ ප්‍රතිපත්ති දෙමළ ජනයා අතරට ගෙන යෑමට පියවර ගනිමු. ඉකුත් දෙවසර තුළ පවත්වාගෙන ආ 'සමසමාජය' නමැති අප සහෝදර පුවත්පත ලක් වැසි සිංහල ජනගහනය තුළ විප්ලවකාරී ප්‍රබෝධයක් ඇති කර තිබේ. අප පක්ෂයේ ප්‍රතිපත්ති ජනතාවට රහසක් නොවන නිසා මේ පුවත්පතේ අරමුණු ගැන කීම නුවුවමනා ය. එහෙත් අලුත් පුවත්පතක් ආරම්භ කිරීමේ දී ප්‍රතිපත්ති ගැන කීම සිරිතකි. එහෙයින් ඉතා කෙටියෙන් මෙසේ කියමු.

"අද ලොව පුරා ජනයා කුසගින්නේ පෙළෙති. ඇඳීමට වස්ත්‍ර නැත. ඉන්නට නිවහනක් නැත. නිදන්නට පැදුරක් පවා නැත. රක්ෂා හිඟය උග්‍ර ය. තිබෙන රක්ෂාවලින් ලැබෙන වේතනය යන්තම් ජීවත් වීමටත් මදි ය. එහෙත් ධනපති අතළොස්සක් දෙන සියලු සම්පත් සහිත ව වැජඹෙති. රුසියාවේ හැර ලෝකයේ අනෙක් සැම රටක ම පවතින ආර්ථික ප්‍රතිපත්ති අනුව එසේ සිදු වේ. නියපොත්තක කුණු පොදක් නොගෑවුණු, කිසිදු රස්සාවක් නොකරන කම්මැළි මිනිස්සු ධන කුවේරයන් වී සිටිති. ඔවුන්ට සල්ලි, මාළිගා, යාන-වාහනවලින් හිඟයක් නැත. මෙය කොතරම් අසාධාරණයක් ද? මේ අයුරින් විශාල පිරිසකගේ ශ්‍රමය ස්වල්ප දෙනෙකු විසින් භුක්ති විඳීම ඉවසිය හැකි ද? ආර්ථික ප්‍රතිපත්ති සමසමාජ ක්‍රමයට වෙනස් කළ හොත් මෙම අසාධාරණය සිදු නො වේ. එම වැදගත් කාර්යයට 'සමධර්මම්' සහයෝගය දක්වා සිටී."

යාපනයේ සහ උඩරට ප්‍රදේශවල දෙමළ ජනයාගේ රැස්වීම් වාර්තා කිරීම 'සමධර්මම්' මඟින් සිදු කැරිණි.

"අධිරාජ්‍ය පාලනය ලංකාවෙන් තුරන් කිරීමට කම්කරු පන්තිය පෙරමුණ ගෙන සිටී. පීඩා විඳින සිංහල - දෙමළ කම්කරුවෝ සහෝදරත්වයෙන් අත්වැල් බැඳගෙන සිටිති. සිංහල, දෙමළ පොදු ජනයාගේ සතුරන් වන්නේ සිංහල, දෙමළ සහ සුදු ජාතික ධනපතියන් අතළොස්ස බව අපි වටහා ගනිමු," යැ යි 1938 මැයි පළමු වැනි දා කීරමලේ පැවති රැස්වීමක දී පාසල් ගුරුවරයකු වූ ඇස්. මහාදේව ප්‍රකාශ කැර ඇත.

1939 ජූලි 7 කලාපයේ සිට 'සමධර්මම්' ප්‍රධාන කර්තෘ ලෙස කටයුතු කෙළේ කේ. රාමනාදන් ය. ඔහු ඉංග්‍රීසි උපාධිධාරියකු වූ අතර, දෙමළ භාෂාවෙන් සහ ඉංග්‍රීසියෙන් ලිවීමේ දක්ෂයෙක් විය. 'විප්ලවයක් කරමු. නව දිවියක් දකිමු' මැයෙන් ඔහු ලියූ ලිපියකින් කොටසක අනුවාදය මෙසේ යඃ

"ලංකාවේ අක්කර ලක්ෂ ගණනක තේ සහ රබර් වතු තිබේ. ලංකාණ්ඩුවේ ආදායමෙන් 4/5ක් ම ලැබෙන්නේ මෙම වතුවලිනි. වතු කම්කරුවන්ගේ ශ්‍රමයෙන් ලැබෙන ආදායම භුක්ති විඳින්නෝ සුදු ජාතිකයෝ ය. ඔවුන් මේ ඉඩම් මිල දී ගෙන ඇත්තේ අක්කරය රු. 5/- බැගින් වැටෙන ලෙස ය. ආයෝජනය කළ සැම රුපියල් එකකට ම රුපියල් සියය බැගින් ආදායමක් ඔවුන්ට ලැබේ. මේ ඉඩම් සියල්ල ලංකාවේ දුප්පත් ජනයාට අයිති ව තිබුණු ඒවා යි."

කේ. රාමනාදන් ලංකාවට පැමිණියේ 1939 දී ය. ඔහුගේ පැමිණීමේ අරමුණ වූයේ ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රචාරක කටයුතුවලට සහාය දීම ය. එවකට කේරළ කොමියුනිස්ට් නායකයකු වූ ඒ. කේ. ගෝපාලන්ගේ යෝජනාවක් අනුව මදුරාසියේ කොමියුනිස්ට් නායක පී. රාම්මූර්ති විසින් හෙතෙම ලංකාවට එවන ලදි.

'සමධර්මම්' ද සමසමාජ නායකයන් හිර භාරයට ගැනීමත් සමඟ ඇනහිටියේ ය. 1940 ජූනි 14 වැනි දින පුවත්පත නවත්වන විට නිකුත් කැර තිබුණු කලාප ගණන එකසිය දොළහකි.



## 6. ජනශක්තිය

ලංකා සමසමාජ පක්ෂය ජාත්‍යන්තර ප්‍රශ්නයක් මත භේද වීමෙන් පසු 'කොළඹ කම්කරු සමාජය' ස්වකීය සංවිධානය බවට පත් කැර ගත් පිරිස 'ජනශක්තිය' නිකුත් කළහ. සමසමාජ පක්ෂය ට්‍රොට්ස්කි ලෝක විප්ලවයේ අසහාය නායකයා ලෙස හඳුන්වද්දී අනෙක් කණ්ඩායම ස්ටාලින් ලෝක විප්ලවයේ නායකයා ලෙස හැඳින්වූ හ. 'ජනශක්තිය' මේ මත භේදයේ දී ස්ටාලින් පාර්ශ්වය ගෙන අදහස් දැක්වී ය. මෙතෙක් පොදු සටනක් වෙනුවෙන් ජන සන්නිවේදන කාර්යයෙහි යෙදී සිටි වාමාංශිකයෝ එතැන් සිට අන්තර් න්‍යායික වශයෙන් වූ දේශපාලන මතභේදය ද ජනතාව අතරට ගෙන ගියහ.

'ජනශක්තිය' පළමු වන කාණ්ඩයේ ප්‍රථම කලාපය 1940 මැයි 17 වැනි දා නිකුත් කරන ලදි. ටැබ්ලොයිඩ් (ඩිමයි 1/2) ප්‍රමාණයේ පිටු හයකින් යුත් එය සතිපතා පුවත්පතකි. ප්‍රකාශකයා වූයේ මාතර කොටුවේගොඩ ටී. බැනට් සිල්වා ය. මුද්‍රණය කරන ලද්දේ මාතර සුදර්ශන යන්ත්‍රාලයේ ය. 'ජනශක්තිය' පාලක කර්තෘ වශයෙන් දොස්තර ඇස්. ඒ. වික්‍රමසිංහගේ නම සඳහන් වී ඇත. එහෙත් පුවත්පත සකස් කළ සංස්කාරකයන් අතර මුල් තැන ගෙන සිටියේ ඇස්. පියසේන ය (මොහු පසු කාලයේ ලංකා පාර්ලිමේන්තුවේ කතා පරිවර්තනය කිරීමේ සේවයෙහි නියුතු ව සිටියේ ය). ඊ. ඇස්. රත්නවීර බාහිර ලේඛකයකු හා සිංහල පරිවර්තකයකු ලෙස කටයුතු කෙළේ ය. පුවත්පතේ අරමුණ සඳහන් වී ඇත්තේ "ජනශක්තිය දේශපාලන පත්‍රයකි. මෙරට සහ ජාත්‍යන්තර දේශපාලන පුවත් ගැන අවබෝධයක් ලබා ගැනීමට නම් 'ජනශක්තිය' කියවිය යුතු ය. ගොවි කම්කරුවන්ගේ අයිතිවාසිකම් සහ ජාතියේ නිදහස සහ අභිනව සමාජ ක්‍රමයක් පිණිස ජාතික පෙරමුණක් ගොඩනැඟීම මේ පත්‍රයේ ප්‍රධාන අදහස ය" යනුවෙනි.

'ජනශක්තිය' ප්‍රධාන මත දෙකක් සන්නිවේදනය කෙළේ ය. පළමු වැන්නඃ ට්‍රොට්ස්කිගේ අන්තර්ජාතික ක්‍රියා පිළිවෙත විවේචනය කිරීම යි. දෙවැන්නඃ බ්‍රිතාන්‍යය සහභාගි වී සිටින ලෝක යුද්ධයට විරුද්ධ වීම යි. මේ විරෝධය දක්වන ලද්දේ යුද්ධ නීතිය යටතේ රාජ්‍යාරක්ෂක නියෝග පනවා තිබිය දී ය.

එක් ලිපියක මෙසේ සඳහන් වේ: "ආණ්ඩුකාරයා අපට 'කුල් පිට' සිටින්නට කියන්නේ බ්‍රිතාන්‍යයට කරන යුතුකමක් වශයෙනි. අපේ රටට අපේ යුතුකම් කරන්නට නම් කම්කරුවන් අවදිව සටන් බිමට පැමිණිය යුත්තා හ. කම්කරුවන් වැටී සිටින හීන දීන තත්ත්වයෙන් උසස් බවට පැමිණීමට කම්කරුවෝ කම්කරු සමිති, දේශපාලන පක්ෂ, සමුපකාර සමිති ආදියෙන් සංඝටනය විය යුත්තා හ. බඩු මිල වැඩි නිසා සිය ස්වාමීන්ගෙන් වැඩි පඩි ඉල්ලා කැගැසිය යුත්තා හ. අපේ බදු මුදල්වලින් සතයක්වත් පිටරට යුද්ධවලට යවන්නට නොදීම පිණිස සටන් කළ යුත්තා හ. කොටින්ම පීඩක පන්තිය වූ ධනපතීන්ගේ ආණ්ඩු බලයට විරුද්ධව අන්තිම සටනට සූදානම් විය යුත්තා හ."

1940 ජූලි 6 වැනි දා 8 වැනි කලාපය පළ කිරීමෙන් පසු ව 'ජනශක්තිය' ඇනහිටියේ ය. ඊට හේතුව වූයේ ජූනි 8 වැනි දා ප්‍රකාශය පිළිබඳ විශේෂ නියෝගයක් පනවා පුවත්පත තහනම් කිරීම ය. පළ කරන ලද යුද්ධ විරෝධී ලිපි තුනක් සම්බන්ධයෙන් දොස්තර ඇස්. ඒ. වික්‍රමසිංහ සහ ප්‍රකාශක ටී. බැනට් සිල්වා ද පොලිස් අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් සිර භාරයට පත් කරනු ලැබූ හ. එම දෙදෙන කර්තෘ සහ ප්‍රකාශක ලෙස නිල වශයෙන් පෙනී සිටි අය වූ හ.

බ්‍රිතාන්‍ය පාලකයන්ගේ උපදෙස් පරිදි 'ජනශක්තිය' පුවත්පත තහනම් කැර වසර අටකට පසු ව හෝ ඊට ආසන්න වසරක දී හෝ නැවතත් ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පිටු 6ක පුවත්පතක් ලෙස ප්‍රකාශයට පත් වී ඇත. 1948 ඔක්තෝබර් 8 වැනිද (සිකුරාද) ප්‍රකාශයට පත් වූ මෙම 'ජනශක්තිය', ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සතිපතා පත්‍රය බව එහි මුල්පිටුවේ සඳහන් කැර ඇත. එසේ ම අංක 85, කෝට්ටේ පාර, කොළඹ 08, කාර්යාලයීය ලිපි යොමුව ලෙස ද සඳහන් ව තිබීම විශේෂත්වයකි. මේ වන විට මුද්‍රණය වූ 'ජනශක්තිය' පුවත්පතේ ප්‍රකාශකා ලෙස සඳහන් ව ඇත්තේ ඩබ්ලිව්. ආරියරත්න වන අතර, අංක 85 ස්ථානයේ 'ලංකා' යන්ත්‍රාලයෙහි දී මුද්‍රණය කැර ප්‍රකාශයට පත් කැර ඇත්තේ ශත පහක මිලකට ය.

'ජනශක්තිය' පුවත්පතේ ඉහළ කොටස සැම විට ම වෙන් වී තිබුණේ ජාත්‍යන්තර කම්කරු ගීතය ලෙස සැලකෙන,



"සාදුකින් පෙළෙනවුන්
දූන් ඉතින් නැඟිටියව්
මිහිතලේ අසරණුන් පිබිදියව්
සොහොයුරන්, සොයුරියන් සටනට එළඹියව්
ධනපතීන්, අදිමිටුන් සුන්කරව්
සව්ලොවේ මේ හඬින් සැම ජාතීන් එක්ව දූන්
අන්තිම සටනට
අන්තිම සටනට
අන්තිම සටනට සැරසියව්!

මෙම ගී පද මාලාව ප්‍රකාශයට පත් කිරීමට ය.

"ජනශක්තිය" පුවත්පතේ ඇතැම් ප්‍රවෘත්ති හැඟීම්බර අන්දමින් ප්‍රකාශට පත් කැර තිබීම විශේෂත්වයකි. දේශපාලන න්‍යායයක් වෙනුවෙන් පෙනී සිටින පුවත්පතක එවැනි අන්දමේ ප්‍රවෘත්ති නිරන්තරයෙන් පළවන්නේ, පොදු ජනතාවට ධනපති පන්තිය ගැන කලකිරීමක්, විරෝධයක් ඇති කිරීමේ චේතනාවෙන් බව ඉතා පැහැදිලි ය. මේ සඳහා 1948 ඔක්තෝබර් 8 වැනිදා ප්‍රකාශයට පත් වූ ''ජනශක්ති'' පුවත්පතේ ප්‍රවෘත්තියක් නිදසුන් ලෙස සඳහන් කිරීම වැදගත් ය.

"කුරුණෑගල - රතු වීරයාට පිදූ අවසාන ගෞරවය" - "සෙනෙවිරත්නගේ නාමය අමරණීයයි" යන හිසින් යුතු ප්‍රවෘත්තියේ මෙසේ සඳහන් ව ඇත.

"යූ.ඇන්.පී. මැරවරයෙක් ඇන්න දමරික පිහියා පහරක් දෙන් රිචඩ් සෙනෙවිරත්න සහෝදරයාගේ හද පළා ගෙන ගියේය. සෙනෙවිරත්න සහෝදරයා උතුර උතුරා ලේ පතින පපුව බදගෙන ඇද වැටුණේය. අන්තිම හුස්ම හෙලුවේය. තමාටත් තමාගේ දූදරුවන්ටත් තමන් වැනි අනිකුත් දුක් විඳින පීඩිත ජනතාවටත් සෞභාග්‍යයේ ක්ෂේම භූමිය සොයා, දුක් අන්ධකාරයෙන් සැපවත් ආලෝකයකට පාර සොයා ඉදිරියට තැබූ පළමුවෙනි පියවරේදීම පන්ති සතුරාගේ පිහිය පහරට ලක්වූයේ ය."

එම ප්‍රවෘත්තියේ තවදුරටත් මෙසේ සඳහන් වේ.

"සෙනෙවිරත්න සහෝදරය !,

"ලංකාවේ පීඩිත පන්ති සටන වෙනුවෙන්, දුක්විඳින පන්ති ව්‍යාපාරය වෙනුවෙන්, තමන්ගේ දුක්විඳින දරුවන් වෙනුවෙන්, කුසපුරා අහරක් ලැබීමේ මඟක් සොයා ගිය ඔබට පන්ති සතුරෝ, මනුෂ්‍ය සංහතියේ ද්‍රෝහියෝ පිහියෙන් ඇන්නාහුය. ඔබ අහර ඉල්ලන විට ඔබට හද පැලෙන පිහිය පහරක් දුන්හ. අවිහිංසාව දෙසන කෲර පාලකයන්ගේ හිංසා සහගත අකාරුණික හස්තයට ඔබ ගොදුරු වූවෙහිය. පීඩිත පන්ති ව්‍යාපාරයේ සටන් කරන සැම සෙබළෙකුගේම සහෝදරාත්මක භක්ත්‍යාදර ගෞරවය ඔබගේ සොහොන් ගැබ කරා ලක්වන්නේය. ඔබගේ ඇඟෙන් සෙල්වූ ලේ බිංදුවක් පාසා ඒ ගැන වගකිවයුතු අධමයින්ගෙන් පීඩිත පංතිය පළිගන්නවා ඇත. ඔබගේ ශ්‍රී නාමය පීඩිත පන්ති රන් අකුරින් ලියවෙනවා ඇත. පීඩිත පන්ති ව්‍යාපාරය වෙනුවෙන් දිවි පිදූ, මුල්ඔය ගෝවින්දන්, බද්දේගම කාරියවසම්, කොළඹ කන්දසාමි ආදී ඒ රතු වීර භටයන්ගේ නම් ලැයිස්තුවට කුරුණෑගල සෙනෙවිරත්න සහෝදරය, ඔබගේ නාමය ද එක් වී ඇත. ඒ ගැන අපි ආඩම්බර විය යුතුය. ඔබේ සොහොන් ගැබ තුළින් නැඟ එන උද්‍යෝගයේ සටන්කාමීත්වයෙන් අප හැම දෙනම පෙරමුණට යනවා ඇත."

මෙම ප්‍රවෘත්තියට අදාළ ඡායාරූප විස්තර මෙම පුවත්පතේ පළ කැර තම දේශපාලන මතය සන්නිවේදනය කිරීමට උත්සාහ ගෙන ඇත.

විශේෂයෙන් මෙම පුවත්පතේ පළ වී ඇති ප්‍රවෘත්තිවලින් සියයට සියයක් ම ධනපති පන්තිය ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂයටත්, එයට සහාය දෙන පිරිස්වලටත් එරෙහි ව පළ වීම කැපී පෙනෙන ලක්ෂණයකි. තව ද, එක්සත් ජාතික පක්ෂයට විරෝධය පෑම සඳහා රුස්වීම් පැවැත්වීමට ජනතාවගෙන් ආධාර මුදල් ඉල්ලන ප්‍රවෘත්ති 'ජනශක්තිය' පුවත්පතේ පළ වී ඇත.

ආධාර මුදල් ලබා දෙන පුද්ගලයන්ගේ හා සංවිධානවල නම් ප්‍රසිද්ධ කිරීමට ද මෙම පුවත්පත ප්‍රයෝජනයට ගෙන ඇති බව දක්නට ලැබේ.



## 7. නව ශක්තිය (සිංහල)

කොළඹ කම්කරු සමාජයේ පුවත්පත වූ 'ජනශක්තිය' තහනම් කරනු ලැබීමෙන් පසු ව ඔවුහු ඒ වෙනුවට 'නව ශක්තිය' නමින් වෙනත් සතිපතා සිංහල ප්‍රකාශනයක් නිකුත් කළහ. එහි ප්‍රථම කලාපය 1940 අගෝස්තු 9 වැනි දා පළ විය. ආරම්භක ප්‍රකාශනය සඟරා ප්‍රමාණයේ පිටු හතරකින් යුක්ත වූ අතර, මිල වූයේ සතයකි. වසරක් ඉකුත් වීමෙන් පසු එය නිකුත් කරන ලද්දේ ටැබ්ලොයිඩ් (ඩිමයි 1/2) ප්‍රමාණයෙනි. කර්තෘ සහ ප්‍රකාශකයා ලෙස පෙනී සිටියේ ඩී. පී. යසෝදිස් නමැති සටන්කාමී කම්කරුවෙකි. කොමියුනිස්ට් පාක්ෂිකයකු වූ ඔහු වෘත්තීය සමිති සංවිධායකයෙක් ද විය. 'නව ශක්තිය' සංස්කාරකයා වූයේ ඇස්. පියසේන ය. ආරියවංශ ගුණසේකර සහ ඇම්. ජී. මැන්ඩිස් සහායකයෝ වූ හ. ප්‍රථම කතු වැකිය 'කම්කරු සමිති' මැයෙන් ඉදිරිපත් කැරිණි. එහි අවසාන කොටස මෙසේ යː

"කම්කරු සමිතිවල වැඩ කරන සහෝදරයන්ගේ අත්දැකීම්, කම්කරුවන්ගේ දුක්ගැනවිලි, ස්වාමීන්ගෙන් ලැබෙන හිරිහැර, කම්කරු සමිති තොරතුරු, පැක්ටරි තත්ත්වයන් 'නව ශක්තිය' තීරුවක් පාසා පළ කිරීමෙන් කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමට නිතර ම සූදානමින් සිටින බව මෙයින් සිහිපත් කරමු."

'නව ශක්තිය' කම්කරු සංවිධාන සහ සටන් පිළිබඳ ව වාර්තා කරන අතර, යටත් විජිත ආණ්ඩුවට විරෝධය දක්වන ප්‍රකාශන සහ ජාත්‍යන්තර පැසිස්ට්වාදයට විරුද්ධ ප්‍රකාශන ද වැදගත් තැනක් දී පළ කළේ ය. ඒ සමඟ ම සමසමාජ පක්ෂයේ ප්‍රතිපත්ති සහ ට්‍රොට්ස්කිවාදය ද විවේචනයට භාජනය කරනු ලැබිණ. 'නව ශක්තිය' ආරම්භයේ දී ගෙන ගිය පැසිස්ට් විරෝධි යුද්ධ ප්‍රචාරය 1941 ජූනි 12 වැනි දා බ්‍රිතාන්‍ය ආණ්ඩුව සහ සෝවියට් ආණ්ඩුව අතර පැසිස්ට් විරෝධ යුද ගිවිසුම ඇති කැර ගැනීමෙන් පසු අමුතු මුහුණුවරක් ගත්තේ ය.

එතැන් සිට ජර්මන් - ඉතාලි - ජපන් පිලට විරුද්ධ වූ ප්‍රචාරයට මුල් තැන් දුන්නේ ය. ඒ අතර ම ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාගේ පාලන ප්‍රතිපත්ති ද විවේචනයට භාජනය

කරන ලදි. මේ පුවත්පතේ මුද්‍රණාලයට හා ප්‍රකාශකයාට කිහිප වරක් ම පොලිස් තර්ජන එල්ල කරනු ලැබී ය. වරක් එක්සත් සෝෂලිස්ට් පක්ෂයේ ලේකම් වූ ඇම්. ජී. මැන්ඩිස් සිර භාරයට ගැනීමට පක්ෂ කාර්යාලයත් ඔහු නැවතී සිටි කාමරයත් පොලීසිය මඟින් වටලන ලද නමුත් එය අසාර්ථක විය. ඒ පුවත 'නව ශක්තිය' වාර්තා කෙළේ මෙසේ යඃ

"අතුරුදහන් වූ ඇම්. ජී. මැන්ඩිස් සහෝදරයා සොයා ගැනීමට අපොහොසත් වූ පොලිසිය ඒ සහෝදරයාගේ කාමරයේ තිබුණු බඩු බාහිරාදිය පමණක් නොව කඩදාසි කැලි, රෙදි කැලි හා කුණු රොඩු ආදිය ද ආරක්ෂක නීති යටතේ හිර බාරයට ගෙන ආරක්ෂා සහිත ව ගෙන ගිය බව දැන ගන්නට තිබේ."

මේ පුවතින් කෝපයට පැමිණි රහස් පොලිස් අධිකාරිවරයා යසෝදිස් සිය කාර්යාලයට කැඳවා කමිසයේ කරෙන් අල්ලා සොලවා ''පරයා! ආයිත් එහෙම ඔය පත්තරේ ගැහැව්වොත් බලා ගෙන'' යි කියා, වෙඩි තබන බවට තර්ජනය කෙළේ ය. ඒ පුවත ඊළඟ 'නව ශක්තිය' කලාපය තුළ පළ කෙළේ 'සී.අයි.ඩී. ලොක්කා පැසිස්ට් ක්‍රමයක් පතයි' යනුවෙනි. 1942 මාර්තු මාසයේ එක්සත් සෝෂලිස්ට් පක්ෂය නීති විරෝධී කිරීමෙන් පසු ව ද 'නව ශක්තිය' ආණ්ඩුව විවේචනයට භාජනය කෙළේ ය. මේ අතර 1942 අප්රේල් 5 වැනි දා ලංකාවට ජපන් බෝම්බ ප්‍රහාරයක් ද එල්ල විය. 1942 අප්රේල් 22 වැනි දා මුද්‍රණාලයට කඩාවැදුණු පොලිස් බළ ඇණියක් එදින මුද්‍රිත ව තිබුණු පුවත්පතේ සියලු පිටපත් ද සමඟ ප්‍රකාශක කර්තෘ ලෙස පෙනී සිටි යසෝදිස් සිරභාරයට ගත්තේ ය. පුවත්පත පළ කිරීම ද තහනම් කරන ලදි. ඒ වන විට මුද්‍රණය කොට ජනතාව අතරට පත් කැර තිබුණු 'නව ශක්තිය' කලාප ගණන අසූහයකි.

1942 ජූලි 31 වැනි දා ඩී. පී. යසෝදිස් සිරබාරයට ගැනීමට හේතු වූ පළමු වැනි ලිපිය 1942 අප්රේල් 8 වැනි දින පළ විය.

'පැසිස්ට් මෘගයා පාගා දමනු' මැයෙන් යුත් එහි කොටස් කිහිපයක් මෙසේ යඃ

"ජපන් ආක්‍රමණය ඕස්ට්‍රේලියාවට පැතිර තිබෙනාතර බුරුමයේ සතුරා ජයග්‍රහණයෙන් ඉදිරියට යන බව පෙනේ.



ලංකාව ආක්‍රමණය ද ආරම්භ විය. කොයි මොහොතේ සතුරු සේනා අප පිටට කඩා පනී දැයි කිව නොහැකි ය.

"ජපන් ගොදුර බවට පත් රටවල පැසිස්ට් විරෝධි ජනතාවට ආක්‍රමණිකයා පලවා හැරීමට අවි අතට ගැනීමට ඉඩ නොදී ඔවුන්ගේ අතපය බැඳ පැසිස්ට් මෘගයාට පාවා දී සාර්ථක ලෙස පසු බැස්ස බ්‍රිතාන්‍යය ලංකාවටත් ඒ ටික ම කරන්නට යන්නේ ද? නැතහොත් මේ අවසාන මොහොතේ දී වත් රටවැසියා අතට අවි ආයුධ දී පැසිස්ට් ආක්‍රමණයෙන් රට බේරා ගැනීමට ඉඩ හරින්නේ දැයි ලංකාවාසීන් ආණ්ඩු පාලකයන්ගෙන් විමසිය යුතු ය."

"අධිරාජ්‍ය බියගුල්ලන්ට පැසිස්ට් මෘගයා මෙල්ල කළ නොහැකි බව පැහැදිලිව පෙන්නුම් කර තිබියදීත් පැසිස්ට් ආක්‍රමණය මැඩලීම් වස් ආයුධ අතට ගැනීමට ඉදිරිපත් වූ ලාංකික ජනතාවගේ අතපය පාගා බැඳ දැමූ ලේටන් ඒකාධිපතියාත් කැල්ඩිකෝට් හෙනහුරාත් අප රට සහ පැසිස්ට් විරෝධි අප ජනතාව පැසිස්ට් ජපානයට පාවා දී සාර්ථක ලෙස පසු බසී ද?

"මෙරට හිතුවක්කාර ඒකාධිපති අධිරාජ්‍ය ආණ්ඩුව තිබෙන තුරු අපට පැසිස්ට් ආක්‍රමණයට විරුද්ධව නැඟී සිටීමට ඉඩ නොලැබෙන්නේ ය. පැසිස්ට් මිනීමරුවන්ගෙන් අපේ ගෙවල් දොරවල් ආරක්ෂා කර ගැනීමට නම් ලංකාව පාලනය කරන පැසිස්ට් ඒකාධිපතියන් රොත්ත මක බැවී යා යුතු ය. අපට පැසිස්ට් මෘගයාගෙන් අපේ ජීවිත ආරක්ෂා කරගත හැක්කේ ලංකාවේ මහජන මතය ගරු කරන මහජන ආණ්ඩුවක් ඇති වුවහොත් පමණකි.

"අවුරුදු හාරසීයක් තිස්සේ පරදේශීය අධිරාජ්‍ය තිරිසනුන්ගේ මෘගවාදී සූරාකෑමට හසු වී වහල් ව සිටි අපට තවදුරටත් වහලුන් වී සිටිය නොහැකි ය. අපේ නිදහස සඳහා අවසාන හුස්ම තෙක් නොපසුබට ව ම සටන් කිරීමට අපි ස්ථිරව ම අධිෂ්ඨාන කරගෙන සිටිමු." (සරත්, 2000ඃ පිටුව 60-61)

දෙවැනි ලිපිය 1942 අප්රේල් 2 වැනි දා පළ විය.

මේ 'ගෙල මිරිකමින් කරන වාදනය' මැයෙන් යුත් එහි කොටස් කීපයකි:

"ලෝකයේ යුද්ධ කාලවල දී ඇති වන භයානක හානින්ගෙන් දුක් කරදර පීඩා විඳීමට සිදු වන්නේ වැඩ කරන පන්තියේ දුප්පත් කම්කරු හා ගොවි ජනතාවට ය. එය නැති කිරීමට ලෝකයේ අද පවතින ධනේශ්වර හෝ පැසිස්ට් හෝ ආණ්ඩු තිබෙන තුරු කිසි කලෙකත් බැරි ය. සුදු හා කළු ධනේශ්වරයන්ගේ පැක්ටරිවල කර්මාන්ත ශාලාවල උදයේ සිට සවස් වන තුරුත් රෑ වන තුරුත් වැඩ කරන කම්කරු සහෝදර සහෝදරියන්ට කිසියම් නිදහසක් කිසියම් සැනැසිල්ලක් නැත.

"තම තමන් වැඩ කරන සෑම කර්මාන්ත ශාලාවකින් ම තමන්ට උවමනා ප්‍රමාණයක පඩි, තමන්ගේ ආරක්ෂාවට උවමනා කරන වෙනත් සෑම දෙයක් ම ලබා ගැනීමට එක්තරා මාර්ගයක් තිබිණි. එය මේ දුෂ්ට අධිරාජ්‍ය ආණ්ඩු පාලකයෝ පැසිස්ට් ජපනුන් මෙන් ඔවුන්ගේ ද පැසිස්ට් නීතියෙන් වසා දැමූ හ. එය වසා දමා ස්ට්‍රයික් කරන කම්කරුවන් ඇදගෙන විත් බලහත්කාරයෙන් වැඩ ගැනීමට හෝ නැතිනම් ඔවුන් සිරබාරයට ගැනීමට මොවුන් විසින් පැසිස්ට් නීති පනවා ගන්නා ලදී.

"මේ අන්දමින් කම්කරු ජනතාවගේ ගෙල මිරිකා මේ වටේට පිත්තල ආණ්ඩු පාලක පැසිස්ට් ලේටන් හා හිතුවක්කාර නොන්ඩි කැල්ඩිකෝටුත් එකතුව වීණා වාදනයක් කළහ. එය නම් කිසි ම කර්මාන්ත ශාලාවක වැඩ නතර නොකළ යුතුය යන්න ය.

"කම්කරු පන්තියට හා මුළු දුප්පත් පන්තියට ම ද්‍රෝහිකම් කරන්නේ පැසිස්ට්වාදය යි. දැනට අපගේ සම්පූර්ණ සටන පැසිස්ට්වාදයට විරුද්ධව ය. එසේ නැතිව ජාතියකට, රටකට හෝ වර්ගයකට හෝ විරුද්ධව නොව, මහජනයා බලහත්කාරයෙන් පාගා ආණ්ඩු කරන පැසිස්ට් නීති ක්‍රමයට විරුද්ධව ය. එය ජර්මන් හෝ වේවා ඉතාලි හෝ වේවා ජපන් හෝ වේවා ඉංග්‍රීසි හෝ වේවා පැසිස්ට් ක්‍රමයට විරුද්ධව අපගේ පැසිස්ට් විරෝධී සටන ගෙන යන්නෙමු.'' (සරත්, 2000: පිටුව 61-62)



මෙයින් සන්නිවේදනය කරන ලද්දේ එවක පැවැති පළමු වැනි කොමියුනිස්ට් රාජ්‍යය වන සෝවියට් සංගමයේ ජාත්‍යන්තර දේශපාලන මතවාදය යි. මේ වකවානුව තුළ සෝවියට් සංගමය සමඟ සෘජු සම්බන්ධයක් ලංකාවේ කොමියුනිස්ට් පාක්ෂිකයන්ට නොතිබිණි. එසේ වුවත් ජාත්‍යන්තර කොමියුනිස්ට් පක්ෂවල මතවාද නිවැරදි එකක් ලෙසින් ලංකාවේ කොමියුනිස්ට්වරු පිළිගත්හ. ඔවුන්ගේ ප්‍රාර්ථනය වූයේ ජාත්‍යන්තර සමාජවාදයේත් එවකට පැවති ප්‍රථම සමාජවාදී රාජ්‍යයේත් සුරක්ෂිත බව ය.

## 8. නව ශක්ති (දෙමළ පුවත්පත)

සිංහල 'නව ශක්ති' පුවත්පතට සමගාමී ව 'නව ශක්ති' නමින් දෙමළ පත්‍රයක් ද 'කොළඹ කම්කරු සමාජ' කණ්ඩායම විසින් පළ කරන ලදි. එය ද පසු ව එක්සත් සෝෂලිස්ට් පක්ෂයේ සන්නිවේදන මාර්ගයක් විය. සති පතා ඉරිදා පත්‍රයක් වශයෙන් (ඩිමයි 1/4) සඟරා ප්‍රමාණයෙන් පළ වුණු මේ ප්‍රකාශනයේ මිල ශත දෙකකි. කොළඹ පෙරි වීදියේ අංක 189 දරන තැන පදිංචි කේ. ආර්. කරුපකුට්ටි කර්තෘ හා ප්‍රකාශක වශයෙන් පෙනී සිටියේ ය. සංස්කාරක සහායක වූයේ ලංකා සමසමාජ පක්ෂයේ සිටිය දී 'සමධර්මම්' පත්‍රයේ කර්තෘ ධුරය දැරූ කේ. රාමනාදන් ය. 'නව ශක්ති' දෙමළ පත්‍රයේ පළමු වැනි කලාපය 1940 සැප්තැම්බර් පළමු වැනි දා නිකුත් විය.

එහි මුල් කතු වැකියේ කොටසක මෙසේ සඳහන් ය:

"අද සිට දෙමළ කම්කරු සහ සාමාන්‍ය ජනතාවගේ සහයෝගයෙන් 'නව ශක්ති' පළ කරනු ලැබේ. වර්තමාන ජාත්‍යන්තර තත්ත්වය කුමක් ද? එය පුපුරා හැලෙන ගිනි කන්දක් උඩ වාඩි වී සිටින මිනිසකුගේ තත්ත්වයට සමාන ය. අපි මේ පුවත්පත මඟින් වර්තමාන සමාජ ක්‍රමයේ පවතින දුර්වලකම සහ අඩුපාඩු ජනතාවට පෙන්වා දෙමු. කම්කරු ශක්තිය ගොඩනඟමු. කම්කරුවනි, තරුණයනි, 'නව ශක්ති' ඔබේ ය. එය රැකගැනීමට උදවු වන්න."

මේ පුවත්පත සිංහල ජනයා සමඟ මිත්‍රත්වය රැකගන්නා ලෙස ඉන්දීය දෙමළ ජනයාට අවවාද කැර තිබේ. 'නව ශක්ති'

ක්‍රමානුකූල ව පළ වී නැත. පළමු වැනි කාණ්ඩයේ කලාප පහළොවක් ද අනතුරු ව කලාප ගණනාවක් අවිධිමත් ලෙස ද නිකුත් වී තිබේ. 1942 ජනවාරි 21 වැනි දින එහි අවසාන කලාපය පළ විය. ඒ වන විට නිකුත් කැර තිබුණු සම්පූර්ණ කලාප ගණන තිස් හතරකි. පුවත්පත ප්‍රකාශයට පත් කළ කරුපකුට්ටි සහ කේ. රාමනාදන් කීප වරක් ම පොලිස් අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් කරනු ලැබූ හ. පොලිස් හිරිහැර නිසා බිය වුණු මුද්‍රණාල හිමියන්ගේ පසුබෑස්ම ද පුවත්පත අඩපණ වීමට හේතු විය. එක්සත් 'සෝෂලිස්ට් පක්‍ෂය' මඟින් 'නව ශක්ති' නමින් මලයාලි බසින් මුද්‍රිත ප්‍රකාශනයක් ද පළ කරන ලදි. එහි කර්තෘ වූයේ සී. ශන්කර් ය. වෛද්‍යාචාර්ය පී. රාමක්‍රිෂ්ණා එහි මෙහෙයුම්කරු විය. මේ පුවත්පත ද මර්දන නීති නිසා ඇනහිටියේ ය.

## 9. යුනයිටඩ් සෝෂලිස්ට් (ඉංග්‍රීසි පුවත්පත)

'කොළඹ කම්කරු සමාජය' තුළ සංවිධානය වී සිටි වාමාංශිකයන්ගේ ඉංග්‍රීසි ප්‍රකාශනය වූ 'යුනයිටඩ් සෝෂලිස්ට්' මුල් කලාපය නිකුත් වූයේ 1940 ඔක්තෝබර් 29 වැනි දා ය. සඟරා ප්‍රමාණයේ (ඩිමයි 1/4) පිටු අටකින් යුත් පුවත්පතේ මිල ශත පහක් විය. කර්තෘ, ප්‍රකාශක සහ මුද්‍රණකරු වූයේ ඇම්. ජී. මැන්ඩිස් ය. 'යුනයිටඩ් සෝෂලිස්ට්' පළ කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ එවකට මේ රටේ තිබුණු 'ලංකා සමාජවාදී පක්‍ෂය' නම් වූ මලයාලි ජාතික කම්කරුවන්ගේ සංවිධානය සහ 'කොළඹ කම්කරු සමාජය' ඒකාබද්ධ කිරීමේ පදනම දැමීම ය. ලංකා සමසමාජ පක්‍ෂයට විකල්ප වශයෙන් අනෙක් මාක්ස් ලෙනින්වාදී පක්‍ෂයක් එමඟින් ගොඩනඟන ලදි. එතැන් සිට එහි හඬ ඉංග්‍රීසි පාඨකයන් වෙත ගෙන ගියේ 'යුනයිටඩ් සෝෂලිස්ට්' මඟිනි.

ප්‍රථම කලාපයේ කතු වැකියේ අවසාන වගන්ති කීපය පුවත්පතේ ප්‍රතිපත්ති පැහැදිලි කළේ ය. එහි සිංහල අනුවාදය මෙසේ ය:

"අපි මාක්ස්-ලෙනින්වාදයත් විද්‍යාත්මක සමාජවාදයත් වෙනුවෙන් පෙනී සිටිමු. පළමු වැනි කම්කරු රාජ්‍යය වන සෝවියට් සංගමයේ සෑම සියලු ක්‍රියාවකට ම අපගේ පූර්ණ සහයෝගයත් අනුකූලතාවත් ප්‍රකාශ කරමු.



"ධනවාදී රටවල කම්කරු අරගලවලටත් යටත් විජිත රටවල නිදහස් අරගලවලටත් අපගේ පූර්ණ අනුකූලතාව දක්වමු.

දේශපාලන අවබෝධයෙන් යුතු, කම්කරු පන්තිය නායකත්වය දරන්නා වූ, අධිරාජ්‍ය පීඩනයට විරුද්ධ ව අරගල කරන ජාතික පෙරමුණක් අපගේ අරමුණ යි."

'යුනයිටඩ් සෝෂලිස්ට්' සංස්කරණ කටයුතු කේ. රාමනාදන් සහ ඇම්. ජී. මැන්ඩිස් විසින් කරන ලදි. ලිපි සම්පාදනය කළවුන් අතර පී. ශන්කර් නමැති මලයාලි ජාතිකයා සහ පසු කාලයේ පේදුරුතුඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූ පී. කන්දයියා ද වූ හ.

මෙම පුවත්පතේ දෙවැනි කලාපය මුද්‍රණය කිරීමට සූදානම් ව තිබිය දී මුද්‍රණාලයේ අයිතිකරු පොලිස් අත්අඩංගුවට ගනු ලැබ ප්‍රශ්න කිරීමෙන් පසු රුපියල් පන්සියයක ඇප පිට නිදහස් කරන ලදි.

'යුනයිටඩ් සෝෂලිස්ට්' හත් වැනි කලාපය 1940 දෙසැම්බර් 10 වැනි දා නිකුත් විය. ඉන් පසු පුවත්පත පළ කිරීම ඇනහිටියේ ය. කේ. රාමනාදන් පොලිස් අත්අඩංගුවට ගනු ලැබීමත් ඇම්. ජී. මැන්ඩිස් රහස් පොලීසිය මඟහැර කොළඹ නගරයෙන් පිට වී යෑමත් ඊට හේතු විය.

## 10. ස්ට්‍රේට් ලෙෆ්ට්

ලංකා සමසමාජ පක්‍ෂයේ නායකයන් කීප දෙනකු විසින් 1941 පෙබරවාරි පළමු වැනි දා 'ස්ට්‍රේට් ලෙෆ්ට්' නමින් පුවත්පතක් නිකුත් කරන ලදි. එහි අරමුණ වූයේ 'යුනයිටඩ් සෝෂලිස්ට්' නමින් පළ වූ ප්‍රකාශනයට පිළිතුරු දීම ය. එය සඟරා ප්‍රමාණයේ පිටු අටකින් යුක්ත විය. එහි සංස්කාරකයා වූයේ ඩොරික් ද සූසා ය. පුවත්පත අවස්ථානුකූල ව පළ වන බවත්, ප්‍රවෘත්ති සහ මත ඉදිරිපත් කිරීම අරමුණ බවත් සඳහන් වෙයි. ට්‍රොට්ස්කිට පක්‍ෂපාත ව ස්ටාලින් විවේචනයට භාජනය කරන ලිපි එහි පළ කැර තිබේ.

1941 නොවැම්බර් 7 වැනි දා පළ වුණු හතර වැනි කලාපයෙන් පසු එය ඇනහිටියේ ය.

## 11. ජන ශක්තිය (දෙවැනි වර)

ලංකාවේ ස්ටාලින් පාර්ශ්වයේ වාමාංශිකයන් පිහිටුවාගෙන තිබුණු 'එක්සත් සෝෂලිස්ට්' පක්ෂය නීති විරෝධී කැර, ඔවුන්ගේ 'නව ශක්තිය' සිංහල පුවත්පත සහ 'යුනයිටඩ් සෝෂලිස්ට්' ඉංග්‍රීසි පුවත්පත තහනම් වීමත් සමඟ ම, කලින් නවත්වාදමනු ලැබූ 'ජන ශක්තිය' අභිනව සතිපතා පුවත්පතක් ලෙසින් එළි දුටුවේ ය. එහි පසුබිමෙහි සිටියේ රහසිගත ව ක්‍රියා කළ එක්සත් සෝෂලිස්ට් පක්ෂය සහ ඔවුන් විසින් ගොඩනඟා ගනු ලැබූ කම්කරු සමිති සම්මේලනය යි. අභිනව 'ජන ශක්තිය' නිකුත් වූයේ රාජගිරියේ, කෝට්ටේ පාරේ, අංක 65 දරන තැන පදිංචි පී. ඩී. ඩේවිට් ගේ නමිනි. මේ පුවත්පතේ පළමු වැනි කාණ්ඩයේ පළමු වැනි කලාපය 1942 මැයි 1 දා ප්‍රකාශයට පත් විය. ටැබ්ලොයිඩ් (ඩිමයි 1/2) ප්‍රමාණයේ පිටු හයකින් යුත් ප්‍රකාශනයේ මිල ශත පහකි.

දෙවැනි වරට නිකුත් කළ 'ජන ශක්තිය' ක්‍රියාත්මක වූයේ පැසිස්ට්වාදී සතුරන්ටත්, ලංකාවේ බ්‍රිතාන්‍ය පාලක පක්ෂයටත් විරුද්ධ වන අතර සෝවියට් රුසියාව ඇතුළත් මිත්‍ර පක්ෂයට සහයෝගය දැක්වීමේ අරමුණ ඇති ව ය. ඒ සමඟ ම කම්කරු සටන් පිළිබඳ වත් අධිරාජ්‍ය විරෝධී ජාතික පෙරමුණක් ගොඩනැඟීම පිළිබඳ වත් අදහස් ජනතාව අතරට ගෙන ගියේ ය. නීති විරෝධී තත්ත්වයෙන් ක්‍රියා කරමින් සිටි එක්සත් සෝෂලිස්ට් පක්ෂයේ සාමාජිකයෝ 1943 දී 'ලංකා කොමියුනිස්ට් පක්ෂය' නමින් අභිනව පක්ෂයක් පිහිටුවාගත් අතර 'ජන ශක්තිය' ප්‍රසිද්ධියේ ම එහි නිල දේශපාලන ප්‍රකාශනය බවට පත් විය. 'ජන ශක්තිය' 1942 මැයි මාසයේ සිට 1948 ඔක්තෝබර් දක්වා අවුරුදු හයක් පවත්වාගෙන එනු ලැබී ය.

මෙම පුවත්පතේ දෙවැනි ආරම්භක කර්තෘ ලෙස ක්‍රියා කෙළේ ඩී. සී. ලියනගේ ය. ඔහු කොළොන්නාව සුළු නගර සභාවේ පෙනී සිටි කොමියුනිස්ට් නියෝජිතයා ය. එවකට කම්කරු සමිති සම්මේලනයේ ප්‍රධාන ලේකම් ධුරයට පත් ව සිටි ප්‍රේමලාල් කුමාරසිරි සහ 1956 දී බණ්ඩාරනායක ආණ්ඩුවේ උප ඇමැතිවරයකු බවට පත් වුණු නිමල් කරුණාතිලක සහායකයෝ



වූ හ. 1945න් පසු 'ජන ශක්තිය' ප්‍රධාන කර්තෘ ප්‍රේමලාල් කුමාරසිරි විය.

## 12. කොමියුනිස්ට්

'ජන ශක්තිය' (දෙවැනි වර) අවසාන කලාපය 1948 ඔක්තෝබර් 29 වැනි දා පළ වූ අතර, එය ඊළඟ සතියේ - එනම් 1948.11.05 දින සිට - 'කොමියුනිස්ට්' නමින් පළ කැරෙන බව නිවේදනය විය. එම පත්‍රයේ කර්තෘ ලෙස පෙනී සිටියේ වෘත්තීය සමිති සංවිධායක ඇම්. ජී. මැන්ඩිස් ය.

පුවත්පතේ නම මෙසේ වෙනස් කිරීමට මූලික ව බලපෑවේ ඒ වන විට දෙවැනි ලෝක යුද්ධ ජයග්‍රහණයත් සමඟ සෝවියට් රාජ්‍යය හා බැඳුණු 'කොමියුනිස්ට්' යන වදනට ආරෝපණය වී තිබුණු කීර්තිය විය හැකි ය. එසේ ම සමසමාජ පක්ෂය සිය පක්ෂයේ නමින් ම ඔවුන්ගේ සති පතා පත්‍රය නිකුත් කිරීම ද තවත් පෙලඹවීමක් වන්නට ඇත.

ප්‍රථමයෙන් සති පතා පුවත්පතක් ලෙස ආරම්භ වූ 'කොමියුනිස්ට්' 1949 මැයි පළමු වැනි දා සිට දින පතා පුවත්පතක් බවට පත් විය. එහි ප්‍රකාශකයා ලෙස පෙනී සිටියේ පසු කලෙක සෝවියට් රුසියාවේ වෙසෙමින් රුසියානු පොත් සිංහලයට පරිවර්තනය කිරීමේ යෙදුණු දෑදිගම වී. රුද්‍රිගු ය.

දින පතා 'කොමියුනිස්ට්' පිටපත් හයදාහක් අලෙවි වුණු බව පුවත්පතේ සටහන් වී තිබේ. එහි කර්තෘ මණ්ඩලය ඒ. ඇස්. රත්නවීර, එච්. ජී. ඇස්. රත්නවීර, ඩී. සී. ලියනගේ, ප්‍රේමලාල් කුමාරසිරි සහ හේමා ද සිල්වා යන අයගෙන් සමන්විත විය.

වාමාංශික ව්‍යාපාරය මඟින් නිකුත් කරනු ලැබූ ප්‍රථම දින පතා පුවත්පත වශයෙන් 'කොමියුනිස්ට්' සැලකිය හැකි ය. පුවත්පතේ මිල ශත පහකි. ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පිටු හතරකින් සමන්විත විය. තත්කාලීන ව අමෙරිකානු එක්සත් ජනපදය සහ සෝවියට් සංගමය අතර පැවැති ශීතල යුද්ධය පිළිබිඹු කෙරෙන පුවත්වලට එහි විශේෂ තැනක් ලැබිණි. මහජන චීනය පිළිබඳ වත් උතුරු දකුණු කොරියානු යුද්ධය පිළිබඳ වත්, පරමාණු

බෝම්බ ව්‍යසනයට විරුද්ධ ව හා ලෝක සාම ප්‍රයත්නය පිළිබඳ වත් පැහැදිලි කිරීම වැඩි වශයෙන් කැරිණි. එහෙත් දේශීය වශයෙන් වාමාංශික ව්‍යාපාරයේ මතභේද තුනී කිරීමේ හඬක් නොපෙනිණි. ඊට හේතුව ස්ටාලින්ගේ සෝවියට් නායකත්වය ලංකා සමසමාජ පක්ෂය මඟින් නොපිළිගැනීම ය. පුවත්පතේ ශීර්ෂයත් සමඟ ම 'පීඩිත පන්ති විප්ලවවාදී එක ම දින පතා ප්‍රවෘත්ති පත්‍රය කියවීමෙන් අද පැතිර යන ලෝක විප්ලවයට විරුද්ධ ව ධනපති ප්‍රවෘත්ති පත්‍ර ගෙන යන ජඩ ප්‍රචාරයට උත්තර දෙන්න' යි පළ කළ පාඨය මඟින් එහි අරමුණු පැහැදිලි කැර තිබේ.

## 13. සටන

දෙවැනි ලෝක යුද්ධය අවසානයේ ලංකාවේ පනවා තිබුණු යුද්ධාරක්ෂක නීති ඉවත් විය. ඒ අනුව ලංකා සමසමාජ පක්ෂය නීති විරෝධී බවින් මිදිණි. පක්ෂය තහනම් ව තිබීම නිසා දේශපාලන ක්‍රියාකාරීන්ට ලැබෙන කීර්තිය එම පක්ෂයේ නායකයන්ට ලැබී තිබිණ. සිරගෙයින් නිදහස් වූ නායකයෝ සහ අප්‍රකට ව ඉන්දියාවේ සිට පැමිණි නායකයෝ අධිරාජ්‍ය විරෝධ ලාංකික ජන කොටස් අතර ප්‍රසාදයට ලක් වී සිටියහ. එහෙත් එතෙක් තිබූ ස්ටාලින්වාදී සහ ට්‍රොට්ස්කිවාදී බෙදීමට අමතර ව තවත් බෙදීමක් ඔවුන් අතරින් මතු වී තිබිණ. මෙහි දී වූයේ පිල්වාදී හබයකි. එක් පිලක් කොල්වින් ආර්. ද සිල්වාගේ සහ ලෙස්ලි ගුණවර්ධනගේ නායකත්වයෙන් යුක්ත වූ අතර, එය හැඳින්වූයේ "හතර වැනි ජාත්‍යන්තර සභාවේ කොටසක් වූ ඉන්දියාවේ බොල්ෂෙවික් ලෙනිනිස්ට් පක්ෂයේ ලංකා ශාඛාව" හැටියට ය. විල්සන් ගුණවර්ධන, සෝමා වික්‍රමනායක, පුෂ්පරාජන්, රෙදිමෝලේ ධර්මසේන, වී. කරාලසිංහම්, හෙක්ටර් අබේවර්ධන, හෙන්රි පීරිස්, සෙලිනා පෙරේරා ආදිහු ඊට ඇතුළත් වූ හ. අනෙක් පිල හිරගෙදරින් නිදහස් ව පැමිණි ඇන්. ඇම්. පෙරේරාගේ සහ පිලිප් ගුණවර්ධනගේ නායකත්වයෙන් යුක්ත වූ අතර රොබට් ගුණවර්ධන ද, ඩබ්ලිව්. ජේ. (හොස්පිටල්) පෙරේරා, සෝමවීර චන්ද්‍රසිරි ආදි පිරිස් ද ඊට එක් ව සිටියහ.

'සටන' නමින් වූ සති පතා ප්‍රකාශනය නිකුත් කෙළේ 'කොල්වින් - ලෙස්ලි පිල' වෙනුවෙනි.



එම පුවත්පතේ ප්‍රථම කලාපය නිකුත් වූයේ 1945 නොවැම්බර් 9 සිකුරාදා ය. එය හඳුන්වා දී තිබෙන්නේ ''හතර වැනි ජාත්‍යන්තර සභාවේ කොටසක් වූ ඉන්දියාවේ බොල්ෂෙවික් ලෙනිනිස්ට් පක්ෂයේ ලංකා ශාඛාවේ පුවත්පත'' ලෙසිනි. ටැබ්ලොයිඩ් පිටු හතරකින් යුත් 'සටන' ශත දහයකට මිල කර තිබිණි. මේ පුවත්පතේ කර්තෘ වූයේ මුල් 'සමසමාජය' පුවත්පතේ කර්තෘවරයකු ව සිටි හෙන්රි පීරිස් ය.

'සටන' බොල්ෂෙවික් ලෙනිනිස්ට් පක්ෂයේ ලංකා ශාඛාව වෙනුවෙන් කොළඹ බගතලේ පාරේ 33 වැනි ලේන්හි නො. 9 නිවෙසේ පදිංචි පතිරණගේ පියදාස විසින් ප්‍රකාශයට පත් කරන ලදි. වසරක් ගෙවී ගිය තැන, එනම් 1946 ජූලි 12 දින - 'සටන' කලාපය නිකුත් වීමෙන් පසු එය ඇනහිටියේ ය.

## 14. සමසමාජය (දෙවැනි වර)

දෙවැනි ලෝක යුද්ධ වකවනුවේ පැවැති මර්දන නීති ඉවත් වීමෙන් පසු 'සමසමාජය' නැවත නිකුත් වූයේ ''සතර වැනි අන්තර්ජාතිකය අනුගාමික ලංකා සමසමාජ පක්ෂයේ සති පතා පත්‍රය'' වශයෙනි. ටැබ්ලොයිඩ් ප්‍රමාණ පිටු හතරකින් යුක්ත වූ සති පතා පත්‍රයේ මිල ශත දහයක් විය. පත්‍රය පළ වූයේ සතියේ සිකුරාදා ය. එය ආරම්භක 'සමසමාජය' සමඟ සම්බන්ධ කැර තිබුණේ 10 වැනි කාණ්ඩයේ 1 වැනි පත්‍රය ලෙසිනි. මුල් 'සමසමාජය' පත්‍රයේ නොවූ ලක්ෂණයක් හැටියට අභිනව පත්‍රයේ දෑකැත්ත සහ මිටිය සලකුණ හරහා හතරේ ඉලක්කමක් යොදා තිබේ. මුල් පිටපත නිකුත් කරන ලද්දේ 1945 සැප්තැම්බර් 7 වැනිද ය. ප්‍රකාශක හැටියට පෙනී සිටියේ ඩබ්ලිව්. පියසේන බොතේජු ය.

මෙම පුවත්පත නිකුත් වූයේ 'කොල්වින් - ලෙස්ලි පිලේ සටන' පත්‍රයට ප්‍රතිපාක්ෂික ව ය. ඇන්. ඇම්. පෙරේරා සහ පිලිප් ගුණවර්ධන කණ්ඩායම මුල් සමසමාජ පක්ෂය එසේ ම පවතින බව සන්නිවේදනය කරමින් පළ කළ මෙම පුවත්පත මඟින් තමන් දිගට ම විප්ලවීය මාර්ගයේ ගමන් කරන බව ද ප්‍රකාශ කිරීමට වෑයම් කර ඇත. මෙම පුවත්පත ප්‍රකාශයට පත් වූයේ 1946 සැප්තැම්බර් 20 සිකුරාදා තෙක් පමණි.

## සමසමාජ සටන

මේ ප්‍රකාශනය ඉදිරිපත් කැර තිබෙන්නේ 'සතර වැනි ජාත්‍යන්තරීය ලංකා ශාඛාවේ සතිපතා පත්‍රය' ලෙසිනි. පුවත්පතේ එක් කොනක "4 වැනි අන්තර්ජාතිකයට ජය වේවා" යි උද්‍යෝග පාඨයක් දැක්වේ. ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පිටු හතරකින් යුක්ත වූ අතර, මිල ශත දහයකි.

සමසමාජ පක්ෂයේ භේද වී සිටි කණ්ඩායම් දෙක යළි එක්සත් වීම අනුව එතෙක් පවත්වා ගෙන ආ පුවත්පත් දෙකේ නාමයන් ද ඒකාබද්ධ කැර අලුත් ප්‍රකාශනය නිකුත් කැර තිබෙන බව පෙනේ.

'සමසමාජ සටන' පළමු වැනි කාණ්ඩයේ පළමු වැනි කලාපය 1946 ඔක්තෝබර් 18 වැනි සිකුරාදා නිකුත් කැර තිබේ. කලින් "හතර වැනි අන්තර්ජාතිකය අනුගාමී" යනුවෙන් 'සමසමාජ' පත්‍රයේ යෙදුම වෙනුවට 'හතර වැනි ජාත්‍යන්තර සභාවේ කොටසක් වූ ඉන්දියාවේ බොල්ෂෙවික් ලෙනිනිස්ට් පක්ෂයේ ලංකා ශාඛාවේ සතිපතා පත්‍රය' යනුවෙන් සඳහන් කැර තිබේ. කෙසේ වුවත් ඇන්. ඇම්. පෙරේරා ප්‍රමුඛ කණ්ඩායමෙන් එක් පිරිසක් පමණක් සමඟියට එකඟ වී ඇත.

පිලිප් ගුණවර්ධන මේ එකඟතාව ප්‍රතික්ෂේප කර 'විප්ලවකාරී සමසමාජය' නමින් අභියෝගකාරී ව පෙනී සිටියේ ය. 'සමසමාජ සටන' ඇන්. ඇම්. පෙරේරාගේ වගකීම පිට නිකුත් කළ අතර, එහි ප්‍රකාශක ලෙස කොල්ලුපිටියේ ගාලු පාරේ අංක 317 දරන ස්ථානයේ බී. එච්. හර්මන් අප්පුහාමිගේ නම සඳහන් වී තිබේ. මෙහි දී මතු වුණු පිල් පොරයෙහි දී තමන් නිල වශයෙන් පිළිගත යුතු පිරිස බව දැක්වීමේ උත්සාහයක් ද දක්නා ලැබේ. පුවත්පතෙහි ඉහළින් ම මෙසේ සඳහන් යඃ

"ඔබ විප්ලවකාරී සමසමාජවාදියකු, කම්කරුවකු, ගොවියකු හෝ පීඩිතයකු නම් ඔබගේ පන්තිකාමී සටනෙහි මාර්ගෝපදේශක භටයා එක ම විප්ලවවාදී 'සමසමාජ සටන' පත්‍රය යි. මාක්ස් - එංගල්ස් - ලෙනින් හා ට්‍රොට්ස්කිගේ විප්ලවවාදී සටන් මාර්ගය උගන්වන 'සමසමාජ සටන' කියවීම ඔබ යුතුකම ය."



## 15. මව්බිම

'ලංකා කොමියුනිස්ට් පක්ෂය' විසින් 'කොමියුනිස්ට්' දින පතා පත්‍රය නවත්වා, ඒ වෙනුවට පළ කළ දිනපතා ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පිටු හයකින් යුත් පුවත්පත 'මව්බිම' නම් විය. අලුත් පුවත්පතක් වශයෙන් පළ කළ 'මව්බිම' 1 කාණ්ඩය - 1 පත්‍රය 1950 සැප්තැම්බර් 1 වැනි දින නිකුත් කරන ලදි. පත්‍රයේ මිල ශත පහකි. කර්තෘවරයා වශයෙන් එච්. ජී. ඇස්. රත්නවීරගේ නම සඳහන් කැර තිබේ. ප්‍රකාශක දූදිගම වී. රුද්‍රිගු ය. මුල් පිටුවේ "කොමියුනිස්ට් පක්ෂය මව්බිමට සුබපතයි" ශීර්ෂය යටතේ එම පක්ෂයේ නායක දොස්තර ඇස්. ඒ. වික්‍රමසිංහගේ ප්‍රකාශයක් පළ කැර ඇත. 'මහජන හඬ නඟන දේශප්‍රේමී පත්‍රය' - 'සිංහල ප්‍රගතිශීලී දිනපතා පත්‍රය මව්බිම' යනුවෙන් හැඳින්වීමක් ද කැර ඇත. පුවත්පතේ පරමාර්ථය 'සාමය, ජාතික ස්වාධීනත්වය හා වඩා යහපත් ජීවන තත්ත්වයක් සඳහා අපේ මහජනතාවන්ගේ බලාපොරොත්තු හඬ නැගෙන එක ම දිනපතා සිංහල පත්‍රය' යනුවෙන් දක්වනු ලැබේ.

මේ රටේ එවකට රාජ්‍ය බලයෙහි සිටි එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව සහ එහි පිටුපස සිටි බලවේගය බ්‍රිතාන්‍ය - අමෙරිකානු අධිරාජ්‍යයන්හි කොන්තරාත්කාර රූකඩයක් ලෙස හඳුන්වාදීම 'මව්බිම' ප්‍රධාන පරමාර්ථය විය. එහෙයින් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට විරුද්ධ ව සිටිනා සියලු වාමාංශික පක්ෂත් අනෙකුත් දේශප්‍රේමී ප්‍රගතිශීලී පක්ෂත් එක්සත් කිරීමට උපයෝගී වන මතවාදයක් ජනතාව අතරට ගෙන යෑමට එම පුවත්පත ක්‍රියා කැර ඇති බව පෙනෙන්නට තිබේ. ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් ඉවත් ව විපක්ෂයට පැමිණීම අගය කරමින් ප්‍රචාරයක් ගෙන යෑම ඊට සාක්ෂ්‍යයකි.

"සියලු ම යූ. ඇන්. පී. විරෝධී කොට්ඨාස සමගි කළ යුතු ය" යන ශීර්ෂ පාඨය එහි නිරන්තර ව දකින්නට ලැබිණ.

මේ පදනම මත එම මතය නොපිළිගත් සමසමාජ පක්ෂය ප්‍රමුඛ අනෙකුත් සමාජවාදී පක්ෂවලට ප්‍රහාර එල්ල කිරීම ද දක්නා ලදි.

## 16. වෙනත් වමේ පුවත්පත්

වාමාංශික ව්‍යාපාරයට සම්බන්ධ වූ ඇතැම් අය විසින් ඊට සහයෝගය දක්වනු පිණිස පෞද්ගලික වශයෙන් පවත්වාගෙන ගිය පුවත්පත් කීපයක් ද ලාංකික ජන මතය කෙරෙහි බලපෑම් කෙළේ ය.

විශේෂයෙන්, මෙරට බිහිවූ රැඩිකල් මාධ්‍යවේදිනියක වන තේජා ගුණවර්ධන මහත්මියගේ කර්තෘත්වයෙන් 1952 ප්‍රකාශයට පත්වූ 'ට්‍රයින්' (Trine) නමැති ඉංගිරිසි පුවත්පත සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටි පුවත්පතකි. මාක්ස්වාදය සහ කොමියුනිස්ට්වාදය ගැන මනා අවබෝධයකින් කටයුතු කළ තේජා ගුණවර්ධන මහත්මිය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ ඉතා කිට්ටු සබඳතාවක් පැවැත්වූවා ය.

'ට්‍රයින්' පුවත්පත දේශීය හා විදේශීය දේශපාලන, සමාජ හා ආර්ථික කරුණු කාරණා ගැන පුළුල් විග්‍රහයක යෙදුණු පුවත්පතකි. මෙයට කදිම නිදසුනක් වන්නේ, ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක මෙරට මුදල් ඇමැතිවරයා වශයෙන් සිටිය දී බ්‍රිතාන්‍යයෙන් ගනු ලැබූ ණය මුදලට අදාළ රහස් සම්මුතියක් පිළිබඳ ව 'ට්‍රයින්' පුවත්පත කරුණු හෙළිදරවු කිරීම නිසා තේජා ගුණවර්ධනට යූ.ඇන්.පී. ආණ්ඩුවෙන් විවිධ තර්ජන හා බලපෑම් එල්ල වීම ය.

ඔලිවර් ගුණතිලකව දිගින් දිගට ම 'ට්‍රයින්' පුවත්පත මඟින් දරුණු ලෙස විවේචනය කිරීම නිසා ඇයට එරෙහි ව නඩු පවරා ඇය සිර බාරයට ගැනීමට ආණ්ඩුව වෑයම් කෙළේය.

අවසානයේ යූ.ඇන්.පී. ආණ්ඩුව තේජා ගුණවර්ධනට නඩු පැවරීය. මෙම නඩුවට මුහුණ දීම සඳහා ඇය බ්‍රිතාන්‍යයේ රාජ නීතිඥ ඩී.එන්. ප්‍රිට් මහතා ලංකාවට ගෙන්වා ගත්තේය.

ශ්‍රී ලංකාවේ එවකට සිටි නීතිඥයන් පිළිබඳ ව පැහැදිලි විශ්වාසයක් නොමැති නිසාත්, ප්‍රිට් බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයේ සටන්කාමී නායකයකු වූ නිසාත් මෙවැනි තීරණයකට ඇය පැමිණි බව වාර්තා වෙයි.



කෙසේ නමුත් තේජාට එරෙහි ව ආණ්ඩුව පැවරූ නඩුව ජූරියක් නොමැති රජ තුන් කට්ටුවත් ඉදිරියේ පුරා තෙමසක් විභාග කෙරිණි. අවසන් ප්‍රතිඵලය වූයේ තේජා ගුණවර්ධන මහත්මිය නඩුවෙන් ජය ගැනීම යි. ඒ සඳහා ඇය එද ලක්ෂ තුනකට වැඩි මුදලක් වැය කැර තිබිණි.

1952 වසරේ තේජා ගුණවර්ධන මහත්මිය ලංකා-චීන මිත්‍ර සංගමයේ සභාපති ධුරය දැරුවා ය. පාකිස්ථානයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරිය ලෙස කටයුතු කෙළේ ඉන් පසු ව වීම විශේෂත්වයකි.

උඩකැන්දවල සිරි සරණංකර හිමියන් හා තේජා ගුණවර්ධන මහත්මිය අතර ඉතා හොඳ හිතවත්කමක් තිබූ බව ඉතිහාස තොරතුරුවලින් සනාථ වෙයි. මේ හිතවත්කමට ප්‍රධාන හේතු කාරණා දෙකක් බලපා ඇති බව සඳහන් කිරීම වැදගත්ය. ඉන් පළමු වැන්න වන්නේ, සරණංකර හිමියන් ඍජු කොමියුනිස්ට්වාදියකු වීමත්, දෙවනුව උන්වහන්සේ ඍජු ලෙස අදහස් ප්‍රකාශ කරන ලේඛකයකු වීමත් ය.

තේජා ගුණවර්ධන මහත්මිය පදිංචි ව සිටි නිවෙස පිහිටා තිබුණේ සරණංකර හිමියන් වැඩ විසූ උඩුගම්පොළ නයිවල පාරේ පිහිටි, කොස්පිල්ලෑව පන්සල පෙනෙන දුරින් වීම විශේෂත්වයකි.

තව ද, මෙරට වාම ව්‍යාපාරයට සම්බන්ධ ව කටයුතු කළ ලයනල් එදිරිසිංහ හෙවත් ලයනල් සරත් මහතා 'බජරි හටන' නමින් පිටු හතරකින් යුත් ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පුවත්පතක් ප්‍රකාශයට පත් කැර තිබේ. 1964 අග භාගයේ දී පමණ ප්‍රකාශයට පත් වූ මෙම පුවත්පත උපහාසාත්මක පුවත්පතක් ලෙස සැලකේ. ශ්‍රී ලංකවේ වාම සන්නිවේදනය සමාජ ගත කිරීම සඳහා මෙවැනි උපහාසාත්මක පුවපත්පත් ප්‍රකාශයට පත් වී ඇත.

ශත 15කට මිල කැර ඇති මේ පුවත්පත, පුවත්පතක් ලෙස එවකට මහ තැපැල් කන්තෝරුවේ ලියාපදිංචි කැර ඇති බව සඳහන් වෙයි. පුවත්පතේ මුල් පිටුවේ ඉහළ කොටසේ,

"අග්නිදිග ආසියාවේ සෑම ජාතික පත්‍රයකටම වඩා ඉහළින් විකිණේ'' යන පාඨය යොදා තිබීම විශේෂත්වයකි. මෙම පාඨය

සෑම පුවත්පතක් ම පළ කරනු ලබන්නේ කුමන අරමුණකින් ද යන්න ගැටලුවකි. එහෙත් පොදුවේ ගත් කල පාඨක අවධානය යොමු කිරීම සඳහා මෙම පාඨය යොදා ඇති බව අපට සිතිය හැකිය. තව ද ප්‍රධාන සිරස්තලයට ඉහළින් එක ම කවියක් සෑම පුවත්පතක ම පළ කිරීම විශේෂත්වයකි. එම කවිය මෙසේ ය.

බජරි හටන අපි වැනි වැනි ගෙන යන  වා
බජරි ගෙනත් ළඟදීම කන්නට දෙන  වා
බජරි කාපු අය ඔක්කොම අලි වෙන  වා
බජරි පාටියේ ලොක්කා රට කන  වා

"බජරි හටන" පුවත්පතේ භාෂාව උපහාසාත්මක මෙන් ම, ප්‍රහාරාත්මක බවක් පෙන්නුම් කරයි. ඒ තුළින් පවතින දේශපාලන විවේචනය කරනු ලැබුවේ පොදු ජනතාව අතර ව්‍යවහාර වන භාෂාවකිනි. ඇතැම් විට ග්‍රාමීය බස් වහරක් ඒ තුළින් ප්‍රදර්ශන වූ බව ඇතැමකුට සිතීමට පුළුවන. එබැවින් මේ සඳහා නිදසුන් කීපයක් ඉදිරිපත් කිරීම වැදගත් ය. 1966 දෙසැම්බර් 30 සිකුරාද 'බජරි හටන' ප්‍රධාන සිරස්තල මේ අන්දමින් පළ වී තිබිණි.

"යුද්දෙ බං යුද්දෙ !
බත්ගොටු බැල්ලියෝ කෝ?"

එම සිරස්තල ප්‍රවෘත්තියේ මෙසේ සඳහන් වී තිබිණි. ''ඊයේ රාත්‍රියේ 'බජරි හටන' කර්තෘ හා ජනරංජනතුමා සාගතය නිවා ගැනීමට බත් හැලි සොයමින් ගෙයක් ගානේ ඇවිදිද්දී සිදුවුණ අරගලයක් නිසා කර්තෘතුමා තුවාල ලැබූ අතර ජනරංජනතුමා අනුනවයෙන් බේරුණේය.'' මෙම සිරස්තලයට අදාළ කාටූන් චිත්‍රයක් මුල් පිටුවේ පළවී තිබිණි. එය නම් කැර තිබුණේ 'බජරි කෝලං' නමිනි. තව ද මෙම පුවත්පත්වල විශේෂත්වයක් වූයේ, මුල් පිටුවේ අග කොටසේ ලොකු අකුරින් ''එකම අපක්ෂපාත ජාතික පුවත්පත'' යනුවෙන් සඳහන් කැර තිබීම යි.

'බජරි හටන' කතුවරයා සිය දේශපාලන දෘෂ්ටිය සමාජගත කිරීම සඳහා සීපද නිර්මාණය කොට පළ කළ අවස්ථා තිබිණි. එම සීපදයක් නිදසුනක් ලෙස සඳහන් කිරීම වැදගත්ය.



හත්පොලේ ගගා පජ වී
දඟලනවා
ගත්තොත් බලේ කැඳ නම්
බොන්නට වෙනවා
හත් හවුලක් වෙලා උන් ටික
රට කනවා
බත් කන ගොනුන් ඡන්දය දී
ලත වෙනවා''

('බජරි හටන' - 1966, දෙසැම්බර් 30 වැනි ද)

1967 දෙසැම්බර් 5 වැනි ද ප්‍රකාශයට පත් වූ 'බජරි හටන' ප්‍රධාන සිරස්තලය හා ඊට අදාළ ප්‍රවෘත්තිය මුල් පිටුව පිරෙන ලෙස පළ කැර තිබුණේ දේශපාලන උපහාසය ගෙන දෙන ආකාරයෙනි. එම සිරස්තලය මෙසේ ය.

"ඔළු දෙපලු වෙයි !
ගුවන් විහිලුවට ගල්"

එම පුවත්පතේ ම ඇතුළත පිටුවල තිබූ සිරස්තල කීපයක් නිදසුන් වශයෙන් පෙන්වාදීම වාම සන්නිවේදනයේ උපහාසාත්මක දේශපාලනය තව දුරටත් මැනවින් තේරුම් ගැනීමට හේතු වන බව පැවසිය හැකි ය.

"යෝද පෙළපාළියක් !"
මුද්දරප්පලන් ඉල්ලා පාරට බසිති

"අරියස් යුවල ලෙඩින්"
එහි යාම තහනම්

"රුපියල රුපියලමයි"
ජනරංජනයට නිවන් සැප ලැබේවා

"කාපියව්! කාපියව්!!"
ඉල්ලීම අහක

## 17. නිදහස

මෙය ස්වාධීන වාමාංශිකයකු වූ සුප්‍රසිද්ධ කවියකු සහ 1970 සමඟි පෙරමුණු ආණ්ඩුවේ උපඇමැතිවරයකු වූ කැස්බෑවේ

සෝමවීර චන්ද්‍රසිරි අයිතිකාර කර්තෘ වශයෙන් සිටිමින් විටින් විට පළ කරන ලද්දකි. කර්තෘවරයා ම ඒ ගැන මෙසේ කියයි:

'නිදහස' පත්‍රය වරින් වර ඔබට දකින්නට ලැබීම සමහර විට විහිළුවක් වන්නට පුළුවනි. එය එසේ ම වේවා. නමුත් කිසිවකුගේ ධනයට බලයට ගැතිව මෙය නොපවත්වන හෙයින් හිස ඔසවාගන්නට පුළුවන් විට පමණක් පළ කරවීම වුව ද අපට සැනසිල්ලකි.''

'නිදහස' සමසමාජ පක්ෂයට හිතවත් ව ද ඇතැම් විට විවේචනාත්මක ව ද අදහස් පළ කැර ඇත. සමසමාජවාදය ධනවාදීන් ප්‍රචාරය කරන අන්දමට බිහිසුණු ක්‍රියාදාමයක් නොවන බව කියන අතර ම, එය ජාතික ස්වරූපයකින් ක්‍රියාවට නඟන ලෙස එහි නායකයන්ගෙන් ඉල්ලා සිටී.

සෝමවීර චන්ද්‍රසිරිගේ කර්තෘත්වයෙන් 'නිදහස' පළ කිරීම ආරම්භ වූයේ 1936 සැප්තැම්බර් 16 වැනි දා ය. එය 1938 ඔක්තෝබර් තෙක් පැවතිණි. 'අස් කොන්', 'දිගට හරහට' ආදි ශීර්ෂ යටතේ ඉතා රසවත් තීරු ලිපි 'නිදහස' පුවත්පතේ දක්නා ලැබේ. එම ලිපි සෝමවීර චන්ද්‍රසිරිගේ ම රචනා ය. 1940 ජනවාරියේ දී ඔහු සමසමාජ පක්ෂයට සම්බන්ධ ව සිටිය දී ම 'නිදහස' එහි නායකයන් විවේචනයට භාජන කෙළේ ය. ඒ අනුව ඔහු පක්ෂයෙන් නෙරපා හරින ලදි. 'නිදහස' 1942 දී යළිත් ආරම්භ කළ අතර ආණ්ඩුව විවේචනය කිරීම සම්බන්ධයෙන් ඔහු සිරභාරයට ගනු ලැබී ය. මෙම පුවත 'නිදහස සිර කළා' මැයෙන් 1942.03.18 වැනි දින 'නව ශක්තිය' පුවත්පතේ පළ විය.

## 18. කම්කරුවා (දෙවැනි වර)

සමසමාජවාදියකු වූ කොළොන්නාවේ මීතොටමුල්ලේ හේමසිරි සිල්වාගේ ප්‍රකාශකත්වයෙන් 'කම්කරුවා' අලුත් පුවත්පතක් වශයෙන් පළ කෙරිණි. 'ටැබ්ලොයිඩ්' ප්‍රමාණයේ පිටු හයකින් යුත් එය දෙසති පුවත්පතකි. සමසමාජ නායකයන් සිරබාරයට ගනු ලැබීමෙන් පසු අත්අඩංගුවට පත් නොවී සිටි පිරිසකගේ මෙහෙයවීමෙන් මෙය නිකුත් කරන ලදි. ප්‍රථම කලාපය 1940 සැප්තැම්බර් තුන් වැනි දා පළ විය. එහි අරමුණ

LIBRARY
SRI PALEE CAMPUS



ට්‍රොට්ස්කිවාදී මතයට ප්‍රචාරය ලබා දීම ය. මේ කාලසීමාවේ සමසමාජ පක්ෂයේ හඬ ගෙන ගියේ මේ පුවත්පත මඟිනි. 1942 මාර්තු 20 වැනි දා එහි පළ කරන ලද ලිපියක් අනුව ප්‍රකාශක හේමසිරි සිල්වා අත්අඩංගුවට ගනු ලැබුවේ ය. 1942 අප්‍රේල් 4 වැනි දා පළ කළ 39 වැනි කලාපයෙන් පසු පුවත්පත ඇනහිටියේ ය. හේමසිරි සිල්වාට විරුද්ධ ව නඩු පවරනු ලැබුවේ ය. 1942 ජූලි 8 වැනි දා උසාවියේ දී වරදකරු ලෙස තීන්දු කරන ලද ඔහුට ස වසරක්, බරපතළ වැඩ සහිත සිර දඬුවම නියම විය. ඒ අනුව යුද සමයේ පුවත්පත් නිදහස වෙනුවෙන් බන්ධනාගාර ගත වී සිටි අය අතරට තවත් පුවත්පත් ප්‍රකාශකයෙක් එක් වුණේ ය.

## 19. ගිනි පුපුර

'ලංකා එක්සත් සෝෂලිස්ට් පක්ෂය' සමඟ මතභේද ඇති කැර ගෙන ඉන් ඉවත් ව ගොස් 'ලංකා කම්කරු සහ ගොවි සමාජය' නමින් සංවිධානයක් පිහිටුවා ගත් කණ්ඩායමක් වෙනුවෙන් 'ගිනි පුපුර' නිකුත් කැරිණි. මේ සංවිධානයේ මූලිකයෝ පසු කාලයේ 'ලංකා රැඩිකල් ඩිමොක්‍රැටික් පක්ෂය' ලෙසින් පෙනී සිටියෝ ය. මෙම ව්‍යාපාරයේ නායකත්වය දැරුවේ ඒ. ගුණසේකර ය. 'ගිනි පුපුර' රුසියානු විප්ලව සමයේ රුසියාවේ පළ කළ 'ඉස්ක්‍රා' නමැති පුවත්පතේ නම සිංහලයෙන් ඉදිරිපත් කිරීමකි. මෙම පුවත්පතේ කර්තෘවරයා වූයේ සිරිසේන කුලතිලක ය. කළමනාකාර කර්තෘ වූයේ ඒ. ගුණසේකර ය. මොහු ආරම්භක යුගයේ සිට ම සමසමාජ ව්‍යාපාරය වෙනුවෙන් සන්නිවේදන කාර්යයෙහි යෙදුණු අයෙකි. පසු ව පක්ෂ නායකත්වය විවේචනයට භාජන කෙළේ ය. ඒ අනුව ඔහු පක්ෂයෙන් නෙරපිණි.

## 20. එක්සත් පෙරමුණු සමසමාජය

ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පිටු හතරකින් යුත් සති පතා පුවත්පතකි. නිකුත් වූයේ බදාදාවල ය. මිල ශත තුනකි. පළමු වැනි කාණ්ඩයේ ප්‍රථම කලාපය 1953 ඔක්තෝබර් 28 වැනි දා ප්‍රකාශයට පත් විය.

මෙම පුවත්පත මඟින් සන්නිවේදනය කරන ලද්දේ 1953 ඔක්තෝබර් මාසයේ මුල දී ලංකා සමසමාජ පක්ෂයෙන්

ඉවත් වුණු පිරිසකගේ මතවාදය යි. 1952 සමසමාජ ආණ්ඩුවක් පිහිටුවීමේ සටන් පාඨය ඉදිරිපත් කිරීමෙන් අත් වුණු පරාජය නිසා පක්ෂයේ එක් පිරිසක් සියලු වාමාංශික පක්ෂ එකමුතු ව බණ්ඩාරනායක මහතා ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද සමඟ පොදු සටන් පෙරමුණක් ගොඩනැඟිය යුතු ය යන මතයක් ඉදිරිපත් කළහ. 1953 හර්තාලයෙන් පසු ව එම මතය උත්සන්න වී, ලංකා සමසමාජ පක්ෂය තුළ සාකච්ඡාවට භාජනය විය. යෝජනාව ඉදිරිපත් කළ කණ්ඩායම පරාජයට පත් වුණු අතර, ඔවුහු 'ස්ටාලින්වාදී ඔත්තුකාරයන් ය' යන චෝදනාවට ලක් වූ හ. අනතුරු ව පක්ෂයෙන් ඉවත් වුණු එම පිරිස ස්වාධීන කණ්ඩායමක් ලෙස පෙනී සිටිමින් ආරම්භ කළ පුවත්පත 'එක්සත් පෙරමුණු සමසමාජය' නමින් හැඳින්විණි. මෙම පුවත්පත ගල්කිස්සේ රෝලී ප්‍රනාන්දුගේ නමින් ප්‍රකාශයට පත් කරන ලදි. එහි ක්‍රියාකාරී කර්තෘ වූයේ ආරම්භයේ සිට ම 'සමසමාජය' පුවත්පතේ සම කර්තෘවරයකු වූ හෙන්රි පීරිස් ය.

'එක්සත් පෙරමුණු සමසමාජය' 1954 සැප්තැම්බර් 22 වැනි දා හතළිස් වැනි කලාපය නිකුත් වීමෙන් පසු ව ඇනහිටියේ ය.

## 21. ජනසතිය

ශ්‍රී ලංකාවේ දේශපාලන පුවත්පත් කලාව තුළ, ප්‍රකාශයට පත් වූ තවත් සති අන්ත පුවත්පතක් වූයේ 'ජනසතිය' පුවත්පත යි. මෙම පුවත්පතේ මංගල කලාපය 1963 දී ප්‍රකාශයට පත් වී ඇත. එයින් වසර 10 ක් ගෙවී ගිය තැන, එනම් 1976 දී මෙහි මුද්‍රණ කටයුතු නවතා දැමීය. මිල ශත 25ක් වූ මේ පුවත්පත 'ඩිමයි' කොළයේ 'බ්‍රෝඩ්සීට්' ප්‍රමාණයෙන් කොලම් අටකින් දිනපතා පළ වී තිබේ. එහි ප්‍රකාශන කටයුතු කරනු ලැබ ඇත්තේ කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 157 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත සතිය ප්‍රකාශන සමාගම විසිනි. එසේ ම ජයන්ත වීරසේකර මාවතේ අංක 157 දරන ස්ථානයේ පිහිටි ජාතික මුද්‍රණ ශිල්පීන්ගේ මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කැර ඇති බව සඳහන් ය. මේ කාලයේ වාම දේශපාලනය තුළ ඉතා ජනප්‍රිය පුවත්පතක් වූ 'ජනදින' සති අන්ත (ඉරිද) පුවත්පතක් වූ අතර, දින



පතා පුවත්පතක් වශයෙන් ප්‍රකාශයට පත් වී ඇත්තේ 'ජනසතිය' පුවත්පත යි.

මෙම 'ජනසතිය' පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයා ලෙස කටයුතු කැර ඇත්තේ ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදියකු වූ පියල් වික්‍රමසිංහ මහතා ය. සම කර්තෘවරයකු වූයේ ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදියකු වූ එස්. පතිරවිතාන මහතා ය. (මොහු ත්‍රිභාෂා ප්‍රවීණයකු වන අතර, 'දැනුම' සඟරාව ආරම්භ කෙළේ ය. පසුව 'ඩේලිනිවුස්' පුවත්පතේ කර්තෘ ධුරය ද දරා ඇත. ලේක්හවුස් ආයතනයට නොදන්වා නැඟෙනහිර ජර්මනියේ සංචාරයකට යෑම නිසා, ආයතනයෙන් ඉවත් කැර ඇත. පසු කලක 'අයිලන්ඩ්' පුවත්පතට සම්බන්ධ ව ද කටයුතු කැර තිබේ). තව ද 'ජනසතිය' පුවත්පතේ විශේෂාංග කර්තෘවරයා වශයෙන් කටයුතු කැර ඇත්තේ තිස්ස ගුණතිලක නම් වූ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියා ය. (තිස්ස ගුණතිලක, බී.ඒ. සිරිවර්ධන නම් වූ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් ලේක්හවුස් ආයතනයේ සේවය කැර, ඉන් එක වර ඉවත් වී ඇත. තිස්ස ගුණතිලක මහතා 'ජනතා' පුවත්පතේ කර්තෘ වශයෙන් ද කටයුතු කැර ඇත. ලේක්හවුස් ආයතනයෙන් ඉවත් වූ බී.ඒ.සිරිවර්ධන මහතා 'ඇත්ත' පුවත්පතට සම්බන්ධ වූ අතර, තිස්ස ගුණතිලක මහතා 'ජනසතිය' පුවත්පතට සම්බන්ධ වී තිබේ).

'ජනදින' හා 'ජනසතිය' යන පුවත්පත් සඳහා මුදල් යොදවා ඇත්තේ 'ලංකා සමසමාජ' පක්ෂයයි. ලංකා සමසමාජ පක්ෂ මෙම පුවත්පතේ පසුබිමේ සිටිය ද, එයට අදාළ න්‍යායික කාරණ සාකච්ඡා වූ බවක් මෙහි දක්නට ලැබෙන්නේ නැත. පොදු සමාජයේ පවතින ප්‍රශ්න ඉතා සරල ලෙස පාඨකයාට ඉදිරිපත් කළ බව පෙනෙන්නට තිබිණි. විශේෂයෙන් 'ඇත්ත' පුවත්පතට සාපේක්ෂ ව බලන විට මෙම පුවත්පත් දෙකේ භාෂාව ප්‍රහාරාත්මක නොවී ය. එහෙත් මේ පුවපත්පත් දෙක යූ.ඇන්.පී. විරෝධී දේශපාලන මතවාද වෙනුවෙන් පෙනී සිටින නිසා, දේශපාලන පුවත්පත් ලෙස පාඨකයා අතර ජනප්‍රිය වී තිබිණ. මේ පුවත්පත් දෙකේ සිරස්තල ඇල්මැරුණු ස්වාභාවයක් පෙන්නුම් කළ බව කිව යුතු ව තිබේ. නිදසුනක් ලෙස, 1966 ජුනි 2

වැනි ද (බෘහස්පතින්ද) 'ජනසතිය' පුවත්පතේ ප්‍රධාන සිරස්තලය වූයේ, රූප සුන්දරී, දිය කිදුරි, ලස්සන මූණ ආදී නානා මාදිලියේ නම්වලින් 'රූ රැජිනියන්' තේරීමේ තරගාදිය නිසා බාල පරිපූර නොමඟ යැම ගැන ය. මේ තත්ත්වය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීමේ වැදගත්කම පිළිබඳව, එවකට සිටි අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමැති අයි.ඇම්.ආර්.ඒ. ඊරියගොල්ල මහතා කළ ප්‍රකාශය මෙම පුවත්පතේ සිරස්තලය වී තිබිණි. ඒ සිරස්තලය මෙසේය.

"රූ රැජින තරඟ බැහැ"
අධ්‍යාපන ඇමැති නීතිරීති සකස් කරයි

මේ සිරස්තලය මඟින් සාම්ප්‍රදායික බවක් ප්‍රකාශ වන අතර, දේශපාලන පුවත්පතකට මෙවැනි සිරස්තල යෙදීමෙන් පාඨක අවධානය හීන වී යන අවස්ථා තිබේ. එහෙත් මෙම පුවත්පතේ කාටූන් හා ඇතැම් සිරස්තල දේශපාලන ස්වරූපයක් ගෙන තිබීම අගය කළ යුතු ව තිබේ. එවකට පැවැති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දුගී ජනයාගේ සහනාධාර කපා හැරීමට ගත් තීරණයට එරෙහි ව, ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා විසින් ලියන ලද දේශපාලන ලිපිය, යූ.ඇන්.පී. විරෝධීන්ට අස්වැසිල්ලකි. එහෙත් මේ පුවත්පතේ තිබූ විශේෂත්වය වන්නේ කලාව, සංස්කෘතිය හා සිනමාව ගැනත් දින පතා සති පතා වැඩියෙන් ලිපි පළ වීම යි. ඇතැම් කෙටි කතා ලියා ඇත්තේ ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදියකු වූ නිමල් හොරණ මහතා ය. මෙයට අමතර ව කොටගම වාචිස්සර හිමි, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, අනුලා විජේසිරි, ඔරුවල බන්දු වැනි අයගේ ලිපි ද 'ජනසතිය' පුවත්පතේ විටින් විට පළ වී ඇත. එම ලිපි දේශපාලන මුහුණුවරක් ගෙන නොතිබීම විශේෂත්වයකි. එසේ ම පාඨකයා තුළ කාව්‍යමය රසය ඇති කිරීමේ අරමුණින් දින පතා ම කවි පළ වීම 'ජනසතිය' තුළින් දකින්නට ලැබිණි. මේ බොහෝ කවි දේශපාලන දෘෂ්ටිවාදයකින් ලියවී නොතිබීම කැපී පෙනෙන ලක්ෂණයකි.

'පැල්ගිය හිමියාට' යන හිසින් යුතු ව කපුරුබණ්ඩාර ජයතිලක නැමැති අයකු ලියා ඇති කවිය මෙහි සඳහන් කිරීම වැදගත් ය.



මිනිසුන් සිටින මුත් මේ ගෙය ළඟ     පාත
ඔබ ගැන හිතෙන විට හද ඇති වෙයි     බීත
ගත කිලි පොලයි වැද උදුවප් මහ     සීත
සුළඟේ ඇදී යයි මගෙ දුක් මුසු     ගීත

අලිරැල ඇවිත් දඬුවැට පොඩි කරනව     ද
මැටිඳ තැලූ පාඩෙන් ඇඟ රිදෙනව     ද
හිරිකඩ සුළඟ වැද ගත කිලි පොලනව     ද
හිමියනි කාංසිය තනිකම දූනෙනව     ද

අණ ගුණ නොසලකන තනියා ඇවිත්     රැයේ
ඔබ හා ගැටෙයි දෝ සිතමින් ගැහෙමි     බියේ
උණුසුම් දෙන්න ගත හිරිගඩු පිපෙන     පැයේ
තනියට මමත් එන්න ද ඔබ සමඟ     පියේ

ඔබේ ගත වෙලන ගනඳුර සහ දූඩි     සීත
ගත්වනවා ද නොදනිමි හද තුළ     බීත
මා සිටිනවා නම් ඔබ පැල ළඟ     පාත
උණුසුම් කරන්නෙමි දෙතොලග සහ     දෑත

කෙසේ නමුත් කොමියුනිට් පක්ෂයේ ඇතැම් නායකයන්ගේ අදහස වී ඇත්තේ 'ජනසතිය' සහ 'ජනදින' පුවත්පත් ලංකා සමසමාජ පක්ෂයේ සහාය ඇති ව ප්‍රකාශයට පත් කෙළේ 'ඇත්ත' පුවත්පතට විකල්පයක් ලෙස ඉදිරියට ගෙනයෑමේ අරමුණින් බව යි. එහෙත් වසර දහයක් ඉක්මී ගිය තැන මෙමෙ පුවත්පත් දෙක නැවතී ගිය අතර 'ඇත්ත' දේශපාලන පුවත්පතක් වශයෙන් ජනප්‍රිය විය.

ඊට ප්‍රධාන හේතුව වූයේ 'ඇත්ත' ස්වාධීන පුවත්පතක් ලෙස පාඨකයා ඉදිරියේ පෙනී නොසිටීම යි. ''ඇත්ත'' ස්වාධීන නොවන කොමියුනිස්ට් පක්ෂයට පක්ෂ පුවත්පතක් බව ඇතැමුන් ප්‍රකාශ කළ විට, ''ඇත්ත'' ප්‍රකාශ කෙළේ තමන් පක්ෂපාත වන්නේ ජනතාවට පමණක්'' බව යි. ඒ අනුව ''ඇත්ත'' - ''අදීනයි'' - ''අවංකයි'' - ''අභීතයි'' යන තම පාඨය වාම පුවත්පත් කලාව තුළ මැනවින් තහවුරු කිරීමට සමත් වූ බව මෙහි දී කිව යුතු ය.

## 22. ඇත්ත

ශ්‍රී ලංකාවේ දේශපාලන පුවත්පත්, සඟරා ඉතිහාසය පිළිබඳව කරන අධ්‍යයනවල දී 'ඇත්ත' පුවත්පතට හිමි වන්නේ සුවිශේෂ තැනකි. ඒ, ගවේෂණාත්මක ප්‍රවෘත්ති කලාවේ ප්‍රථමයා, මෙන් ම ප්‍රමුඛයා වශයෙන් කටයුතු කරමින් 'ඇත්ත' පුවත්පත කළ කාර්යභාරය නිසා ය.

1964 දෙසැම්බර් 14 වැනි දින 'ඇත්ත' පුවත්පතේ, මංගල කලාපය නිකුත් විය. 'ඩිමයි' කොළයේ 'බ්‍රෝඩ්සීට්' ප්‍රමාණයෙන් කොලම් අටකින් යුතු ව 'ඇත්ත' දින පතා පළ වූ අතර එහි ප්‍රකාශක වූයේ මාවිල ලියනආරච්චිගේ අරනෝලිස් අප්පුහාමි මහතා ය. ඔහුගේ අභාවයෙන් පසු 'ඇත්ත' ප්‍රකාශක වූයේ වැලිවිට ආරච්චිගේ ධර්මදාස මහතා ය. මොවුහු දෙදෙනා ම කොමියුනිස්ට් පක්ෂයේ පූර්ණකාලීනයෝ වූ හ.

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ මඟ පෙන්වීම යටතේ 'ඇත්ත' ප්‍රකාශයට පත් වූ අතර එය තැළී පෑගෙන පීඩිත පන්ති ජනතාව වෙනුවෙන් පෙනී සිටි බව කිව යුතු ය.

ඇත්ත පුවත්පත ආරම්භ වීමත් සමඟ එහි ප්‍රථම කතුවරයා ලෙස කටයුතු කෙළේ රිචඩ් විජයසිරි මහතා ය. කොළඹ නීති විද්‍යාලයේ ශිෂ්‍යයකු වශයෙන් සිටි අතරතුර කාලයේ රිචඩ් විජයසිරි මහතා දේශපාලනයට සම්බන්ධ විය.

'දිනමිණ', 'ලංකාදීප', 'දවස' ආදි පුවත්පත්වලට සම්බන්ධ වී කටයුතු කළ විජයසිරි මහතා දක්ෂ පරිවර්තකයකු ලෙස ජනප්‍රිය වී සිටියේය. පසු කලෙක ඔහු 'මනහර' සඟරාවේ ප්‍රධාන සංස්කාරක ධුරය ද හොබවා ඇත.

'ඇත්ත' - 'අදීන යි, අවංක යි, අභීත යි' යන පාඨය, එයට හඳුන්වා දීමට මුල් වූ කීප දෙනා අතර, රිචඩ් විජයසිරි මහතා ද විය. එසේ ම 'ප්‍රව්ඩා' යන රුසියානු වචනයේ සිංහල අර්ථය ලෙස සැලකෙන 'ඇත්ත' යන නම පුවත්පතට භාවිත කළ යුතු යැයි කියා සිටි කොමියුනිස්ට්වාදීන් අතර රිචඩ් විජයසිරි මහතා ප්‍රමුඛයෙක් විය.



රිචඩ් විජයසිරි මහතා 'ඇත්ත' කර්තෘ ධුරයෙන් ඉවත් වීමෙන් පසු, එච්.පී.එස්. රත්නවීර මහතා 'ඇත්ත' කර්තෘ ධුරයේ කෙටි කලක් වැඩ බැලී ය. එච්.පී.එස්. රත්නවීර මහතා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩල සාමාජිකයකු වූ අතර 'ඇත්ත' පුවත්පතේ උපදේශක කර්තෘ ධුරය දැරී ය.

'ඇත්ත' පුවත්පත ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ සෘජු දේශපාලන උපදේශකත්වය ලැබීම නිසා, අපේ රටේ පැවති සාම්ප්‍රදායික පුවත්පත් කලාව විකල්ප මාවතකට ඉතා වේගයෙන් පරිවර්තනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් ශක්තියක් වූයේ ලේක්හවුස් ආයතනයේ සේවය කළ බී.ඒ. සිරිවර්ධන මහතා 'ඇත්ත' පුවත්පතට පූර්ණකාලීන ව සම්බන්ධ වීම ය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියකු වූ සිරිවර්ධන මහතා සිංහල සහ ඉංගිරිසි භාෂා පිළිබඳ ව ලබා තිබූ පරිචය 'ඇත්ත' පොදු ජනතාව අතර ජනප්‍රිය වීමට ප්‍රධාන එක් හේතුවක් වූ බව කිව යුතු ය. අනෙක් ප්‍රධාන හේතුව වූයේ තමා ලියන දෙය ගැන බී.ඒ. සිරිවර්ධන මහතාට තිබූ අචල විශ්වාසය යි. ඒ විශ්වාසය ඔහුට ඇති වූයේ මාක්ස්-ලෙනින්වාදී චින්තනය පිළිබඳ තිබූ විශ්වාසය නිසායි. විශේෂයෙන් ලේඛන කටයුතුවල දී එය ඔහුගේ පුළුල් ස්ථාවරය විය. එහෙත් දේශපාලන පත්තර කලාව ගැන කතා කරන විට සිරිවර්ධන මහතා මාක්ස්වාදී ලේඛකයකු නොවන බව ඇතැම්හු පෙන්වා දෙති. එ නමුත් එච්.ජී.එස්. රත්නවීර මහතාගේ උපහාසාත්මක සහ තීක්ෂණ දේශපාලන සිතිවිලිත්, ජන විඥානය නිවැරැදි ලෙස හඳුනාගැනීමට සිරිවර්ධන මහතාට තිබූ හැකියාවත් 'ඇත්ත' පුවත්පත ජනතාව අතර ජනප්‍රිය වීමට හේතු විය.

'ඇත්ත' පුවත්පත ආරම්භ වූ මොහොතේ සිට රැඩිකල් මතවාදයක් අනුගමනය කළ අතර, සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික සිද්ධීන් පිළිබඳ ව විවෘත ව අදහස් පළ කෙළේය. මේ සඳහා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන නායකත්වය සෘජු ව ලැබුණු අතර, සාම්ප්‍රදායික පුවත්පතක් මෙන් ස්වාධීන වීමට කිසි ම උත්සාහයක් නොගත් බව කිව යුතු කරුණකි. මේ පසුබිම සැලකිල්ලට ගත් ප්‍රතිගාමී කඳවුර

'ඇත්ත' ස්වාධීන නොවන කොමියුනිස්ට් පක්ෂයට පක්ෂපාතී පුවත්පතක් ලෙස හංවඩු ගැසූ අවස්ථා තිබිණි. ඊට පිළිතුරු දුන් 'ඇත්ත' ප්‍රකාශ කැර සිටියේ තමන්, ස්වාධීන නොවන බවත්, තමන් පක්ෂග්‍රාහී වන්නේ මේ රට ජනතාවට පමණක් බවත් ය.

මේ ඍජු දේශපාලන පදනම වඩාත් හොඳින් ශක්තිමත් වීමට තවත් හේතුවක් වූයේ ප්‍රගතිශීලී තරුණ පුවත්පත් කලාවේදීන් රැසක් සහ ශ්‍රී ලංකාවේ නමක් දිනාගත් ලේඛකයන් රැසක් 'ඇත්ත' පුවත්පත වටා රොක් වී සිටීම යි. මේ තරුණයන්ගෙන් සුළු පිරිසක් පුවත්පත් කලාවට ආධුනිකයන් වුවත්, තවත් පිරිසක් සමාජ අත්දැකීම් බහුල වූ කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකත්වය ලැබූවන් වීම විශේෂත්වයකි.

ජැක්සන් සේනාරත්න, නිව්ටන් සෙනෙවිරත්න, සිරිලාල් කොඩිකාර, දයා ලංකාපුර, සුනිල් සී. සිල්වා, බෙනට් රූපසිංහ, කුලසිරි රාජපක්ෂ, සුරත් අම්බලන්ගොඩ හෙවත් එස්.එම්. ජයසීල, ස්ටැන්ලි සමරසිංහ, ජෙෆ්රි යුනුස්, මොටාගෙදර වනිගරත්න, ගුණසිරි සිල්වා, චූලවංශ සිරිලාල්, රූපසිරි විද්‍යාරත්න, ආරියරත්න ගනේගොඩ, යූ. එම්. අබේරත්න, ලොකුබණ්ඩාර වනිගසේකර ඇතුළු විශාල පිරිසක් 'ඇත්ත' පෝෂණය කිරීමට දායක වූ හ. ඉන් පසු අවස්ථා කීපයක දී ම මූල්‍යමය හේතු පදනම් කැරගෙන 'ඇත්ත' පුවත්පතේ මුද්‍රණ කටයුතු නවතා දැමුණු අවස්ථා තිබිණි.

එය එසේ වුවත්, 'ඇත්ත' පුවත්පත ජනතාව අතර ජනප්‍රිය වූයේ, එය දේශපාලන පුවත්පතක් වීම නිසා ය. සමාජවාදී අදහස් දරන්නන් අතර ඇත්ත කතුවැකිය, සිරස්තල හා යුනුස්ගේ කාටූන් චිත්‍ර මෙතරම් ජනප්‍රිය වීමට හේතුව කුමක් ද යන ප්‍රශ්නය තරමක් ගැඹුරින් විමසා බැලිය යුතු ප්‍රශ්නයකි. එය පුවත්පත් කලාව හා බැඳුණු හුදු සාහිත්‍ය ප්‍රශ්නයක් පමණක් යැයි බොහෝ දෙනෙකුට සිතෙන්නට ඇති ඉඩකඩ වැඩි ය. විශේෂයෙන් මේ ජනප්‍රියත්වයට හේතුව එහි තිබූ භාෂා ශෛලිය, නිවැරදි වහර, සාහිත්‍ය ගුණාංග ආදිය යැයි ඔවුන් දක්වන කරුණු ඉවතලිය හැකි නොවේ. ආධුනිකයනට සිංහල ක්‍රියාකාරක පද සම්බන්ධය රැකගෙන නිරවුල් ලෙස අදහස් පැවසීම ඉගෙන ගැනීමට එදා හොඳ ම ලෙහෙසි ම මඟ වූයේ 'ඇත්ත' පුවත්පතේ කතුවැකි



හා සිරස්තල අධ්‍යයනය කිරීම යි. එහි ජනප්‍රිය භාවයට හේතුව මතුපිටින් දැකිය හැකි මේ කරුණු යැයි යමකුට සිතිය හැකිය.

විශේෂයෙන් 'ඇත්ත' ජනප්‍රියත්වයට මීට වඩා ගැඹුරු පදනමක් තිබේ ය යන්න කිව යුතු ය. එය දැක ගත හැක්කේ ඒ කතුවැකිය පිටුපස ඇති චින්තනය විභාග කැර බැලීමෙන් පමණකි. ඒ චින්තනය පාඨක බුද්ධියට, හදවතට ඉතා ආසන්න ව පවතින්නක් පමණක් නොව මෙරට මාක්ස්වාදී සමාජවාදී ව්‍යාපාරයට ඉතා වැදගත් වන මඟ පෙන්වන්නකු බව ද කිව යුතු ය.

මේ අනුව බලන විට 'ඇත්ත' කතුවැකිය පිටුපසින් ඇති දේශපාලන චින්තනය මූලික ලක්ෂණ දෙකකින් සමන්විත බව පෙන්වාදීම වැදගත් ය.

1. න්‍යායවාදී වහල් බවෙන් තොර වීම.
2. ප්‍රත්‍යක්ෂ මූලික විශ්ලේෂණ මඟක් ගැනීම.

ඒ අනුව බලන විට 'ඇත්ත' කතුවැකිය සකසා ඇත්තේ මේ දෙපා මත වීම විශේෂත්වයකි. නිදසුනක් වශයෙන් සාහිත්‍යකරණය වෙනුවෙන් පිරිනැමෙන ජනාධිපති සම්මානය 1977 සිසිර කුමාර මානික්කආරච්චිට හිමි වූ අවස්ථාව දැක්විය හැකි ය. ඔහු ලේක්හවුස් ආයතනයේ සේවය කළ පුවත්පත් කලාවේදියකු වූ අතර, ග්‍රන්ථකරණයෙහි ද නියැළුණු ලේඛකයෙකි. විශේෂයෙන් ඔහු විසින් ලියන ලද 'සාහිත්‍ය කොල්ලය', 'සාගරයක් මැද අමන රටක් ඇත' වැනි කෘති ශාස්ත්‍රීය මට්ටමින් බැහැර වූ අතිශය ප්‍රතිගාමී ඒවා විය. සාහිත්‍යය හා සමාජය නිර්දය ලෙස මොහුගේ විවේචනයට ලක් ව ඇති අතර ඔහුගේ බොහෝ කෘතිවලින් මාක්ස්වාදය හා මෙරට වාමාංශික ව්‍යාපාරය හෙළා දැක තිබේ. ඒ බැවින් මානික්කආරච්චි ජනාධිපති සම්මානයෙන් පුදන්නට තරම් සුදුසු සාහිත්‍යධරයකු නොවන බව ඇත්ත කතුවරයා සිය කතුවැකියෙන් මෙසේ පෙන්වා දී ඇතඃ

## කුංජි මුදලාලි සහ ජනාධිපති සම්මානය

වප් මඟුල පිණිස, සුබ නැකතින් වෙලට බසින සේ අරියමින් ජනාධිපති උතුමාණන් වහන්සේ අතට රිදී නඟුල

දෙන්නේ මස් කඩකාර කුංජි මුදලාලි ය. ඒ නඟුල ගත් අතින් ම සතියක් ඇතුළත ජනාධිපති සම්මානය පිරිනැමෙන්නේ මානික්ක ආරච්චිටය. දෙක අතරේ පුදුම සමානකමක් ඇති සේ පෙනේ. මේවා දකින මේ රටේ මී ගොනුන් හට වුව ද ලජ්ජා හිතෙනු පුදුම ද? ''අහෝ කාලය! අහෝ ගුණධර්ම'' යැයි කීවාක් මෙන් යූඇන්පී කලියුග කාලේ සමාජ සාර ධර්මවලට මිනිස් වටිනාකම්වලට ඇගයීම්වලට ගිය කල අහෝ!.

වප් මඟුල වෙනුවෙන් උතුමාණන් වහන්සේ අතට රිදී නඟුල පිළිගන්වන්නට මස් කඩ කාරයකුට වඩා සුදුසු පුද්ගලයෙක් එහි නොසිටියේ ද? මී හරකා ගොවිතැනේ අවශ්‍ය අංගයෙකුත් වප් මඟුලේ මංගල සංකේතයෙකුත් වෙයි. මස් කඩකාරයා හරකා ගේත් මී හරකා ගේත් මාරයා ය. වප් මඟුල වැනි මංගල උලෙළකට මස් කඩ කාරයකු යොදා ගැනීම මූසලකමෙකි. වප් මඟුලේ දී මී හරකුන් කුලප්පු වූයේත් මස් කඩ කාරයාගේ ඉව ඔවුනට දැනුණු නිසා විය නොහැකි ද? සතුනට හොඳට ඉව තිබේ. මී හරකකුට වුව ද කුංජි මුදලාලි සයිස් එකෙන් ම හඳුනා ගන්නට බැරි කමක් නැත. කෙසේ හෝ වේවා මස් කඩ කාරයකු ජනාධිපති තුමාට පමණක් දෙවැනි තැනෙක ලා (සමහර විට උතුමාණන් වහන්සේට ද ඉහළ තැනක් ලෙසින් වුවත් සලකන්නට පුළුවන) සම්බන්ධ කොට ගැනීම වෙන මොනවා නැතත් පහත් රුචිය පළ කරන්නෙකුත් වප් මඟුලේ මංගල ස්වභාවය කෙලෙසන්නෙකුත් වෙයි.

මස් කඩ කාරයා වස් මඟුලට ගෙන ආවේ උතුමාණන් වහන්සේ නොවන බව අපට විශ්වාසයි. ඔහු කැන්ද ගෙන එන්නට ඇත්තේ ප්‍රදේශයේ යූඇන්පී කෙරුමකු හෝ කැචර් කෙනෙකු හෝ විසින් බවට සැක නැත. එබැවින් රිදී නඟුල තමන් අතට දුන්නේ මස් කඩ කාරයකු බව උතුමාණන් වහන්සේ නොදැන සිටින්නට ඇත. එයින් ම ඔහුට වගකීමෙන් නිදහස් විය හැකි ද? තමා අතට රිදී නඟුල පිළිගැන්වූ පුද්ගලයා කවරෙක් දැයි ජනාධිපති උතුමාණන් වහන්සේ නොදැන සිටියා නම් ඔහු ගැන අසා විමසා බලන්නේ නැතිව නොහඳුනන පුද්ගලයකු සමඟ සමතැන් ගෙන එවැනි මංගල කාරියකට සහභාගි වීම උතුමාණන්



වහන්සේගේ පදවියේ ගරුත්වයට වටනේ ද? සමහර විට ඔහු කසිප්පු මුදලාලියකු, ගංජා කාරයකු වූවා නම්? පළාතේ යූඇන්පී නායකයන් ඉස්සරහට දමන ඕනෑම සැක කටයුතු පුද්ගලයකු ගැන ප්‍රශ්න කිරීමක් නැතිව උතුමාණන් වහන්සේ ඔවුන් හට අනුග්‍රහය දක්වනවා නම් එතැන මොකක් හෝ බරපතළ වරදෙක් තිබේ.

මානික්ක ආරච්චිට ජනාධිපති සම්මානය දීම, කුංජි මුදලාලි අතින් රිදී නඟුල ගැනීමට දෙවැනි නැත. ජනාධිපති සම්මානය මේ රටේ ඇති උතුම් ම සම්මානයයි. එය යූඇන්පී සම්මානයක් නොව ජාතික සම්මානයෙකි. යූඇන්පී සම්මානයෙක් නම් මානික්ක ආරච්චිට නොව කෝර්නේලිසාට ගියත් මොන බල්ලාට ගියත් අපට කමෙක් නැත. එහෙම යනවා නම් අපි වඩාත් කැමැතිය. මුදලත් නොවේ ප්‍රශ්නය. අද මහජන මුදල් ලක්ෂ ගණනින් ගසා කන සැටි බලන විට යූඇන්පී ඇම්බැට්ටයකුට මහජන මුදලින් ම රුපියල් 500ක් වැනි සුළු මුදලක් ගෙවූවත් (වැරැදි වුවත්) අපට එය ඉවැසිය හැකියි. එහෙත් ජනාධිපති සම්මානය පිදෙන්නේ ජාතිය වෙනුවෙනි. එය ජාතියේ උපහාරයයි. සම්මානය නිසා එය ලබන පුද්ගලයාට ගෞරවයක් වන්නා සේ ම, පුද්ගලයා සම්මානයට ද ගෞරවයක් විය යුතුය. නොතරම් පුද්ගලයකුට එවැනි සම්මානයක් දීම ජාතියට ම කරන බරපතළ අවමානයෙකි.

මෙයින් පෙර මේ සම්මානය ලැබූ දෙදෙනා ම මාර්ටින් වික්‍රමසිංහ මහතා සහ නිත්තවෙල ගුණයා මහතා ජාතියට ආඩම්බර විය හැකි වූත්, ජාතියේ ඉහළ ම සම්මානයෙන් පුදනු ලැබූවන් හැටියට ලජ්ජා නැති ව ලෝකයට ඉදිරිපත් කළ හැකි වූත් දෙදෙනෙකි. හැත්තෑ හයේ සම්මානය සඳහා මේ වතාවේ තෝරා ගෙන ඇති (ඔහු තෝරාගෙන ඇත්තේ මානික්ක ආරච්චි නිසා එන අපවාදය අමතක කැරැවීමට බවට සැක නැත) මුදලිඳු ඒ.සී.ජී.ඇස්. අමරසේකර මහතා ද රටට ආඩම්බර විය හැකි, ලජ්ජා නැති ව ලොවට ඉදිරිපත් කළ හැකි පුද්ගලයෙකි. එහෙත් හැත්තෑ හතේ සම්මානයට තෝරා ගනු ලැබූ මානික්ක ආරච්චි ඉහත කී පුද්ගලයන් සමඟ සසඳන විට විළි ලජ්ජාවෙක් නොවේ ද?

යූඇන්පී කාරයකුට ම දෙන්නට වුවමනා වී නම් ජනාධිපති සම්මානය තරම් ම උසස් ගෞරවයකට සුදුසු ලේඛකයකු පුවත්පත් කලාවේදියෙකු හැටියට හැමට ම එක සේ පිළිගත නොහැකි නමුදු ඩේවිඩ් කරුණාරත්න මහතා වැනි කෙනෙක් මානික්ක ආරච්චිට වැඩියෙන් දහස් වරක් සුදුස්සෙක් නොවෙත් ද?

ජනාධිපතිතුමාට සිංහල සාහිත්‍යය ගැන වැඩි අවබෝධයක් නැති වීම අපට තේරුම් ගත හැකියි. එබැවින් මෙතැන දී ද, ඔහුට කුංජ් මුදලාලි "විකුණුවා" මෙන් කවුරුන් හෝ විසින් මානික්ක ආරච්චි ද ශ්‍රේෂ්ඨ ලේඛකයකු හැටියට විකුණනු ලැබුවාට සැක නැත. ඒ වූ පලියට ඔහුට මෙතැන දී ද වගකීමෙන් මිදෙන්නට බැරි ය. ඇයි ඔහු අසා විමසා බලන්නේ නැති ව මෙවැනි ලණු කන්නේ? අඩු ගණනේ ලේක්හවුසියේ සිටින යූඇන්පීයට හිතවත් වුව ද වෘත්තීය ගෞරවයක් ඇති පත්‍ර කලාවේදින් අත්සන් කොට මානික්ක ආරච්චිට විරුද්ධ ව ජනාධිපතිතුමා වෙත එවන ලද පෙත්සම කියැවූවා නම් සම්මානය සඳහා තෝරාගනු ලැබූ පුද්ගලයාගේ කැරැට්ටුව ගැන ඔහුට යමක් දැනගන්නට තිබිණි.

දේශපාලන වශයෙන් පමණක් බලනවා නම් මානික්ක ආරච්චිට ජනාධිපති සම්මානය ලැබීම ගැන අපි ඉතා සතුටු වමු. මක් නිසා ද? ජනාධිපති සම්මානය සමඟ ජනාධිපති තුමා මානික්ක ආරච්චිගේ තත්ත්වයට වැටෙන බැවිනි. යූඇන්පීයේ සර්ව බලධාරී ජනාධිපතිතුමා, විසින් බාල්දු වීම දේශපාලන වශයෙන් කියලා වත් කරවා ගන්නට බැරි දැයෙකි. එහෙත් මෙතැන දී අප බලන්නේ දේශපාලන මත භේද අනුව නොව පොදුවේ රටක් ජාතියක් වශයෙනි. මානික්ක ආරච්චි වැනි කෙනෙකුට ජනාධිපති සම්මානය දීමෙන් ජාතියට ම අත්වන විලි ලජ්ජාව පාච්චලය අනුව බලන විට යූඇන්පී ජනාධිපතිතුමා දේශපාලන වශයෙන් බාල්දු වීම අපට එතරම් සතුටු විය හැක්කෙක් නොවේ. ජනාධිපතිතුමා නම් තව කල් යන විට කොහොමටත් දේශපාලන වශයෙන් බාල්දු වනු ඇත. එයින් ජාතියට සිදු වන අවනම්බුවෙක් නැත. එහෙත් ජාතිය වෙනුවෙන් මානික්ක ආරච්චිට ජනාධිපති සම්මානය පිදීමෙන් ජාතියට කරන ලද අවමානය සඳ නොමැකී පවතිනු ඇත. යූඇන්පියේ සර්ව බලධාරී ජනාධිපතිතුමා



පත් වී මාස කිහිපයක් යන්නට පෙර, අහෝ ශ්‍රී ලංකාව කුංජ් මුදලාලියනටත් මානික්ක ආරච්චියනටත් ගිය රටක් බවට පිරිහුණු හැටි!. (1977) (බලන්න - සිල්වා, ගුණසිරි (සංස්කරණය), සිරාලාල්-සුරත් ලියූ ඇත්ත කතුවැකි, 2007)

තව ද අපේ රටේ ඇතැම් දේශපාලනඥයන් විටින් විට කලාකරුවන් වීමටත්, නිර්මාණකරුවන් වීමටත් උත්සහ ගන්නා අවස්ථා බහුල ව දකින්නට තිබේ. එහෙත් ඒ සැම උත්සාහයක දී ම සිදු වූයේ මේ දේශපාලනඥයන් කලාකරුවන්ගේ හාස්‍යයට ලක් වීම යි. එවැනි අවස්ථාවක ඇත්ත පුවත්පතේ විශේෂාංග රචකයකු වූ සිරිලාල් කොඩිකාරට කවි රසය ඇවිස්සී ලියන ලද හරි අපූරු නිර්මාණයක් ඇත්ත පුවත්පතේ පළවූයේ 'කයියට කයිය' යන සිරස්තලය යටතේ ය. එය මෙසේ යː

කයියට කයිය

රණසිංහ ප්‍රේමදස කවියා ඇළහැර දී කවි කීවේ ය. ජූනියස් ජයවර්ධන කවියා හිඟුරක්ගොඩ දී කවි කීවේ ය. අපේ කවි රසය ඇවිස්සී ගියේ ය. ඒ නිසා අද අපි කවි කියමු.

මින්නේරියේ ඡන්ද ව්‍යාපාරයේ යෙදුණු ජූනියස් ජයවර්ධන කවියාගේ කවි සිත කොහොම කැලඹුණා දැයි අපි නොදනිමු. එතුමා හිඟුරක්ගොඩ ඡන්ද රැස්වීමේ වේදිකාවට ගොඩ වී වට පිට බැලී ය. ඩී.ඇස්. සේනානායක මහතා මින්නේරි ගොවි ජනපදයේ ගොවීන් පදිංචි කැර වූ කාලයේ එහි පැමිණි පුරෝගාමියකු රැස්වීමේ සිටිනවා දැයි විමසූ විට එක් ගොවියෙක් වේදිකාවට ආයේය. 'දිනමිණ' වාර්තා කළ ආකාරයට හෙතෙම 1938 දී පැමිණියෙකි. වයස 72 කි.

කවුඩුල්ලේ වෙහෙරගල ඩී.එච්. රත්නායක ඔහු ගේ නම ගම ය. ගොවියා කවියා වූයේ ය. හේ හිට්වන කවියක් කීවේ ය. ඒ කවිය මෙසේ ය.

මා වැනි ගොවින්ද
වර වර ළඟට කැන්ද
දුක් සැප කුමන්ද
අසන ජනපති වෙන කොයින්ද

එම කවිය අසා සිටි ජූනියස් ජයවර්ධන කවියා වෙහෙරගල රත්නායක කවියාට කවියකින් ම සංග්‍රහ කරමින් මෙ සේ කී ය.

කොපමණ ගුණ කළත්
දුදනෝ නොවෙති යහපත්
කිරි දියෙන් දෙවියත්
අඟුරු සුදු වන කලෙක් නම් නැත්

වෙහෙරගල රත්නායක කවියා සහ සේදවත්තේ ජූනියස් ජයවර්ධන කවියා එකකින් සමාන ය. ඒ වයසෙනි. එකකින් අසමාන ය. ඒ කවියෙනි. හේතුව මෙය යි.

කවි සේදවත්තේ
කවි තැනුමට නො දත්තේ
බිලිඳු කල දත්තේ
පොතේ කවියකි කියා ඇත්තේ

ඔහු කළ යුතු ව තිබුණේ මා වැනි ගොවින්ද යනුවෙන් රත්නායක කවියා කියූ කවියට කවිය ගලපා කීම ය.

ගුත්තිලයේ එන කවි දෙකක් පත්‍ර කලාවේදියකු තාලයට ගළපා ලීවේ මෙසේ ය.

මස්සිනේ මෙ සමේ
බැලුව මුළු ගමෙහි ම මේ
සොඳට අඩි ගැසුමේ
සම ව සිටිනෝ අපි දෙදෙන මේ

බිව්ව මුත් සොඳ සේ
සිටිය නාඹර වයසේ
මට මහලු වයසේ
බැරි ය අඩි පුඩි ගැහුම පෙර සේ

සේදවත්තේ ජූනියස් ජයවර්ධන කවියා එසේ ගළපා නො කීම නිසා රස නිෂ්පත්තියට බාධා ඇති විය. ගොවි කවියා ගේ කවිය පන්දමට ගළපා ඇතත් එය කාලයට ගළපා නැත. එය ගළපන්නට තුබුණේ මෙසේ ය.



මා වැනි ගොවින්ද
වර වර ළඟට කැන්ද
ඊයේ කිව් හින්ද
කීව මිස හිතෙකින් නොවෙන්ද

හිතට එකඟ ව මේ කවිය කියන්න තිබිණි.

මා වැනි ගොවින්ද
රුදවූ මෙහේ ඉන්ද
ඩී.ඇස්. තිරින්ද
කෑවෙ ජූනියස් රිචඩ් උන්ද

අප එතැන සිටියා නම් කියන කවිය මෙය යි.

කලින් කවි බන්ද
පාඩම් කළ ගොවින්ද
වර වර යි කැන්ද
රඟන ජනපති වෙන කොයින්ද

'අඟුරු සුදු වන කලෙක් නම් නැත්' යන සේදවත්තේ කවියාගේ පොතේ කවියට අපේ කවිය මෙසේ යි.

අඟුරු සුදු කරනට
කුමට ලනු කිරි බඳුනට
ලැකර් පිංසලය ට
අරන් ගෑ කල සිටී ජොලියට

රුස්විමේ සිටි ජනතා විමුක්ති පෙරමුණේ තරුණ කවියකුට අවස්ථාවක් නොලැබීම පාඩුවෙකි. ''කොපමණ ගුණ කළත් දුදනෝ නොවෙති යහපත්'' යයි සේදවත්තේ කී පදවලට පිළිතුරු වශයෙන් මෙ සේ කියන්නට තිබිණි.

මහ මහ එවුන්නේ
ගිවිසුම් කවුද දන්නේ
අපි පොඩි එවුන් නේ
අපේ පිල නැත පාව දෙන්නේ

කෙහෙල්වත්තේ රණසිංහ ප්‍රේමදාස කවියා ඇළහැර දී කියා ඇති කවිවලින් පද කීපයෙක් මෙසේ ය.

අපට    කුඹියනේ
ඡන්දෙන් රජෙක්    ලැබුණේ
අනේ    කුඹියනේ
නුඹලා නැද්ද    දන්නේ
රටක් පාවා දුන් එවුන්    නේ
දූ පුතුන් ඉපදිල යි    ඉන්නේ

කෙසෙල් වත්තේ කවියා නොකී කවි මේවා ය.

අපට කුඹිය    නේ
ඡන්දෙන් රජෙක්    ලැබුණේ
රට ම ඉන්    නැසුණේ
කුඹි වෙන්න යි අපට    තිබුණේ

තොපේ    රජ්ජුරුවෝ
පෝලිම පුරුදු    කෙරුවෝ
අපේ    රජ්ජුරුවෝ
ලලිත් අරගෙන මුලට    කෙරුවෝ

අනේ කුඹිය    නේ
ලජ්ජාවෙනි    කියන්නේ
පාවා දුන්    උන්නේ
පුතෙකි මහ රජ ළඟට    ගන්නේ

රජුන්    කුඹින්නේ
මෙහෙම ද වැඩ    කරන්නේ
උදව් කළ    උන්නේ
කුඹි රජු නම් ළඟට    ගන්නේ

අපෙන් කවියක්

රසය මෙන්    මීයේ
කරන බවකුයි    කීයේ
අනේ පොල්    බෑයේ
කයිය පමණෙකි ඉතිරි    වූයේ

(1984)

(බලන්න - සිල්වා, ගුණසිරි (සංස්කරණය) සිරා-ලාල්-සුරත් ලියූ - ඇත්ත කතුවැකි, 2007)



මෙයට අමතර ව ඇත්ත පුවත්පත සිය දේශපාලන මතය සමාජ ගත කිරීමේ දී ප්‍රවෘත්ති වාර්තාකරණයට මුල් තැනක් දී ඇත. එසේ ම ප්‍රවෘත්තියේ සජීව බව රඳා පවත්වා ගැනීමට හැකි සිරස්තල යෙදීම අතින් මේ රටේ බොහෝ පුවත්පත්වලට ආදර්ශයක් ගෙන දීම විශේෂත්වයකි. මේ සඳහා නිදසුන් කිපයක් ඉදිරිපත් කිරීම වැදගත් ය. 'ලක්සල' ආයතනය දේශීය නිෂ්පාදනකරුවන් නිපදවන කලාත්මක භාණ්ඩ මිලදී ගෙන, දේශීය හා විදේශීය සංචාරකයන්ට අලෙවි කරන රාජ්‍ය ආයතනයකි. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයකු ලක්සල සමඟ තරග කිරීම සඳහා 'ලක්පහන' නමින් ආයතනයක් ආරම්භ කෙළේය. මෙහි විශේෂත්වය වන්නේ ලක්සල සමඟ සම්බන්ධ වී සිටි දේශීය නිෂ්පාදනකරුවන්ට වැඩි මුදලක් ගෙවා ඔවුන් තමන් වෙත දිනා ගැනීමට ලක්පහන ආයතනය කටයුතු කිරීම නිසා ලක්සල ආයතනය වටා සිටි දේශීය නිෂ්පාදකයන් ඉවත් වූ අතර අලෙවිය ඉතා වේගයෙන් පහත වැටීම ය.

මේ සිද්ධිය 'ඇත්ත' වාර්තා කැර තිබූ අතර, ඊට අදාළ සිරස්තලය මෙසේ යොද තිබිණි.

**"ලක්සලේ තෙල් ටික**
**ලක්පහන දමා ගනී"**

තවත් එවැනි ම නිදසුනක් පෙන්වා දීම වැදගත් ය. වෙසක් උත්සවය මූලික කැරගෙන වෙන්නප්පුව ප්‍රදේශයේ, වෙසක් තොරණක් ප්‍රදර්ශනය කැර ඇති අතර, එහි කතා පුවත වී ඇත්තේ 'නාලාගිරි දමනය' යයි. මේ දිනවල මහ මැතිවරණයක් පැවැත්වෙමින් තිබිණි. තොරණ ප්‍රදර්ශනය කැර පැ කිපයකට පසු, එහි ප්‍රදර්ශන කටයුතු තහනම් කරන ලෙස පොලිසිය නියෝග කෙළේය. තොරණේ සංවිධායකවරුන් තහනමට හේතුව කුමක් දැයි විමසූ විට පොලිසිය පවසා ඇත්තේ, මැතිවරණයට තරඟ කරන ප්‍රධාන පක්ෂ දෙකට අයත් ඡන්ද ලාංඡන දෙකක් කතා පුවත ආශ්‍රයයෙන් ප්‍රදර්ශනය වන බවත්, එමඟින් මැතිවරණ නීති උල්ලංඝනය වන බවත් ය. රා බී ඉදිරියට පැමිණි 'ඇතා' මඟින් එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද ලාංඡනය ප්‍රදර්ශනය වන බවත්, බුදු රජාණන් වහන්සේ මෛත්‍රී සිතින් 'අත' ඉදිරියට දමා

ඇනා දමනය කිරීම මඟින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්ද ලකුණ වන අත ප්‍රදර්ශනය වන බවත් පොලිසිය තොරණේ සංවිධායකවරුන්ට පෙන්වා දී ඇත.

මේ සිද්ධිය 'ඇත්ත' වාර්තා කැර තිබූ අතර ඒ සඳහා යොදා තිබූ සිරස්තලය මෙසේ ය:

"නාලාගිරිං ගජවරන්
පොලිසියෙන් නැත වරම්"

මෙයට දශක කීපයකට පෙර බෙන්තර, ඇල්පිටිය, බලන්ගොඩ සහ බණ්ඩාරවෙල යන ආසන සඳහා අතුරු මැතිවරණ තුනක් පැවැත්වූ අතර, ඒ මැතිවරණවලින් අත්ත පරාජයකට පත්වීමට එක්සත් ජාතික පක්ෂයට සිදු විය. මේ පුවත පිළිබඳ ව වාර්තා කිරීම සඳහා ඇත්ත පුවත්පත යොදා තිබූ සිරස්තලය මෙසේ ය:

'ඩඩ්ලිට තුන ම නැහැ'. මේ අතුරු මැතිවරණය පවත්වන විට ඩඩ්ලි සේනානායක මහතා අගමැති මෙන් ම එක්සත් ජාතික පක්ෂයේ නායකයා ද විය. ඔහුගේ පක්ෂයට බලය තිබූ ප්‍රධාන මැතිවරණ ආසන තුනක්, අතුරු මැතිවරණයකින් පරාජය වීම උපහාසාත්මක ව පෙන්වා දීම සඳහා ඇත්ත පුවත්පත මෙවැනි සිරස්තලයක් යෙදීම විශේෂත්වයකි.

මේ නයින් බලන විට එදා ඇත්ත පුවත්පතේ සිරස්තල කලාව හා ඉන් ජනිත වන දේශපාලන මතවාදය, ශ්‍රී ලංකාවේ වාම පුවත්පත් සන්නිවේදනයේ දිශානතිය තීරණය කරන එක් සාධකයක් වූ බව කිව යුතු ය. මේ බව තවත් හොඳින් තහවුරු වන සිද්ධියක් වන්නේ, මෙයට දශක කීපයකට පෙර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා ව සිටි ඒමන් කාරියකරවන මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ සංස්ථාවේ ඉඩම්වල එළවුළු වැවීමේ ව්‍යාපෘතිය දෙස ඇත්ත උපහාසයෙන් බැලීම ය. ජපානයේ ව්‍යාපාරිකයන් පිරිසක් ලංකාවට ගෙන්වා ඔවුන් සමඟ සාකච්ඡා පවත්වා මේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සභාපතිවරයා අවශ්‍ය කරන අඩිතාලම දැමීය. එය ප්‍රසිද්ධ කිරීමට හා පැහැදිලි කිරීමට ගුවන් විදුලි සංස්ථා පරිශ්‍රයේ ප්‍රවෘත්ති සාකච්ඡාවක් ද පැවැත්විය. මේ ප්‍රවෘත්ති සාකච්ඡාව ඇත්ත පුවත්පතේ මාධ්‍යවේදී දයා ලංකාපුර වාර්තා කළ අතර, එය පසු දින ප්‍රධාන සිරස්තලය ලෙස පළ විය. මේ ප්‍රවෘත්තිය සඳහා ඇත්ත යොදා තිබූ සිරස්තලය දේශපාලන සන්නිවේදනයට උපහාසය එක් කළ අවස්ථාවක් විය.

"මෙන්න ප්‍රවෘත්ති
ගුවන් විදුලි සංස්ථාව
පතෝල රට පටවයි" යනුවෙනි.

ඇත්ත පුවත්පත උපහාසාත්මක ප්‍රවෘත්ති, ඊට අදාළ සිරස්තල මෙන් ම රැඩිකල් මතවාද සමාජ ගත කිරීමට සමත් වූ බව කිව යුතු කරුණකි. විශේෂයෙන් අධිරාජ්‍යවාදයට, ධනවාදයට පමණක් නොව කුලවාදයට, රදලවාදයට එරෙහි ව පෙනී සිටීමට අමතක නොකෙළේය. සමාජයේ සිදු වන සිද්ධියක් පාදක කොට ගනිමින් සිරිලාල් කොඩිකාර විසින් ලියන ලද 'රංචාගොඩ ළමයා' වැනි කාව්‍ය නිර්මාණ දේශපාලන දෘෂ්ටියකින් ඉදිරිපත් කිරීමට කටයුතු කෙළේය. මෙයට අමතර ව ඇත්ත පුවත්පතේ පළ වූ සාමාන්‍ය කවි, නිසඳැස් නිර්මාණ ද බොහෝ විට දේශපාලන දෘෂ්ටිවාදයකින් ඉදිරිපත් වීම තවත් විශේෂත්වයකි. "දේශයේ රතු මල් පිපේවා" යන හිසින් යුතු ව, ලංකා ජාතික ශිෂ්‍ය සංගමයේ ලේකම් වශයෙන් කටයුතු කළ චන්දන විජේකෝන් ඇත්ත පුවත්පතට ලියූ නිසඳැස් කාව්‍යයක් මේ පසුබිමට කෙටි නිදසුනකි.

දිනක් නිම වී.... දිනක්....
උද වෙත් ම....
අවිගත්තෝ දුවති....
ලේ තැවරුණු.... මළ කඳන් පාගමින්

ගිනි අවි අතට ගත්තෝ....
විමුක්තිය සොයති දේශයේ....
අධිරාජ්‍යවාදයට අත වනමින්....
ජාතිවාදී, කුලවාදී, ආගම්වාදී....
හැඟුම් බර ය.... උන්ගේ හදවත්....

දේශයේ රතුමල් පිපෙන්නට....
දේශයේ නිදහස ලබන්නට....
සටන් කරමු.... අපි....
භීෂණය පරදා....

සාමයේ සමගියේ රතු මල් පිපෙන්නට
සටන් කරමු.... අපි....
ජාති, කුල, ආගම් භේදය....
පරදා....

(ඇත්ත - 1989 ඔක්තෝබර් 14 වැනිදා)

මේ අනුව බලන විට පැහැදිලි වන කරුණක් වන්නේ 'ඇත්ත' දේශපාලන පුවත්පතක් වශයෙන් සිය මතය සමාජ ගත කිරීමේ දී, ධනපති පන්තිය සමඟ කිසිදු සම්මුතියකට නොගිය බව යි. ජනතාවට හා සමාජයට විනා කරන කණ්ඩායම් මෙන් ම පුද්ගලයන්ගේ තරාතිරම නොබලා විවේචනය කිරීමට ශක්තියක් 'ඇත්ත ට' තිබූ බව දේශපාලන පුවත් සන්නිවේදන අධ්‍යයනයේ දී පෙනී යයි.

### පාදක සටහන්

1. සරත්, ලයනල් (2000) 'ලංකාවේ වාමාංශික ජන සන්නිවේදනය' (මුල් යුගය), කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
2. එම.
3. එම.
4. එම.
5. එම.
6. ජයවර්ධන, කුමාරි (2009), 'ශ්‍රී ලංකාවේ කම්කරු පන්ති ව්‍යාපාරයේ කෙටි ඉතිහාසය 1893 - 1947', කොළඹ, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පෞද්ගලික) සමාගම.
7. සරත්, ලයනල් (2000), 'ලංකාවේ වාමාංශික ජන සන්නිවේදනය' (මුල් යුගය), කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
8. එම.

පස් වැනි පරිච්ඡේදය

# නවලෝකය සහ අන්තර්ජාතික දේශපාලන සන්නිවේදනය

ශ්‍රී ලංකාව, දකුණු ආසියාවේ ඉහළ ම සාක්ෂරතා මට්ටමක් ලබා ඇති රටකි. අප රට උපරිම සාක්ෂරතා මට්ටමට ම ළඟා වී අද්විතීය ජයග්‍රහණයක් ලබා තිබේ. කාන්තාවන් අතුරින් සියයට 83ක් සාක්ෂරතාව ලබා ඇති අතර පිරිමින් අතරින් සියයට 93ක් ම සාක්ෂරතාව ලබා තිබෙන බව වාර්තා පෙන්වා දෙයි. මෙයින් ගම්‍ය වන්නේ කියවීමට හුරු ජනතාවක් ශ්‍රී ලංකාව සතු බව යි. ඒ නයින් බලන විට උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ උත්සාහයෙන් හා කැපවීමෙන් 'නවලෝකය' නම් මාසික සඟරාව ප්‍රකාශයට පත් වූයේ ප්‍රගතිශීලි අදහස්වලට මුල් තැන දීම සඳහා ය. 'නවලෝකය' නමින් උඩකැන්දවල සිරි සරණංකර හිමියන් අදහස් කෙළේ 'නවලෝකයට' දෙර විවෘත කිරීම යන්න යි. එසේ ම 'නවලෝකය' යනුවෙන් තව දුරටත් උන්වහන්සේ අදහස් කෙළේ සමාජවාදී ලෝකය යි. වැදගත් අන්තර්ජාතික ප්‍රශ්න පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ ආසාවෙන්, දැනුම් පවසින් සිටි විශාල පාඨක සංඛ්‍යාවකට පිළිසරණ වෙමින්, ජනප්‍රිය සඟරාවක් බවට 'නවලෝකය' එදා පත්වීම ඓතිහාසික සිද්ධියකි. සරණංකර හිමියන් 'නවලෝකය' ආරම්භ කෙළේ තහනම් කැර තිබුණු 'එක්සත් සෝෂලිස්ට් පක්ෂය' වෙනුවට 'ලංකා කොමියුනිස්ට් පක්ෂය' පිහිටුවීමට සැලසුම් කැර තිබූ කාල වකවනුවේ ය. එනම් 1941 වසරේ දී ය. නීතිඥ ටී. දුරෙයිසිංහම් මහතාගේ (නීතිඥ ටී. දුරෙයිසිංහම්, ලංකා කොමියුනිස්ට් පක්ෂය ආරම්භ කිරීමට මුල් වූ පුරෝගාමියෙකි.) 'මෝහන් සහ භාට්' නම් ප්‍රකාශන ආයතනය පිටු දෙළහකින් 'නවලෝකය' මුලින් ම ප්‍රකාශයට පත් කෙළේය.

සරණංකර හිමියන් 'නවලෝකය' ආරම්භ කරමින් උත්සාහ කෙළේ 1917 සුප්‍රසිද්ධ ඔක්තෝබර් විප්ලවයේ බලපෑම හේතු කොට ගෙන එවකට පැවැති ලෝකය විවෘත වන අන්දම පාඨකයාට විචාරාත්මක ව විස්තර කැර දීමට ය. විශේෂයෙන්

'නවලෝකය' එදා මතු වුණේ දේශීය ප්‍රතිගාමීන්, ඔවුන්ගේ විදේශ නියෝජිතයන්ගේ පූර්ණ සහාය ඇති ව සෝවියට් දේශයත්, එය කේන්ද්‍ර කොටගෙන නැගී ආ සමාජවාදී ලෝකයත් පිළිබඳ ව වැරදි තොරතුරු ප්‍රචාරය කිරීමේ දැවැන්ත වූ ව්‍යාපාරයක යෙදී සිටි සන්දර්භයක් තුළ යි. මේ වන විට 'නවලෝකය' ප්‍රධාන වශයෙන් සන්නිවේදනය කෙළේ දෙවැනි ලෝක සංග්‍රාමයේ දී ජර්මන්, ජපන් පැසිස්ට් පිලට විරුද්ධ ව සෝවියට් දේශය ද සම්බන්ධ වී සිටි මිත්‍ර පක්ෂයට අදාළ වූ මතවාදය ය.

මුල් කාලයේ, මේ පැසිස්ට් විරෝධී මතවාදය සමාජ ගත කිරීම සඳහා ලිපි සැපයූ ලාංකික ලේඛකයන් අතර ඇස්. පියසේන, ඇල්. ආරියවංශ ප්‍රමුඛ විය. ඇස්. පියසේන 'ජන ශක්තිය' පුවත්පතේ කර්තෘ මාණ්ඩලිකයෙක් ද විය. ඇල්. ආරියවංශ එවක පැවති ලංකා ජාතික ශිෂ්‍ය සංගමයේ ලේකම් තනතුර දැරුවේ ය. පසු කාලයේ ලංකාව ද සම්බන්ධ වූ ලෝක ගුරු සංගම් සම්මේලනයේ සභාපති වූයේ ද ඔහු ය. අනගාරික ධර්මප්‍රිය ද ලිපි සම්පාදකයකු සහ පද්‍ය රචකයකු ලෙස මුල් කාලයේ 'නව ලෝකයට' සම්බන්ධ වී සිටියේ ය.

1951 දී 'නවලෝකය' සඟරාවේ දශ වර්ෂ පූර්ණ සංවත්සරය සමරමින් කතුවැකියක් ලියමින් සරණංකර හිමියන් කියා සිටින්නේ සෝවියට් විරෝධී ප්‍රචාර වළකාලීමට 'නවලෝකය' ආරම්භ කෙරුණු බවත් 1945 දී හිට්ලර් පරාජය කිරීමත් සමඟ 'නවලෝකය' උදා වූ බවත් ය. නිදහස හා සමානාත්මතාව මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී ලොවක් ගොඩනැඟීමටත්, පැසිස්ට්වාදය නිසා විනාශ වූ සියල්ල නැවත වගා කැර ගැනීමටත් නව ලොවක් අවශ්‍ය වන්නේ ඇයි දැයි උන්වහන්සේ පැහැදිලි කරති. පැසිස්ට්වාදය පරදවා මේ ජයග්‍රහණය ලැබීමට ජීවිතය පුද කළ ලක්ෂ සංඛ්‍යාත වූ ජනතාවගේ අපේක්ෂාව වූයේ නිදහස සහ අභිමානය රැකෙන නව ලෝකයක් බිහි කිරීම බව තව දුරටත් පෙන්වා දෙති.

'නවලෝකයේ' පරමාර්ථය එසේ වුවත්, සරණංකර හිමියන්ගේ විවේචකයන් එම සඟරාව සැලකුවේ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ හුදු ප්‍රචාරක මාධ්‍යයක් වශයෙනි.



සරණංකර හිමියන් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය සමඟ පැවති සබඳතාව හේතු කොටගෙන එවැනි විවේචනයක් මතු වීම සාමාන්‍ය දෙයක් වුවත්, උන්වහන්සේ ලිපි තෝරා ගැනීමේ දී සහ නූතනයේ වැදගත් අන්තර්ජාතික සිද්ධීන්ට අදාළ ප්‍රවෘත්ති පළ කිරීමේ දී යම් සමබරතාවක් පවත්වාගෙන යෑමට සමත් වීම විශේෂත්වයකි. නිදසුනක් වශයෙන් ''අගමැතිනිය, පත්‍ර කලාවේදීන් අමතයි'' යන හිසින් යුතු ලිපිය පෙන්වා දිය හැකි ව තිබේ. එම ලිපිය මෙසේ ය:

"ගිය මස 26 දින කොළඹ කලා භවනයේ පැවැත් වූ ශ්‍රී ලංකා පත්‍ර කලාවේදී සංගමයේ පස් වැනි සංවත්සර උත්සව සභාවේ මුලසුන ගනිමින් අගමැතිනිය කළ සම්පූර්ණ කතාව යි මේ.

"ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් යටතේ පුවත්පත්වලට හිමි වන තැන ඉතා වැදගත් දැයි කියතොත්, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක නිසියාකාර පැවැත්ම පවා රඳා පවතින්නේ මනා ලෙස, නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් අනුව හැඩගැසුණු පුවත්පත් මත ය, යන්න, අවිවාදයෙන් පිළිගත යුතු දෙයක් වන අතර, එය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයේ මූලික අවශ්‍යතාවකි. ප්‍රථම වශයෙන් ම මහජන මතය හැඩගස්වන්නේ පුවත්පත් වන අතර, මහජනයා සිය සිතුම් පැතුම්, අදහස් උදහස් ප්‍රකාශ කරන මාර්ගය ද එය වෙයි. එම නිසා සෑම තරාතිරමක ම අදහස් පළ කරන සෑම කොටසකගේ ම අදහස් ප්‍රකාශ කරන පුවත්පත්, ප්‍රජාතන්ත්‍රවාදී රටකට අවශ්‍ය වේ. ඒ නමුත් අභාග්‍යයකට මෙන් අපේ රටේ පුවත්පත්වල අයිතියත්, ඒවායේ පාලනයත් පවුල් කීපයකට හිමි වී ඇත. දිවංගත අගමැතිතුමා ද සෑම අවස්ථාවක දී ම පෙන්වා දී ඇති පරිදි ඇත්ත වශයෙන් ම ශ්‍රී ලංකාවේ පුවත්පත්වල සම්පූර්ණ වෙළඳ බලය සහ තනි අයිතිය මෙසේ සුළු දෙනෙකු අතට පත් වී තිබීම එතරම් සතුටුදායක නැත. බොහෝ අවස්ථාවන්හි දී අප පුවත්පතක් දිග හරිනවිට එහි දකින්නට ලැබෙන්නේ, අප යම් තැනක කළ කථාවකට සම්පූර්ණයෙන් ම පාහේ ප්‍රතිවිරුද්ධ අදහස් දක්වෙන කථාවේ වාර්තාවකි. ඒ හැරත් සාමාන්‍ය ජනතාවගේ අදහස්වලට ලැබෙන්නේ ඉතා සුළු තැනකි. මේ සම්බන්ධයෙන් දිවංගත අගමැතිතුමා මෙසේ ප්‍රකාශ කර ඇත.

"එහෙත් පුවත්පතක, නොයෙක් සියුම් ක්‍රමවලින්, අතනින් මෙතනින් වෙනස් කිරීමත් සාමාන්‍යයෙන්ම පුවත්පත් කාර්යාලයේදීම සකස් වන ''නිර්නාමික ලියුම්'' වලින්, නොයෙක් මාදිලියේ කතු වැකි වලින් සහ ලිපිවලින්, තනි පුද්ගලයකුට තනිව කිසිවිටක කළ නොහැකි තරමේ වැරදි හැඟීමක් මහජනයාගේ සිත් තුළ ඇති කිරීමත් කළ හැකියි. මේ නිසා, විශේෂයෙන්ම පුවත්පත් ආඥා දයකත්වයක් හා පුවත්පත් ඒකාධිකාරිත්වයක් වැනි යමක් කරා ළං වන මෙරට බඳු රටක පුවත්පත් මත පැවරී ඇති වගකීම දැන් ඔබ හැම අවබෝධ කර ගන්නවා නිසැක ය."

මෙම කියමනෙහි ඇති සත්‍යතාව මට බලවත් ලෙස වැටහුණේ, මා පළමුවෙනි වරට දේශපාලන වේදිකාව මත පා තැබූ අවස්ථාවේදිය. ජූලි මැතිවරණයට පෙර පුවත්පත් පවත්වාගෙන ගිය අප්‍රියජනක ව්‍යාපාර දැන් අමතක කිරීම වඩා හොඳ බව පෙනේ. නමුත් එක් කරුණක් නම් ප්‍රකාශ කළ යුතුමය. තවමත්, අද පවා, සිද්ධීන් පිළිබඳව උපේක්ෂා සහගත විවේචනයක් වත්, ඒවා උපේක්ෂා සහගතව පළකිරීමක් වත්, දකින්නට නොමැති අතර, බොහෝ අවස්ථාවන්හි දී ජාතික උවමනාවන් සහ ජාතික අවශ්‍යතාවන් ගැන පවා පුවත්පත් වැඩි උනන්දුවක් නොදක්වන බව පෙනේ. ඒ අතරම සුළු කොටසකගේ අයිතිය සහ උවමනාවන් පමණක් ආරක්ෂා කිරීමට සෑම ප්‍රයත්නයක්ම පුවත්පත් දරන අතර, මේ කොටසට ප්‍රතිවිරුද්ධ අදහස් දක්වන්නන්ගේ මත පළකිරීම අත් හැරීමෙන්ද, ඔවුන්ගේ මත සමහරවිට වෙනස් අන්දමට ප්‍රසිද්ධ කිරීමෙන් ද, තම පරමාර්ථයන් ඉටු කිරීමට මාන බලන බව අපට වැටහී ඇත. පුවත්පත් වාර්තාවල සත්‍යවාදී භාවයත්, උපේක්ෂා සහගත භාවයත්, ආරක්ෂා කිරීමට ආණ්ඩුව ළඟදීම විධිවිධාන යොදනවා ඇත. නමුත් ඔබ වැනි, ඉතා උගත්වූත්, විචාර බුද්ධියක් ඇත්තාවූත්, වැදගත්, යහපත් වෘත්තියකට අයිතිවූත්, පුද්ගලයන්ට බලවත් වගකීමක්, විශේෂයෙන්ම මහජනතාව කෙරෙහි බලවත් වගකීමක් තිබේ. මෙම වගකීම නිසියාකාර ලෙස ඉටු කිරීමේ දී ඔබ පුවත්පත් අයිතිකරුවන්ගේ මතවලට විරුද්ධවද, ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථා එළඹෙන බව නිසැකය. එවැනි අවස්ථාවකදී ඔබගේ යුතුකම සෑමවිටම නිර්භයව සත්‍යය ආරක්ෂා කිරීමය.



ජාතික අභිවෘද්ධිය තකා මහජන මතය හැඩගැස්වීම සහ එය වැඩිදියුණු කිරීම පුවත්පත් කලාවේදීන් වශයෙන් ඔබගේ යුතුකමය. මෙතෙක් කල් සිද්ධීන් වාර්තා කිරීම කෙබඳු තත්ත්වයකින් පැවතුනාද කියහොත්, සමහර අවස්ථාවල සමාජයේ ආරක්ෂාව සහ දියුණුව තකා පුවත්පත්වලට ඇතැම් සිද්ධීන් වාර්තා කිරීමේදී තහනම් නීති පනවන්නට සිදුවී ඇත. සමහර අවස්ථාවලදී යම් යම් සිද්ධීන්ට, ඇතැම්විට සිදු නොවුණ සිද්ධීන්ට පුවත්පත්වල ලැබෙන ප්‍රමුඛස්ථානය නිසා මහජනයා නොසන්සුන් තත්ත්වයකට පත්වෙනවා පමණක් නොව, තම වාර්තා මගින් උවමනාවෙන්ම ඉතා සියුම් අන්දමින්, රටෙහි කලබල අවස්ථා ඇති කිරීමේ අදහසින් කෙරෙන බවද අපගේ වැටහීමයි. එබැවින් මේ කරුණු නිසා මම කියා සිටින්නේ, ඔබ වැදගත් වෘත්තියෙහි යෙදී සිටින සෑම දෙනාගේම බලවත් යුතුකම් විය යුත්තේ උපේක්ෂා සහගතව සිද්ධීන් වාර්තා කිරීමත්, එය ප්‍රමාණාකාරයෙන් කිරීමත්, රටේ දැනට තිබෙන භේද නැති කරන සිද්ධීන්වලට මුල්තැන දීමත්, සාමය සහ සමගිය කඩවෙන අන්දමේ සිද්ධීන්ට වැඩි තැනක් නොදීමත්, විනාශකාරී, දරුණු විවේචනවලට අඩු තැනක් දීමත් යන්නය. තවද, ඔබ යමක් වාර්තා කරන විට, යම් කුඩා සිද්ධියක් මහත් ලෙස පුම්බා, එය බොහෝ සෙයින් පතළ දෙයක් හැටියට වාර්තා නොකළ යුතුය.

මෙවැනි තත්ත්වයක් ගැන ඔබ සෑම දෙනාටම මා දොස් කියන්නේ නැත. නිසි ස්වාධීනතාවයකින් යුක්තව තම රටටත්, ජාතියටත් මහත් ලැදියාවකින් යුක්තව, වැඩ කටයුතු කරන පුවත්පත් කලාවේදීන් සිටින බව මම දනිමි. නමුත්, ඔබ නිතරම මතක තබා ගත යුත්තේ, මා මෙම කතාවේදී මීට ප්‍රථමයෙන් සඳහන් කළ පරිදි සම්පූර්ණ වගකීමකින් යුක්තව ක්‍රියා කිරීමටය. සිද්ධීන් වාර්තා කරන විට, නිතරම ඇත්ත ඇති සැටියෙන් වාර්තා කරන මෙන් මම ඉල්ලමි. පළකරන සිද්ධීන් පිළිබඳ විවේචනය කිරීමේදී නම් තමන්ට උවමනා අන්දමින් තමන්ගේ අදහස් උදහස් ප්‍රකාශ කිරීමට හැක. නමුත් මෙය කරනවිට නිතරම මහජන සුභසිද්ධිය ප්‍රමුඛස්ථානයෙහි පිහිටා කිරීම වටී.

පුවත්පත් තම පරමාර්ථයන් ඉටුකර ගැනීම පිණිස වාර්තා නොයෙකුත් අන්දමින් හැඩ ගස්වන බව, මා මීට පෙර සඳහන්

කර ඇත. නමුත් දිවංගත අගමැතිතුමා 1959 පුවත්පත් සංගමය අමතා කළ කතාවේ ප්‍රකාශ කළ අදහස් මේ අවස්ථාවෙහිදී මතක් කරන්නට කැමැත්තෙමි. කුඩා සිද්ධීන් විශාල ලෙස පෙන්වා වාර්තා නොකරන්න.

පුවත්පත් කලාවේදීන් වශයෙන් රක්ෂාව කරන්නේ, දිවි පෙවෙත රැක ගැනීමට බව මම දනිමි. නමුත් ඔබගේ රක්ෂා වෙන රක්ෂා සමහරක් මෙන් නොව, රටටම වගකිව යුතු රක්ෂාවකි. පුවත්පත් අයිතිකරුවන්ගේ අදහස් පමණක් දැන් නොව, රටේ මහජන මතය හැඩගැස්වීම ඔබගේ කාර්යයකි. මේ දෙක අතර, ඝට්ටනයක් ඇතිවුවහොත්, දේශප්‍රේමී පුද්ගලයා වශයෙන් ඔබගේ හැසිරීම කෙසේ වියහැකි දැයි යන්න ගැන කිසි අඩමානයක් නොවිය යුතුය. ''(නවලෝකයඃ 1963, පෙබරවාරි, පි. 35-36)

අනෙක් අතට එදා ශ්‍රී ලංකාවේ ඉහළ පැළැන්තියේ බෞද්ධයෝ කිසි විටකත් 'නවලෝකය' සඟරාව සමාජගත කළ මතවාදයන් කිසි සේත් නොපිළිගත් හ. ඔවුහු 'නවලෝකය' දැඩි ලෙස විවේචනය කළ අතර, සඟරාව වටා එකතු වන පාඨකයන් දුරස් කිරීමට ඍජු ව හා වක්‍ර ව වැඩ පිළිවෙළවල් යෙදූහ. 'නවලෝකය' සඟරාවේ පළ වූ 'බුදුන් වහන්සේ සර්වඥ ද' යන ලිපිය පදනම් කැර ගනිමින් රට පුරා අසත්‍ය ප්‍රචාරයන් ගෙන ගියහ. එම ප්‍රචාරය අභියෝගයක් ලෙස බාර ගත් 'නවලෝකය' ඊට පිළිතුරු දීමට කතු වැකියක් ද පළ කෙළේ ය.

"බුදුන් සර්වඥ නැති ලු" යන හිසින් ලියන ලද එම කතුවැකිය මෙසේ යඃ

"ශ්‍රමදායී විමුක්තියත්, ආධ්‍යාත්මික විමුක්තියත් යන දෙක ම මැයි මසට එළඹීම ඉතා වැදගත් ය.

මැයි මහේ මල්වල සුවඳින් බුදු දහමේ මිහිරත්, වැඩ කරන පන්තියේ පැහැයත් රන්වන් ව පෙනෙන විට එය දකින හදවතකට කෙතරම් පිරුණු ආශ්වාදයක් ලබාගත නොහැකිද?

එහෙත් මේ වෙසක් මහේ අපට විශේෂ යමක් කීමට සිදුවී ඇත. ඒ අපේ නවලෝකයත් - අපේ ගරු උඩකැන්දවල සිරි සරණංකර හිමියනුත් පිළිබඳවය.



අපේ හතුරෝ මේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරයේ හතුරෝ පමණක් නොව හතුරන්ගේ සන්තෝසම්වලින් නඩත්තු වූ අවස්ථාවාදියොත් නවලෝකයටත්, සරණංකර හිමියන්ටත් ජඩ බසින් පහර දුන්හ. ඔවුන් හේතු කොට ගත්තේ නවලෝකය මඟින් සරණංකර හිමියන් බුදු දහමට නිගරු කරන බව ය.

'නවලෝකය' ආරම්භ කරන ලද්දේ මැඩියන් මෙන් ජීවත් වීම ශික්ෂණයක් කරගත් සමාජයට දොර හැර දීම සඳහාය. ඒ බැවින් තර්කයෙන් හා ඇතුළු හදවතින්ම යමක් තේරුම් ගැනීමටත් හඳුනා ගැනීමටත් 'නවලෝකය' මඟ හෙළි කෙළේය. "බුදුන් වහන්සේ සර්වඥ ද?'' නමින් ලියුම්කරුවකු විසින් සපයන ලද ලිපියක් නවලෝකයේ පළ කළ අවස්ථාවේ දී ඒ මඟින් අවශ්‍ය කරුණු එළියට ඒමට ඉඩදෙනු වෙනුවට අපේ හතුරනුත් අවස්ථාවාදීනුත් කෙළේ සරණංකර හිමියන්ටත්, නවලෝකයටත් ගල් ගැසීමයි. ජඩ බසින් බැණ වැදීමය. ඇත්ත වශයෙන්ම බුදුන් වහන්සේ සර්වඥ නැතැයි යන ප්‍රකාශයක් සරණංකර හිමියෝ පළ නොකළහ.

එහෙත් දැන් ඒ අදහස පළවන්ට පටන් ගෙන තිබේ. එදා ගල් ගැසූ අය නිහඬ කරමින් මහාචාර්ය මලලසේකර මහතා බුදුන් සර්වඥ නැති බව ප්‍රකාශ කරයි. අපේ හතුරන් දැන් කියන්නේ මොනවාද? ඔවුන්ගේ ගල් ගොඩවල්වල ගල් ඉවරවද? අවස්ථාවාදී ජඩයන්ට වාසිය ප්‍රතිපත්තිය වී ඇති නිසාද?

ප්‍රශ්නයක් දෙස තම වුවමනාව අනුව නොව එහි සැබෑ තත්ත්වය අනුව මුහුණදීමේ ශිෂ්ට ගතිය මුණට පිහිටිය යුතුය. "බුදුන් වහන්සේ සර්වඥ නැත" යනු එකක් නොවේ දෙකකි. 'නවලෝකයේ' පළ වූයේ විමැසුමකි. දැන් මලලසේකර මහතා දී ඇත්තේ එයට පිළිතුරයි. බුදුන් වහන්සේ සර්වඥ නැතිලු!.

එදා සරණංකර හාමුදුරුවන්ගේ සිවුරු පවා ගැලවීමට ඉදිරිපත් වූ ගරුතර මහා සඟරුවන දැන් නිහඬ, උන්වහන්සේලාත් මලලසේකර මහතාගේ මතය ගරු කරන නිසාද?

කෙසේ වෙතත් මේ ප්‍රශ්නය ගැන 'නවලෝකයට' ගල් ගැසූ අයට ඒ ගල් ආපසු හැරවීමට අපට පුළුවන. එහෙත් අපි එවැනි වසල වැඩවල නොයෙදෙන්නෙමු.

'නවලෝකයත්', 'සරණංකර හිමියනුත්' නිවැරදි බවත්, ප්‍රතිපත්ති ගත බවත්, යළි යළිත් අපේ හතුරන්ට පෙන්වා දීමට කැමැත්තෙමු. එහෙත් මෙහිදී අපේ හතුරන්ගේ නිරුවත දකින්නට සිදුවීමේ පිළිකුල් දර්ශනය ලෝකයාට පෙන්වීම අපේ යුතුකම යැයි සිතමු." (නවලෝකයඃ 1968, මැයි, පි.01)

මේ අභියෝග හමුවේ 'නවලෝකයේ' අරමුණ තව දුරටත් පැහැදිලි කරන සරණංකර හිමියෝ ''ප්‍රතිගාමීත්වය වළලා දැමීම රුසියානු විප්ලවයෙන් ලැබිය හැකි ලොකුම පාඩමයි'' යන හිසින් යුතු ව, 1964 නොවැම්බර් මාසයේ ප්‍රකාශයට පත් වූ 'නවලෝකය' සඟරාවට කතුවැකියක් ලියමින් ප්‍රතිගාමීත්වය සහ සූරාකෑම දැඩි ලෙස විවේචනයට ලක් කරති. එම කතුවැකියේ උන්වහන්සේ මෙසේ සඳහන් කරති. "අද අප රට ද ප්‍රතිගාමී සූරා කන්නන්ගෙන් මිදී සමාජවාදය කරා යෑමට ගමනාරම්භ කර තිබේ. එය නැවැත්වීම සඳහා දූන් ධනපති ප්‍රතිගාමී අතළොස්සක් මහජනයා නොමඟ යැවීමට නොයෙක් හදි හූනියම් යන්ත්‍ර මන්ත්‍ර ජප කිරීමට පටන්ගෙන තිබේ. මන්ත්‍ර බලය මහජන බලයට යටත් බව මතක් කරමු." (නවලෝකයඃ 1964, නොවැම්බර්, පි.295-296)

'නවලෝකය' ප්‍රධාන කාර්ය දෙකක් ඉටු කළ අන්දම අපට නිරීක්ෂණය කළ හැකි ය. එය 'සමාජවාදී අදහස්' සිංහලයෙන් සමාජගත කිරීමට උත්සාහ ගත් අතර, සෝවියට් දේශයේ සිදුවීම් සමඟ කාලානුරූප වීමට කටයුතු කෙළේය. එවැනි ප්‍රචාරක හැඩගැසීමක් අවශ්‍ය වූයේ එවකට මෙරට ස්ථාපිත වී තිබුණු පුවත්පත්, සමාජවාදී ප්‍රතිපත්ති කෙරෙහි කිසි ම අනුකම්පාවක් නොදැක්වූ බැවිනි. විශේෂයෙන් ප්‍රවෘත්ති වාර්තා එක පැත්තකට යොමු ව තිබූ අතර, ශ්‍රී ලාංකික වාම නායකයන් හා දුක් විඳින ජනතාව ගැන සැලකිය යුතු අවධානයක් යොමු නොකොට, හැමවිට ම ධනපති පන්තියේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටියේය. ධනපති පාලකයන් ප්‍රකාශයට පත් කළ පුවත්පත් ප්‍රකාශනවලින් පමණක් සෑහීමකට පත් වීමට සිදු ව සිටි මෙරට ප්‍රගතිශීලී පාඨක පිරිස 'නවලෝකය' ඉතා ආදරයෙන් පිළිගත්හ.

'නවලෝකය' සඟරාවේ පළ කළ, එමෙන් ම සාකච්ඡාවට බඳුන් වූ විෂයයන් ගැන අධ්‍යයනයක් කරන විට පෙනී යන ප්‍රධාන කරුණක් වන්නේ, සමාජවාදී රටවල ප්‍රධාන ප්‍රවණතා කෙරෙහි



අවධානය යොමු වන ලිපි හා කවි, කථා නිර්මාණ පළ කිරීමට විශේෂ උත්සාහයක් ගත් බවකි. නිදසුනක් වශයෙන් රුසියාව, චීනය, ඉන්දියාව ආදි රටවල සිදුවන ආර්ථික, සමාජ, දේශපාලන සහ සංස්කෘතික වෙනස්කම් හඳුන්වාදීමට උත්සාහ ගෙන ඇත. මේ අනුව ආගම, විශේෂයෙන් බෞද්ධාගම (මතභේදයට ලක් වූ කරුණක් බැවින්), චීනයේ බෞද්ධ ආයතන සහ සමාජවාදී රජය අතර සබඳතාවෙහි ස්වභාවය විස්තර කරන ලිපි 'නවලෝකය' තුළ සවිස්තරාත්මක ව පළ කැර ඇත. නිදසුනක් වශයෙන් ''සමාජවාදී රටවල බුදු දහම'' යන හිසින් යුතු ව 'නවලෝකය' 1968 මැයි කලාපයට ලිපියක් ලියන ලයනල් සිල්වා නමැති ලේඛකයා, චීන රජය හා බුදු දහම අතර ඇති සම්බන්ධතාව ගැන සිය දීර්ඝ ලිපියේ මෙසේ සඳහන් කැර ඇත. ''මහජන චීනයෙහි ප්‍රධාන වශයෙන් ආගම් වර්ග හතරක් ඇති බව පෙනියයි. එනම් බුද්ධාගම, තාඕවාදය, ක්‍රිස්තු ධර්මය සහ ඉස්ලාම් ආදී වශයෙනි. ජනතාවගෙන් වැඩි කොටසක් බුදුදහම පිළිපදින අය වෙති. ඔවුන්ගේ සංස්කෘතියත්, භාෂාවත්, සම්ප්‍රදායන් සහ විශ්වාසයන් කොමියුනිස්ට් පක්ෂය නායකත්වය දරන මහජන ආණ්ඩුවෙන් ආරක්ෂා කිරීම පමණක් නොව ඒවා විද්‍යාත්මක මාර්ග තුළින් වැඩිදියුණු කර වර්ධනය කිරීම සඳහා ධෛර්ය ලබා දෙයි. රුස්ස ගසකින් සෑම දෙසටම විහිදී ගිය සංස්කෘතිය සහ කලාව යන අතුවලට, නොබිඳිය හැකි එක්සත් බව නමැති හුයෙන් වෛවර්ණ මල් සම්බන්ධ වී පවතින්නාක් වැනි වූ ශ්‍රේෂ්ඨ රටක් හැටියට මහජන චීනය සැලකිය හැක. බෞද්ධ ධාර්මිකයන් විශාල පිරිසක් සිටින චීනයේ බෞද්ධ කලාව, සංස්කෘතිය, චිත්‍ර ශිල්පය සහ ප්‍රතිමා සෑම පෙදෙසකම දැකිය හැක. මුළු රට පුරාම ආරණ්‍ය සහ වෙහෙර විහාර මහත් රාශියක් ඇත. මේ වෙහෙර විහාර අතරින් පැරණිතම විහාරය හැටියට සැලකෙන්නේ "ලොයාන්ග්" හි පිහිටි "සුදු අශ්ව (White Horse Temple) විහාරයයි". දෙවැනි සියවසේදී බුද්ධ ධර්මය චීනයට හඳුනාදුන් පසු චීනයේ සාදන ලද ප්‍රථම විහාරය ලෙස මෙය සැලකිය හැක. සෑම විහාරයකම වෙසෙන භික්ෂූන් වහන්සේලා තමා පෙරට වඩා දූන් ගත කරන ජීවිතය කෙරෙහි විශ්වාසය හා ප්‍රීතිය ප්‍රකාශ කරති. චීනයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා තම දිනපතා ජීවිතය සහ ආරණ්‍ය විනය ඉතා සැහැල්ලු සහ වාම් බවකින් යුක්තව ගෙන යති. ශ්‍රී ලංකාවේ

බොහෝ භික්ෂූන් වහන්සේලා මෙන් ලෞකික ජීවිතයට බර වූ ජීවිතයක් නොගෙනයන ඔවුහු එම රටේ සමාජවාදී විප්ලවය සිදුවීමත් සමඟ 'චියංකායිෂෙක්'ගේ රදළ පාලනය පැවැති කාලයට වඩා ආධ්‍යාත්මික අතින් මහත් දියුණුවක් ලබා තිබීම එම රටේ වර්තමාන රජයේ සහයෝගය සහ උනන්දුව නිසා ද සිදු වී ඇතැයි අපට සිතිය හැක". (නවලෝකයː 1968, මැයි, පි.3)

ඉන්දියාවේ මහා කවි රවීන්ද්‍රනාත් තාගෝර්තුමා විසින් බෙංගාලි බසින් ලියන ලද කවි, ගීත සිංහල බසට පරිවර්තනය කොට 'නවලෝකය' සඟරාවේ පළ කළ අවස්ථා බහුල ව දක්නට ලැබීම තවත් විශේෂයක් ගනී. "වෛශාඛ ගීතය" යන හිසින් යුතු ව තාගෝර්තුමා විසින් ලියන ලද ගීතයක්, ශාන්ති නිකේතනයේ ආදී ශිෂ්‍යයකු වූ පන්නිපිටියේ උපාලි අභයගුණවර්ධන මහතා විසින් එද 'නවලෝකයට' එවන ලදුව, එම ගීතය පළ විය. එහි සිංහල පරිවර්තනය මෙසේ යː

"සියලු පාපයන්ගේ කාලුෂ්‍යයන් ඉවත් කළ මැනවි.
ඔබ වහන්සේට ජයග්‍රහණය ලැබේ වා.
සදාකාලික ජීවනයේ ආසිරි පැන් ලොවට ඉසින්න.
ශාන්තියේ, අභිවෘද්ධියේ ගුඪ භාවයේ සහ ප්‍රේමයේ උල්පත
වන
උත්තමයාණෙනි! ශෝකයේ අන්ධකාරය හා සියලු
නපුරු සිහිනයන් ඥුන සූර්යයාගෙන් නව ප්‍රභාතයේ
ආලෝකයෙන් දුරිභූත කළ මැනවි.
දවස මායාවෙන් අඳුරු වී පවතී.
මඟියා එහෙයින්, බියෙනි.
වෙනස් වූ නොයෙක් පාරවල් අවුල් ජාලයක් ව ඇති
හෙයින් හේ සැකයෙන් බර ව සිටී.
ශාන්තියේ, අභිවෘද්ධියේ, ශුද්ධ භාවයේ හා
ප්‍රේමයේ උල්පත වන
මහා කාරුණිකයාණෙනි!
මඟ අනතුරුවලින් ඔහු රැක දුන මැනවි.
විපතේ ජලයට, අසු නොවී සදාකාලික නිදහස් සැපතට,
සැපවත් වීමට ඔහුට මඟ පෙන්වා දුන මැනවි''.
(නවලෝකයː 1968, මැයි, පි.13)



මහා කවි රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ මෙවැනි කවි පළ කිරීමට පමණක් සීමා නොවී සරණංකර හිමියෝ, තාගෝර්තුමාගේ සිය වැනි ජන්මෝත්සව දිනය වෙනුවෙන් විශේෂ කලාපයක් 1961 මාර්තු මාසයේ ප්‍රකාශයට පත් කළ හ. මෙය "නවලෝකයේ රවීන්ද්‍ර ජයන්ති කලාපය" යනුවෙන් නම් කළ හ.

මෙහි විශේෂත්වය වූයේ එවකට (1961 වසරේ) ඉන්දීය ජනපති රාජේන්ද්‍ර ප්‍රසාද් මහතා ''නවලෝකයේ රවීන්ද්‍ර ජයන්ති කලාපයට'' විශේෂ පණිවිඩයක් නිකුත් කිරීම යි. ඉන්දීය රජය සරණංකර හිමියන් සමඟ පැවති සුහදතාව නිසා මෙය නිකුත් කිරීම විශේෂත්වයකි.

සරණංකර හිමියන්ගේ නමට, පෞද්ගලික ව 1961 පෙබරවාරි 22 වැනි දින එවන ලද පණිවිඩයේ මෙසේ සඳහන් කොට තිබේː

"තාගෝර් සිහිවටනය වෙනුවෙන් අපට දක්විය හැකි උසස් ම ගෞරවය නම්, එතුමාගේ සංකල්පනයන් හා ලියවිලි අපේ ජීවිතයන් හා හුරුපුරුදු කර ගැනීමත්, ඊට ම සුදුසු උසස් ශෛලියකින් ප්‍රකාශිත ඔහුගේ ශ්‍රේෂ්ඨතම අදහස්වලින් ඉතා ස්වල්පයක් වත් උරා ගැනීමට උත්සහ කිරීමත් ය.

රවීන්ද්‍රනාත්තුමාගේ සිය වැනි ජන්මෝත්සවය සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි". (නවලෝකයː 1961, මාර්තු, පි. 02)

මේ විශේෂ සමරු කලාපයට, ශ්‍රී ලංකාවේ ගිහි පැවිදි ලේඛකයන් ගණනාවක් තාගෝර්තුමාගේ ජීවිතය හා සම්බන්ධ ව ලිපි හා නිර්මාණ ලියා තිබීම කැපී පෙනෙන සිද්ධියකි.

විශේෂයෙන් පී.බී. අල්විස් පෙරේරා, විල්මට් ඒ. පෙරේරා, බඹරැන්දේ සිරි සීවලී හිමි, මාර්ටින් වික්‍රමසිංහ, ශ්‍රී රාහුල හිමි, ගුණසේන විතාන, වී.නෙ. සමරවීර, පී.පී. ආටිගල, මහාචාර්ය වයි. වෙලිෂෙව්, ඩබ්ලිව්.කේ. ගුණවර්ධන, අමරනාත් ජයතිලක, විජයපාල වික්‍රමසිංහ, ඊ.ඒ. විද්‍යාසේකර, මහාචාර්ය ගෝපල හල්ධාර, ලයනල් එදිරිසිංහ, ධර්මප්‍රිය ජයකොඩි, ජෝන් දමසීන්, ගණේගම සරණංකර හිමි, තිස්ස හැඳලගමුවේ, ජස්ටින් විජයවර්ධන, වෙන්නප්පුවේ සිරි, ධර්මදාස ගුණවර්ධන

(නවලෝකයඃ 1961, මාර්තු, පි.01) යන ලේඛකයන් මේ සමරු කලාපය සඳහා දයක වී ඇත.

මේ සමරු කලාපය සඳහා කතුවැකියක් ලියන සරණංකර හිමියන්, එහි මෙසේ සඳහන් කැර ඇත. "රවීන්ද්‍රනාත් මේ ශතකයේ වාසය කළ උසස්ම මානව ප්‍රේමියා යයි කිව යුතුය. යටත් විජිතයක උපන් රවීන්ද්‍රනාත්ට කවියකු වශයෙන් තම ප්‍රභවය අවශ්‍ය පරිදි පතුරුවා ගැනීමට නොහැකි වූයේ අධිරාජ්‍ය වහල් නීති හා ඒ අධිරාජ්‍යවාදයට ආසිරිවාද කරමින් සිටි ස්වදේශීය ගැත්තන්ගේ බලපෑම නිසායි. එහෙත් ඔහු ලොවට දී ගිය කවි පණිවුඩය අධිරාජ්‍යවාදීන්ට පවා ප්‍රතික්ෂේප කළ නොහැකි වූයේ ඔහු තුළ පැවැති උසස් හැඟීම් නිසාය. මේ කවියා නිදහස් රටක ජනිත වූයේ නම් ඔහුගේ ප්‍රභාවය කොතරම් දුර පැතිරෙන්ට තිබුණේ දැයි අද මේ නිදහස් යුගයේ ඔහුගේ සියවස් ජන්ම ජයන්තිය ලොව පුරා සෑම රටක්ම පැවැත්වීමට යන අන්දමින් කාටත් තේරුම් යනවා ඇත. (නවලෝකයඃ 1961, මාර්තු, පි.03)

රවීන්ද්‍රනාත් තාගෝර්තුමා පිළිබඳ ව පී.බී. අල්විස් පෙරේරා, මේ සමරු කලාපයට ලියා තිබූ කවි පෙළක එක් කවියක් සටහන් කිරීම මෙහිදී වැදගත් ය.

නිදහස් සටන් ගිනි ඇවිලෙන විටදී බුරා
පියවර නොනැඟුව ද සිර මැදිරියක් කරා
ඔබ දුන් උදව් සටනට සිත් බඳුන පුරා
අමතක නොවනු ඇත දඹදිව තිබෙන තුරා

(නවලෝකයඃ 1961, මාර්තු, පි.04)

මහා කවි රවීන්ද්‍රනාත් තාගෝර්තුමා පිළිබඳ ව 'නවලෝකය' සඟරාවේ පළවූ බොහෝ කවි නිර්මාණවලින් ප්‍රකාශ වූයේ, පන්ති සහිත සමාජයක පවතින ගැටුම්කාරී ස්වභාවයයි. සමාජ සාධාරණත්වයක් නොමැති ව දුක් විඳින මිනිසුන් පිළිබඳ ව කියැවෙන කවි, ගීත ප්‍රබන්ධ නිර්මාණ 'නවලෝකය' ආරම්භ වූ අවස්ථාවේ සිට එය නැවතී යන තුරු ම පළ වීම විශේෂත්වයකි. සෑම සඟරා කලාපයක ම අඩු ම තරමින් කවි සංකල්පනා පහකට වැඩි ප්‍රමාණයක් පළ කිරීමට සරණංකර හිමියන් කටයුතු කිරීම විශේෂත්වයකි.

LIBRARY
SRI PALEE CAMPUS



"දැකැති කුළු ගෙඩි" (තාලයඃ "දනපතින් සුන් කරව්") හිසින් යුතුව එච්. ප්‍රින්ස් විජය ආනන්ද විසින් ලියන ලද

"දැකැති - කුළුගෙඩි
ගෙන ගොවි - කම්කරු
සොයුරාන් සමගි වී පිය නගාව්//

ජයබිම..... - පෙනී පෙනී
බාධක...... - හමුවේවී
පසු නොබා එක හිතින් පිය නඟාව්

දෑකැති - කුළුගෙඩි......

ධනපති - ඔය ගෙවාල්
කඩදහි - බිත් ගෙවාල්
අළුවිලා යන්නට දූත් ළඟයි

මේ අපේ - දුක් ගිනී
ධනපතීන් - දුන් ගිනී
මතකෙට ගෙන ඉතින් පිය නඟාව්

දෑකැති - කුළුගෙඩි
ගෙන ගොවි කම්කරු
සොයුරාන් සමගි වී පිය නඟාව්//

(නවලෝකය : 1964, මැයි පි. 145)

වැනි ගීත ප්‍රබන්ධ 'නවලෝකය' සඟරාවේ නිරතුරු ව පළ විය. වාමවාදී චින්තනයක් තිබූ තරුණ නිර්මාණ ශිල්පීන්ට 'නවලෝකය' දෙර විවෘත කැරදීමට සරණංකර හිමියන් පසුබට වූයේ නැත. එසේ ම මෙවැනි ගීත සහ පෙළපාළිවල සටන් පාඨ කෙතරම් සංවේදී ස්වභාවයක් ගත්තේ ද යත්, තත්කාලීන අනුගාමිකයන් අතරින් බහුතරයක් දෙනා තම ජීවිතයේ අවසානය වන තෙක් ම වාමාංශික ව්‍යාපාරයෙහි මතිමතාන්තර කෙරෙහි භක්තිමත් ව ඇලී ගැලී සිටි බව, එහි සන්නිවේදන ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී මනා ව පෙනී යයි.

"අමතක නොවන දෙයක්" යන හිසින් පළ වූ රත්මල්ගොඩ සීලානන්දගේ කවි නිර්මාණය මේ සඳහා නිදසුනක් ලෙස ඉදිරිපත් කිරීම වැදගත් ය.

| | |
|---|---|
| හොර ජන්දෙකින් පාලන බල අතට | ගෙන |
| අවුරුදු ගණනක්ම කර ජාතියට | විත |
| රජ සැප විඳින දූගිනගෙ බත්පතට | ඇන |
| යූඇන්පීයට වැදියන් වැහි නැතිව | හෙන |
| | |
| සාද ගන්න ඇරඹූ දූගි දනට | වැඩ |
| පසුගිය දවසෙ හර්තාලයෙ රජත | හඬ |
| පැතිරී යද්දී යූඇන්පී පිරිස | සැඩ |
| අමතක නොවේ දූගිනට උන් කරපු | වැඩ |

(නවලෝකයඃ 1953, නොවැ, පි.164)

"අමු සොහොනක මඟුල් කන හැටි බලපල්ලා'' යන හිසින් යුතු ව, මලල නන්දසේන ලියූ කවිය, සමාජ අසාධාරණය ප්‍රකාශ වන නිර්මාණයකි.

| | |
|---|---|
| රටවැසි ජනතාව දුක් සයුරෙහි | ගිල්ලා |
| ඔළු ටික උගස් කර අපෙ පාලක | බිල්ලා |
| රැජිනගෙ උළෙලෙ අදිරද වලිගය | අල්ලා |
| අමු සොහොනක මඟුල් කන හැටි බල | පල්ලා |
| | |
| මුළු රට බංකොලොත් අඩියට වැටුණු | තැන |
| රුපියල් දෙකෝටියකට වැඩි ණයට | ගෙන |
| බිය-සැක නැති ව කජු කොස් ඇට ලෙසට | ගැන |
| තක්කඩි පිරිස වනසන හැටි බලනු | මැන |

(නවලෝකයඃ 1953, ජූනි, පි.67)

සෝවියට් දේශය ප්‍රමුඛ නැඟෙනහිර යුරෝපීය සමාජවාදී කඳවුර ශක්තිමත් ව පැවැති කාල වකවානුවේ, බලගතු අන්තර්ජාතික සංවිධාන බවට පත් ව තිබූ, අප්‍රිකා-ආසියා ලේඛකයන්ගේ සංවිධානය, අප්‍රිකා-ආසියා සහයෝගිතා සංවිධානය සහ සෝවියට්-ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමය වැනි සංවිධානවල වැඩකටයුතු පිළිබඳ තොරතුරු බෙද හැරීමේ ප්‍රධාන මාධ්‍යය බවට - 'නවලෝකය' පත් ව තිබිණි. හැම විට ම සඟරාවේ ඉඩකඩ මේ සංවිධාන සඳහා වෙන් වී තිබීම විශේෂත්වයකි.

එවකට සෝවියට් සංගමයේ ආසියා-අප්‍රිකා සහයෝගතා කමිටුවේ විධායක ලේකම්, ඩිමීත්‍රී ඩොලිඩියේ විසින් ලියන ලද



ලිපිවල සිංහල පරිවර්තන ගණනාවක් 'නවලෝකය' සඟරාවේ වරින් වර පළවිය. "ජාතික විමුක්ති අරගලය හා සහයෝගිතා ව්‍යාපාරය" යන හිසින් යුතු ලිපියේ ඩිමිත්‍රි මෙසේ සඳහන් කැර ඇතඃ "1950 පසුභාගයේ පටන් අප්‍රිකානු ජනතාව ස්වකීය යටත් විජිත විරෝධී සටනෙහි විශාල ජයග්‍රහණයක් අත්කර ගනිමින් සිටිති. එක්සත් අරාබි ජනරජයේ, ඝානා, ගිනියා, චිලි, ටැන්සිනියා, උගන්ඩා හා කියෝ යන රටවල ජනතාවන් කළ වීරෝදාර සටන් ස්වාධීනත්වය දිනා ගැනීමෙන් කෙළවර විය.

ප්‍රංශ යටත් විජිතවාදීන්ට විරුද්ධව සත් අවුරුද්දක් තිස්සේ නිර්භීත ඇල්ජීරියානු ජනතාව ගෙනගිය සටන ජයග්‍රහණයෙන් කෙළවර වීම - අධිරාජ්‍යවාදීන්ගේ යටත් විජිත ප්‍රතිපත්තියට වැදුණු තවත් තදබල පහරක් විය.

යටත් විජිතවාදය මිහිපිටින් සම්පූර්ණයෙන් අතුගා දැමීම සඳහාත්, අධිරාජ්‍යවාදී ග්‍රහණයෙන් විමුක්තිය ලබා ගැනීම සඳහාත් ජනතාවන් ගෙන යන සටන ශක්තිමත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආසියාවේ හා අප්‍රිකාවේ ජනතාවගේ සහයෝගිතා ව්‍යාපාරය බිහි විය. ''(නවලෝකයඃ 1966 ජනවාරි, පි.17-18)

මේ සමඟ ම ප්‍රගතිශීලී මතධාරී තරුණ ලේඛකයන්ට 'නවලෝකය' දෙර විවෘත කැර තිබූ අතර, ඔවුන් සිය ලේඛන දිවියේ අත්පොත ලෙස තබා ගත්තේ මේ සඟරාව යි.

'නවලෝකය' අනුගමනය කළ ප්‍රධාන ප්‍රතිපත්තියක් වූයේ අන්තර්ජාතික දේශපාලන ක්‍රියාවලිය කෙරෙහි සිංහල පාඨකයා නිරන්තරයෙන් උනන්දු කිරීම යි. මෙයට ප්‍රධාන හේතුව වූයේ දේශිය පුවත්පත්, දේශීය ප්‍රශ්න කෙරෙහි පමණක් යොමු වී සිටීම යි. අනික් අතින් බලන කල, එවකට දේශපාලන පක්ෂ සහ බලපෑම් කරන කණ්ඩායම් අන්තර්ජාතික ප්‍රශ්න කෙරෙහි විශේෂ උනන්දුවක් දැක්වීම යි. මේ නිසා ම සිංහල පුවත්පත් අන්තර්ජාතික ප්‍රශ්න කෙරෙහි විශේෂ (අඩු) අවධානයක් යොමු නොකළේ ය. මේ පසුබිම තුළ කාලීන අන්තර්ජාතික කටයුතු පිළිබඳ ප්‍රවෘත්ති රැගෙන එමින් එළි දැක්වූ 'නවලෝකය' සඟරාව ආසියාවේ හා අප්‍රිකාවේ තරුණ කොටස්වල පිබිදීමක් ඇති කැරලීමට සමත් වූ සන්නිවේදකයෙක් විය.

මේ වන විට ආසියා හා අප්‍රිකා ජනතාව නිදහස් සටන් හා පශ්චාත් නිදහස් උපක්‍රම ඔස්සේ පිබිදෙන රටවල සංවර්ධන ක්‍රියාවලියන්ට බලපෑම් එල්ල කෙළේය. විශේෂයෙන් 'නවලෝකය' සඟරාව මේ උපක්‍රම නිරන්තරයෙන් ප්‍රදර්ශනය කරමින් අන්තර්ජාතික කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ තෘප්තිමත් නොවන ආසාවකින් පෙළුණු ශ්‍රී ලාංකික පාඨක නව පරපුරට මහත් අස්වැසිල්ලක් ගෙන දුන්නේය. මේ පාඨක පිරිස් රට පුරා ගොඩ නඟා ගැනීම සඳහාත්, ඔවුන් මාක්ස්-ලෙනින්වාදී දෘෂ්ටියෙන් පෝෂණය කිරීම සඳහාත් නිරන්තර වෑයමක යෙදී ඇති බව කිව යුතු ය. විශේෂයෙන් 1941 'නවලෝකය' ආරම්භ වූ මොහොතේ සිට සරණංකර හිමියන් ප්‍රගතිශීලී තරුණ ලේඛකයන්ට සිය ලේඛන හැකියාවන් ඔප මට්ටම් කැර ගැනීමට ඉඩකඩ සලසා දුන් බව රහසක් නොවේ. මේ නිසා ශ්‍රී ලංකාව පුරා සිටි, සමාජවාදී සමාජයක් සඳහා දෑඩි විශ්වාසයකින් කටයුතු කළ තරුණ-තරුණියෝ 'නවලෝකය' වැලඳ ගැනීමට පසුබට නොවූහ. වැඩි කලක් යෑමට මත්තෙන් 'නවලෝකය' තරුණ-තරුණියන්ගේ දැනුම ප්‍රගුණ කරන විශ්වවිද්‍යාලයක් බවට පත් විය. එසේ ම, විවිධ විෂයයන් ඔස්සේ සිය නිර්මාණ සමාජ ගත කළ මේ තරුණ පිරිස්, දේශපාලනය, සාහිත්‍ය, කලාව, විදේශ ප්‍රතිපත්ති, විදේශ අත්දැකීම් පිළිබඳ ව සිංහල පාඨකයා දැනුම්වත් කිරීමට තරම් බලසම්පන්න වූ හ. නිදසුනක් වශයෙන් 'සුද්දන්ගේ වතු ගොවීන්ට බෙදා දිය යුතුයි' යන හිසින් යුතුව වලපනයේ ගොවි සංගමයේ ලේකම්ව සිටි කේ.බී. හේරත් 'නවලෝකයට' ලියා තිබූ දේශපාලන ලිපියක මෙසේ සඳහන් වෙයි. ''අධිරාජ්‍යවාදයෙන් හා විදේශීය පාලනයෙන් මිදී ශ්‍රී ලංකාවේ ඉරණම විසඳා ගැනීමට නම් ජාතියේ සෑම කොට්ඨාසයක්ම අයොමය සමගියක පිහිටා එක්සත් ජාතික පෙරමුණක් ගොඩනැංවිය යුතුයි. අපේ ඉරණම රඳා පවත්නේ ජාතියේ සංවිධානාත්මක බලය උඩ ය'' (නවලෝකය: 1947 ජූනි, පි.55)

මේ අනුව බලන විට සිංහල උගත් පිරිස් අතර, සාකච්ඡා උත්පාදනය කිරීමේ අරමුණින් විවිධ පැතිකඩ ඔස්සේ දේශීය ප්‍රශ්න 'නවලෝකය' මඟින් ප්‍රචාරය කළ අවස්ථා බහුල විය. විදේශ ප්‍රතිපත්තිය සැකසීමේ දී දේශීය ලාභ ප්‍රයෝජනයේ ඇති



වැදගත්කම 'නවලෝකය' මඟින් අවධාරණය කෙරිණි. එවකට පැවැති ආණ්ඩුවල විදේශ ප්‍රතිපත්ති හා ඉරියව් විචාරාත්මක ලෙස ඇගයීමට ද ලක් කෙළේය. විශේෂයෙන් ම 1948 ලැබුණු දේශපාලන නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය බොහෝ දුරට මාක්ස්වාදී පක්ෂවල සහ ප්‍රගතිශීලී කොටස්වල බලපෑමට ලක් වූ බව කියන අදහස කිසිවකුගේ අභියෝගයට ලක් නොවිණි. බලයට පැමිණි ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු යථාර්ථවාදී විදේශ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට සමත් වූයේ මෙකී පදනම මත සිටි නිසා ය. එම ප්‍රතිපත්තියේ මුල් ගල වුණේ ජාතික ලාභ ප්‍රයෝජනය සහ අසල්වැසි ඉන්දියාව සමඟ සබඳතාව යි. 'නවලෝකය' සඟරාවේ ලිපි කිපයක් මඟින් මේ අදහස අවධාරණය කිරීම විශේෂත්වයකි. තව ද චීනය සමඟ මිත්‍ර සබඳතා හොඳින් පවත්වා ගෙන යෑම 'නවලෝකය' අවධාරණය කළ අතර, එය ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තියේ වැදගත් අංගයක් බව ද පෙන්වා දුන් අවස්ථා තිබිණි. ශ්‍රී ලංකා-චීන සබඳතාවල ශක්තිය සිංහල පාඨකයාට පෙන්වීම සඳහා 'නවලෝක' කතුවරයා වූ සරණංකර හිමියෝ විටින් විට ලිපි රැසක් පළ කළ හ. ඒ අතර ''නව චීනයේ නව ජීවිතය'' යන මැයෙන් උන්වහන්සේ විසින් ලියන ලද පොත් පිංච වැදගත් තැනක් ගනී. චීනයේ ඉතිහාසය, වර්තමානය සහ අනාගතය පිළිබඳ ව මෙම කෘතියෙන් කියැවෙයි. පසු කලක ''චීනය කොයිබට ද'' යන හිසින් කතුවැකියක් ලියන සරණංකර හිමියන් එහි මෙසේ ද සඳහන් කොට තිබිණි.

"චීනය අධිරාජ්‍ය රදල ධනපති පීඩනයෙන් නිදහස්ව මහජන රජයක් පිහිටුවත්ම ලෝකවාසී ප්‍රගතිවාදී ජනතාවන් තුළ ඇති වූයේ ලොකු බලාපොරොත්තුවකි. චීනය හා ඉන්දියාවත් අනික් ආසියාතික රටවලුත් නිදහස ලැබීමෙන් පසු සමඟි මාර්ගයේ ඉදිරියට යාමෙන් ආසියාවේ සියලුම අධිරාජ්‍යවාදීන්ගේ සෙල්ලම් අවසාන වේ යැයි සිතූහ. චීනයත්, ඉන්දියාවත් ඊළඟට පංචශීල ප්‍රතිපත්තිය ලොවට ප්‍රකාශ කරමින් ලෝකවාසී ප්‍රගතිවාදීන්ගේ බලාපොරොත්තු තව තවත් තර කෙළේය'' (නවලෝකය: 1965, ඔක්තෝබර්, පි.01).

'නවලෝකය' සඟරාවේ තවත් ඍජු ප්‍රතිපත්තියක් වූයේ කාලීන වැදගත්කමකින් යුත් විචාර ලිපි නිතර නිතර පළ කිරීම

යි. මෙරට ඇතැම් සමාජ කණ්ඩායම්වලට, සංවිධානවලට සෘජු ව පිළිතුරු දීම 'නවලෝකය' කතුවරයාගේ සිරිතක් වී තිබිණි. සිය නාමය පාවිච්චි කැර හෝ නොකැර ආරූඪ නමකින් හෝ විවේචනාත්මක ලිපි පළ කිරීමට සරණංකර හිමියන් පසුබට වී නැත. වරක "පෝප්තුමාත් ස්ටාලින් වෙනුවෙන් යාච්ඤා පැවැත්වූහ" යන හිසින් යුතු ලිපියට, උන්වහන්සේ "භක්තිමත් කතෝලිකයා" යන ආරූඪ නම භාවිත කැර තිබේ. එම ලිපියේ එක තැනක මෙසේ සඳහන් වෙයි. "ස්ටාලින්ගේ අසනීපය සැළ වූ කෙණෙහි ඔහුට සුවපතා යාච්ඤා කළ පෝප්තුමා ස්ටාලින්ගේ මරණය අසා කොතරම් කම්පා වී ද යත්, ඒ විගසින්ම පෞද්ගලික පූජ්‍යස්ථානය කරා පැමිණ, ස්ටාලින්ගේ ආත්මය වෙනුවෙන් යාච්ඤා පැවැත්වූ බවද කියා තිබේ. ශුඬ වූ කතෝලික සභාවේ නායකත්වය මෙබඳු නමුත්, මෙරට කතෝලික පූජක සභාව ස්ටාලින්ගේ අසනීපයවත්, මරණයවත් ගැන කිසිම සඳහනක් හෝ කර නැත්තේය. ඒ ඇයි. මෙරට ඇත්තේ කතෝලික පූජක දෙපාර්තමේන්තුවක් මිස ශුඬ වූ කතෝලික සභාව හා සම්බන්ධ අවංක සංස්ථාවක් නොවන බැවිනි" (නවලෝකයඃ 1953 මැයි, පි.41).

'නවලෝකය' සඟරාව පළ කළ කිසි ම ලිපියක්, කවියක්, නිසඳසක් ධනවාදය හෝ අධිරාජ්‍යවාදය හෝ ඉස්මතු වන ආකාරයේ ඒවා නොවීම විශේෂත්වයකි. සමාජවාදය කේන්ද්‍ර කැර ගනිමින්, පවතින සමාජය විවේචනය කිරීම, පැකිලීමකින් තොර ව කළ බව ඉහත පැහැදිලි කිරීම්වලින් ද පෙනී යන කරුණකි. විශේෂයෙන් - ධනවාදී කඳවුර විසින් සමාජවාදය පිළිබඳ ව කරනු ලබන විග්‍රහයන් නිෂේධ කිරීම සඳහා රුසියානු ලේඛකයන්ගේ දේශපාලන ලිපි සිංහල බසට පරිවර්තනය කිරීම සාමාන්‍ය දෙයක් බවට පත් කැර ගත් අවස්ථා තිබිණි. "මාක්ස්වාදය අපරාජිතයි" යනුවෙන් බොරිස් ලිනොට්යිව් විසින් ලියන ලද න්‍යායාත්මක දේශපාලන ලිපිය පළ කිරීම කැපී පෙනෙන සිද්ධියකි. බොරිස් විසින් ලියන ලද දීර්ඝ ලිපියේ එක් තැනක මෙසේ සඳහන් වෙයිඃ "මාක්ස්වාදය විද්‍යාත්මක ප්‍රගතියේ ප්‍රධාන මාවතෙන් ඈත් වී එළි නොදුටුවේය. එහෙත් එය විද්‍යාවේ සියලු ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයන්



තවදුරටත් ඉදිරියට ගෙනයන්නකු වශයෙන් පෙරට ආවේ ය. ජර්මන් දර්ශනවාදයත්, බ්‍රිතාන්‍ය දේශපාලන ආර්ථිකයත්, ප්‍රංශයේ මනඃකල්පිත සමාජවාදයත් එකතු කොට ඒවා විමර්ශනය කිරීමෙන් හා තවදුරටත් වර්ධනය කිරීමෙන් මාක්ස්වාදය සකස් වූ බව කවුරුත් දනිති. මෙහි ප්‍රතිඵලය වූයේ මාක්ස්-එංගල්ස්-ලෙනින්ගේ ද්වන්ද්වාත්මක භෞතිකවාදී දර්ශනවාදය බිහි වීමය. විද්‍යාත්මක දේශපාලන ආර්ථිකය හා විද්‍යාත්මක සමාජවාදය බිහි වීමයි" (නවලෝකයඃ1968 ජූනි, පි.39).

'නවලෝකය', සඟරාවේ මාක්ස්-ලෙනින්වාදී න්‍යායාත්මක පදනම ගැන තව දුරටත් විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ, මිනිසාගේ පරිණාමය හා සූරා කෑමේ ස්වභාවය පාඨකයාට පැහැදිලි කැර දීමට නිරන්තර උත්සාහයක් ගෙන ඇති බව යි. විශේෂයෙන් ඈත අතීතයේ සිට ම ධනවතුන් හා ඔවුන්ට ගැතිකම් කරන්නන් විසින් ද, සූරා කෑම යුක්ති යුක්ත කොට දැක්වීම සඳහා නොයෙකුත් කරුණු ගෙන හැර දක්වා තිබේ. ඔවුහු දැනුදු එසේ කරති. ඔවුන් ගසා කන අන්දමත්, වැඩ කරන ජනතාවගේ දුප්පත්කම හා දුක්ඛිත තත්ත්වය තුළින් ධනය උපයන අන්දමත් එළිදරවු වන්නට ඉඩ හැරීම ඔවුන්ගේ වාසිය පිණිස නොයෙදෙන බව 'නවලෝකය' සිය මාක්ස්වාදී විග්‍රහවල දී පෙන්වාදීමට උත්සාහ කැර තිබේ. එපමණක් නොව, ශතවර්ෂ ගණනාවක් තිස්සේ නිදහස පතා අවංක ව සටන් කළ කොතෙකුත් පුද්ගලයෝ සූරා කෑමේ රහස් අවබෝධ කැර ගැනීමට හා එය ක්‍රියාත්මක වන අයුරු සොයා ගැනීමටත්, මිනිසා මෙම ශාපයෙන් මුදවාගන්නා මං සෙවීමටත් අවංක උත්සාහයක් දැරූ අන්දම පැහැදිලි කිරීමට 'නවලෝකය' කතුවරයා වැර දරා ඇති බව ඉතා පැහැදිලි ය. එහෙත් ප්‍රධාන කාරණය වන්නේ බොහෝ කලක් යන තුරු මෙම ප්‍රයත්නයන් පල නොදැරීම යි. රහස, රහසක් ලෙසින් ම තිබුණු අතර, සූරා කෑම පිටු දැකීමට තරම් වැඩ කරන ජනතාවගේ තෙරක් නැති අරගලය අසමත් විය. එහෙත් සූරා කෑම එලෙසින් ම පැවති බවත්, සිදු වූ එක ම දෙය නම් එක් සූරා කෑමේ ක්‍රමයක් වෙනුවට වෙනත් සූරා කෑමේ ක්‍රමයක් ඇති වීම බවත් 'නවලෝකය' කතුවරයා විග්‍රහ කරයි.

අවුරුදු සිය ගණනකට පමණ ඉහත දී, මිනිස් සමාජයේ ඉතිහාස පිරික්සීමෙහි යෙදුණු කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස් සමාජය වැඩී යෑමේ ස්වාභාවික නියමයන් සොයා ගත්හ. පන්තීන්ගේ ප්‍රභවය මැනවින් අවබෝධ කැර ගත් ඔවුහු එනයින් සමස්ත මිනිස් වර්ගයාගේ ඉතිහාසය නම්, පන්ති සටනේ ඉතිහාසය ම බව ඔප්පු කළහ. පළමු වරට මිනිසකු තවත් මිනිසකු සූරා කෑමේ 'රහස' එළිදරවු කෙළේත්, එය තුරන් කිරීමේ මාර්ග පෙන්නුම් කෙළේත් මාක්ස් හා එංගල්ස් බව පැහැදිලි කැර දීමට 'නවලෝකය' ආරම්භයේ සිට අවසානය තෙක් ම උත්සාහ කළ බවක් දක්නට ලැබේ.

ව්ලැඩිමීර් ලෙනින් මෙම අරමුණු ඉදිරියට ගෙන ගියේය. කාල් මාක්ස්ගේ හා එංගල්ස්ගේ අභාවයෙන් පසු, ලෙනින් ඔවුන්ගේ ඉගැන්වීම් අධිරාජ්‍යවාදීන්ට, ධනපති අදහස් දරන්නවුන්ට විකෘති කිරීමට කිසි සේත් ඉඩ නොතබා, රැක ගත්තේය. එසේ ම එම ඉගැන්වීම් වැඩි දුරටත් සංවර්ධනය කළ ලෙනින්, එහි විවිධ අංශ පැහැදිලි කරමින් ඒවා අලුත් තත්ත්වයන්ට ගැළපෙන සේ සකස් කළ බව අප හොඳින් දන්නා කරුණකි. එහෙත් මෙය විප්ලවය වෙනුවෙන් ලෙනින්ගෙන් වූ සේවයේ එක් කොටසක් බව පැහැදිලි කෙළේය. ඔහු, ආරම්භ කළ 'කොමියුනිස්ට් පක්ෂය' ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය මඟින් ධනපතියන්ගේ හා ඉඩම් හිමියන්ගේ සූරා කෑම මුලිනුපුටා දමා අවසානයේ සියලු ම අන්දමේ සූරා කෑම් සහමුලින් ම අහෝසි කැර, රුසියාවේ වැඩ කරන ජනතාව ජයග්‍රහණය කරා මෙහෙයවූ ආකාරය 'නවලෝකය' පාඨකයාට හැම විට ම පැහැදිලි කැර දුන්නේය.

මාක්ස්ගේ ඉගැන්වීම් වඩාත් හොඳින් පාඨකයා අතර සන්නිවේදනය කිරීමේ අරමුණින් 'ලංකා කොමියුනිස්ට් පක්ෂය' ප්‍රකාශයට පත් කළ "මිනිසා විසින් මිනිසා සූරා කනු ලැබීම අහෝසි කළ හැටි" කෘතියේ ඇතැම් කොටස්, 'නවලෝකය' මඟින් ද ප්‍රකාශයට පත් කළ අවස්ථා තිබිණි. නිදසුනක් නම්, ''මිනිස් සමාජය ආරම්භ වූ අවදියේ දී සූරාකෑමක් නොවීය. දුප්පත් පොහොසත් හා සේවක සේව්‍ය වශයෙන් බෙදීමක් නොවීය. එකල මිනිසාට තිබුණේ, තම පැවැත්ම සඳහා ස්වභාව ධර්මයේ බලවේගයන්ට විරුද්ධ ව සටන් කරනු පිණිස හැම ශක්තියක්ම



යෙදවීම යි. ඔහු තම වැඩ කටයුතු සඳහා භාවිත කළ උපකරණ නොදියුණු ඒවා විය. ආදිකාලීන සමාජයේ ජීවත් වූ එම මිනිසාට තමන්ගේ අවශ්‍යකම් ඉටු කරනු පිණිස (පලතුරු ගෙඩි ආදිය එකතු කැර ගැනීම, මසුන් ඇල්ලීම, වන සතුන් දඩයම් කැර ගැනීම හෝ වාසස්ථාන ඉදි කැර ගැනීම) එක් ව සාමූහික වශයෙන් වැඩ කිරීමට සිදු විය. ගලින් තැනූ පොරොව, හීමුණ සහිත හිය, ගල් පතුරකින් තැනූ තලය සහිත හෙල්ල ආදි තමන් සතු ව පැවැති ආයුධවලින් තනි ව ම සතුන් දඩයම් කර ගැනීමට හෝ වෙනත් කටයුත්තක යෙදීමට හෝ ආදි කාලීන මිනිසාට නොහැකි විය. එම අවදියේ දී දිවි පැවැත්ම සඳහා සාමූහික වශයෙන් ශ්‍රමය යෙදවීම, එක් ව කටයුතු කිරීම අවශ්‍යතම දෙයක් විය. ඇතැමකුට ඉහළින් තමෙවකකු නැගී සිටීමට ඉඩ නොතැබූ මෙම සාමූහික ක්‍රමය මිනිසුන් අතර සමානත්වයේ පදනම වූයේය.

සාමූහික වශයෙන් ශ්‍රමය වැය කිරීම හෙවත්, වැඩ කටයුතු යෙදීම නිසා ඒ සඳහා යොදගත් උපකරණ ද කාටත් සම සේ අයිති විය. ඒවා අයත් වූයේ තනි තනි පුද්ගලයන්ට නො ව, මුළු සමාජයට ම ය. එබඳු තත්ත්වයක් යටතේ නිෂ්පාදිත කවරක් නමුත් පුද්ගලයන්ට නො ව මුළු සමාජයට ම අයත් පොදු දේපළ වූ බව හොඳින් පැහැදිලි ය. ඒ අනුව, එම වකවනුවේ දී ශ්‍රමය වැය කොට නිෂ්පාදිත දේ හෝ නිෂ්පාදන මාර්ග ද පෞද්ගලික දේපළ අයිතියට යටත් නොවුවා මෙන් ම, එසේ වීමට පුළුවන්කමක් ද තිබුණේ නැත.

ආදිකාලීන සමාජය සෙමෙන් වුව ද නොකඩවා සංවර්ධන විය. මිනිසා ක්‍රමයෙන් සතුන් හීලෑ කිරීමට පුරුදු වූ අතර, මිනිසුන්ගේ මෙහෙයට පත් ගවයෝ ඇති වූහ. දඩයම් කිරීමෙන් ලද ප්‍රමාණයට වඩා හීලෑ කරන ලද සතුන්ගෙන් ලැබුණු නිෂ්පාදන ප්‍රමාණය අධික විය. සත්ත්ව ලෝම හා කිරි වැනි අලුත් නිෂ්පාදන සුලභ විය.

මිනිසා යකඩ, ලෝකඩ හා තඹ ද උණු කරන හැටි උගත්තේ ය. ඒ අනුව පැරණි ගල් ආයුධ වෙනුවට ලෝහයෙන් තැනුණු පොරෝ, නඟුල් දත්, හෙල්ල හා හී මුණු ආදිය ද අනුක්‍රමයෙන් භාවිතයට පත් විය. ලෝහ උපකරණ භාවිතයෙන් නිෂ්පාදනයේ

දී ලැබූ ප්‍රතිඵල පෙරට වඩා සැලකිය යුතු තරමින් වැඩි විය. වැඩ කිරීමේ දී අවශ්‍ය උපකරණ තැනීමටත්, නිවාස ඉදි කිරීමට හා එදිනෙදා ජීවිතයට අවශ්‍ය බඩු බාහිරාදිය සෑදීමටත් නිතර නිතර අවශ්‍ය වීම නිසා හස්ත කර්මාන්තය දියුණු විය. ශ්‍රම ඵලදාව වැඩිවීම නිසා සමාජය විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ප්‍රමාණය ද වැඩි විය. අතීතයේ දී නිෂ්පාදනය කළ ප්‍රමාණය එම සමාජයේ සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා වුව නොසෑහුණු නමුත්, නිෂ්පාදනය වැඩි වීමත් සමඟ අවශ්‍ය පමණටත් වඩා ද්‍රව්‍ය නිපදවන්නට විය. පමණට වඩා නිෂ්පාදනය කිරීම නිසා මෙසේ ඉතිරි වූ සම්, ලෝම, මස් ආදි ද්‍රව්‍ය වෙනත් ජන සමූහයක් සමඟ ධාන්‍ය වර්ග ලබා ගැනීම සඳහා හුවමාරු කර ගැනීමට හැකි විය. එඬේරකමින් ජීවත් වූ ජන සමූහ සතුන් ඇති කරමින් නිපද වූ දෑ කෘෂිකාර්මික ද්‍රව්‍ය නිෂ්පාදනවලට හුවමාරු කර ගත්හ. හස්ත කර්මාන්ත දියුණු වීමෙන් ජන සමූහයන් අතරත්, එසේ ම ඒ එක් එක් ජන සමූහය තුළත් තව දුරට ශ්‍රමය වෙනස්, වෙනස් කටයුතු සඳහා යෙදවීම (ශ්‍රම විභජනය) බහුල විය.

සූරා කෑම ඇති වූ අයුරු හා ඊට හේතු - වඩාත් ප්‍රබල උපකරණ පරිහරණය කිරීම නිසා, තනි තනි ව ලොකු සතුන් දඩයම් කිරීමටත්, තනි තනි ව ගොවිතැන් කිරීමටත් මිනිසාට හැකි විය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් සාමූහික දේපළ අයිතිය බිඳ වැටෙන්නට විය. ඒ වෙනුවට නිෂ්පාදන මාර්ගවල (උපකරණවල) පුද්ගල අයිතිය ඇති වීමෙන් ඒවා මුළු සමාජයට ම නො ව තනි පුද්ගලයන් අතට පත් විය. නිෂ්පාදන මාර්ග පෞද්ගලික අයිතියට නතු වීම නිසා, අනිවාර්යයෙන් ම නිෂ්පාදිත ද්‍රව්‍යයේ ද පෞද්ගලික අයිතිය ඇති විය. එක් පුද්ගලයකුට තමන්ගේ අවශ්‍යතාවන්ට සරිලන ප්‍රමාණයට වඩා නිෂ්පාදනය කිරීමට හැකි වන තරම් නිෂ්පාදනය දියුණු වීමත් සමඟ ම, එසේ ඉතිරි ද්‍රව්‍ය තමන්ට අවශ්‍ය වෙනත් දේ ලබා ගැනීම සඳහා, සමාජයේ සම්බන්ධකමක් නැති ව, තනි ව ම වෙනත් කෙනෙකු සමඟ හුවමාරු කර ගැනීමට ඔහුට හැකි විය. සමාජයේ හා පුද්ගලයන්ගේ අපේක්ෂා අනුක්‍රමයෙන් එකිනෙකට වෙනස් දිසාවලට යොමු විය.



නිෂ්පාදන මාර්ග අයිති කරගත්, සමාජයේ තනි පුද්ගලයන් විසින්, තමන්ගේ ශ්‍රමයෙහි ප්‍රතිඵල මෙන් ම අනුන්ගේ ශ්‍රමයෙහි ප්‍රතිඵලවලින් කොටසක් ද අත්කර ගැනුම ආරම්භ කරන ලදි. එනයින් දේපළ අයිතිය පිළිබඳ අසමානත්වය පහළ වූ අතර, දුප්පත් පොහොසත් යනුවෙන් දෙකොටසක් ඇති විය. නිෂ්පාදන මාර්ග පෞද්ගලික අයිතියට නතු වීම නිසා මිනිසා විසින් මිනිසා සූරා කනු ලැබීම ඇරඹිණි.

නිෂ්පාදන දියුණු වීමෙන් නිෂ්පාදන මාර්ග පෞද්ගලික අයිතියට නතු වීමත්, පෞද්ගලික දේපළ අයිතිය නිසා දේපළ හිමි හා දේපළ අහිමි යනුවෙන් පන්තීන් පහළ වීමත් මෙසේ සිදු විය. මෙහි දී දේපළ හිමි පන්තිය විසින් දේපළ අහිමි පන්තියේ ශ්‍රමයෙහි ප්‍රතිඵල අත්පත් කර ගන්නා ලදි. එක් පන්තියක ශ්‍රමයෙහි ප්‍රතිඵල තවත් පන්තියක් විසින් උදුරා ගනු ලැබීම මෙනයින් ලද සූරා කෑමෙහි හරය වෙයි.

සූරා කෑමට හැකි වන්නේ නිෂ්පාදන මාර්ග පෞද්ගලික අයිතියට නතු ව පවත්නා සමාජයක් තුළ පමණකි. නිෂ්පාදන මාර්ග පෞද්ගලික අයිතියට නතු ව තිබීම සූරා කෑම ඇති වීමටත් සූරා කන සමාජ ක්‍රමවලටත් අනිවාර්යයෙන් ම හේතු විය. මිනිස් වර්ගයාගේ ඉතිහාසය සෙවීමේ දී එබඳු සමාජ තුනක් දක්නට ලැබේ. වහල් හිමි සමාජය, වැඩවසම් සමාජය හා ධනවාදී සමාජය ඒ තුන වෙයි" (නවලෝකය : 1967 දෙසැම්බර්, පි. 356, 357, 358) යන්න යි.

සරණංකර හිමියන් 'නවලෝකය' සඟරාවට ලිපි තෝරා ගැනීමේ දී, හැම විට ම දේශපාලන දෘෂ්ටිවාදයකින් කටයුතු කළ බව රහසක් නොවේ. ඊට ප්‍රධාන වශයෙන් බලපෑවේ මාක්ස්-ලෙනින්වාදී දෘෂ්ටියේ පදනම බව කිව යුතු ය. මේ තත්ත්වය නිසා සමාජයේ මතු වී ඇති, එමෙන් ම මතු වෙමින් එන ගැටලු මනා ලෙස අධ්‍යයනය කැර විකල්ප මාර්ග යෝජනා කිරීම 'නවලෝකය' මඟින් දක්නට ලැබුණු පොදු ලක්ෂණයක් විය. විශේෂයෙන් සමාජවාදී අදහස් සමාජගත කිරීම සඳහා 'නවලෝකය' දැරූ සන්නිවේදන දයකත්වය අඩුවෙන් තක්සේරු කළ නොහැකි ය.

1815 මාර්තු 2 වැනි ද ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට යටත් වීම සිහි ගන්වමින් 'නවලෝකය' 1967 මාර්තු කලාපයේ කතුවැකියක් ලියා තිබිණි. වෙනත් ලිපි ලේඛන මෙන් ම මෙම, කතුවැකියේ බස්වහර ද රැඩිකල් ස්වරූපයක් ගෙන තිබීම විශේෂත්වයකි. එම කතුවැකියේ එක තැනක මෙසේ සඳහන් වී තිබිණි.

"අධිරාජ්‍යවාදී ධනවැද්දන්ගේ හා දේශීය ධනේශ්වර පන්තියේ සල්ලාලයන්ගේ ග්‍රහණයෙන් අප මාතෘභූමිය මුදාගෙන අපේ සුන්දරතම අනාගතය සිහිකරවන සමාජවාදය වෙත මෙරට ජනතාව මෙහෙයැවීමේ පරම අභිලාෂයෙන් හා මහඟු අදිටනින් නැඟී සිටින ලෙස අපි ජාතික ශෝක දිනයේදී යළිත් වරක් මෙරට දේශප්‍රේමී ජනතාවට ආයාචනය කර සිටිමු.'' (නවලෝකයඃ 1967, මාර්තු, පි.93)

මෙයින් පැහැදිලි වන්නේ 'නවලෝකයේ' සැබෑ දේශපාලන දෘෂ්ටිය යි. සඟරාව පටන් ගත් දිනයේ සිට එය නැවතී යන තුරු ම එක ම ආකාරයෙන් එම දෘෂ්ටිය හා බස් වහර පැවැතීම විශේෂත්වයකි. නිදසුනක් වශයෙන් "සුද්දන්ගේ වතු ගොවීන්ට බෙදා දිය යුතුයි" යන හිසින් පළ වූ ලිපියේ එක තැනක මෙසේ සඳහන් ව තිබේ.

"කදිම මංකොල්ලයකි. දේශප්‍රේමීයෙනි! තරුණයිනි! ගොවියෙනි! අවදිවව්! අද ලෝකයේ නිදහස සඳහා සටන් කරන්නවුන් දෙස බලා ලාංකික ගොවීන්ගේ අතීත එඩිතරකම් ගැන සිතා ජාති ආලයෙන් පුබුදු වී පෙරමුණු ගනිව්!" (නවලෝකයඃ 1947 ජූනි, පි.55)

කෙසේ නමුත් 'නවලෝකය' සඟරාවෙන් සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික යන අංශ කෙරෙහි පාඨක අවධානය යොමු කිරීමට අමතර ව, 'කාටූන්' නිර්මාණ හා 'ඡායාරූප' කෙරෙහි පාඨක අවධානය යොමු කිරීමට සරණංකර හිමියන් උත්සහයක් ගත් බව කිව යුතු ය. ඇතැම් සඟරාවල මුල් පිටකවරයේ හා ඇතුළු පිටුවල කාටූන් හා ඡායාරූප පළ වී ඇති අතර, ඒ සැම දෙයකින් ම අධිරාජ්‍යවාදයට හෝ ධනවාදයට හෝ



එරෙහි වන දේශපාලන අර්ථයක් සමාජගත කිරීමට උත්සාහ දරා තිබීම විශේෂත්වයකි.

'නවලෝකය' 1953 මාර්තු කලාපයේ මුල් පිටුවේ පළ වී තිබූ ඡායාරූප විස්තරයෙන් පැහැදිලි කැර ඇත්තේ චීනයෙන් ශ්‍රී ලංකාවට ලැබුණු පළමු හාල් තොගය, ආර්.පී. සේනානායක මහතා ඇතුළු පිරිස භාරගත් අන්දම යි. තව දුරටත්, එමඟින් කියා ඇත්තේ අමෙරිකානු අධිරාජ්‍යවාදීන් මේ හාල් තොගය ශ්‍රී ලංකාවට ගෙන්වීම වළක්වාලීමටත්, ලක්වැසි ජනතාව හාමතේ තැබීමටත් උත්සාහ කැර ඇති අන්දම පිළිබඳ ව ය.

එම වසරේ ම 'නවලෝකය' අප්‍රේල් කලාපයේ මුල් පිටකවරයේ, ස්ටාලින්ගේ ඡායාරූපයක් පළ කැර තිබේ. සෝවියට් දේශයේ චිත්‍ර ශිල්පියකු විසින් අඳින ලදැයි සිතිය හැකි, සිත් ගන්නා සුලු මේ ඡායාරූපයට යොදා ඇති සිරස්තලයේ මෙසේ සඳහන් කැර ඇත.

"ලෝක සාම ව්‍යාපාරයේ පිතෘවර
ජේ.වී. ස්ටාලින්
උපන්නේ 1879 පරලොව ගියේ 1953"

ස්ටාලින් සම්බන්ධ ව විටින් විට 'නවලෝකය' සඟරා කලාපවල ලිපි පළ වුව ද, 1953 අප්‍රේල් කලාපයේ මුල් පිට කවරයේ ඡායාරූපයක් පළ කිරීමට හේතු වී ඇත්තේ ඔහුගේ 73 වැනි අවුරුද්ද සිහි කැරලීම ය. එම සිහි කැරලීමට සමගාමී ව ස්ටාලින්ගේ ජීවිතය, දේශපාලනය සහ අන්තර්ජාතික ක්‍රියාකාරීත්වය සම්බන්ධ ලිපි මෙම කලාපයේ පළ වී තිබීම විශේෂත්වයකි.

විටින් විට 'නවලෝකය' කතුවරයා, මාක්ස්, එංගල්ස්, ලෙනින් හා ස්ටාලින් වැනි නායකයන්ගේ චරිත පිළිබඳ වත්, ඔවුන් සමාජගත කළ දර්ශනය පිළිබඳ වත් පාඨකයා දැනුම්වත් කිරීමට පෙරමුණු ගත් බව ඉතා පැහැදිලි ය.

නිදසුනක් වශයෙන්, සෝවියට් දේශයේ අගමැතිවරයකු ව සිටි, ජී.ඇම්. මැලන්කොව්, ස්ටාලින්ගේ 70 වැනි ජන්මෝත්සව දිනයේ ලියන ලද ලිපියක් සිංහල භාෂාවට පරිවර්තනය කොට,

1953 අප්‍රේල් 'නවලෝකය' සඟරාවේ පළ කිරීමට ද කටයුතු කරන ලදී. එම ලිපියේ කොටසක් උපුටා දැක්වීම වැදගත් ය.

"ස්ටාලින් අන් හැමට ම වඩා සම්පූර්ණ ලෙස මාක්ස්-ලෙනින්වාදය ඉගෙන ගෙන එය වර්ධනය කොට, මාක්ස්-එංගල්ස්-ලෙනින්වාදයේ නිවැරදි භාවය සහතික කොට, ලෙනින්වාදී අලුත් මුහුණුවරක් මත පක්ෂයක් ගොඩනඟා සතුරන් විනාශ කොට සෝෂලිස්ට්වාදය ගොඩනඟා ඉදිරියට යාමට සමත් අන්තර් නායකයන් ඇති කෙළේය.

ස්ටාලින්ගේ ශ්‍රේෂ්ඨත්වය ලොවට පෙනී ගියේ වරක් දෙවරක් නොවේ. 1917 දී ලෙනින් සමඟ මහා ඔක්තෝබර් විප්ලවයට නායකත්වයක් දී එය ජයග්‍රාහී බවට පත් කිරීමේ දීත් ඉන්පසු සතුරු රාජ්‍යයන් හා ප්‍රතිවිප්ලවාදීන් පහර දීමේ දී සෑම පෙරමුණකට ම ගොස් සටන් මෙහෙයවා සතුරන් විනාශ කිරීමේ දී හා සෝවියට් බලය මේ යැයි සතුරන්ට පෙන්වා දීමේදීත්, ලෝකයේ ඇති බලසම්පන්න හමුදව යැයි ප්‍රකට හිට්ලර් හමුදවන් කඩා වැදීමේ දී එයට විරුද්ධ ව සටන් මෙහෙයවා මුළුමහත් ලෝකයම විස්මයට පත් කිරීමේ දීත්, ස්ටාලින්ගේ ශ්‍රේෂ්ඨත්වය විදහා දැක්විණි.

අතිශ්‍රේෂ්ඨ ලෙනින් සමඟ එකතුව ස්ටාලින් ලෝකයේ පළමු වැනි සෝෂලිස්ට්වාදී රජය බිහි කළේය. ලෙනින්ගේ ධජය හා ස්ටාලින්ගේ නායකත්වය යටතේ මුළු මහත් සෝවියට් ජනතාව දිනෙන් දින ඉදිරියට යනවා පමණක් නොව ශක්තිමත් වන්නේය.

නැඟෙනහිර යුරෝපීය ප්‍රජාතන්ත්‍රවාදී රටවල් ජනතාව ද, චීන මහජනතාව ද කොරියාවේ හා නැඟෙනහිර ජර්මනියේ ජනතාව ද, තමන්ගේ මිත්‍රයා, සගයා හා මඟ පෙන්වන්නා හැටියට ස්ටාලින් පිළිගනු ලබන්නේ මේ කරුණු නිසාය. තෙවැනි ලෝක යුද්ධකට විරුද්ධ ව ජාතීන් අතර සාමය ඇති කොට එමඟින් විමුක්ති ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමේ මාවත පෙන්වා දුන් ස්ටාලින් ශ්‍රේෂ්ඨ නායකයා හැටියට කෝටි සංඛ්‍යාත ජනයා පිළිගෙන තිබේ."



මෙයට අමතර ව 'නවලෝකය' පාඨකයන් ස්ටාලින්ගේ වීරත්වය පිළිබඳ කියවෙන කවි නිර්මාණ ද මෙහි පළ කළ අවස්ථා තිබිණි. මේ එවැනි කවියකි.

ලොවම දනවාදයට යට වී තිබුණ සමයක
පෙරට ඒමෙන්
නියම මාවත මාක්ස්-එංගල්ස්-ලෙනින්
පැවසූ ලොවට දීමෙන්
පරම නිදහස ලොවට දැක්වූ කොමියුනිස්ට්
රතු එළිය පෑමෙන්
අසම සම වීරයා මුළු ලොව අහෝ
ඇත මරුමුවට වීමෙන්

සටන් කොට පීඩිතයා වෙනුවෙන් අනාගතයක්
ලොවට පෙන්නූ
ඔබෙන් මුළු ලෝකයම පිබිදුණි අඳුරු
යුගයක වැතිර උන්නූ
තමන් තව තව තවත් පෙරටම අඩිය
හදවත එඩි ගැන්නූ
ගමන් ගන්නෙමු ඔබේ මාවත දිගේ
නිදහස් රහස ගෙන්නූ

1953 ඔක්තෝබර් 'නවලෝකය' කලාපයේ මුල් පිට කවරය වෙන් කැර තිබුණේ ශ්‍රී ලංකාව සහ චීනය අතර ගොඩනැඟෙමින් එන සහයෝගිතාව පෙන්වීම සඳහා ය. එවකට ශ්‍රී ලංකා ආණ්ඩුවේ වෙළෙඳ ඇමැති රිචඩ් ගෝඨාභය සේනානායක මහතා නව චීනයේ එවකට විදේශ ඇමැති චෞ එන්ලායි මහතා සමඟ තේ පානය කරමින් සුහද සාකච්ඡාවක නිරත වන ඡායාරූපයක් පළ කැර තිබීම විශේෂත්වයකි.

මෙයට සමගාමී ව මේ කලාපයේ ශ්‍රී ලංකා - චීන සම්බන්ධතාව පිළිබඳ ලිපි හතක් පළ කිරීමට 'නවලෝකය' කතුවරයා පෙරමුණ ගෙන ඇත්තේ අන්තර්ජාතික සහයෝගිතාව ඔපවත් කිරීමේ අරමුණ පෙරදරි කැර ගෙන බව ඉතා පැහැදිලි ය.

ඒ බව තව දුරටත් සනාථ වන්නේ "චීන ලංකා සම්බන්ධයක් ඇති විය යුතුයි" සිරස්තලය යටතේ 1951 'නවලෝකය' ඔක්තෝබර් කලාපයට කතු වැකියක් ලියන උඩකැන්දවල සිරි සරණංකර හිමියන් එහි මෙසේ සඳහන් කැර තිබීමෙනි. "ලංකාව සමඟ චීනයේ සම්බන්ධය අද ඊයේ එකක් නොවේ. පාහියන්ගේ කාලයටත් පෙර පටන් පැවැති එකකි. එබැවින් අධිරාජ්‍යවාදීන්ගේ කුමන්ත්‍රණවලට අසු නොවී අපේ සම්බන්ධකම් චීනය සමඟ වහාම තරකර ගත යුතුව තිබේ. අපේ රබර් ආදී අමුද්‍රව්‍යවලට චීන රෙදි හා හාල් හුවමාරුවට පටන් ගත යුතුවේ. චීන ආණ්ඩුව පිළිගත්තා මෙන්ම, චීනය සමඟ වහාම වෙළෙඳ සම්බන්ධකම් පමණක් නොව තානාපතියන්ද මාරු කරගෙන වර්ෂ දහස් ගණනක් තිස්සේ තිබී දැන් අභාවයට ගොස් තිබෙන සංස්කෘතික සම්බන්ධකම් ද ඇති කිරීමට අප රටවාසීන් උත්සාහ කළ යුතුය" යනුවෙන් සඳහන් කොට ඇත. මේ ඓතිහාසික සම්බන්ධය තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා උඩකැන්දවල සිරි සරණංකර හිමියෝ "නව චීනයේ නව ජීවිතය" නමින් කෘතියක් ද සම්පාදනය කළහ. චීන ඉතිහාසය, චීනයට යුරෝපීයයන්ගේ පැමිණීම, චීනයේ ඇති වූ විප්ලවය හා අරගල, චීන කොමියුනිස්ට් ව්‍යාපාරය, කොමියුනිස්ට් හා කොමින්ටැන් අරගලය, සිවිල් යුද්ධ, චීන මහජන සමූහාණ්ඩුව පිහිටුවීම, චීන ආණ්ඩුව මොන ක්‍රමයේ ආණ්ඩුවක් ද ආදි වශයෙන් මේ කෘතිය මඟින් සරණංකර හිමියන් සාකච්ඡා කිරීම, අන්තර්ජාතික සහයෝගිතාවට ශක්තියක් වූ බව කිව යුතු ය.

මෙයට අමතර ව චීනය ගොඩනැගූ මාවෝ සේතුං සහෝදරයා පිළිබඳ කවි නිර්මාණ පළ කිරීමට ද උන්වහන්සේ කටයුතු කැර තිබේ. ''මාවෝ වීරයාණෙනි!'' යන හිසින් යුතු ව, නවුන්තුඩුවේ මේධානන්ද හිමි විසින් ලියන ලද කවි සංකල්පනාවක් නවලෝකයේ පළ කිරීමට, සරණංකර හිමියන් කටයුතු කැර තිබීම විශේෂත්වයකි.

නින්දිත කබල් පාලනයක තිබුණ දැති
පොඩි කර දමා පීඩිත දන සමඟ එති
නව චීනයක් බිහි කළ යස ඉසුරු ඇතී
මාවෝ වීරයාණෙනි! නිදහසට රැතී



දනපති රදල මළකුණු පස් අතර ඔබා
ගෙන දෙනු පිණිස නිදහස සිය රටට නොබා
නිම නැත විදි ගැහැට පිළිමල් බලය හඹා
අද ඉන් චීන දන තුටු වෙති පලය ලබා

සිය ජනතාව වැලපෙනු දැක කඳුළු ගඟේ
ලය කකියමින් ගොස් රතු කොඩි සෙවණ දිගේ
ජය පැන් බිබී බිඳ රුපුනගෙ තිබුණ දඟේ
රට සුවපත් කෙරුව හැටි ඔබ පියකු වගේ

සුන්කර දමා එහි තිබු අසරණ බාවේ
මුළු චීනයෙම ඇති කළ පියකරු තාවේ
මාවෝ වීර! නැංවුම යහගුණ රාවේ
අද පෙරදිගට ඔබගෙනි එළියක් ආවේ

ගස්වල පොතු කමින් සාගිනි පවස පිට
ඇස් ගෙඩි ගිලී සිටි සෝ දුක් සයුර යට
බස් වා චීන දන නිදහස් සටන කට
සස් සික කෙරුවෙහිය ඔබ හැමතැනම රට

නින්දිත කායිසෙක් පාදඩ කමට උගේ
ලක් කර ඇමරිකන් සගයන් ඇති ව දඟේ
ඔන්නට සටනකට සැරසෙන අයුරු හැඟේ
පෙන් වනු සොයුර! රතු ලේවල තිබෙන අගේ

කබල් පාලනය චීනය ගිනි ලැවෝ
පනස් පස් කෝටියක් ජය පැන් බීවෝ
උසස් වීර ගති හැම තැනක ම පෑවෝ
මහත් ආදරෙන් අපි පිළිගමු මාවෝ

නැන්වෙන කිත් සුවඳ ලෝකයෙ හතර අත
මාවෝ සොයුර! අද මුළු පෙරදිගට කොත
ඔබගේ පිහිට හැර පිහිටක් අපට නැත
යොමු කළ මැනවි එබැවින් අප කෙරෙහි නෙත

අද ලක්බිමේ තතු සිහිවෙන හැම වාරේ
සංවේගයෙන් දෙනෙතෙහි කඳුළැලි බේරේ
පාලකයින්ගෙ ශැටි දැක හදවත පෑරේ
යන්නෙමු අපි වීරය ඔබ අඩි පාරේ

මෙවැනි කවි සංකල්පනා 'නවලෝකය' සඟරාවේ පළ කිරීමෙන් අන්තර්ජාතික සහයෝගය පමණක් සරණංකර හිමියන් අපේක්ෂා කෙළේ නැත. උන්වහන්සේ, අධිරාජ්‍යවාදි සහ ධනවාදි දේශපාලන ක්‍රියාමාර්ගයන්ට විරුද්ධ ව පෙළගැසෙන මෙරට වාමාංශිකයන්ට උත්තේජනයක් එද ලබා දීමට මෙවැනි කවි සංකල්ප මෙන් ම, ගීත ප්‍රබන්ධ බහුල වශයෙන් යොද ගත් අවස්ථා තිබිණි.

මෙම ශ්‍රී ලංකා - චීන සම්බන්ධතාවල පෙර ගමන්කරුවකු වූ 'නවලෝකය' ඇතැම් අවස්ථාවල චීනයේ ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ක්‍රියාවලිය දැඩි ලෙස විවේචනයට ලක් කෙළේය. කතු වැකිවලින් පමණක් නොව, ඇතැම් ලිපිවලින් ද විවේචන එල්ල කෙළේය. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපෑවේ චීන - සෝවියට් මතභේදය යි. එම මතභේදය උත්සන්න වූ අවස්ථාවේ 'නවලෝකය' සෝවියට් දේශයේ පැත්ත ගනිමින් චීනය බරපතළ ලෙස විවේචනය කළ බව වාම සන්නිවේදන ඉතිහාසයේ මැනවින් සඳහන් වෙයි.

"චීන සෝවියට් මතභේදය" යන මැයින් 1964 මැයි "නවලෝකය" කලාපයේ පළ වූ ලිපියක කොටසක් මෙහි දී උපුටා දැක්වීම වැදගත් ය. මෙම ලිපිය සකස් කැර ඇත්තේ, 1964 අප්රේල් 3 වැනිද රුසියාවේ 'ප්‍රව්ඩා' පුවත්පතේ පළ වූ ලිපියක් පාදක කොට ගෙන වීම විශේෂත්වයකි.

"සාමය සඳහා කරන සටනෙත් සමාජවාදය සඳහා කරන සටනෙත් සම්බන්ධයක් නැතැයි චීනය කියන මුත්, මේ සම්බන්ධයෙන් වාර්තාවේ හොඳින් කරුණු සඳහන් කොට ඇත. එසේ ම පන්ති සටන ශක්තිමත් කිරීම හා එය සංවර්ධනය කිරීම සම්බන්ධ අදහස ද වාර්තාවේ අන්තර්ගතය. චීන නායකයන් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් දක්වන අදහසෙහි හරය නම් සිය රටේ මෙන් ම විදේශීය රටවල ද තත්ත්වය ගැන කිසිත් නොසලකා සෑම තැන ම ආයුධ නිපදවීම දැඩි විය යුතු බව ය.

"පෙරදිග සුළඟ අපරදිග සුළඟ ජයගනී යන චීන නායකයන්ගේ සටන් පාඨය අනුව ම ඔවුන් වැඩ කටයුතු කරන බව පසුගිය අවුරුදු කීපය තුළ ඔවුන් කළ කී දෙයින් පැහැදිලි විය. මේ සටන් පාඨය චීන නායකයන්ගේ දේශපාලන න්‍යායික තර්කයක් වී තිබේ.



"වර්තමාන සමාජය ප්‍රජාතන්ත්‍රවාදයට අවහිර වූ පුද්ගලයන් පිදීමෙන් යුක්ත වූ එකක් ලෙස තබා ගැනීමට ඔවුහු සිතති. ලෝක කොමියුනිස්ට් ව්‍යාපාරය මඟින් මුලිනුපුටා දමා ඇති පුද්ගලාභිවාදනය මාවෝ සේතුං වෙත තබා ගැනීමට චීන නායකයන් කැමැත්තෙන් සිටින බව අපි දනිමු.

"චීන නායකයන් දරන දේශපාලන අදහස් බොහෝ දුරට ට්‍රොට්ස්කිවාදය අනුව ගොස් තිබේ. මාක්ස් - ලෙනින්වාදයේ පළමු හතුරා වූ ඔවුහු ට්‍රොට්ස්කිවාදය නැවත ගොඩනැඟීමට උත්සාහ දරති.''

දේශපාලන වශයෙන් ගත් විට ප්‍රගතිශීලී බලවේගවල එක්සත්කම මඟින් අධිරාජ්‍යවාදය සහ ධනවාදය පරාජය කිරීමට ප්‍රබල ශක්තියක් ලැබෙන බව 'නවලෝකය' නිරන්තරයෙන් පෙන්වාදුන් තවත් කරුණකි. මේ තත්ත්වය වඩා හොඳින් තහවුරු වන්නේ 1964 'නවලෝකය' මැයි කලාපයේ මුල් පිට කවරයේ පළ වී තිබූ ඡායාරූපය පිළිබඳ ව අවධානය යොමු කරන විට ය. ඇන්.ඇම්. පෙරේරා, පීටර් කෙනමන්, කොල්වින් ආර්. ද සිල්වා, තිලක් වැනි වාමාංශික එක්සත් පෙරමුණේ නායකයන් පෙරටු කොටගත් ඓතිහාසික "ඒකාබද්ධ වෘත්තීය සමිති සංවිධානයේ'' මැයි පෙළපාළිය කොළඹ නගරයේ ගමන් කරන ඡායාරූපය ඉහත දේශපාලන කාරණය සමාජ ගත කිරීමට ප්‍රබල පිටුබලයක් වූ බව කිව යුතු ය.

මේ අනුව බලන විට 'නවලෝකය' මුල් පිට කවරයේ ජාතික හා අන්තර්ජාතික සිද්ධි පදනම් කැර ගනිමින් ඡායාරූප පළ කළ අවස්ථා නිරන්තරයෙන් දක්නට ලැබිණි. නිදසුනක් වශයෙන් අහසින් බැසගත් යූරි ගගාරින් සෝවියට් ශිෂ්‍ය - ශිෂ්‍යාවන් අතරට යෑම (1962, නොවැම්බර් කලාපය), රුසියනු අභ්‍යාවකාශ වීරයන් දෙදෙනා, අභ්‍යාවකාශයට ඇතුළු වී ඉන් එක් අයකු යානයේ පිටතට පැමිණ පරීක්ෂණ පවත්වන අයුරු දැක්වෙන රුසියානු චිත්‍රයක් ද (1965 අප්රේල්-මැයි කලාපය) අමෙරිකානු අධිරාජ්‍යවාදින් වියට්නාමය තුළ සිදු කළ 'බෞද්ධ සංහාරයට'

විරුද්ධ ව ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලා ගෙනගිය සාමකාමී විරෝධතාව (1965 ජූලි කලාපය) හා වියට්නාම් හමුද සෙබළියක යෝධ අමෙරිකානු සෙබළකු යටත් කැර ගෙන රැගෙන යන අයුරු (1967 ජූලි කලාපය) දැක්වෙන ඡායාරූප 'නවලෝකය' සඟරාවේ මුල් පිටකවරයේ පළ කිරීමෙන් අන්තර්ජාතික දේශපාලන සිද්ධි පාඨකයා වෙත සන්නිවේදනය කිරීමට උත්සුක වූ බව කිව යුතු ව ඇත.

එසේ ම මුල් යුගයේ 'නවලෝකය' සඟරා බොහෝ ගණනක මුල් පිට කවරවල ඡායාරූප සඳහා යොදාගෙන තිබුණේ කාන්තා ඡායාරූප වීම තවත් විශේෂත්වයකි. නිදසුනක් වශයෙන් 1946 සැප්තැම්බර් 'නවලෝකය' කලාපයේ මුල් පිට කවරය සඳහා සෝවියට් තරුණියන් පිරිසකගේ ඡායාරූපයක් පළ කිරීම විශේෂත්වයකි. 'සෝවියට් සිරි' යනුවෙන් මේ ඡායාරූපය නම් කොට ඇත්තා පමණක් නොව, 'ස්ත්‍රී පක්ෂය හා සෝවියට් රුසියාව' යන මැයින් නාරාවිල ධම්මරතන හිමියන් මෙම සඟරා කලාපයේ ලිපියක් ද පළ කැර ඇත.

1947 'නවලෝකය' ජූනි කලාපයේ ද පළවී තිබුණේ කාන්තා ඡායාරූපයකි. මේ ඡායාරූපයේ විශේෂත්වය වන්නේ, සිංහල චිත්‍රපටයක් ලෙස සැලකෙන 'අශෝකමාලා' චිත්‍රපටයේ, අශෝකමාලාගේ චරිතය රඟ පෑ නිළියගේ අලංකාර ඡායාරූපයක් වීම යි. ඡායාරූපයක් මුල් පිටකවරයේ පළ කිරීමට පමණක් සීමා නොවී, 'අශෝකමාලා' චිත්‍රපටය පිළිබඳ ව නිමල් කරුණාතිලක විසින් ලියන ලද විචාර ලිපියක් ද 'නවලෝකය' සඟරාවේ පළ කිරීමට කතුවරයා වග බලා ගැනීම විශේෂත්වයකි.

මේ නයින් බලන විට උඩකැන්දවල සිරි සරණංකර හිමියන් ජාතික හා අන්තර්ජාතික ප්‍රශ්න පිළිබඳ ව ඉතා පුළුල් මානයකින් බැලීම නිසා 'නවලෝකය' දේශපාලන සඟරාවක් වශයන් පාඨකයා අතර ඉතා ජනප්‍රිය විය. විශේෂයෙන් සරණංකර හිමියෝ ලොව ප්‍රකට ලේඛකයන් සමඟ ඍජු සබඳතා පවත්වමින්, ඔවුන්ගේ නිර්මාණ සිංහල බසට පරිවර්තනය කැර පළ කිරීමට කටයුතු කළ හිමි නමකි. ඉන්දියාවේ රවීන්ද්‍රනාත් තාගෝර් තුමා සමඟ උන්වහන්සේ තිබූ සබඳතාවත්, බෙංගාලි, රුසියානු, ඉංගිරිසි



භාෂාවන් චතුර ලෙස හැසිරවීමට තිබූ නිපුණතාවත් නිසා ජගත් සාහිත්‍යයත්, ජගත් දේශපාලනයත් ශ්‍රී ලංකාවට කැඳවා ගෙන ඒමට සමත් වූ බව කිව යුතු ය. මේ නිසා ඉමහත් වූ පරිශ්‍රමයකින් විසිපස් වසරක් සිංහල පාඨකයාගේ දැනුම් පිපාසය සංසිඳවීමට මහත් වූ කැපවීමකින් කටයුතු කරමින් නව ලොවක් බිහි කරලීමට 'නවලෝකය' මෙහෙයවූ බව ශ්‍රී ලංකා වාම සන්නිවේදනයේ සටහන් ව තිබේ.

### පාදක සටහන්

1. නවලෝකයෘ 1963, පෙබරවාරි
2. නවලෝකයෘ 1968, මැයි
3. නවලෝකයෘ 1964, නොවැම්බර්
4. නවලෝකයෘ 1968, මැයි
5. එම
6. නවලෝකයෘ 1961, මාර්තු
7. එම
8. එම
9. එම
10. නවලෝකයෘ 1964, මැයි
11. නවලෝකයෘ 1953, නොවැම්බර්
12. නවලෝකයෘ 1953, ජූනි
13. නවලෝකයෘ 1966, ජනවාරි
14. නවලෝකයෘ 1947, ජූනි
15. නවලෝකයෘ 1965, ඔක්තෝබර්
16. නවලෝකයෘ 1953, මැයි
17. නවලෝකයෘ 1968, ජූනි
18. නවලෝකයෘ 1967, දෙසැම්බර්
19. නවලෝකයෘ 1967, මාර්තු
20. නවලෝකයෘ 1947, ජූනි

ස වැනි පරිච්ඡේදය

# සමාලෝචනය සහ නිගමනය

ශ්‍රී ලංකාවේ වාම දේශපාලනයේ පුරෝගාමීන්ගේ ප්‍රධාන අරමුණ වූයේ සමාජවාදී සමාජයක් ගොඩනැඟීම යි. ඒ අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා ඔවුහු මූලික අංග දෙකක් වෙනුවෙන් කැපවීම් කළ හ. ඉන් පළමු වැන්න වූයේ, අධිරාජ්‍යවාදී ආණ්ඩුව සහ එහි බලධාරීන් කෙරෙහි ජනතාව තුළ පවතින බිය තුරන් කැර, ප්‍රජාතන්ත්‍රවාදී මානුෂික අයිතීන් දිනා ගැනීමට උනන්දු කැරවීමත්, ජාතික නිදහස් සටන් ප්‍රාණවත් කිරීමත් ය. දෙවැනි කාරණය වූයේ ස්වකීය දේශපාලන අපේක්ෂාවන් සාක්ෂාත් කැර ගැනීම සඳහා සන්නිවේදන ක්‍රමවේදයක් ගොඩනගා ගැනීම ය.

අධිරාජ්‍යවාදීන් විසින් විනාශ කැර දමනු ලබන එසේ ම උල්ලංඝනය කරනු ලබන ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැක ගැනීම සඳහා විවිධ ආකාරයේ අරගල ඒ කාලයේ ඇරැඹුණු අතර, ඒ සඳහා නාගරික කම්කරු පන්තිය විශාල වශයෙන් එක් වූහ. ඇතැම් සටන් ජයග්‍රහණය තෙක් ගමන් කළ අතර, තවත් සමහර සටන් ආරම්භයේ දී ම විනාශ කැර දැමීමට අධිරාජ්‍යවාදී පාලක පන්තියේ සන්නිවේදනය එද සමත් විය. එහෙත් වාම ව්‍යාපාරය වටා රොක් වී සිටි දහස් ගණනක් වූ කම්කරු පන්තිය දෘෂ්ටිමය වශයෙන් පෝෂණය කිරීමට ක්‍රමවත් සංවිධාන සැලැස්මක් හෝ අඛණ්ඩ ව ඉදිරියට යන සන්නිවේදන ක්‍රමවේදයක් හෝ සැකසී නොතිබිණි. මේ නිසා කම්කරු පන්තියේ දේශපාලන විඥානය සැලකිය යුතු ලෙස වර්ධනය වී නොතිබිණි.

මේ උද්ඝෝෂණවලට හා අරගලවලට නායකත්වය දුන් පුරෝගාමී වාම නායකයෝ, කම්කරු පන්තිය දේශපාලන වශයෙන් සන්නද්ධ කිරීම සඳහා දින පතා, සති පතා හා මාස් පතා දේශපාලන පුවත්පත් මුද්‍රණය කිරීමට අඩිතාලම දැමූ හ. එහි ප්‍රතිඵලයක් හැටියට 'ටැබ්ලොයිඩ්' ප්‍රමාණයේ පුවත්පත් රැසක් මුද්‍රණය කිරීමට ඔවුහු කටයුතු කළහ. එ නමුත් මේ වාමවාදී පුවත්පත්වලින් කම්කරු පන්තිය, කෙටිකාලීන ව සංවිධානය කළ



ද, දීර්ඝ කාලීන ව, එසේ ම බලය ලබා ගැනීම සඳහා සංවිධානය කිරීමට නොහැකි විය. විශේෂයෙන් මේ වාමවාදී පුවත්පත්, වෘත්තිය සමිති කේන්ද්‍ර කැරගත් ප්‍රවෘත්තිවලට පමණක් මුල් තැන දීම නිසා, ජන විඥානය සංකල්පීය හා න්‍යායාත්මක වෙනසකට ලක් කිරීමට නොහැකි වී තිබිණි.

මෙයට අමතර ව බලයේ සිටි අධිරාජ්‍ය ගැති පාලකයන් හා ඔවුන්ගේ නිලධාරීන් නිරන්තරයෙන් ක්‍රියාත්මක කළ මර්දනයත්, පුවත්පත් පවත්වාගෙන යෑමට අවශ්‍ය කරන මූල්‍ය පහසුකම් අඩු වීමත්, මේ පුවත්පත්වල සම්පාදකයන් ලෙස කටයුතු කළ වෘත්තිය සමිති නායකයන් නිරන්තරයෙන් අත්අඩංගුවට ගෙන සිර ගත කිරීමත් යන හේතු නිසා වාම සන්නිවේදන ක්‍රියාවලිය පසු බැසීමකට ලක් වූ බව ඉතා පැහැදිලි ය.

තවත් පැත්තකින් මේ වාමවාදී ප්‍රකාශන සහ පුවත්පත් බෙහෙවින් ම කොළඹ නගරය කේන්ද්‍ර කැර ගෙන ප්‍රකාශයට පත් වීම නිසා, අධිරාජ්‍ය විරෝධී දේශපාලන මත පිටපළාත්වලට නොයෑමේ තත්ත්වයක් උද වී තිබිණි. විශේෂයෙන් කොළඹ නගරය මූලික කැර ගනිමින් සියලු උද්ඝෝෂණ හා අරගල දියත් වීම නිසා ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වූ කම්කරුවන් අධිරාජ්‍ය විරෝධී අරගලයේ කොටස්කරුවන් නොවීම, වාම දේශපාලයේ බරපතළ බේදවාචකයක් විය. මේ නිසා සිදු වූයේ නාගරික හා ග්‍රාමීය කම්කරුවන් අතර සැලකිය යුතු ප්‍රමාණයේ සන්නිවේදනයක් සිදු නොවීම යි. මේ සන්නිවේදන දුර්වලතාව තේරුම් ගත් ධනපති පන්තිය, වාම ව්‍යාපාරයට එරෙහි ව මුදාහළ රීතියා ප්‍රචාරයන් ඉතා ඉක්මනින් වැලඳ ගැනීමට ග්‍රාමීය කම්කරු පන්තිය පෙලඹුණු බව කිව යුතු ය. නිදසුනක් ලෙස, මාක්ස්වාදීන් මූලික සමාජ ධර්මතා නොපිළිගන්නා බවත්, ඔවුන් ආගමක්, දහමක් නොමැති ම්ලේච්ඡ පිරිසක් බවත් ප්‍රචාරය කිරීමට ධනපති පන්තිය නිරන්තරයෙන් උත්සාහයක යෙදුණේ ය. එ බැවින්, මේ ප්‍රචාරයන් අබිබවා යමින් ඊට පිළිතුරු දැක්වීමට හැකි මානව සම්පත් ජාලයක් වාමාංශික ව්‍යාපාරය සතු ව තිබුණත්, එය ඉදිරියට ගැනීමට නොහැකි වූයේ න්‍යායාත්මක කරුණු කාරණ මත වම බෙදී යෑම නිසා යි. මේ පසුබිම තුළ වමේ ව්‍යාපාරයට ධනපති පන්තියෙන් එල්ල වන

නොනවතින අභියෝගවලට එක්සත් ව මුහුණ දීම වෙනුවට සිදු වූයේ න්‍යායාත්මක කරුණු පදනම් කැර ගෙන වාදවිවාද කිරීම යි. ඒ නිසා පන්ති පදනම් දෙදරා ගොස් වාම සන්නිවේදනය වේගයෙන් අර්බුදයකට ඇදී ගිය බව කිව යුතු ය. වමේ ව්‍යාපාරයේ මේ බෙදීම ප්‍රයෝජනයට ගත් ධනපති පන්තිය සිය සන්නිවේදන ක්‍රියාවලිය නව දුරටත් ශක්තිමත් කරමින්, වමට විරුද්ධ ව පැතිරවූ ඊනියා ප්‍රචාරයට මුහුණ දීම පහසු නොවීය. මේ පසුබිම තුළ වම හා එහි සන්නිවේදන ක්‍රියාවලිය දෘෂ්ටීය වශයෙන් බිඳ වැටීමකට ලක් වූ බව කිව යුතු ය. එහෙත් ඒ අභියෝග ඉදිරියේ වම සිය දෘෂ්ටිය සමාජ ගත කිරීම සඳහා විවිධ සන්නිවේදන මෙවලම් ප්‍රයෝජනයට ගත් බව ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වෙයි. නිදසුනක් වශයෙන් දේශපාලන පන්ති, සභා රැස්වීම්, පෙළපාලි, විප්ලවීය ගීත, රතු කොඩි, සංකේත, වාමාංශික පක්ෂවල නම්, ඇතැම් අවස්ථාවල ධර්ම දේශනා, කැම පැයේ පිකටින් හා අතින් ලියන ලද පෝස්ටර් වැනි සන්නිවේදන මෙවලම් මේ අතර ප්‍රධාන විය.


මෙවැනි සමාජ වටපිටාවක් තුළ ධනපති පන්තියේ දේශපාලන මත සෘජු ව පරාජය කිරීමටත්, ඒ මතවලට පිළිතුරු දීමටත් උඩකැන්දවල සිරි සරණංකර හිමියන් 'නවලෝකය' සඟරාව ආරම්භ කළ බව කිව යුතු ය. මේ සඟරාව මඟින් ශ්‍රී ලංකාවේ වාම සන්නිවේදනයට සෘජු දයකත්වයක් එද ලබාදුන් අතර පාඨක (නවලෝකය කියවන්නන්ගේ) සමාජ රට පුරා ආරම්භ කරමින් ජන විඥනය අධිරාජ්‍ය විරෝධි මතවලින් පෝෂණය කිරීමේ සමාජ වගකීම භාර ගත්තේය. විශේෂයෙන් එද ප්‍රකාශයට පත් වූ වාම පුවත්පත්වල අන්තර්ගතයට වඩා 'නවලෝකය' සඟරාවේ අන්තර්ගතය තුළ වෙනසක් දක්නට ලැබිණි. දේශපාලන ලිපිවලට හා ප්‍රවෘත්තිවලට පමණක් සීමා නොවී ජාතික, අන්තර්ජාතික සිද්ධි මෙන් ම කලාව, සංස්කෘතිය සහ සාහිත්‍යය යන විෂය 'නවලෝකය' තුළ සාකච්ඡා විය. ඒ සෑම සාකච්ඡාවකින් ම ධනවාදයට එරෙහි දේශපාලන දෘෂ්ටියක් සමාජ ගත කිරීමට සරණංකර හිමියෝ උත්සාහ කළහ. එසේම, සරණංකර හිමියන් මාක්ස්, ලෙනින්වාදී ස්ථාවරයට හානියක් නොවන ලෙස 'නවලෝකය' මෙහෙයවීමට කළ කැප වීම අගය



කිරීම වැදගත් ය. එ නමුත් වාම සන්නිවේදනයට ක්‍රමවත් ව හා අඛණ්ඩ ව ඉදිරියට යෑමට නොහැකි වූයේ, එය පිටුපස සිටි දේශපාලන දෘෂ්ටියක් හා පන්නරයක් ඇති පිරිස් කාලයාගේ ඇවෑමෙන් ඈත් වීමත්, පුද්ගල කේන්ද්‍රීය සන්නිවේදනයක් ගොඩනැඟී තිබීමත් නිසාය. මේ තත්ත්වයට නිදසුනක් වන්නේ ඇතැම් වෘත්තිය සමිති නායකයන් මියයෑම, සිරගත වීම, බොහෝ වාම දේශපාලන පුවත්පත් බිඳවැටීමට හේතු වීම යි. උඩකැන්දවල සිරි සරණංකර හිමියන් අපවත් වී වැඩි කලක් යෑමට පෙර 'නවලෝකය' සඟරාව නැවතී යෑම වාම සන්නිවේදනයට වැදුණු තවත් බරපතළ පහරක් බව කිව යුතු ය.

විශේෂයෙන් සරණංකර හිමියන් නැතිවීමේ හිඩස පිරවීමට සමත් ගිහි පැවිදි කිසිවකු මතු නොවීම 'නවලෝකය' අභාවයට යෑමට ප්‍රධාන හේතුවක් විය. හැටේ දශකයේ අවසාන කාලයේ 'නවලෝකය' මෙහෙයවීමේ අභියෝගය භාරගත් ඇතැම් වාම කොටස්වලට ගැඹුරු දේශපාලන පදනමක් හෝ න්‍යායක් හෝ නොවීම නිසා, ඒ වන විට මතු ව තිබූ ජාතික හා අන්තර්ජාතික දේශපාලන, සමාජ කාරණ මේ සඟරාව මඟින් සාකච්ඡා නොවිණි. ඇතැම් ධනපති පක්ෂවල නායක-නායිකාවන්ගේ අවශ්‍යතා අනුව දේශපාලන මතවාද ගොඩනැඟීමට 'නවලෝකය' සඟරාව ප්‍රයෝජනයට ගත් පිරිස් කටයුතු කළ හ. ඔවුන් සුළු ධනේශ්වර අරමුණු වෙනුවෙන් පෙනී සිටි අතර, ඔවුන්ගේ ලෝකයක් වෙත යෑමට 'නවලෝකය' ප්‍රයෝජනයට ගත් බවක් පෙනෙන්නට තිබූ බව ඒ පිළිබඳ ව අධ්‍යයනවල දී පෙනී යන කරුණකි.

එසේ ම දින පතා සමාජය වෙනස් වීමත් සමඟ, වාම සන්නිවේදනයේ ස්වරූපය, ගමන් මඟ සැලකිය යුතු වෙනසකට ලක් විය. විශේෂයෙන් වාම දේශපාලනය දෙසට නැඹුරු ව සිටි පිරිස් විවිධ චින්තන ධාරාවන් ඔස්සේ, තම දේශපාලන ගමන් මඟ තෝරා ගැනීම නිසා ඇති වූ හිඩස පිරවීමට වමට නොහැකි විය. ඒ බැවින් වාම සන්නිවේදනයේ ආරම්භක අවදියේ තිබූ සටන්කාමිත්වයේ යම් පිරිහීමක් ප්‍රදර්ශනය වූ බව කිව යුතු ය.



NAVALOKAYA


PROGRESSIVE SINHALESE MONTHLY

Bhikkhu U. Saranankara
Managing Editor.

GAMPAHA, 5. 2. 1949.
(Ceylon)

උඩකැන්දවල සිරි සරණංකර හිමියන් විසින් හිතවත් භික්ෂුවකට ලියන ලද ලිපියක්.






ලංකා කොමියුනිස්ට් පක්ෂය ආරම්භ කිරීමට උඩකැන්දවල සිරි සරණංකර හිමියන් සමඟ පෙරමුණ ගත් දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහතා රෝගාතුර වූ හිටක සුවදුක් බැලීමට ගෙවතත්තේ ගිය අවස්ථාවක්.




උඩකැන්දවල සිරි සරණංකර හිමියන් අවසාන වරට සහභාගි වූ අසර්බයිජානයේ (එවකට, අසර්බයිජානය සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවට අයිති ව තිබූ සමූහාණ්ඩුවකි) බාකු නගරයෙහි පැවැති අන්තර්ජාතික ලේඛක හමුවේ දී ගත් ඡායාරූපයක්. මෙ සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ ඩබ්ලිව්.ඒ. අබේසිංහ මහතා සමඟ සරණංකර හිමියන් ප්‍රදර්ශන භාණ්ඩ පරීක්ෂා කරන අන්දම.





සරණංකර හිමියන්ගේ අභාවයට හේතු වූ හෘදයාබාධය මුල් වරට හටගත්තේ 1959 ජූලි මස 28 වැනි ද දහවල් 12.30ට පමණ ඉරාකයේ අගමැති කරීම් කසීම් සෙනෙවියා සමඟ සාකච්ඡා කරමින් සිටිය දී ය. මෙහි දැක්වෙන්නේ එම හෘදයාබාධය වැලඳීමට ආසන්න අවස්ථාවේ කසීම් සෙනෙවියා සමඟ සාම සාකච්ඡාවක් අරඹමින් සිටි ආකාරය යි.




වියට්නාමයේ බෞද්ධයන්ට විරුද්ධ ව අමෙරිකානු අධිරාජ්‍යවාදීන් එල්ල කළ අමානුෂික ප්‍රහාරයට විරෝධය පළකිරිම සඳහා 1963 මැයි 20 වැනි ද කොළඹ අමෙරිකානු තානාපති කාර්යාලයය ඉදිරිපිට කරන ලද උපවාසයට උඩකැන්දවල සිරි සරණංකර හිමියන් ද සහභාගි වූ ආකාරය මෙහි දක්වේ.






බුරියත් මොංගෝලියාවේ මහානායක හිමියෝ ලංකාවට වැඩි අවස්ථාවේ කොස්පිල්ලෑවේ විහාරස්ථානයට වැඩම කැර සරණංකර හිමියන්ගේ සුවදුක් විමසා බැලිය. මෙහි දෙපසින් වැඩ සිටින්නෝ අපවත් වී වදාළ දෙරණාගොඩ නායක හිමියෝ සහ සරණංකර හිමියන්ගේ ආචාර්යයන් වහන්සේ වන මහකටුවන්නාවේ ගුණානන්ද හිමියෝය.




ඉන්දියාවේ රාෂ්ට්‍රපති ශ්‍රී සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් සමඟ සරණංකර හිමි පිළිසඳරක යෙදී සිටි අවස්ථාවක්.




උඩකැන්දවල
සිරි සරණංකර හිමියන්
ගම්පහ කොස්ඔිල්ලෑවේ
විහාරස්ථානයේ
වැඩ සිටි කුටිය.






උඩකැන්දවල සිරි සරණංකර හිමියන් ලෝක සාමය වෙනුවෙන් කළ කාර්යභාරය අගයමින් 'ලෙනින් සාම ත්‍යාගය' පිරිනැමිණි. මෙහි දැක්වෙන්නේ උන්වහන්සේට ලැබුණු එම ත්‍යාගයේ ඡායාරූපයකි.






අපවත් වූ උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ දේහය අවසන් කටයුතු සඳහා කොළඹ නගර ශාලාවෙන් පිටතට වැඩම කළ අවස්ථාව. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ද මෙහි සිටී. ගම්පහ හිටපු මන්ත්‍රී ඇස්.ඩී. බණ්ඩාරනායක, දෙස්තර එස්.ඒ. වික්‍රමසිංහ, කේ.පී. සිල්වා, බර්නාඩ් සොයිසා, චන්ද්‍රා ගුණසේකර, පී. කුමාරස්වාමි, වී.ඒ. සමරවික්‍රම දේහය ඔසවාගෙන යන අන්දම.



ශ්‍රේෂ්ඨ කලා කෘතියක් ලෙස ලෝක ප්‍රසිද්ධ ලෙනින් සමාධියේ ආකෘතියක් ලෙස සකසන ලද උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ චිතකය. මෙම චිතකය නිර්මාණය කරන ලද්දේ මාපලගම විපුලසාර හිමියන්ගේ උපදෙස් හා අධීක්ෂණය යටතේය.





අපවත් වූ උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ භස්මාවශේෂ බඳුන, එම හිමියන්ගේ ආචාර්යයන් වහන්සේ වන කොස්පිල්ලෑවේ විහාරාධිපති මහකටුවන්නාවේ ගුණානන්ද හිමියන් බාරගෙන තැන්පත් කළ අවස්ථාව.

## පරිශීලනය කළ මූලාශ්‍රය


### ග්‍රන්ථ

1. ජයවර්ධන, කුමාරි (2009), 'ශ්‍රී ලංකාවේ කම්කරු පංති ව්‍යාපාරයේ කෙටි ඉතිහාසය 1893-1947', කොළඹ, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පෞද්ගලික) සමාගම.
2. සරත්, ලයනල් (2000), 'ලංකාවේ වාමාංශික ජනසන්නිවේදනය' (මුල් යුගය), කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
3. වර්ණපාල, විශ්වා (2006), 'අධිරාජ්‍ය විරෝධී අරගලය හා භික්ෂු දේශපාලනය', කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
4. දුරේසිංහම්, ටී. 'ලෙනින් සහ ආසියාව', බොරැල්ල, මහජන ප්‍රකාශකයෝ.
5. සිරි සරණංකර, උඩකැන්දවල (1972), ''සටනක සටහන්''.
6. ගුණවර්ධන, රණවීර ලෙස්ලි, 'අරගලයක අතීතය', බොරැල්ල, මහජන ප්‍රකාශකයෝ.
7. සරත්, ලයනල් (2006), 'එම්. ජී. මැන්ඩිස්', කොළඹ, සේයා ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ටර්ස් (පෞද්ගලික) සමාගම.
8. 'ශ්‍රී ලංකා වෘත්තීය සමිති සම්මේලනය හා කම්කරු පන්ති ව්‍යාපාරය' (1996), කොළඹ, ගුණරත්න සහ සමාගම.

### සඟරා

9. 'මගේ සඟරාව' - 1937 ජනවාරි සිට දෙසැම්බර් තෙක් කලාප.
10. 'නවලෝකය' - 1941 අප්‍රේල්, 1942 මැයි, 1947 ජූනි, 1951 මාර්තු, 1957 මාර්තු, 1966 ජූනි යන කලාප.

### පුවත්පත්

11. 'කම්කරුවා' - 1937 මාර්තු සිට 1942 දෙසැම්බර් තෙක් කලාප.
12. 'සමසමාජය' - 1936 ජූලි සිට 1945 අගෝස්තු තෙක් කලාප.
13. 'සමසමාජිස්ට්' - 1937 ජූනි කලාපය.
14. 'සමධර්මම්' - 1938 අප්රේල්, මැයි කලාප.
15. 'ජන ශක්තිය' - 1940 මැයි, ජූනි කලාප.
16. 'නව ශක්තිය' (සිංහල) - 1940 අගෝස්තු කලාපය.
17. 'නව ශක්ති' (දෙමළ පුවත්පත) - 1940 සැප්තැම්බර් කලාපය.
18. 'යුනයිටඩ් සෝෂලිස්ට්' (ඉංග්‍රීසි පුවත්පත) - 1940 ඔක්තෝබර් කලාපය.
19. 'ස්ට්‍රේට් ලෙෆ්ට්' - 1941 පෙබරවාරි, අප්රේල් කලාප.
20. 'ජන ශක්තිය' (දෙවැනි වර) - 1942 මැයි සිට 1948 ඔක්තෝබර් දක්වා කලාප.


LIBRARY
SRI PALEE CAMPUS




21. 'කොමියුනිස්ට්' - 1948 ඔක්තෝබර් කලාපය.
22. 'සටන' - 1945 නොවැම්බර්, දෙසැම්බර් කලාප.
23. 'සමසමාජ සටන' - 1946 ඔක්තෝබර්, දෙසැම්බර් කලාප.
24. 'මව්බිම' - 1952 සැප්තැම්බර් කලාපය.
25. 'නිදහස' - 1936 සැප්තැම්බර් කලාපය.
26. එක්සත් පෙරමුණු සමසමාජය - 1953 ඔක්තෝබර් කලාපය.
27. 'ඇත්ත '- 1977 ජනවාරි - දෙසැම්බර්, 1984 ජනවාරි - දෙසැම්බර්, 1989 ඔක්තෝබර්.
28. 'ජනසතිය' - 1966 ජූනි.
29. 'බජරි හටන' - 1966 දෙසැම්බර්, 1967 දෙසැම්බර්.



# නවලෝකය

## වාම සන්නිවේදනයේ පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි භූමිකාව

චන්දන විජේකෝන්

උඩකැන්දවල සිරි සරණංකර හිමි ශ්‍රී ලාංකේය වාමාංශික දේශපාලන සන්නිවේදනය පෝෂණය කිරීම සඳහා සිදු කළ දේශප්‍රේමී කාර්යභාරය ඉතිහාසයෙන් මකා දැමිය නොහැකි ය. ඒ මන්ද යත්: එහි සංවර්ධන අරමුණු සහ පරමාර්ථ දේශප්‍රේමී ලෙස ජාතික අභිවෘද්ධිය උදෙසා කළමනාකරණය කිරීමට උන්වහන්සේ ගත් උත්සාහය නිසා ය. න්‍යායික, දාෂ්ටිවාදී ක්ෂේත්‍රවලට සීමා වූ මෙරට වාම දේශපාලනය බෞද්ධ භික්ෂුවකගේ සමසමාජ ක්‍රමයට හිතැති ප්‍රගතිශීලී බලවේගයක් බවට පත් වෙමින් අධිරාජ්‍යවාදී අභියෝගයනට තීරණාත්මක බලපෑමක් සිදු කිරීම අගය කළ යුත්තකි. ඒ අනුව බෞද්ධ ශික්ෂණය කේන්ද්‍රීය ප්‍රජාමූලක සමාජ සංවිධානාත්මක බව ඉතිහාසයෙහි තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරමින් උඩකැන්දවල සිරි සරණංකර හිමි ගොඩනැගූ සන්නිවේදනය අද්‍යතන සමාජය තුළ ප්‍රබල ඥාන ධාරාවක් බවට පත් කළ බව කිව යුතු කරුණකි.

කොළඹ හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලවලින් උසස් අධ්‍යාපනය ලබා ගත් චන්දන, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ජනමාධ්‍යවේදය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව හිමි කැර ගෙන ඇති අතර, මේ වන විට ජනමාධ්‍ය පර්යේෂණ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හදාරමින් සිටී. මෙයට අමතර ව චන්දන, එක්සත් රාජධානියේ 'රොයිටර්' ආයතනයේ දී අන්තර්ජාතික ප්‍රවෘත්ති රචනය හා සංස්කරණය පිළිබඳ පුහුණුව ලබා ඇති අතර ස්වීඩනයේ 'කල්මා' විශ්වවිද්‍යාලයේ දී ප්‍රජාතන්ත්‍රවාදය සහ මාධ්‍ය, ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා හදාරා ඇත. එමෙන් ම ඔහු තවත් රටවල් ගණනාවක දී මාධ්‍ය භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලා රැසක් හදාරා තිබේ.

'නවලෝකය - වාම සන්නිවේදනයේ පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි භූමිකාව' මාධ්‍යවේදී චන්දන විජේකෝන් අතින් ලියැවුණ අටවැනි කෘතිය යි. මෙයට පෙර ජනමාධ්‍ය, පුරාවිද්‍යාව විෂයයන් පිළිබඳ ව ඔහු අතින් කෘති කිහිපයක් ම සම්පාදනය වී ඇති බව සඳහන් කළ යුතු ය.

**මහාචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්**
අංශාධිපති (වැ.බ) - ජනමාධ්‍ය අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී පාලි මණ්ඩපය

ISBN 978-624-5710-00-3
Rs. 450.00
9"786245"710003"

විශ්ව සාහිත්‍යයේ සිංහල ලකුණ
දයාවංශ ජයකොඩි සහ සමාගම